# විගණකාධිපතිවරයාගේ ත්‍රෛවාර්ෂික වාර්තාව

## 2021-2023

## ව්‍යවස්ථාපිත හා අනෙකුත් අරමුදල්

# පටුන


| | | | පිටු අංක. |
|---|---|---|---|
| **1.** | විධායක සාරාංශය | | 4 |
| **2.** | මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ මතය | | 5 |
| **3.** | ව්‍යවස්ථාපිත හා අනෙකුත් අරමුදල් වල ස්වාධීන නිරීක්ෂණ | | |
| | 3.1 | ගොවිජන සංවර්ධන අරමුදල | 10 |
| | 3.2 | ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | 12 |
| | 3.3 | ගොවීන්ගේ භාරකාර අරමුදල | 28 |
| | 3.4 | ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | 37 |
| | 3.5 | බුද්ධශාසන අරමුදල | 42 |
| | 3.6 | හින්දු සංස්කෘතික අරමුදල | 45 |
| | 3.7 | චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ ජාතික චිත්‍රපට සංස්ථා භාරය | 48 |
| | 3.8 | ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදල | 53 |
| | 3.9 | ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල | 58 |
| | 3.10 | ධීවර ත්‍යාග අරමුදල | 70 |
| | 3.11 | පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳපල සංකීර්ණ කළමනාකරණ භාරය | 73 |
| | 3.12 | කැලෑ දෙපාර්තමේන්තු අරමුදල | 76 |
| | 3.13 | වන සත්ව සංරක්ෂණ අරමුදල | 78 |
| | 3.14 | සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධන අරමුදල | 86 |
| | 3.15 | වෙරළ ආරක්ෂක ත්‍යාග අරමුදල | 90 |
| | 3.16 | සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදල | 94 |
| | 3.17 | සමෘද්ධි  අරමුදල | 96 |
| | 3.18 | සමෘද්ධි  නිවාස සංවර්ධන අරමුදල | 99 |
| | 3.19 | සේවක අර්ථසාධක අරමුදල | 100 |
| | 3.20 | ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල | 121 |
| | 3.21 | පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල | 123 |
| | 3.22 | රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල | 125 |
| | 3.23 | තේ ශක්ති අරමුදල | 128 |
| | 3.24 | තුරුසවිය අරමුදල | 139 |

| | | | |
|---|---|---|---|
| | 3.25 | රේගු අතිකාල, නැව් බඩු පරීක්ෂා කිරීමේ ගාස්තු සහ රේගු තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන අරමුදල | 141 |
| | 3.26 | රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදල | 149 |
| | 3.27 | ශ්‍රී ලංකා රේගුව - රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදල | 155 |
| | 3.28 | ත්‍යාග හා දිරිදීමනා අරමුදල | 170 |
| | 3.29 | වායු විමෝචන භාරකාර අරමුදල | 175 |
| | 3.30 | සුරාබදු තැගි අරමුදල | 196 |
| | 3.31 | ලංකා විදුලිබල මණ්ඩලයේ අර්ථසාධක අරමුදල | 200 |
| | 3.32 | ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අරමුදල | 206 |
| | 3.33 | දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල | 208 |
| | 3.34 | සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩල අරමුදල | 210 |
| | 3.35 | ලංකා විදුලිබල මණ්ඩලයේ විශ්‍රාම වැටුප් අරමුදල | 213 |
| | 3.36 | අපි වෙනුවෙන් අපි අරමුදල | 216 |
| | 3.37 | ජාතික ආරක්ෂක අරමුදල | 221 |
| | 3.38 | සිරකරු සුභසාධක අරමුදල | 223 |
| | 3.39 | හිමිකම් රක්ෂණ අරමුදල | 229 |
| | 3.40 | බුද්ධිමය දේපළ අරමුදල | 232 |
| | 3.41 | සමාගම් අරමුදල | 236 |
| | 3.42 | සමූපකාර අතිරික්ත අරමුදල | 239 |
| | 3.43 | සමූපකාර සංවර්ධන අරමුදල | 243 |
| | 3.44 | ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල | 247 |
| | 3.45 | මිනුම් ඒකක ප්‍රමිති හා සේවා අරමුදල | 249 |
| | 3.46 | පොල් වගාකිරීමේ මණ්ඩලයේ අර්ථ සාධක අරමුදල | 251 |
| | 3.47 | ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල | 256 |
| | 3.48 | විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල | 263 |
| | 3.49 | විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල | 264 |
| | 3.50 | ජාතික ක්‍රීඩා අරමුදල | 265 |
| | 3.51 | උද්භිද උද්‍යාන භාර අරමුදල | 271 |
| | 3.52 | අම්බුළුවාව දිසානායක මුදියන්සේලාගේ ජයරත්න ආගමික මධ්‍යස්ථානය සහ ජෛව විවිධත්ව සංකීර්ණය භාර අරමුදල | 273 |

| | | | |
|---|---|---|---|
| | 3.53 | ජාතික රක්ෂණ භාර අරමුදල | 278 |
| | 3.54 | ශ්‍රී ලංකා තැන්පතු රක්‍ෂණ යෝජනා ක්‍රමය | 285 |
| | 3.55 | ඇසල පෙරහැර භාරය | 288 |
| | 3.56 | දේශීය ආදායම් දිරිගැන්වීමේ අරමුදල | 290 |
| | 3.57 | ජනාධිපතිවරයාගේ අරමුදල | 293 |

## 1. විධායක සාරාංශය

අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හෝ රාජ්‍ය සංස්ථා යටතේ නිශ්චිත පරමාර්ථයන් ඉටු කර ගැනීම අරමුණු කර ගෙන ව්‍යවස්ථාපිත හා ව්‍යවස්ථාපිත නොවන අරමුදල් 57ක් ස්ථාපිත කර ඇති අතර එම අරමුදල්වලින් අරමුදල් 52 ක් පනතක්, නියෝගයක්, රීතීන්, අමාත්‍ය මණ්ඩල අනුමැතියෙන් හා නියමාවලින් යටතේ ස්ථාපිත කර තිබූ අතර අරමුදල් 05 ක් භාර ඔප්පුවක් මඟින් ස්ථාපිත කර තිබුණි.

2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15 ඡේදය මඟින් ඇතුළත් කළ මුදල් රෙගුලාසි 876(3) ප්‍රකාරව ව්‍යවස්ථාපිත නොවන අරමුදල් වහාම ක්‍රියාත්මක වන පරිදි අහෝසි කොට ඒවායේ මුදල් ශේෂයන් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු බව දන්වා ඇති අතර එම ඡේදය ප්‍රකාරව ව්‍යවස්ථාපිත නොවන අරමුදලක් පවත්වා ගෙන යාමට සාධාරණ හේතු ඇත්නම් එවැනි අරමුදල් පාර්ලිමේන්තු පනතක් මඟින් නීතිගත කිරීමට කටයුතු කළ යුතු බවට සඳහන් කර ඇතත්, අරමුදල් 07 ක් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

අරමුදල් 57 අතුරින් එක් අරමුදලක් 2017 වර්ෂය දක්වා ගිණුම් ඉදිරිපත් කර තිබූ අතර, අරමුදල් 4ක් 2023 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි. එසේම එක් අරමුදලක් 2023 දෙසැම්බර් 31 දින සිට ඇවර කිරීමට තීරණය කර තිබුණි.

තවද, 2023.12.31 දිනට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබූ අරමුදල් 57 කින් අරමුදල් 52 කට අදාලව පැවති මුළු වත්කම් ශේෂය රු. 4,520,018,947,912 ක් හා පැවති මුළු වගකීම් ශේෂය රු. 166,528,980,180 ක් විය.

## 2. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ මතය

ව්‍යවස්ථාපිත හා අනෙකුත් අරමුදල් විසින් වර්ෂය අවසානයට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත වාර්ෂිකව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලැබේ. ආයතනවල ක්‍රියාකාරීත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ තත්ත්වයක් මූල්‍ය ප්‍රකාශනවලින් පිළිබිඹු කරන්නේද යන බවට ස්වාධීන සහතිකයක් විගණකාධිපති විසින් ලබාදෙනු ලැබේ. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම මගින් මෙම සහතිකය ලබාදෙනු ලැබේ. ව්‍යවස්ථාපිත හා අනෙකුත් අරමුදල්හි තත්ත්ව ප්‍රකාශනය හා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනවලින් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු වන්නේද හෝ නොවන්නේද යන්න සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතින්ට හෝ දැනට ජාත්‍යන්තර රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතින්ට අනුකූල වන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට සහ මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතින්ට එම මූල්‍ය ප්‍රකාශන අනුකූල වන්නේද හෝ නොවන්නේද යන්න පිළිබඳ විගණකාධිපතිවරයාගේ නිගමනය විගණන මතයෙන් ප්‍රකාශ කෙරේ.

මූල්‍ය ප්‍රකාශන අනුව ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් හෝ නොඑකඟතාවයන් හා විෂය පථය සීමාවීම් හා කළමණාකරණය හා විගණනය අතර මතුවන නොඑකඟතාවයන් සලකාබැලීමෙන් අනතුරුව සිව් ආකාරයක මතයන් ප්‍රකාශයට පත්කරනු ලබයි. ඒවා නම්.

**තත්ත්වාගණනය නොකළ මතය**

මූල්‍ය ප්රකාශනවල ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් හෝ අනුකූල නොවීම වාර්තා වී නොමැති විට මෙම මතය ප්‍රකාශ කෙරේ.

**තත්ත්වාගණනය කළ මතය**

මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශන හෝ නොගැලපීම් වාර්තා කර ඇති නමුත් ආයතනයේ මූල්‍ය ප්‍රකාශන වලට පැතිරී නොමැති විට මෙම මතය ප්‍රකාශ කෙරේ.

**අහිතකර මතය**

මූල්‍ය ප්‍රකාශන වල වාර්තා කර ඇති ප්‍රමාණාත්මක / සාවද්‍ය ප්‍රකාශයන් මූල්‍ය ප්‍රකාශන වලට ව්‍යාප්ත වී ඇති විට, අහිතකර විගණන මතය ප්‍රකාශ කෙරේ.

**මතය ව්‍යාචනය කිරීම**

විෂය පථය සීමා වීම හේතුවෙන් විගණකට විගණන මතය සඳහා ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීමට නොහැකි වීම හා විගණක විසින් මූල්‍ය ප්‍රකාශන වල හෙළි නොවූ සාවද්‍ය ප්‍රකාශ තිබිය හැකි යැයි තීරණය කරන විට මෙම මතය ප්‍රකාශ කෙරේ.

**ව්‍යවස්ථාපිත හා අනෙකුත් අරමුදල් වල මතයන් පිළිබඳ විස්තර**

2021, 2022 සහ 2023 වසර සඳහා ව්‍යවස්ථාපිත හා අනෙකුත් අරමුදල් 57කට අදාළව ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් නිකුත් කරන ලද විගණන මතයන් පිළිබඳ තොරතුරු පහත වගුවේ දැක්වේ.

| | 2021 | 2022 | 2023 |
|---|---|---|---|
| තත්ත්වාගණනය නොකල | 11 | 10 | 10 |
| තත්ත්වාගණනය කල | 39 | 38 | 35 |
| අහිතකර | 1 | 1 | 1 |
| වියාචනය | 4 | 5 | 5 |
| මතය තවමත් තීරණය කර නොමැති ගණන | - | - | - |
| මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැති ගණන | 2 | 3 | 6 |

| | නම | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|
| **1.** | ගොවිජන සංවර්ධන අරමුදල | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ |
| **2.** | ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ | ව්‍යාචනය කළ |
| **3.** | ගොවීන්ගේ භාරකාර අරමුදල | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ |
| **4.** | ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ |
| **5.** | බුද්ධශාසන අරමුදල | තත්ත්වාගණනය කළ | - | - |
| **6.** | හින්දු සංස්කෘතික අරමුදල | තත්ත්වාගණනය නොකළ | තත්ත්වාගණනය නොකළ | තත්ත්වාගණනය නොකළ |
| **7.** | චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ ජාතික චිත්‍රපට සංස්ථා භාරය | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ | - |
| **8.** | ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදල | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය නොකළ |
| **9.** | ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ |
| **10.** | ධීවර ත්‍යාග අරමුදල | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ |
| **11.** | පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳපල සංකීර්ණ කළමනාකරණ භාරය | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ |

| | | | | |
|---|---|---|---|---|
| **12.** | කැලෑ දෙපාර්තමේන්තු අරමුදල | තත්ත්වාගණනය කළ | අහිතකර | අහිතකර |
| **13.** | වන සත්ව සංරක්ෂණ අරමුදල | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ |
| **14.** | සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධන අරමුදල | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ |
| **15.** | වෙරළ ආරක්ෂක ත්‍යාග අරමුදල | තත්ත්වාගණනය නොකළ | තත්ත්වාගණනය කළ | වියාවනය කළ |
| **16.** | සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදල | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ |
| **17.** | සමෘද්ධි අරමුදල | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය නොකළ | තත්ත්වාගණනය නොකළ |
| **18.** | සමෘද්ධි නිවාස සංවර්ධන අරමුදල | අහිතකර | තත්ත්වාගණනය නොකළ | තත්ත්වාගණනය නොකළ |
| **19.** | සේවක අර්ථසාධක අරමුදල | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ |
| **20.** | ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය නොකළ |
| **21.** | පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල | තත්ත්වාගණනය කළ | ව්‍යාවනය කළ | ව්‍යාවනය කළ |
| **22.** | රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල | ව්‍යාවනය කළ | ව්‍යාවනය කළ | ව්‍යාවනය කළ |
| **23.** | තේ ශක්ති අරමුදල | - | - | - |
| **24.** | තුරුසවිය අරමුදල | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය නොකළ | තත්ත්වාගණනය කළ |
| **25.** | රේගු අතිකාල, නැව් බඩු පරීක්ෂා කිරීමේ ගාස්තු සහ රේගු තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන අරමුදල | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ |
| **26.** | රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදල | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ |
| **27.** | ශ්‍රී ලංකා රේගුව - රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදල | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ |
| **28.** | ත්‍යාග හා දිරිදීමනා අරමුදල | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ |
| **29.** | වායු විමෝචන භාරකාර අරමුදල | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ |
| **30.** | සුරාබදු තෑගි අරමුදල | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ |
| **31.** | ලංකා විදුලිබල මණ්ඩලයේ අර්ථසාධක | තත්ත්වාගණනය නොකළ | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ |

| | | | | |
|---|---|---|---|---|
| | අරමුදල | | | |
| **32.** | ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අරමුදල | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ |
| **33.** | දාශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය නොකළ |
| **34.** | සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩල අරමුදල | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ |
| **35.** | ලංකා විදුලිබල මණ්ඩලයේ විශ්‍රාම වැටුප් අරමුදල | තත්ත්වාගණනය නොකළ | තත්ත්වාගණනය නොකළ | තත්ත්වාගණනය කළ |
| **36.** | අපි වෙනුවෙන් අපි අරමුදල | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ |
| **37.** | ජාතික ආරක්ෂක අරමුදල | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ |
| **38.** | සිරකරු සුභසාධක අරමුදල | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ |
| **39.** | හිමිකම් රක්ෂණ අරමුදල | තත්ත්වාගණනය නොකළ | තත්ත්වාගණනය නොකළ | තත්ත්වාගණනය කළ |
| **40.** | බුද්ධිමය දේපළ අරමුදල | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ |
| **41.** | සමාගම් අරමුදල | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ |
| **42.** | සමුපකාර අතිරික්ත අරමුදල | තත්ත්වාගණනය කළ | ව්‍යාවනය කළ | ව්‍යාවනය කළ |
| **43.** | සමුපකාර සංවර්ධන අරමුදල | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ |
| **44.** | ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල | ව්‍යාවනය කළ | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ |
| **45.** | මිනුම් ඒකක ප්‍රමිති හා සේවා අරමුදල | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ |
| **46.** | පොල් වගාකිරීමේ මණ්ඩලයේ අර්ථ සාධක අරමුදල | - | - | - |
| **47.** | ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ |
| **48.** | විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල | තත්ත්වාගණනය නොකළ | තත්ත්වාගණනය නොකළ | තත්ත්වාගණනය නොකළ |
| **49.** | විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල | තත්ත්වාගණනය නොකළ | තත්ත්වාගණනය නොකළ | තත්ත්වාගණනය නොකළ |
| **50.** | ජාතික ක්‍රීඩා අරමුදල | තත්ත්වාගණනය නොකළ | තත්ත්වාගණනය නොකළ | තත්ත්වාගණනය කළ |
| **51.** | උද්භිද උද්‍යාන භාර අරමුදල | තත්ත්වාගණනය නොකළ | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ |

| | | | | |
|---|---|---|---|---|
| **52.** | අම්බුළුවාව දිසානායක මුදියන්සේලාගේ ජයරත්න ආගමික මධ්‍යස්ථානය සහ ජෛව විවිධත්ව සංකීර්ණය භාර අරමුදල | ව්‍යාවනය කළ | ව්‍යාවනය කළ | - |
| **53.** | ජාතික රක්ෂණ භාර අරමුදල | ව්‍යාවනය කළ | ව්‍යාවනය කළ | - |
| **54.** | ශ්‍රී ලංකා තැන්පතු රක්‍ෂණ යෝජනා ක්‍රමය | තත්ත්වාගණනය නොකළ | තත්ත්වාගණනය නොකළ | තත්ත්වාගණනය නොකළ |
| **55.** | ඇසල පෙරහැර භාරය | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ |
| **56.** | දේශීය ආදායම් දිරිගැන්වීමේ අරමුදල | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ |
| **57.** | ජනාධිපතිවරයාගේ අරමුදල | තත්ත්වාගණනය නොකළ | තත්ත්වාගණනය නොකළ | තත්ත්වාගණනය නොකළ |

# 3. ව්‍යවස්ථාපිත හා අනෙකුත් අරමුදල් වල ස්වාධීන නිරීක්ෂණ

## 3.1 ගොවිජන සංවර්ධන අරමුදල

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | බදු පෙර ලාභය (අලාභය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 498,559,804 | 150,880,472 | 347,679,332 | 8,441,248 | තත්ත්වාගණනය කළ |
| **2022** | 562,767,045 | 146,163,543 | 416,603,502 | 49,078,658 | තත්ත්වාගණනය කළ |
| **2023** | 600,960,892 | 135,914,015 | 465,046,877 | 49,228,196 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| 1. | මුදල් රෙගුලාසි 876(3) ප්‍රකාරව ව්‍යවස්ථාපිත නොවන අරමුදල් අහෝසි කිරීමට හෝ තවදුරටත් පවත්වාගෙන යාමට සාධාරණ හේතු ඇත්නම් පාර්ලිමේන්තු පනතක් මගින් නීතිගත කළ යුතු වුවත් අරමුදල සඳහා එසේ සිදුකර නොතිබුණි. | 2023 | නීති රීති, රෙගුලාසි වලට අනුව අරමුදල පවත්වාගෙනයාම සිදුකළ යුතුය. | 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ VIII වන පරිච්ඡේදයේ 97.1 වගන්තිය යටතේ ගොවිජන සංවර්ධන අරමුදල ස්ථාපිත කර ඇත. | |
| 2. | ගොවිජන සංවර්ධන අරමුදලට අදාල අක්කර බදු සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යාලයේ අක්කර බදු ගෙවිය යුතු ඉඩම් පිළිබඳ ලේඛනයක් නඩත්තු කර නොතිබුණු බැවින් දිස්ත්‍රික් කාර්යාල | 2022 2023 | නව පරිගණක පද්ධතිය කඩිනමින් ස්ථාපිත කර යාවත්කාලීන කරන ලද තොරතුරු පද්ධතියක් පවත්වා ගත යුතුය. | පරිගණක පද්ධතියක් ආශ්‍රයෙන් අක්කර බදු ගෙවිය යුතු ඉඩම් පිළිබඳ නිර්ණය කිරීමට කටයුතු කරමින් ඇත. | මේ වන විටත් ඩිජිටල් තාක්ෂණය ඔස්සේ Geo Goviya 1 අදියර යටතේ සියු දිස්ත්‍රික්කවල මඩ ඉඩම් මැන අවසන් කර ඇති අතර Geo Goviya 2 යටතේ 2025 වර්ෂයේදී ගොඩ ඉඩම් මැනීම |

| | |
|---|---|
| විසින් ප්‍රේෂණය කරන ලද සියයට 20 ක අක්කර බදු දායක මුදල නිවැරදිව ප්‍රේෂණය කරනු ලබයි ද යන්න තහවුරු කරගත නොහැකිව තිබුණි. මේ සම්බන්ධයෙන් යාවත්කාලීන කරන ලද තොරතුරු පද්ධතියක්ද ක්‍රියාත්මක කර නොතිබුණි. | ආරම්භ කිරීමට නියමිතය. |

## 3.2 ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 1,497,334,645 | 83,464,375,410 | (81,967,040,765) | 340,728,410,000 | තත්ත්වාගණනය කළ |
| **2022** | 1,516,033,327 | 87,508,723,634 | (85,992,690,306) | 314,051,635,000 | තත්ත්වාගණනය කළ |
| **2023** | 2,202,748,150 | 89,457,327,489 | (87,254,579,339) | 467,192,949,000 | ව්‍යාචනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ගය | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| 1. | යෝජනාක්‍රමයේ මුළු වත්කම් රු.2,202,748,150 ක් සහ මුළු වගකීම් රු.89,457,327,488 ක් වූයෙන් වත්කම් ඉක්මවූ වගකීම් රු.87,254,579,339 ක් ද, මුළු ජංගම වත්කම් රු.1,092,503,529 ක් සහ මුළු ජංගම වගකීම් රු.2,527,354,554 ක් වූයෙන් ජංගම වත්කම් ඉක්මවූ ජංගම වගකීම් රු.1,434,851,025 ක් ද වන අතර භාණ්ඩාගාරයේ දායකත්වයක් නොමැතිව යෝජනා ක්‍රමය පවත්වාගෙන යා නොහැකි තත්ත්වයක පවතින නිසා යෝජනාක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම ගැටළු සහගතවේ. | 2023 2022 2021 | යෝජනා ක්‍රමය සක්‍රිය කර ගැනීමට කටයුතු කළ යුතුය. | රජයේ අයවැය මගින් මුදල් වෙන්කර ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම සිදුකරගෙන යනු ලබයි. | අඛණ්ඩ පැවැත්ම තහවුරු වන ක්‍රියාමාර්ග ගෙන නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2. | ගොවීන්ගේ නිවැරදි ජීව දත්ත තොරතුරු යාවත්කාලීන කිරීමේ ක්‍රමවේදයක් නොමැති වීම හේතුවෙන් මියගිය සහ වෙනත් හේතූන්මත හිමිකම් නොපාන ගොවීන්ගේ විශ්‍රාම වැටුප දිගින් දිගටම තැපැල් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර තිබුණි. මේ හේතුවෙන් 2023 වර්ෂයේ දී ගොවීන් විසින් භාර නොගැනීම නිසා තැපැල් දෙපාර්තමේන්තුව විසින් ආපසු එවූ විශ්‍රාම වැටුප රු.259,373,191 ක් වූ අතර සමාලෝචිත වසර අවසානයට එම දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු ශේෂය රු.81,000,602 ක් විය. විශ්‍රාම වැටුප් ලබා නොගත් ගොවීන් පිළිබඳ විස්තර නඩත්තු කර නොතිබීම නිසා වර්ෂ අවසාන ශේෂයෙහි සහ ලද මුදලෙහි නිරවද්‍යතාව තහවුරු නොවීය. | 2023<br>2022 | හිමිකම් නොපෑ මුදල් පිළිබඳ තොරතුරු යාවත්කාලීනව පවත්වාගත යුතුය. | ප්‍රධාන කාර්යාලය වෙත ලැබෙන ලේඛන පරික්ෂා කර බලා ප්‍රධාන කාර්යාලයේ හෝ ලේඛනාගාරයේ ගබඩා කිරීමටත් එම ලේඛනවල තොරතුරු සහිත පරිසනක දත්ත පද්ධතිය යාවත්කාලින කිරීමටත් කටයුතු කිරීම. දිසා ගණකාධිවරුන් විසින් අන්තර්ජාලය ඔස්සේ ලබාදෙන නොගෙවූ විශ්‍රාම වැටුප් ලේඛන පවත්වා ගැනීමට කටයුතු කිරීම | ජීව දත්ත තොරතුරු යාවත්කාලීන කර ඒ අනුව හිමිකම් නොපාන ගොවීන්ගේ විශ්‍රාම වැටුප භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර නොමැත. |
| 3. | 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රම පනතේ 12(ඇ) වගන්තිය ප්‍රකාරව යෝජනාක්‍රමය සම්බන්ධයෙන් ජීව | 2023<br>2022 | යෝජනා ක්‍රමයේ ජීව දත්ත තොරතුරු පද්ධතිය යාවත්කාලීන කර පවත්වාගෙන යා යුතුය. | E.R.P මෘදුකාංග පද්ධතිය බැංකු පද්ධතිය සමඟ සම්බන්ධ කර පවත්වා ගනිමින් දත්ත යාවත්කාලීන කිරීමට සැලසුම් කර 2022 වර්ෂයේ සිට | ජීව දත්ත තොරතුරු පද්ධතිය යාවත්කාලීන කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | දත්ත ඇතුළත් තොරතුරු පද්ධතියක් පවත්වා තිබුණද යාවත්කාලීනව දත්ත ඇතුළත් කර යාවත්කාලීන නොකිරීම නිසා අවශ්‍ය මූල්‍ය හා මෙහෙයුම් වාර්තා ලබා ගැනීමට නොහැකි විය. | | | පසු වාරික පරිගණකගත කිරිම ආරම්භ කිරිමට සැලසුම් කරමින් ඇත. | |
| 4. | 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනතේ 12(ඇ) වගන්තිය ප්‍රකාරව යෝජනා ක්‍රමය පිළිබඳව සමීක්ෂණ අගැයුම් හා සමාලෝචනය කර මෙහෙයුම් රීතිවල වෙනස්කම් ඇති කිරීම සිදු කළ යුතු වුවත්, ගොඩනගාගන්නා ලද නීතියක් රීතියක් හෝ රෙගුලාසියක් නොමැතිව හිමිකම් නොපෑ විශ්‍රාම වැටුප ආපසු ගෙවීමේ දී අර්ධ වර්ෂයකට සියයට 3.32 ක පොලී ප්‍රතිශතයක් ශුද්ධ වාරික මුදලට අමතරව ගණනය කර තිබුණි. | 2023<br>2022 | ශුද්ධ වාරික මුදල මත පොලිය ගණනය කිරීමට රීතියක් ගොඩනගාගත යුතුය. | ශුද්ධ වාර මුදල් හා පොලිය ගණනය කිරීම් ජීවගණිතඥයෙකු විසින් සිදු කරන බව දක්වා ඇතත් එසේ කර නොතිබුණි. | ශුද්ධ වාරික මුදල මත පොලිය ගණනයට රීතියක් ගොඩනගා නොමැත. |
| 5. | 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනතේ 15(1) වගන්තිය ප්‍රකාරව පිළිවෙලින් වාරික 5 ක් | 2023<br>2022 | වාරික මුදල් නිසිපරිදි නොගෙවීම මත ප්‍රතිලාභ අහිමි වීම දායකයා දැනුවත් කළ යුතුය. | ප්‍රතිලාභ අහිමි වීම පිළිබඳව දායකයා දැවුවත් කිරීමට ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත | කිසියම් වාරික ප්‍රමාද වී සහතික ඔප්පුවේ සඳහන් ප්‍රතිලාභ අහිමි වීම පිළිබඳව දායකයා දැනුවත් කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ගෙවීම පැහැර හැර ඇති දායකයෙකුට සහතිකය යටතේ වූ ප්‍රතිලාභ අහිමි කිරීම දායකයා වෙත දැන්වීමට මණ්ඩලයට බලය ඇතත් ප්‍රතිලාභී පාර්ශවය විසින් පිළිවෙලින් වාරික 5 ක් ගෙවීම පැහැර හරිනු නොලබන නමුත් කඩින් කඩ හෝ වාරික 5 ක් නොගෙවූ ප්‍රතිලාභීන් ද ඔප්පුව කඩකළා සේ සලකා විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අහිමි කර තිබුණි. | | | | |
| 6. | 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනතේ 27(1) වගන්තිය ප්‍රකාරව විෂයභාර අමාත්‍යවරයාගේ සහ මුදල් විෂයභාර අමාත්‍යාවරයාගේ එකඟතාවය මත, යෝජනාක්‍රමය විසින් ලබා ගන්නා ණය ප්‍රමාණය තීරණය විය යුතු වුවත් එවැනි එකඟතාවයක් ලබානොගෙන කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයෙන් මෙම යෝජනාක්‍රමයට රු.290,800,755 ක ණය මුදලක් ලබාගෙන තිබුණි. 2023 දෙසැම්බර් 31 | 2023<br>2022 | විෂයභාර සහ මුදල් අමාත්‍යාවරයාගේ එකඟතාවය මත, යෝජනා ක්‍රමයට ණය ලබාගත යුතුය. | 2010 හා 2011 වර්ෂවලදී ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා යෝජනාක්‍රමයේ මුදල් නොමැති වීම නිසා මුදල් අමාත්‍යාංශය විසින් ලබාදී ඇති නිර්දේශ අනුව කෘෂි රක්ෂණ හා ධීවර විශ්‍රාම වැටුප් යෝජනාක්‍රම තුළින් මුදල් ලබාගෙන ගොවි විශ්‍රාම වැටුප් ගෙවීමට කටයුතු කිරීම. | ණය ලබාගැනීමේ දී විෂයභාර සහ මුදල් අමාත්‍යාවරයාගේ එකඟතාවය ලබාගෙන නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | දිනට ගෙවිය යුතු පොලියද ඇතුළත් මුළු ණය ශේෂය රු.518,782,124 ක් විය. | | | | |
| 7. | සහතික ඔප්පුවේ 6 වගන්තිය ප්‍රකාරව ගෙවා ඇති අර්ධ වාර්ෂික දායක මුදල් ප්‍රමාණයෙන් සියයට 75 ක් ලැබී තිබේ නම් මණ්ඩලය විසින් තීරණය කරන පරිදි නියමිත විශ්‍රාම වැටුපට වඩා අඩු විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම් ඇතත් එම දායකයින් සඳහා විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අහිමිකර තිබුණි. | 2023<br>2022 | නියමිත විශ්‍රාම වැටුපට වඩා අඩු විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම් ඇත. | අඩුකළ විශ්‍රාම වැටුප් සැකසීම සඳහා දායකත්වය අවලංගු නොවී දායකයෙකු ගෙවිය යුතු වාරික ප්‍රමාණයෙන් සියයට 75 කට වඩා ගෙවීම් කර ඇත්නම් ඔහුට අඩුකළ විශ්‍රාම වැටුපක් සැකසීමට කටයුතු කිරීම. | නියමිත විශ්‍රාම වැටුපට වඩා අඩු විශ්‍රාම වැටුපක් නොගෙවා ගොවියාගෙ වාර මුදල් ආපසු ගෙවා ඇත. |
| 8. | යෝජනා ක්‍රමයට අදාළව අනුමත කාර්ය මණ්ඩලයක් නොසිටින අතර මණ්ඩලයෙහි මුළු සේවක වැටුප් වියදමින් හා අනිකුත් පරිපාලන වියදම් වලින් ද සියයට 50 ක් බැගින් වූ ප්‍රතිශතයක් යෝජනා ක්‍රමයේ වියදම් ලෙස හරකර තිබුණි. හිමිකම් නොපෑ විශ්‍රාම වැටුප් ආපසු ගෙවීමේ දී ප්‍රතිලාභියාගෙන් ලැබෙන සෑම වාරිකයකින්ම රු.15 බැගින් පරිපාලන වියදම් වශයෙන් ද ගොවියා නිසි පරිදි | 2023 | අනුමත රීතියක් නොමැතිව වාරික මුදලින් වෙනත් අය කිරීම් නොකළ යුතුය. | ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායක වන ගොවි මහතුන් හට ගොවි විශ්‍රාම වැටුප් පනතේ 4 ආ, ඇ සහ ඈ වගන්ති අනුව විශ්‍රාම වැටුපට අමතරව මරණ පාරිතෝෂිතයක් හා පූර්ණ අර්ධ බෙලහීන දීමනාවක් ලබා දිය යුතු බැවින් එම රක්ෂණ ආවරණය වෙනුවෙන් කන්නයක් සඳහා රු.30 ක රක්ෂණ ගාස්තුවක් අය කරනු ලැබේ. | වාරික මුදලින් ගාස්තු අය කිරීමට අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ගෙවූ එක් වාරිකයකට රු.30 බැගින් රක්ෂණ ගාස්තුවක් ද ගොවියාට ආපසු ගෙවන මුදලින් රු.150 ක් යලි රක්ෂණ ගාස්තුවක් ලෙස ද අඩු කර ගොවියාට ආපසු ගෙවන මුදල තීරණය කර තිබුණ ද මේ සඳහා කිසිඳු රීතියක් හෝ අනුමත කර ගෙන නොතිබුණි. | | | | |
| 9. | තොරතුරු පද්ධතියක් සඳහා දත්ත රැස්කිරීමට 2017 වර්ෂයේදී රු.5,640,925 ක් වියදම් කර ඇතත් අපේක්ෂිත තොරතුරු රැස් නොකිරීම නිසා තොරතුරු පද්ධතිය ගොඩනගා නොතිබුණි. | 2023<br>2022 | තොරතුරු රැස්කර අදාළ පද්ධතිය ගොඩනගා යාවත්කාලීන කර පවත්වාගෙන යා යුතුය. | ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | තොරතුරු පද්ධතිය යාවත්කාලීන කර පවත්වා නොතිබුණි. |
| 10. | ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ 2007 දෙසැම්බර් 31 දිනට පැවති සමූහ ජීවිත රක්ෂණ අරමුදලේ සහ එයට අදාළ ආයෝජනය වූ රු.251,547,146 ක ශේෂය කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ ගිණුමට මාරු කර තිබුණි. යෝජනාක්‍රමයේ මුදල් අවශ්‍යතාව සඳහා 2010, 2011 සහ 2012 වර්ෂවලදී සමූහ ජීවිත රක්ෂණ අරමුදලෙන් රු.295,230,442 ක | 2023<br>2022<br>2021 | යෝජනා ක්‍රමයට ආර්ථිකමය වාසි සැලසෙන පරිදි නිවැරදි තීරණ ගත යුතුය. භාණ්ඩාගාරයෙන් ලද මුදල් වෙනත් කටයුතු සඳහා උපයෝජනය කර නොගත යුතුය. | ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | ආර්ථික වාසි ලැබෙන ලෙස අරමුදලේ කටයුතු සමාලෝචනය කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ණය මුදලක් ලබාගෙන තිබුණු අතර ඒ සඳහා 2023 වර්ෂය දක්වා වූ සමුච්චිත පොලිය රු.422,547,571 ක් විය. සමාලෝචිත වර්ෂයේ යොජනා ක්‍රමයේ පරිපාලන වියදම් සඳහා භාණ්ඩාගාරයෙන් ලද රු.206,225,000 ක මුදලින් රු.7,980,276 ක මුදලක් ද ගොවීන්ගෙන් ලද වාරික ආදායමින් රු.20,000,000 ක් යොදාගෙන ණය මුදලින් කොටසක් වශයෙන් පියවා තිබුණි. මේ අනුව ජීවිත රක්ෂණ අරමුදලෙහි ආයෝජනය ණය මුදලක් බවට පත් වී තිබුණි. | | | | |
| 11. | මාවිල් ආරු සොරොව්ව වැසීම නිසා ගොවීන් වෙත වගා හානි වන්දි ගෙවීම සඳහා රුපියල් මිලියන 7 කට වැඩි මුදලක් පෙර වර්ෂයන්හිදී ගෙවීම් කර තිබුණු අතර මේ සම්බන්ධව ගොනු කරන ලද නඩුව නීතිපති උපදෙස් සඳහා 2007 නොවැම්බර් 30 දින යොමුකර ඇතත් මෙම වාර්තාවේ දින වන | 2023 | ගොනු කරන ලද නඩු සම්බන්ධයෙන් පසුවිපරම් කළ යුතුය. | ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත | ගොවීන් වෙත වගා හානි වන්දි ගෙවීම් අක්‍රමිකතා පසුවිපරම් කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | විටත් ඒ සම්බන්ධයෙන් කිසිදු පසුවිපරමක් සිදුකර නොතිබුණි. | | | | |
| 12. | 2012 වර්ෂයේ සිට හිමිකම් නොපෑ ගෙවියයුතු රු.4,254,932,613 ශේෂයෙන් රු.3,033,329,200 ක මුදලක් අදාළ ගොවීන්ට ගෙවීමට කටයුතු නොකර විශ්‍රාම වැටුප් අරමුදලට මාරු කිරීම නිසා අරමුදලේ අවාසිදායක තත්ත්වය අඩුවී තිබුණි. | 2023 | ගොවීන්ට ගෙවිය යුතු විශ්‍රාම වැටුප සොයා බලා ගෙවීමට කටයුතු කළ යුතුය. | ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත | ගොවීන්ට ගෙවිය යුතු විශ්‍රාම වැටුප ගෙවීමට කටයුතු කර නොමැත. |
| 13. | යෝජනා ක්‍රමය තුළ ලියාපදිංචි 871,425 ක්වූ ගොවීන්ගෙන් 2023 දෙසැම්බර් 31 දිනට අවුරුදු 61 සිට අවුරුදු 93 දක්වා වයස් ගතවූ ගොවීන් 474,803 ක් වුවත් ඉන් 264,227 දෙනෙකුට විශ්‍රාම වැටුප් ගෙවා නොතිබුණි. 2022 දී අවුරුදු 60 සම්පූර්ණ කළ විශ්‍රාම වැටුප හිමිවිය යුතු ඉල්ලුම්පත්‍ර එවා නොමැති, දායකයින් සොයා විශ්‍රාම වැටුප් ලබාදීමට අවශ්‍ය කටයුතු කරන ලෙස සියලුම දිස්ත්‍රික් නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂවරුන් වෙත 2023 ජුනි 23 යොමු කරන ලද අංක | 2023<br>2022 | අවුරුදු 60 සම්පූර්ණ කළ විශ්‍රාම වැටුප ඉල්ලුම් නොකළ දායකයින් හඳුනාගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. | ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත | වයස අවුරුදු 60 සම්පූර්ණ කළ විශ්‍රාම වැටුප නොගෙවූ දායකයින් හඳුනාගැනීම කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 6/FPS/පා/2 දරන ලිපිය මගින් දැනුම් දී තිබුණද, දිස්ත්‍රික් කාර්යාල 12 ක නියැදියක් පරීක්ෂා කිරීමේදී ඉන් 6 ක් මේ අනුව කටයුතු කර නොතිබුණි. | | | | |
| 14. | අනුගාමී වාරික 5 ක් කඩ කර ඇති විට ඒ බව දැනුවත් කර ඔප්පුව සක්‍රිය කිරීම සඳහා අවශ්‍ය පහසුව සලසා නොමැති නිසා නියමිත වයස සම්පූර්ණ වූ පසු විශ්‍රාම වැටුප් සඳහා අයදුම් කළ දායකයින්ගෙන් 2021 වර්ෂයේදී දායකයින් 1,127 දෙනෙකුටද 2022 වර්ෂයේදී දායකයින් 2,226 දෙනෙකුටද සමාලෝචිත වර්ෂයේ දායකයින් 715 දෙනෙකුටද විශ්‍රාම වැටුප් නොගෙවා ශුද්ධ වාරික මුදල් ගෙවීම් කර තිබුණි. | 2023 | අනුගාමී වාරික 5 ක් කඩ කර ඇති විට ඒ බව දැනුවත් කර ඔප්පුව සක්‍රිය කිරීම සඳහා අවශ්‍ය පහසුව සැලසිය යුතුය. | ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත | අනුගාමී වාරික 5 ක් නොගෙවීම දැනුවත් කර ඔප්පුව සක්‍රිය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| 15. | විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයට 2021 වර්ෂයෙන් පසු බඳවාගැනීමේදි ගෙවීම් පැහැර හැර ඔප්පුව අක්‍රිය වී ඇති ගොවීන් හඳුනාගෙන ඔවුන්ගේ වාර මුදල් භාර නොගන්නා ලෙස එම ගිණුම අත්හිටුවීමට | 2023 | ඔප්පුව කඩ කිරීම හඳුනා ගැනීමට ක්‍රමවේද හඳුන්වා දිය යුතුය. | ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත | ඔප්පුව කඩ කිරීම හඳුනා ගැනීමට ක්‍රමවේද හඳුන්වා දි නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ක්‍රමවේද හඳුන්වා දී නොතිබුණි. | | | | |
| 16. | 2023 ක්‍රියාකාරී සැලැස්මේ විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයේ ඵලදායීත්වය ඉහළ නැංවීම යන උපායමාර්ගය යටතේ සැලසුම් කළ ක්‍රියාකාරකම් 3ක් ප්‍රකාරව දායකයින් සක්‍රීයව පවත්වා ගැනීමට වැඩසටහන් හඳුන්වා නොදීම, කෙටි පණිවිඩ (SMS) මගින් දැනුවත් කිරීම හා ගිණුමේ ශේෂය පරීක්ෂා කිරීම සඳහා වෙබ් යෙදවුම් හඳුන්වා දීම සිදු කර නොතිබීම. | 2023 | දායකයින් සක්‍රීයව පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය. | ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත | යෝජනා ක්‍රමයේ ඵලදායීත්වය ඉහළ නැංවීමට උපායමාර්ගය සැලසුම් ක්‍රියාකාරකම් ඉටුකර නොතිබුණි. |
| 17. | තරඟකාරී රක්ෂණ ආයතන විසින් වාරික ගෙවීම් සහ ප්‍රමාදවීම් පිළිබඳව දායකයින් දැනුවත් කිරීම් සිදු කර ඔවුන්ට මග පෙන්වීම ලබා දෙන නමුත් මණ්ඩලය විසින් ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබීම. | 2023 | කර්මාන්තයේ පවතින ප්‍රවර්ධන තත්ත්වයන් අනුගමනය කළ යුතුය. | ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත | තරඟකාරී රක්ෂණ ප්‍රවර්ධනයන් සිදු කර නොතිබුණි. |
| 18. | සක්‍රීය දායකයින්ගෙන්, ගිණුම් වර්ෂය සඳහා ලැබිය යුතු දායක මුදලේ වටිනාකම හඳුනාගැනීමට හැකිවන පරිදි විශ්‍රාම වැටුප් යෝජනාක්‍රමය සඳහා බැඳුන දිනය සහ | 2022<br>2021 | දායකයින්ගේ නාම ලේඛන යාවත්කාලීන කර පවත්වා ගත යුතුය. | පසු වාරික ස්වයංක්‍රීයව පරිගණකගත කිරීම සඳහා වැඩපිළිවෙලක් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින්ම ඇත. | දායකයින්ගේ හිඟ ශේෂ නාම ලේඛන යාවත්කාලීන කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | හිමිකම්පාන දිනය ඇතුළත් දායකයින්ගේ නාමලේඛනය වාරික ලැබීම් ඇතුළත් කරමින් සම්පූර්ණව සහ යාවත්කාලීනව පවත්වාගෙන නොයාම නිසා දායකයින්ගෙන් ලද ආදායම උපචිත පදනම වෙනුවට මුදල් පදනමට රු.13,420,221 ක් ලෙස ගිණුම් ගත කර තිබුණි. | | | | |
| 19. | සමාලෝචිත වර්ෂය තුළ ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලද රු.3,968,000,000 ක මුදලින් රු.3,918,881,123 ක් ගෙවීම් කිරීමෙන් පසු ඉතිරි මුදල වූ රු.49,118,877 ක් නැවත භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර නොතිබුණු අතර එය ආපසු ගෙවිය යුතු මුදලක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | 2022 | දායකයින් වෙත නොගෙවූ මුදල් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ යුතුය. | ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත | දායකයින්ට නොගෙවූ මුදල් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර නොමැත |
| 20. | සමාලෝචිත වර්ෂය තුළ ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම් වලින් හිමිකම් නොපෑ රු.167,470,484 ක් ගොවීන්ට ආපසු ගෙවිය යුතු බැරකමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් | 2022<br>2021 | විශ්‍රාම වැටුප් මුදල් ගොවීන් විසින් නැවත ලබා ගන්නාතෙක් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. | 2023 වර්ෂයේදී ලබා නොගත් විශ්‍රාම වැටුප් පමණක් ගෙවිය යුතු ලෙස උපචිත කර තිබුණි. | හිමිකම් නොපෑ විශ්‍රාම වැටුප වූ 2021 දී රු.125,633,943 ක් සහ 2023 දී රු.340,373,793 ක් නිරවුල් කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | නොකර යෝජනා ක්‍රමයේ ආදායම ලෙස සලකා ගිණුම්ගත කර තිබුණි. | | | | |
| 21. | ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය, ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය සහ කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය යන ගිණුම් ඒකක තුනම එක්ව ක්‍රියාත්මකව තිබුණත්, කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ පරිපාලන වියදමින් සියයට 50 ක් සහ අනෙකුත් වියදම්වලින් සියයට 20 සිට සියයට 50 ක් දක්වා වූ ඉහළ ප්‍රතිශතයන් ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අන්තර්ග්‍රහණය කර තිබුණි. එම අනුපාතවල සාධාරණත්වය පරීක්ෂා කිරීම සඳහා අනුපාත තීරණය කළ පදනම හෙළිදරව් කර නොතිබුණි. | 2022 | වියදම අන්තර්ග්‍රහණ අනුපාතය තීරණය කළ පදනම හෙළිදරව් කළ යුතුය. | ඉදිරියේදී මෙම අනුපාතයන් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගනිමින් සමාලෝචනය කිරීමට කටයුතු කරන බව | යෝජනා ක්‍රමවල සත්‍ය වියදම අන්තර්ග්‍රහණ කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| 22. | 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රම පනතෙහි 6(1)උප වගන්තිය ප්‍රකාරව දායකයෙකු තම වයස අවුරුදු 60 වූ විට විශ්‍රාම වැටුපකට හිමිකම් ලැබිය යුතු වුවත් මෙම යෝජනාක්‍රමයේ | | | | |
| (i) | විශ්‍රාම වැටුප් අයදුම්පත් ලබා ගැනීමට සහ ඉල්ලුම් කළ යුතු නියමිත දිනයන් පිළිබඳ ඔවුන් දැනුවත් කිරීමට සහ අයදුම්පත් ගෙන්වා ගැනීමට ක්‍රමවේදයක් නොතිබුණි. | 2022 | විශ්‍රාම වැටුප් අයදුම්පත් ලබා ගැනීමට පහසු ක්‍රමවේදයක් සැකසිය යුතුය. | අවුරුදු 60 සම්පූර්ණ වූ ගොවීන්ගේ විස්තර දිස්ත්‍රික් කාර්යාල සඳහා යොමු කරන බවත්, ඉදිරියේදී විද්‍යුත් තැපැල මගින් හා SMS පණිවුඩ මගින් ගොවීන් දැනුවත් කිරීමට අපේක්ෂා කරන බවත්. ගොවිජන සේවා මට්ටමින් හා දිස්ත්‍රික් මට්ටමින් දැනුවත් කිරීම් ගොවිජනතාව වෙත ගෙනයාමට කටයුතු කරන බව | විශ්‍රාම වැටුප් අයදුම්පත් ලබා ගැනීමට පහසු ක්‍රමවේදයක් හඳුන්වා දී නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ii) | නියමිත වයස සම්පූර්ණ වන ගොවීන් හඳුනාගැනීමේ ක්‍රමවේදයක් නොතිබීම හේතුවෙන්, ප්‍රතිලාභියා විසින්ම විශ්‍රාම ප්‍රතිලාභ අයදුම් පත්‍රය ඉදිරිපත් කළයුතු වීම නිසා ප්‍රතිලාභියා රෝහල්ගතවී හෝ නිවසේ එක්තැන්වී ප්‍රතිකාර ලබා ගැනීම, දායක මුදල් සටහන් පොත අස්ථානගත වී තිබීම, දායක මුදල් සටහන් පොත නොමැතිව මණ්ඩලය වෙත අයදුම්පත් ඉදිරිපත් කළ නොහැකි වීම වැනි හේතු නිසා අයදුම්පත් නියමිත දිනට ඉදිරිපත් නොකිරීමේ ප්‍රමාදය නිසා වූ අලාභය ඔහු විසින්ම දරාගත යුතුවිය. | 2022 | නියමිත වයස සම්පූර්ණ වන ගොවීන් හඳුනාගැනීමේ ක්‍රමවේදයක් සැකසිය යුතුය. | වයස අවුරුදු 60 සම්පූර්ණ වූ ගොවීන් දැනුවත් කිරීම සඳහා ඔවුන් විසින් ලබාදී ඇති ලිපිනයන් වෙත තැපැල්පත් යොමු කර ඔවුන් දැනුවත් කිරීමටත්, පුවත්පත් දැන්වීම් මගින් ගොවීන් දැනුවත් කිරීමටත් කටයුතු කරන බව | නියමිත වයස සම්පූර්ණ වන ගොවීන් හඳුනාගැනීමේ ක්‍රමවේදයක් නොතිබුණි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික්ක 4 ක ගොවීන් 12 දෙනෙකු සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී වාර මුදල් ආපසු ගෙවීමේදී අවුරුදු 2 සිට අවුරුදු 10 දක්වා කාලයක් ප්‍රමාදව පැවතීම සහ නියමිත වයස සම්පූර්ණ වූ දින සිට මාස 10 ත් වර්ෂ 9 ත් අතර කාලයක් විශ්‍රාම වැටුප ප්‍රදානය ප්‍රමාද කළ අවස්ථා | 2022 | වයස අවුරුදු 60 සම්පූර්ණ වූ දින සිට ගොවි විශ්‍රාම වැටුප් ගෙවිය යුතු අතර ශුද්ධ වාර මුදල් ගෙවීම අප්‍රමාදව සිදු කළ යුතුය. | දිස්ත්‍රික් කාර්යාලය වෙත ලැබෙන අයදුම්පත් සඳහා ප්‍රමාදයකින් තොරව විශ්‍රාම වැටුප් ලබා දීමට දායකයා වෙත අංකයක් ලබා දීම සහ Google Drive හි යාවත්කාලීන කිරීමට උපදෙස් ලබා දී ඇත. | වයස අවුරුදු 60 සම්පූර්ණ වූ දින සිට ගොවි විශ්‍රාම වැටුප් නොගෙවා ශුද්ධ වාර මුදල් ප්‍රමාද කර සිදු කරණු ලබයි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | නිරීක්ෂණය විය. | | | | |
| (iv) | විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ හිමි වූ දින සිට විශ්‍රාම වැටුප සකස් කළ දිනය දක්වා වූ කාලයට අදාළ මුදල ගොවීන් වෙත ගෙවීමට කටයුතු නොකිරීම නිසා 2012 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා හිඟ ගොවි විශ්‍රාම වැටුප් රු.3,914,947,932 ක් මූල්‍ය ප්‍රකාශනවල නිරවුල් නොකර දිගින් දිගටම ඉදිරියට ගෙන එමින් තිබුණි. | 2022 | වයස අවුරුදු 60 සම්පූර්ණ වූ දින සිට ගොවි විශ්‍රාම වැටුප් ගෙවිය යුතුය. | විශ්‍රාම වැටුප් හිමිකම ලබන අවස්ථාවේදීම විශ්‍රාම වැටුප් ලේඛනයට නම ඇතුළත් කිරීමටත් ගෙවිය යුතුව පවතින හිඟ විශ්‍රාම වැටුප් ඉදිරියේදී භාණ්ඩාගාර ප්‍රතිපාදන ලබාගෙන ක්‍රමිකව ගෙවීමටත් නියමිත බව | වයස අවුරුදු 60 සම්පූර්ණ වූ දින සිට ගොවි විශ්‍රාම වැටුප් ගෙවිය යුතුය. |
| 23. | මාස 6 ක් විශ්‍රාම වැටුප ලබා නොගත් විශ්‍රාම වැටුප් හිමියන්ගේ නම් මියගිය බව තහවුරු කර ගැනීමකින් තොරව විශ්‍රාම වැටුප් අංශයේ නිලධාරීන් විසින් විශ්‍රාම වැටුප් ගෙවීම් නාමලේඛනයෙන් ඉවත්කර තිබුණි | 2022 | විශ්‍රාම වැටුප් නාමලේඛනයෙන් නම් ඉවත් කිරීමට පෙර මියගිය බව තහවුරු කර ගත යුතුය. | දිගින් දිගටම විශ්‍රාම වැටුප් ලබා නොගන්නා විශ්‍රාම වැටුප්ලාභීන් පිළිබඳ පරීක්ෂා කර ගෙවීම් නාම ලේඛනයෙන් නම ඉවත් කිරීමට කටයුතු කරන බව | මියගිය බව තහවුරු කර ගෙන නාමලේඛනයෙන් ඉවත් කර නොතිබුණි. |
| 24. | නව ගොවි විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ යෝජනාක්‍රමයක් ආරම්භ කර වසර 1½ ක් ගතවී, නව දායකයින් 485 ක් යෝජනාක්‍රමයට දායකත්වය ලබාගෙන ඇතත් නිසි පරිදි වාරික ගෙවා නොමැති දායකයින් හඳුනාගෙන | 2022 | නිසි පරිදි වාරික ගෙවා නොමැති දායකයින් හඳුනාගෙන දැනුවත් කිරීමට කටයුතු කළ යුතුය. | පසු වාරික අයවීම් තොරතුරු යාවත්කාලීනව නොමැත. | වාරික ගෙවා නොමැති දායකයින් හඳුනාගැනීමට. ක්‍රමවේදයක් නොතිබුණි. |

දැනුවත් කිරීමට
කටයුතු කර
නොතිබුණි.

**3.3 ගොවීන්ගේ භාරකාර අරමුදල**

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 1,623,928,859 | 38,001,969 | 1,585,926,890 | 99,344,921 | තත්ත්වාගණනය කළ |
| **2022** | 1,679,448,992 | 28,133,509 | 1,651,315,483 | 64,254,621 | තත්ත්වාගණනය කළ |
| **2023** | 2,321,478,018 | 48,558,163 | 2,272,919,855 | 659,362,632 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| 1. | රු.1,193,727 ක් වූ හඳුනා ගත නොහැකි ලැබිය යුතු පොලී ශේෂය, රු.14,347,914 ක ලැබිය යුතු කෙටිකාලීන ණය ශේෂය සහ භාරකාර අරමුදල පිහිටුවීමේදී පවරා ගෙන තිබුණු රු.9,112,579 ක් වූ ගොවි කම්ටු ණය ශේෂයන් අයකර ගැනීමේ හැකියාව අවිනිශ්චිත විය. | 2023<br>2022<br>2021 | අවිනිශ්චිත ශේෂ සඳහා හානිකරණය වෙන් කිරීම් කළ යුතුය. | කමිටුවක් පත්කර ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. | අවිනිශ්චිත ශේෂ අය කර නැත. |
| 2. | 2002 වර්ෂයේ දී චක්‍රීය අරමුදල සහ කෘෂිකාර්මික භාර අරමුදල ඒකාබද්ධ කර ගොවීන්ගේ භාරකාර අරමුදල පිහිටුවීමේදී පවරා දුන්, රු.697,644 ක් වටිනා ගොවීන්ගේ තැන්පතු, රු.591,965 ක් වටිනා කොටස් ගිණුම සහ | 2023<br>2022<br>2021 | ශේෂ සනාථන ඉදිරිපත් වීම අනුව ඒවායේ නිවැරදිතාවය තහවුරු කර ගත යුතුය. | ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | ශේෂ සනාථන ලබාගැනීම කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | රු.159,399,408 ක් වූ ගොවිසෙත අරමුදලෙහි සඳහන් ශේෂයන් සනාථ කිරීම සඳහා කිසිඳු සාක්ෂියක් ඉදිරිපත් නොවූ නිසා එම ශේෂයන්ගේ නිවැරදිතාවය තහවුරු කර ගත නොහැකි විය. | | | | |
| 3. | 1994 මාර්තු 9 දිනැති ගොවීන්ගේ භාරකාර අරමුදලේ භාරකාර ඔප්පුව 14 වගන්තිය ප්‍රකාරව භාරකාර අරමුදල සඳහා කාර්ය මණ්ඩල බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කර නොතිබුණි. | 2023<br>2022<br>2021 | බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කළ යුතුය. | ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කර නොමැත. |
| 4. | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය I කොටස 15.1 ඡේදය (මු.රෙ 876(2)) ප්‍රකාරව දැනට ක්‍රියාත්මක වන ව්‍යවස්ථාපිත නොවන අරමුදල් වහාම ක්‍රියාත්මක වන පරිදි අහෝසි කොට ඒවායේ මුදල් ශේෂයන් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු අතර නොඑසේනම් තවදුරටත් පවත්වාගෙන යාමට සාධාරණ හේතු ඇත්නම් එවැනි අරමුදල් පාර්ලිමේන්තු | 2023<br>2022<br>2021 | චක්‍රලේඛය ප්‍රකාරව පාර්ලිමේන්තු පනතක් මගින් නීතිගත කිරීමට කටයුතු කළ යුතුය. | පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. | පාර්ලිමේන්තු පනතක් මගින් නීතිගත කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | පනතක් මගින් නීතිගත කිරීමට කටයුතු කළ යුතුය. එසේ වුවත්, 1994 මාර්තු 09 දිනැති ගොවීන්ගේ භාරකාර ඔප්පුව මගින් ස්ථාපිත කර ඇති මෙම අරමුදල, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | | | | |
| 5. | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයට අදාළ ආකෘතිපත්‍ර සහ මාර්ගෝපදේශ 05 ඇමුණුම I පරිච්ඡේද 07 ප්‍රකාරව ගොවීන්ගේ භාරකාර අරමුදලේ පරමාර්ථ ඉටු කිරීම පිළිබඳව සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | 2023 | ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ඒ අනුව කටයුතු කළ යුතු ය. | ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ගෙන නැත. | ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොමැත. |
| 6. | 2002 සිට 2004 වර්ෂය දක්වා අවස්ථා 9 කදී ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය වෙත එකතුව රු.102,662,700 ක ණය මුදලක් ලබාදී ඉන් රු.9,000,000 ක් වසරක් තුළදී නැවත අරමුදලට පියවීමටත්,රු.93,662, 700 ක් මහනුවර පිහිටි මහබෙරියතැන්න වත්ත නමැති ඉඩම විකුණූ වහාම | 2023<br>2022<br>2021 | නොපියවූ ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | මාසික වාරිකය රු.500,000 බැගින් අයවේ. | වසරක් තුළදී අයකර ගැනීමට කටයුතු කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | පියවීමටත් ගිවිසුම් ප්‍රකාරව එකඟ වී තිබුණි. එහෙත් එකඟවන අවස්ථාව වන විටදී ද බාහිර පාර්ශවයකට ඉඩම 99 අවුරුදු බදු දී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණය මුදල් ලබාදී වසර 21 ක් ගතවී තිබුණ ද නොපියවූ ණය ශේෂය රු.49,512,700 ක් සහ ඒ සඳහා උපචිත පොලිය රු.98,023,448 ක් හිඟව පැවතිණි. | | | | |
| 7. | 2020 වර්ෂයේදී ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත බඩඉරිඟු වගා කරන ගොවීන් සඳහා රු.200,000,000 ක ණය මුදලක් ලබාදී ඒ සඳහා රු.1,788,650 ක ලැබිය යුතු පොලියක් අයකරගතයුතු වුවද කිසිදු පොලී මුදලක් අය කරගෙන නොතිබුණි. | 2023<br>2022<br>2021 | පොලී මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | පොලී මුදලක් අය කරගෙන නැත. | ක්‍රියාමාර්ග ගෙන නොමැත. |
| 8. | 2016 වර්ෂයේදී මාස 24 ක් තුළ අයකර ගැනීමට එකඟ වී රු.500,000 ක මුදලක් අර්තාපල් බෝග වගාව සඳහා ගොවි මහතෙකුට ලබා දුන්නද ව්‍යාපෘතිය ඉටුකර නොතිබුණු | 2023<br>2022<br>2021 | ණය මුදල හා පොලී මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | ගොවිජන විනිශ්චය සභාව වෙත ඉදිරිපත් කර නීතිමය කටයුතු සිදුකරමින් පවතී | නීතිමය කටයුතු සිදු කරමින් පවතී. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | අතර වසර 7 ක් ගතවී ඇතත් ණය මුදල හා පොලිය අයකරගෙන නොතිබුණි. | | | | |
| 9. | රන් ගෙවිලිය සමාජ ව්‍යවසාය පොදු සමාගමට වසරක කාලයකින් ගෙවීමේ පදනම මත රු.5,966,000 ක පොලී රහිත ණයක් 2018 වර්ෂයේදී ලබා දී තිබුණද අදාළ මුදල සමාලෝචිත වර්ෂය දක්වා අයකර ගෙන නොතිබුණි. | 2023<br>2022<br>2021 | ණය මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. | නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. |
| 10. | ගොවි සමාගම් වෙත ණය ලබා දීම සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට භාර අරමුදල විසින් වරින් වර ලබා දී තිබුණු ණය මුදල් වලින් අය වීමට ඇති ශේෂය රු.14,347,914 ක් වූ අතර වර්ෂ 24 ක සිට වර්ෂ 32 ක් දක්වා වූ කාල පරාසයක් ගතවී තිබුණි. | 2023<br>2022 | ණය මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | ණය අයකර ගැනීමට කටයුතු කර නොමැත. |
| 11. | 2002 වර්ෂයේදී චක්‍රීය අරමුදල සහ කෘෂිකාර්මික භාර අරමුදල ඒකාබද්ධ කර ගොවීන්ගේ භාරකාර අරමුදල පිහිටුවීමේදී අරමුදලට පවරන ලද චක්‍රීය අරමුදලේ රු.44,255,850 ක කෙටි කාලීන ණය ශේෂය අයකරගැනීම | 2023<br>2022<br>2021 | ණය මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | කමිටුවක් පත්කර ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. | කමිටුවක් පත්කර ඇතත් ණය මුදල අයකර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | සඳහා 2014 වර්ෂයේදී රු.1,490,000 ක දීමනා ගෙවා විශ්‍රාමික නිලධාරින් 10 දෙනෙකු පත් කර තිබුණු නමුත්, තවදුරටත් අයකර නොගත් ණය ශේෂය රු.39,909,275 ක් විය. | | | | |
| 12. | පුද්ගලික සමාගමක් වෙත 2003 වසරේදී ලබාදී ඇති ණය මුදලින් රු.860,000 ක්, සහ උපචිත පොලී වටිනාකම රු.816,666 ක් තව දුරටත් අයවීමට පැවතුණි. | 2023<br>2022<br>2021 | ණය මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | නීතිපති දෙපාර්තමේන්තුව වෙත මේ වන විට යොමු කර ඇත. | නීතිමය කටයුතු සිදු කරමින් පවතී. |
| 13. | ලොකු ළූණු බීජ නිෂ්පාදනය කරනු ලබන ගොවීන් 63 ක් සඳහා 2016 වර්ෂය වන විට ලබා දුන් ණය මුදලින් රු.2,451,780 ක් වූ ණය ශේෂ අය නොවී පැවතුණි. | 2023<br>2022<br>2021 | එකඟවූ පරිදි ණය මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | කොටස් වශයෙන් අයකර ගනිමින් පවතී. | රු.2,451,780 ක හිඟ ශේෂයක් පවතී. |
| 14. | වසරක් ඇතුළත අයකර ගැනීමේ කොන්දේසිය යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ බඩඉරිඟු වගා කරන ගොවීන් සඳහා ලබා දීමට ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් වෙත 2015 වර්ෂයේදී ලබා දී තිබුණු ණය මුදලින් රු.13,223,746 ක ශේෂයක් අයවීමට පැවතුණි. | 2023<br>2022<br>2021 | එකඟවූ පරිදි ණය මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | කොටස් වශයෙන් අයකර ගනිමින් පවතී. | එකඟවූ කොන්දේසි අනුව ණය අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| 15. | 2022/23 මහ කන්නයේ ජාතික බීජ වී අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා හදිසි බීජ වී මිලදී ගැනීමේ වැඩසටහන සඳහා රු.මිලියන 50 ක ණය අත්තිකාරමක් 2022 ජූලි 21 දින කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත දී මාසයක් පුරා එම දෙපාර්තමේන්තුව තුළ නිශ්කාර්යව තිබී එම මුදල නැවත 2022 අගොස්තු 20 දින ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබුණි. එම මුදලින් රු.36,656,960 ක් භාවිතා කර නොතිබුණු අතර එය ලබාදුන් මුළු මුදලින් සියයට 73.31 ක් විය. | 2023 | ලබාගත් ණය නිසි අරමුණට යොදාගන්නා බව සනාථ කර ගත යුතුය. | ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | ලබාගත් ණය නිසි අරමුණට යොදාගන්නා බව සනාථ කර ගෙන නැත. |
| 16. | ගොවීන්ගේ භාරකාර අරමුදල පිහිටුවීමේ ප්‍රධාන අරමුණ ක්‍රියාත්මක කිරීමට මුදල් උපයෝජනය නොකර භාරකාර අරමුදලේ මුදල් දිගින් දිගටම ස්ථාවර තැන්පතුවල සහ භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එම ස්ථාවර තැන්පතුවල රු.465,000,000 ක් සහ භාණ්ඩාගාර | 2022<br>2021 | අරමුදල පිහිටුවීමේ අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. | ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | භාරකාර අරමුදල පිහිටුවීමේ ප්‍රධාන අරමුණ ක්‍රියාත්මක වී නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | බිල්පත්වල රු.90,420,510 ක් එසේ ආයෝජනය කර රු.72,762,442 ක පොලී ආදායමක් උපයා තිබුණි. | | | | |
| 17. | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15.1. ඡේදය මඟින් හඳුන්වා දී ඇති මු.රෙ.877(2)(ඉ) වගන්තිය ප්‍රකාරව අරමුදලේ 2021 වර්ෂයට අදාළ වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු වුවත් මේ දක්වා එම වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නොතිබුණි. | 2022<br>2021 | චක්‍රලේඛය ප්‍රකාරව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය. | ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | 2021 වර්ෂයේ සිට කාර්යසාධන වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නොතිබුණි. |
| 18. | පුරන් කුඹුරු අස්වැද්දවීමේ විශේෂ වැඩ සටහන යටතේ 2020/21 වර්ෂයේදී රු.25,000,000 ක් ණය මුදලක් ලෙස ගොවීන්ට ප්‍රදානය කිරීම සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කාර්යාල වෙත නිදහස්කර තිබුණු අතර දිස්ත්‍රික් කාර්යාල විසින් එම මුදලින් රු.10,519,024 ක් | 2021 | අපේක්ෂිත අයුරින් සැලසුම් ක්‍රියාත්මක කළ යුතුය. | ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සැලසුම් පරිදි පුරන් කුඹුරු අස්වැද්දවීමේ විශේෂ වැඩ සටහන ඉටු කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ගොවීන් වෙත ලබා දී නොතිබුණි. | | | | |
| 19. | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15.1. ඡේදයෙන් ඇතුළත් කළ මුදල් රෙගුලාසි 877(1)(ඇ) ඡේදය ප්‍රකාරව පවත්නා වර්ෂයේ අයවැය ලේඛනය සැප්තැම්බර් 30 දිනට පෙර මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගැනීම සඳහා ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කළ යුතු අතර එහි පිටපතක් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කළ යුතු වුවත් එසේ යොමු නොකර වර්ෂය තුළ රු.28,164,693 ක වියදම් දරා තිබුණි. | 2021 | අයවැය ලේඛනය සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගත යුතු වීම. | ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | 2021 වර්ෂයේ සිට අයවැය ලේඛනය භාණ්ඩාගාරයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර නොමැත. |

### 3.4 ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 636,238,296 | 4,708,981,776 | (4,072,743,480) | (427,806,224) | තත්ත්වාගණනය කළ |
| **2022** | 663,412,060 | 5,140,628,886 | (4,477,216,826) | (406,060,646) | තත්ත්වාගණනය කළ |
| **2023** | 794,865,150 | 5,695,621,088 | (4,900,755,938) | (425,104,832) | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ගය | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| 1. | විශ්‍රාම වැටුප් වගකීම රු.5,532,349,026 ක් වුවද එදිනට ආයෝජන වටිනාකම රු.793,308,692 ක් වූයෙන් මෙම බැඳීම් පියවීමට ප්‍රමාණවත් ආයෝජනයක් සිදුකර නොතිබුණි. | 2023 | විශ්‍රාම වැටුප් වගකීම පියවීමට ප්‍රමාණවත් ආයෝජනයක් සිදුකළ යුතුය. | ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත | ආයෝජනයක් සිදුකර නොමැත |
| 2. | යෝජනාක්‍රමයේ මුළු ශුද්ධ වත්කම් දිගින් දිගටම සෘණ අගයක් වීම මත යෝජනා ක්‍රමයේ මුළු වත්කම් උපලබ්ධි කිරීමෙන් මුළු වගකීම් පියවීමට නොහැකි වීමත් මත යෝජනාක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම මතභේදාත්මක වේ. | 2023<br>2022<br>2021 | යෝජනාක්‍රමයේ මුළු ශුද්ධ වත්කම් දිගින් දිගටම සෘණ අගයක් වීම වලක්වා ගැනීමට කටයුතු කළ යුතුය. | ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත | ශුද්ධ වත්කම් සෘණ අගයක් වීම වලක්වා ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොමැත |

| | | | | | |
|---|---|---|---|---|---|
| 3. | 1990 අංක 23 දරන ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනතේ 5 (1) වගන්තිය ප්‍රකාරව වයස අවුරුදු 18 සහ 59 අතර ධීවරයෙකුට මෙම ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට බැඳීමට හිමිකම් ඇතත් 2018 වර්ෂයෙන් පසු කිසිදු සාමාජිකයෙකු බඳවාගෙන නොතිබුණි. | 2023<br>2022<br>2021 | යෝජනාක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම සඳහා නව සාමාජිකයින් බඳවා ගත යුතුය. | නව ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් හඳුන්වා දීමට කටයුතු කරමි. | නව සාමාජිකයින් බඳවා ගෙන නොමැත. |
| 4. | 1990 අංක 23 දරන ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනතේ 7 වගන්තිය ප්‍රකාරව යෝජනා ක්‍රමයට දායක වී සිටින ධීවරයින් සඳහා වයස අවුරුදු 60 සම්පූර්ණ වන විටම විශ්‍රාම වැටුප් ප්‍රදානය කළ යුතු වුවත් 2007 ජනවාරි සිට 2016 දෙසැම්බර් දක්වා කාලයට අදාළව විශ්‍රාම වැටුප් ප්‍රදානය කළ ධීවරයන් 139 ක් සඳහා රු.4,159,063 ක් සහ 2022 සහ 2023 වර්ෂවලදී විශ්‍රාම වැටුප් ප්‍රදානය කළ ධීවරයින් 45 ක් සඳහා රු.1,378,518 ක් ලෙස එකතුව රු.5,537,581 ක් හිඟ විශ්‍රාම වැටුප් ලෙස මූල්‍ය ප්‍රකාශනවල | 2023<br>2022<br>2021 | යෝජනා ක්‍රමයට දායක වී සිටින ධීවරයින් සඳහා වයස අවුරුදු 60 සම්පූර්ණ වන විටම විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීමේ වැඩ පිළිවෙලක් සකස් කළ යුතුය. | 60 සම්පූර්ණ වන දායකයින්ගේ ලැයිස්තු දිස්ත්‍රික් කාර්යාල වෙත යවා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව වෙත දැනුම්දී පුවත්පත් දැන්වීමක් මගින් ධීවර ජනතාව දැනුවත් කරමි. | වයස අවුරුදු 60 සම්පූර්ණ වූ විට විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීමේ වැඩ පිළිවෙලක් සකස් කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ප්‍රතිපාදනය කර තිබුණු නමුත් ධීවරයන් වෙත ගෙවීමට කටයුතු කර නොතිබුණි. | | | | |
| 5. | 1990 අංක 23 දරන ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනතේ 16 වගන්තිය ප්‍රකාරව අනුගාමී වාරික දහයක් සඳහා වාරික මුදල් නිසිපරිදි නොගෙවීම මත දායකයෙකුට ප්‍රතිලාභ අහිමිවීම සම්බන්ධයෙන් දායකයා වෙත දැනුවත් කිරීම් සිදු කළ යුතු වුවත් දායක මුදල් එකතු කිරීම සහ වාර්තා කිරීමේ ක්‍රමවේදයක් නොමැති බැවින් දැනුවත් කිරීම් සිදු කර නොතිබුණි. | 2023<br>2022<br>2021 | දායකයෙකුට ප්‍රතිලාභ අහිමිවීම සම්බන්ධයෙන් දායකයා දැනුවත් කිරීම් කළ යුතුය. | ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | ප්‍රතිලාභ අහිමිවීම සම්බන්ධයෙන් දායකයා දැනුවත් කර නොතිබුණි. |
| 6. | 1990 අංක 23 දරන ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනතේ 20 වගන්තිය ප්‍රකාරව යෝජනාක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා ස්ථාපිත උපදේශක කාරක සභාව 2016 නොවැම්බර් මාසයෙන් පසු මේ දක්වා රැස්වී නොතිබුණි. | 2023<br>2022<br>2021 | ධීවර විශ්‍රාම වැටුප් උපදේශක කාරකසභාව කැඳවීම කළ යුතුය. | 2024 වර්ෂය තුළ උපදේශක කාරකසභාව කැඳවීමට කටයුතු කරමි. | උපදේශක කාරක සභාව කැඳවා නොතිබුණි |

| | | | | | |
|---|---|---|---|---|---|
| 7. | 2023 ජනවාරි 27 දිනැති අංක 01/2023 දරන අයවැය චක්‍රලේඛයේ 02 (ඇ) (iii) ඡේදය ප්‍රකාරව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යමණ්ඩල පටිපාටියක් නොමැතිව නිලධාරීන් 4 දෙනෙකු වෙත විශ්‍රාම වැටුප් අංශයේ වැඩ බලන දීමනා ලෙස රු.557,736 ක් ගෙවා තිබුණි. | 2023 | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමත කාර්ය මණ්ඩල පටිපාටියක් සකස් කළ යුතුය. | මෙම ගෙවීම් සඳහා ධීවර විශ්‍රාම වැටුප් උපදේශන කාරක සභාවෙහි, අධ්‍යක්ෂ මණ්ඩලයෙහි සහ විෂයභාර අමාත්‍ය රාජ්‍ය ලේකම්ගේ අනුමැතිය මත ගෙවා ඇත. | අනුමත කාර්යමණ්ඩල පටිපාටියක් සකස් කර නොමැත. |
| 8. | යෝජනා ක්‍රමයට දායක වී සිටින ධීවරයන් සංඛ්‍යාව 64,117 ක් වූ අතර 2018 වර්ෂයෙන් පසු කිසිදු සාමාජිකයෙකු බඳවාගෙන නොතිබුණි. ධීවරයන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 60 ඉක්මවා විශ්‍රාම වයසට පැමිණ සිටි 31,146 ක් වූ ධීවර දායකයන්ගෙන් 24,187 ක් (එකවර දායක මුදල් ගෙවා දායකත්වය ලබාගත් දායකයන් 5,549 ක් ඇතුළුව) වෙත ධීවර විශ්‍රාම වැටුප් ප්‍රතිලාභය ප්‍රදානය කර නොතිබුණි. | 2023 | වයස අවුරුදු 60 සම්පූර්ණ වන විට ගෙවීම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතුය. | 60 සම්පූර්ණ වන දායකයින්ගේ ලැයිස්තු දිස්ත්‍රික් කාර්යාල වෙත යවා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව වෙත දැනුම්දී පුවත්පත් දැන්වීමක් මගින් ධීවර ජනතාව දැනුවත් කරමි. | වයස අවුරුදු 60 සම්පූර්ණ වූ විට විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීමේ වැඩ පිළිවෙලක් සකස් කර නොමැත |

| | | | | | |
|---|---|---|---|---|---|
| 9. | 2010 වර්ෂයේ සිට ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයෙන් ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට අවස්ථා කිහිපයකදී එම යෝජනා ක්‍රමයේ කටයුතු සඳහා රු.518,000,000 ක් වූ ණය මුදල් ලබාදී තිබුණු අතර 2021 වර්ෂය අවසානයට එයින් අය විය යුතු ණය හා පොලී මුදල් එකතුව රු.248,129,566 ක් තවදුරටත් ඉදිරියට ගෙන එමින් පැවතුණි. | 2021 | ණය සහ පොලිය, අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | මෙම මුදල ක්‍රමිකව අයකර ගැනීමට කටයුතු කරමි. | ණය සහ පොලිය, අයකර ගැනීමට කටයුතු කර නොමැත |

## 3.5 බුද්ධශාසන අරමුදල

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 845,241,465 | 7,821,063 | 837,420,402 | 17,674,593 | තත්ත්වාගණනය කළ |
| **2022** | - | - | - | - | - |
| **2023** | - | - | - | - | - |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| 1. | වයස් විශ්ලේෂණ ඉදිරිපත් කර නොතිබු රු.13,031,828 ක් වු ලැබිය යුතු අත්තිකාරම් සහ වෙනත් ලැබිය යුතු මුදල් ශේෂයෙන් රු.1,087,447 ක් වර්ෂ 09 කට සහ රු.11,944,381 ක් වර්ෂ 06 කට වඩා පැරණි ශේෂයන් බව පසුගිය වර්ෂවල මූල්‍ය ප්‍රකාශන අනුව නිරීක්ෂණය වූ අතර අදාළ ශේෂයන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2021 | අදාළ ශේෂයන් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | එම ශේෂයන් අයකර ගැනීමට උපදෙස් ලබා දී ඇති බව. | 2024 සැප්තැම්බර් 30 දින වන විට ද අය වී නොතිබුණි. |
| 2. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 877 (1) (ඇ) ප්‍රකාරව ඉදිරි වර්ෂයේ අයවැය ලේඛනය භාණ්ඩාගාර | 2022 හා 2023 | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | 2023 අයවැය භාණ්ඩාගාරයේ අනුමැතිය සඳහා 2023.10.25 වන දින ඉදිරිපත් කළද තවමත් අනුමැතිය | 2024 සැප්තැම්බර් 30 දින වන විට ද 2023 වර්ෂය සඳහා වූ අයවැය ලේඛනය අනුමත වී නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | අනුමැතිය ලබා ගැනීම සඳහා පවත්නා වර්ෂයේ සැප්තැම්බර් 30 දිනට පෙර ඉදිරිපත් කළ යුතු වුවත් 2022 වර්ෂයේ අයවැය ලේඛනය අනුමැතිය සඳහා ඉදිරිපත් කර නොතිබුණු අතර 2023 මුදල් වර්ෂයට අදාළ අයවැය ලේඛනය භාණ්ඩාගාර අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම 2023 ඔක්තෝබර් 25 දින සිදු කර තිබුණද, අදාළ අනුමැතිය ලැබී නොතිබුණි. | | | ලැබී නොමැති හෙයින් ඒ පිළිබඳව භාණ්ඩාගාරයට සිහිකැඳවීම් ලිපියක් යොමු කිරීම සඳහා කටයුතු කර ඇති බව. | |
| 3. | 2023 වර්ෂයේ දී රු.180,891,411 ක් අරමුදලේ ආදායම් ලෙස ලැබී තිබුණද එයින් රු. 51,573,122 ක් එනම් සියයට 29ක් පමණක් අරමුදලේ අරමුණු වෙනුවෙන් වැය කර තිබුණි. බුද්ධශාසනය ආරක්ෂා කිරීම හා පෝෂණය කිරීම අරභයා ඉතාමත් යෝග්‍ය යැයි මණ්ඩලය සලකනු ලබන ආකාරයට සහ එසේ සලකනු ලබන කාර්යය සඳහා මුදල් යෙදවීම අරමුදලේ කාර්යභාරය වුවද, වර්ෂිකව අරමුදලට ලැබෙන ආදායමට සරිලන අන්දමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අරමුදල අපොහොසත් | 2022 හා 2023 | අරමුදලේ අරමුණු ඉටුකිරීම වෙනුවෙන් ප්‍රමාණවත් පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය. | 2023 වර්ෂයේ රට තුළ පැවති ආර්ථික තත්ත්වය මත බැංකු පොලී අනුපාතය ඉහළ තත්ත්වයක පැවතීම හේතුවෙන් අරමුදල සතු ආදායම රු.මිලියන 180ක් පමණ පැවැති නමුත් 2024 වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම රු.92,535,694ක් පමණ වන බවත් 2023 වර්ෂයේ රට තුළ සංවර්ධන ව්‍යාපෘති අඩු වශයෙන් ක්‍රියාත්මක වූ අතර ඒ අනුව, 2024 වර්ෂයේ මෙම අතිරික්තය සැලකිල්ලට ගනිමින් ව්‍යාපෘති සඳහා ගෙවීම් කටයුතු සිදු කිරීමට කටයුතු කර | 2024 සැප්තැම්බර් 30 දින වන විට ද විගණකාධිපති නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | වී තිබුණි. | | | ඇති බව. | |
| 4. | 2019 වර්ෂය සඳහා වන කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවෙහි සභාගත කිරීම සඳහා 2024 මාර්තු 01 දින ඉදිරිපත් කර තිබූ අතර 2019 වර්ෂයෙන් පසු අරමුදලෙහි කාර්යසාධන වාර්තා පාර්ලිමේන්තුවෙහි සභාගත කිරීමට ඉදිරිපත් කර නොතිබුණි. | 2021, 2022 හා 2023 | පිළිතුර සාවද්‍ය වේ. 2020, 2021 වර්ෂවලට අදාළ විගණන වාර්තා ඉදිරිපත් කර ඇති බැවින් කාර්යසාධන වාර්තා පාර්ලිමේන්තුවෙහි සභාගත කිරීමට කටයුතු කළ යුතුය. | විගණන කටයුතු අවසන් වූ පසු 2020, 2021 වර්ෂ සඳහා අරමුදලේ කාර්යසාධන වාර්තා පාර්ලිමේන්තුවෙහි සභාගත කිරීම සඳහා කටයුතු කිරීමට සටහන් කර ගන්නා ලද බව. | 2024 සැප්තැම්බර් 30 දින වන විට ද 2020 සහ 2021 වර්ෂ සඳහා වූ කාර්යසාධන වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි. |

## 3.6 හින්දු සංස්කෘතික අරමුදල

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | බදු පෙර ලාභය (අලාභය) රු. | මතය |
|---|---|---|---|---|---|
| 2021 | 39,392,353 | - | 39,392,353 | 2,221,118 | තත්ත්වාගණනය නොකළ |
| 2022 | 48,490,086 | - | 48,490,086 | 9,097,733 | තත්ත්වාගණනය නොකළ |
| 2023 | 55,289,584 | - | 55,289,584 | 6,989,419 | තත්ත්වාගණනය නොකළ |

| | ප්‍රධාන විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිරීක්ෂණය | විගණිත ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ තත්ත්වය |
|---|---|---|---|---|---|
| 1. | 1985 අංක 31 දරන හින්දු සංස්කෘතික අරමුදල පනතේ,6 වගන්තියේ 2 (I) උප වගන්තියේ (අ) සහ (ආ) ඡේද ප්‍රකාරව ප්‍රදාන, ත්‍යාග සහ පරිත්‍යාග (දේශීය සහ විදේශීය) යන මාර්ගවලින් වර්ෂය තුළ අරමුදලට ලැබෙන අරමුදල් වර්ධනය කර ගැනීම, අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යයක් ලෙස සඳහන්ව තිබුණ ද, 2023 වර්ෂය තුළ ඒ සඳහා වැඩපිළිවෙලක් සකස් කර නොතිබුණි. | 2023 | පනතේ විධිවිධාන ප්‍රකාරව අරමුදල් වර්ධනය කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. | නව කාර්යාලයට පැමිණීමේ කටයුතු සහ කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් සිදු කළ නොහැකි වූ අතර ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට සටහන් කර ගන්නා ලද බව. | වර්තමානය වන විට ද විගණකාධිපති නිර්දේශය ප්‍රකාරව අරමුදල් වර්ධනය කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| 2. | 1985 අංක 31 දරන හින්දු සංස්කෘතික අරමුදල පනතේ, 3 වගන්තියේ 11 ඡේදය ප්‍රකාරව අරමුදලේ කටයුතු සම්බන්ධ | 2023 | නියමිත පරිදි පාලක මණ්ඩල රැස්වීම් පැවැත්වීමෙන් අරමුදලේ කටයුතු නියාමනය කළ යුතු | ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට සටහන් කර ගන්නා ලද බව. | 2024 සැප්තැම්බර් 30 දින වන විටද 2024 වර්ෂය සඳහා එක් පාලක මණ්ඩල රැස්වීමක් පමණක් පවත්වා තිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ක්‍රියාපටිපාටි නියාමනය කිරීම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී සිදු කළ යුතු වුවත් 2023 වර්ෂය සඳහා එක් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් පමණක් පවත්වා තිබුණි. ඒ අනුව අදාළ පරිදි නියාමන කටයුතු අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් සිදු වී නොතිබුණු අතර වර්ෂයක් සඳහා පැවැත්විය යුතු අවම රැස්වීම් ගණන ඇතුළත් කර පනත සංශෝධනය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | | වේ. | | |
| 3. | 2023 වර්ෂයේදී රු.20,600,000 ක ප්‍රතිපාදන මඟින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කළ හින්දු අධ්‍යාපනික සහ සංස්කෘතික වැඩසටහන් 11 ක් සහ රු.1,000,000 ක ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කළ උඩරට කම්කරු ප්‍රජාව සඳහා වන ධාරිතා ප්‍රවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරිමට කටයුතු කර නොතිබුණි. | 2023 | ක්‍රියාකාරී සැලැස්ම අනුව අදාළ ක්‍රියාකාරකම් සිදු කළ යුතු වේ. | නව කාර්යාලයට පැමිණීමේ කටයුතු සහ කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් සිදු කළ නොහැකි වූ අතර ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට සටහන් කර ගන්නා ලද බව. | 2024 සැප්තැම්බර් 30 දින වන විටද 2024 වර්ෂයට අදාළ කිසිඳු වැඩසටහනක් ක්‍රියාත්මක කර නොතිබුණි. |
| 4. | කොඩි දින ආදායම රු.3,000,000 ක්, දේශීය හා විදේශීය | 2023 | අපේක්ෂිත පරිදි ආදායම් ලබා ගැනීමට අවශ්‍ය | කොවිඩ් වසංගත තත්ත්වය හා ආර්ථික අර්බුදය හේතුවෙන් | 2024 සැප්තැම්බර් 30 දින වන විට ද 2024 වර්ෂයට අදාළ |

| | | | |
|---|---|---|---|
| වශයෙන් මූල්‍යාධාර රු.4,000,000 ක් සහ කලා කටයුතු ආශ්‍රිත වැඩසටහන් මඟින් රු.2,000,000 ක් වශයෙන් ක්‍රියාකාරී සැලැස්මෙන් අපේක්ෂිත ආදායම් ලබා ගැනීමට අවශ්‍ය වැඩපිළිවෙලක් සකස් කර නොතිබීම හේතුවෙන් එම ආදායම සම්පූර්ණයෙන්ම ද. අපේක්ෂිත පොත් අලෙවි ආදායම වූ රු.2,800,000 කින් රු.1,310,424 ක් හෙවත් සියයට 47ක් ද උපයා ගැනීමට නොහැකි වී තිබුණි. | ක්‍රියාමාර්ග ගත යුතු වේ. | කොඩි දිනය හා කලා කටයුතු ආශ්‍රිත වැඩසටහන් මඟින් ආදායම ලබා ගැනීමට කටයුතු නොකෙරිණි. ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට සටහන් කර ගන්නා ලද බව. | අපේක්ෂිත ආදායම උපයා ගැනීමට කටයුතු කර නොතිබුණි. |

## 3.7 චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ ජාතික චිත්‍රපට සංස්ථා භාරය

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 18,919,832 | 92,183 | 18,827,649 | 113,069 | තත්ත්වාගණනය කළ |
| **2022** | 18,211,863 | 76,095 | 18,135,768 | 225,556 | තත්ත්වාගණනය කළ |
| **2023** | - | - | - | - | - |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිරීක්ෂණය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| 1. | 2022 ජූලි මාසය වන විට ආයෝජන පොලී අනුපාතය ඉහළ ගොස් තිබුණ ද, 2022 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ ආසන්න වශයෙන් රු. මිලියන 02 ක පමණ අතිරික්ත මුදල් ශේෂයක් ජංගම ගිණුමෙහි නිශ්කාර්යයව රඳවා ගෙන තිබීමෙන් ලබාගත හැකිව තිබූ පොලී ආදායමක් භාරයට අහිමි වී තිබුණි. | 2022 | භාරකාර මණ්ඩල නිසි අනුමැතීන් මත අරමුදලට අයත් අතිරික්ත මුදල් කඩිනමින් ආයෝජන කිරීමට කටයුතු කළ යුතුය. | භාරකාර මණ්ඩල අනුමැතියක් නොතිබීම මෙයට හේතු වී ඇති අතර ඉදිරියේ දී නිසි අනුමැතීන් මත කටයුතු කෙරෙනු ඇත. | 2024 වර්ෂයේදීද තත්ත්වය එසේම විය. |
| 2. | 1986 අංක 03 දරන චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ ජාතික චිත්‍රපට සංස්ථා භාරය පනතේ; | | | | |
| (i) | 06 වන වගන්තිය ප්‍රකාර ව භාරයේ | 2022 | භාරයෙහි පරමාර්ථයන් ඉටු | භාරයෙහි පරමාර්ථ ක්‍රියාත්මක කිරීම | නව ආදායම් උත්පාදන මාර්ගයන් |

| | | | | | |
|---|---|---|---|---|---|
| | පරමාර්ථ ඉෂ්ඨ කිරීම සඳහා මුදල් සපයා ගැනීම හෝ දේශීය හෝ විදේශීය ප්‍රභවයන්ගෙන් ලත් මුදලින් හෝ භාණ්ඩ වශයෙන් ප්‍රදාන, තෑගි හෝ පරිත්‍යාග භාර ගැනීම සිදු කළ යුතු වුව ද එම කිසිදු කර්තව්‍යයක් සිදු කර නොතිබීමෙන් භාරයේ වියදම් දැරීම. භාණ්ඩාගාරයට වැය බරක් වී තිබුණි. | | කර ගැනීම සඳහා නව අදායම් උත්පාදන මාර්ගයන් හදුනා ගෙන අරමුදල් තත්ත්වය වර්ධනය කර ගැනීමට පියවර ගත යුතුය. | වෙනුවෙන් යෝජනා ක්‍රියාත්මක කිරීමේ දී ඇති වූ ප්‍රායෝගික ගැටළු මත අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට අදාළව නව වැඩසටහන් හෝ ක්‍රියා මාර්ග ක්‍රියාවට නැංවීමට නොහැකි වී ඇත.<br><br>නව භාරකාර මණ්ඩලයක් පත් වීමෙන් පසු නැවතත් මේ පිළිබඳ ව අවධානය යොමු කිරීමට කටයුතු කරනු ඇත. | ක්‍රියාවට නැංවීමට භාරකාර මණ්ඩලයට අවස්ථාවක් නොවූ බව දන්වා ඇත. |
| (ii) | 03(1) වගන්තිය ප්‍රකාරව කළමනාකරණය හා පාලනය, සංස්ථාපනය කරන ලද භාරකාර මණ්ඩලයක් වෙත පැවරෙන බව දක්වා තිබුණ ද 2012 නොවැම්බර් 30 දින සිට 2021 ජූලි 06 දින දක්වා වසර 08 කුත් මාස 07 ට ආසන්න කාලයක් සඳහා භාරකාර මණ්ඩලයක් පත්කර නොතිබුණු අතර 2021 දෙසැම්බර් 31 දින පැවැත්වූ 87 වන භාරකාර මණ්ඩල රැස්වීමෙන් පසු 2023 මාර්තු 31 දින දක්වා වසරකට වැඩි කාලයක් භාරකාර | 2021<br>2022 | රැස්වීම් නිසි පරිදි පැවැත්විය යුතු අතර භාරයේ උන්නතිය උදෙසා භාරකාර මණ්ඩලය සක්‍රීය දායකත්වයක් ලබාදිය යුතුය. | රේඛිය අමාත්‍යාංශය වෙනස්වීම මත ඊට සමගාමී ව නව භාරකාර මණ්ඩල පත් වීමෙන් අනතුරුව 2023 මාර්තු 31 වන දින 88 වන භාරකාර මණ්ඩල රැස්වීම පැවැත්වීමට කටයුතු කර ඇත. | 2023 මාර්තු 31 න් පසු 2024.01.19, 2024.09.19 යන දිනයන් වල 89,90,91 යන භාරකාර මණ්ඩල රැස්වීම් පවත්වා තිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | මණ්ඩල රැස්වීම් පවත්වා නොතිබීමෙන් භාරකාර මණ්ඩලය විසින් භාරයේ උන්නතිය උදෙසා සක්‍රීය දායකත්වයක් ලබා දී නොතිබුණු බව නිරීක්ෂණය විය. | | | | |
| 3. | රණසිංහ ප්‍රේමදාස අනුස්මරණ භාරය වෙනුවෙන් 2019 වර්ෂයේ ජනවාරි මාසයේදී ලැබී භාරය වෙත බැර කිරීමට තීරණය කර තිබුණු රු.1,000,000 ක මුදල, ජාතික චිත්‍රපට සංස්ථාව නමින් ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර පොලී ආදායම් ලබාගෙන අනතුරුව 2022 ජුනි මස 06 දින සංස්ථා භාරය වෙත පවරා තිබුණු අතර භාරය විසින් ද එම මුදල 2022 අගෝස්තු 08 දින දක්වා මාස 02 ක කාලයක් බැංකු ජංගම ගිණුමේ රඳවාගෙන පසුව වසරක කාලයකට ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර තිබුණි. ඒ අනුව මෙම භාරය පිහිටුවා ඇති අරමුණු හෝ කාර්යයන් ඉටු කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර | 2022 | භාරය පිහිටුවා ඇති අරමුණු හෝ කාර්යයන් ඉටු කිරීමට අදාළව කඩිනම් පියවර ගත යුතුය අතර ප්‍රමාදයකින් තොරව ආයෝජනය කිරීමටත් කටයුතු කළ යුතුය. | 2021.07.06 වන දින පැවති 86 වන භාරකාර මණ්ඩල රැස්වීම් තීරණය අනුව මෙම මුදල සංස්ථා භාර අරමුදලේ ස්ථාවර තැන්පතු පවත්වාගෙන යෑමට කටයුතු කර ඇත. | චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයින් සඳහා වූ ජාතික චිත්‍රපට සංස්ථා භාරය යටතට ගෙන ආයෝජන කර ඇත. ඉදිරි භාරකාර මණ්ඩල රැස්වීමක දී එමඟින් කරනු ලබන කාර්යයන් තීරණය කරන බව දන්වා ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | නොතිබුණි. | | | | |
| 4. | රුක්මනී දේවී භාරය, පිහිටුවා ඇති අරමුණ හෝ කාර්යයන් මොනවාද යන්න පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවූ අතර රු. 462,778 ක් වූ එම අරමුදලින් කිසිදු කාර්යක් සිදු නොකර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි යෙදවූ ප්‍රාග්ධනය යටතේ දිගින් දිගටම ඉදිරියට ගෙන එමින් පැවතුණි. | 2021<br>2022 | මෙම අරමුදල පිහිටුවීමට අදාල අරමුණු පිළිබඳ සොයා බලා ඊට අදාළ කාර්යයන් ඉටු කිරීමට ක්‍රියාකළ යුතුය. | මෙම කරුණ පිළිබඳ ව නැවතත් භාරකාර මණ්ඩල අවධානය යොමු කිරීමට කටයුතු කරනු ලැබේ. | ඉදිරි භාරකාර මණ්ඩල රැස්වීම් වලදී මේ පිළිබඳ තීරණ ගනු ලබන බව දන්වා ඇත. |
| 5. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වන වගන්තිය ප්‍රකාරව අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම සඳහා භාරයේ භාරකාර මණ්ඩලය විසින් අභ්‍යන්තර විගණකවරයකු පත්කර නොතිබුණි. | 2021<br>2022 | ජාතික විගණන පනත ප්‍රකාරව අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතුය. | සංස්ථාවේ අභ්‍යන්තර විගණන තනතුර සඳහා නිළධාරියකු පත් කර ගැනීමට අදාළ කටයුතු මේ වන විට සිදු කර ඇති බැවින් එම පත් කිරීම සිදු කල විගස මේ සම්බන්ධව කටයුතු කරන බව දන්වා තිබුණි. | 2024 සැප්තැම්බර් 30 දින වන විටත් අභ්‍යන්තර විගණක පත්කර නොතිබුණි. |
| 6. | සංස්ථා භාරය පිහිටුවා විගණිත දින වන විට වසර 37 කට ආසන්න කාලයක් ගත වී ඇති අතර භාරය ආරම්භක තත්ත්වයේම හෝ වඩා අඩු ක්‍රියාකාරී මට්ටමකින් භාරයේ කටයුතු සිදු කෙරෙමින් පවතින අතර පනතේ දක්වා ඇති පරමාර්ථ අතරින් | 2021 | අරමුදල් තත්ත්වය වැඩි දියුණු කර ගැනීමටත් භාරයෙහි පරමාර්ථයන් ඉටු කිරීමටත් පියවරගත යුතුය. | ප්‍රමාණවත් මූල්‍ය ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරය වෙතින් ලබා ගැනීමෙන් පසු ගෙවූ දීමනාව රු.5,000 දක්වා වැඩි කරන ලද අතර පොරොත්තු ලේඛනයේ ඇතුළත් සියළු සුදුසුකම්ලාභීන් වෙත ගෙවීම් කර ඇත. | පොරොත්තු ලේඛනගත සියළුම සුදුසුකම්ලාභී චිත්‍රපට කලාකරුවන් හා කාර්මික ශිල්පීන් වෙත මාසික විශ්‍රාම වැටුප් දීමනා ලබා දීම සඳහා භාරකාර මණ්ඩලය කටයුතු කර තිබුණද, මරණාධාර සහ වෛද්‍යාධාර ගෙවීම් සිදුකර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | කලාකරුවන්ට සහ කාර්මිකයන්ට දායක විශ්‍රාම වැටුප් මුදල් ගෙවීම පමණක් සිදු කර තිබූ අතර පවතින ආර්ථීක තත්ත්වයන්ට අනුකූලවන පරිදි විශ්‍රාම වැටුප් යාවත්කාලීන කිරීම, පොරොත්තු ලේඛනගත විශ්‍රාමලාභීන්ට කඩිනමින් විශ්‍රාම වැටුප් පිරිනැමීමට සහ සුහසාධන වෛද්‍ය පහසුකම් ලබාදීම ආදී කිසිදු කර්තව්‍යයක් භාරය මගින් සිදු නොවන බව නිරීක්ෂණය විය. | | | තව ද ඉදිරියේ දී සංස්ථා භාර අරමුදල් ආයෝජනය කිරීමෙන් ලැබෙන වාර්ෂික පොළී මුදලින් අවස්ථානුකූල ව මරණාධාර සහ වෛද්‍යාධාර ගෙවීම් කිරීමට කටයුතු කරනු ලැබේ. | |
| 7. | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ I කොටසේ 15.1 මගින් සංශෝධිත 877(2) (ඇ) මුදල් රෙගුලාසියට පටහැනිව සංස්ථා භාරයේ 2022 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන වසරක ප්‍රමාදයකින් පසුව 2024 අප්‍රේල් 17 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර ඒ සමඟ කාර්යසාධන වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | 2022<br>2021 | චක්‍රලේඛය ප්‍රකාරව නියමිත දිනට මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කළ යුතුය. | 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන වෙනුවෙන් ඉදිරිපත් කරන ලද විගණකාධිපති වාර්තාවට අනුකූලව 2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සකස් කර අනුමැතිය සඳහා භාරකාර මණ්ඩලය වෙත යොමු කිරීමට සිදු වීම යන කටයුතු සිදු වීමේ දී යම් ප්‍රමාදයක් සිදු ව ඇත. | 2023 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනද 2024 සැප්තැම්බර් 30 දින වන විටත් විගණනයට ඉදිරිපත් නොකෙරෙණු අතර ප්‍රමාද කාලය මාස 7 ක් විය. |

## 3.8 ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදල

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | බදු පෙර ලාභය (අලාභය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 129,364,050 | 1,832,404 | 127,531,646 | 4,000,099 | තත්ත්වාගණනය කළ |
| **2022** | 145,568,176 | 1,860,404 | 143,707,772 | 12,976,126 | තත්ත්වාගණනය කළ |
| **2023** | 167,170,550 | 2,572,436 | 164,598,114 | 20,890,342 | තත්ත්වාගණනය නොකළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිරීක්ෂණය | විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| 1. | අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනට චිත්‍රපට නිෂ්පාදන ණය, සිනමාශාලා ණය සහ කොවිඩ් 19 -සිනමාශාලා ණය ඇතුළු එකතුව රු 71,648,272.ක් වූ ශේෂයෙන් වසර 05 ඉක්මවූ ණය ශේෂය රු 71,024,268.ක් වූ අතර ඉන් රු 64,602,413.ක් වසර 20 ද ඉක්මවා තිබුණි .කර්මාන්තය බිඳ වැටීම හා කළමනාකරණය විසින් ණය අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග නොගැනීම මත මෙම ණය අයකරගත නොහැකිවී තිබුණු අතර මුළු ණයගැති ශේෂයෙන් සියයට 93ක් වූ රු 67,177,716.ක් අඩමාණ ණය වශයෙන් වෙන්කර තිබුණි .පූර්ව වර්ෂ | 2021<br>2022<br>2023 | හිඟ හිටි පැරණි ශේෂ අයකර ගැනීමට ඉහළ කළමනාකරණය කටයුතු කළ යුතුය. | සිනමාශාලා නවීන තාක්ෂණයෙන් ප්‍රක්ෂේපන කටයුතු සිදුකරන බැවින් 35mm සිනමා ප්‍රදර්ශනය කරවීමේ අවස්ථා අවම වී ඇති අතර මෙම චිත්‍රපට නැවත ප්‍රදර්ශනය කරවා ණය අයකර ගැනීමේ හැකියාව අහිමි වී ඇත. ඉදිරියේදී රූපවාහිනි නාලිකා හා යූ ටියුබ් නාලිකා මඟින් චිත්‍රපට ප්‍රදර්ශනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරන බව. | 2024 සැප්තැම්බර් 30 දින වන විට ද දිර්ඝකාලීන හිඟ ණය ශේෂ අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | විගණන විමසුම් මගින්ද මේ පිළිබඳව පෙන්වා දී ඇතත් සමාලෝචිත වර්ෂය තුළදී පවත්වන ලද පාලක මණ්ඩල රැස්වීමේදී ද මෙම අයකරගත නොහැකි ණය අයකර ගැනීම සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ගයන් පිළිබඳ අවධානය යොමු කරනොතිබුණි. | | | | |
| 2. | 2023 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවෙන්, අරමුදලට ලැබිය යුතු කුලී දායකත්වය රු. 26,393,457 ක්ද, චිත්‍රපට ප්‍රදර්ශනය කිරීමේ ආදායමින් ලැබිය යුතු රු. 3,532,156 ක්ද, ඇතුළු එකතුව රු.31,523,282 ක් වූ ශේෂයෙන් රු.23,002,208 ක් වසර 05 ඉක්මවා තිබුණද කළමනාකරණය විසින් මෙම මුදල් කඩිනමින් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2023<br>2022<br>2021 | සංස්ථාවෙන් ලැබිය යුතු කුලී මුදල් අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය. | වැකන්ද වලව්ව හා නිසලගිර චිත්‍රපට සඳහා ආදායම් ඉපයීමක් නොවන බැවින් මෙම හිඟ මුදල් අයකර ගැනීමට නොහැකි තත්ත්වයක් ඇත. ඉදිරියේදී රූපවාහිනී මාධ්‍ය හරහා චිත්‍රපට ප්‍රදර්ශනය කර ආදායම් ඉපයීමට කටයුතු කරනු ලබන බව. | වර්තමානය වන විටද විගණන නිර්දේශය ප්‍රකාරව සංස්ථාවෙන් ලැබිය යුතු කුලී මුදල් අයකරගෙන නොතිබුණි. |
| 3. | අරමුදලේ සමාලෝචිත වර්ෂයේ තැන්පත් පොලී ආදායම රු. 20,507,972 ක් වන විට අරමුදලේ ප්‍රධාන ආදායම් | 2023<br>2022 | අරමුදලේ මුදල් ආයෝජනය කිරීම වෙනුවට චිත්‍රපට කර්මාන්තයේ සංවර්ධනය වෙනුවෙන් මුදල් | අමාත්‍යාංශ මාරුවීම් මත පාලක මණ්ඩලය පත්කිරීම් ප්‍රමාදවීම් හේතුවෙන් ඵලදායි ක්‍රියාවලියක් සිදු වී නොමැත. | වර්තමානය වන විටද කර්මාන්තයේ සංවර්ධනය වෙනුවෙන් මුදල් වැයකිරීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | මාර්ගය වූ චිත්‍රපට කර්මාන්තය තුළින් උපයා ගෙන තිබුණු ආදායම රු.2,281,047 ක් තරම් අවම මට්ටමක පැවතුණි. චිත්‍රපට කර්මාන්තයේ බිඳ වැටීමත්, එම කර්මාන්තය නඟා සිටුවීමට මූලික අවධානය යොමු කරනු වෙනුවට මුදල් ආයෝජනය කිරීම සිදුකර තිබීමත් මෙම තත්ත්වයට හේතුවී තිබුණි. | | වැය කිරීමට වග බලාගත යුතුය. | | |
| 4. | සමාලෝචිත වර්ෂය තුළ අරමුල විසින් කිසිදු වියදමක් දරා නොතිබුණු අතර 1996 ඔක්තෝබර් 24 දිනැති අංක 946/9 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් සංශෝධිත 1971 අංක 47 දරන ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 61 වන හා 05 වන වගන්තිය යටතේ වන නියෝග ප්‍රකාරව ඉටුකළ යුතු කිසිදු කාර්යයක් ක්‍රියාවට නංවා නොතිබුණි. 2023 දෙසැම්බර් 31 දිනට රු.10,759,729 ක බැංකු ශේෂයක් අරමුදල සතු ව තිබූ අතර ජනවාරි සිට දෙසැම්බර් දක්වා වූ මාස 12 ක කාලය තුළ ද රු. මිලියන 05 කට නොඅඩු මාසික සාමාන්‍ය බැංකු | 2023<br>2021 | අරමුදල පිහිටුවීමේ අරමුණු වෙනුවෙන් මුදල් උපයෝජනය කළ යුතුය. | චෙක්පත් අත්සන් කිරීමේ බලය පැවරීමෙන් පසු 2024 වර්ෂයේ පාලක මණ්ඩලය අනුමැතිය මත රු.මිලියන 08 ආයෝජනය කර ඇත. | 2024 ජුලි 04 දින මිලියන 08 ක් ආයෝජනය කර තිබුණු අතර නියෝග ප්‍රකාරව ඉටුකළ යුතු කිසිදු කාර්යයක් වෙනුවෙන් වියදම් දරා නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ශේෂයක් උපයෝජනය කිරිමකින් තොරව ජංගම ගිණුමෙහි නිශ්කාර්යයව රඳවා ගෙන තිබීම හේතුවෙන් අතිරික්ත මුදල් ආයෝජනය කිරීම තුළින් ලබාගත හැකිව තිබූ පොලී ආදායම අරමුදලට අහිමිව තිබුණි. | | | | |
| 5. | 1996 ඔක්තෝබර් 24 දිනැති අංක 946/9 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් සංශෝධිත 1971 අංක 47 දරන ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 61 වන හා 05 වන වගන්තිය යටතේ වන නියෝගයන්හි පාලක මණ්ඩල රැස්වීම් පැවැත්විය යුතු ආකාරය පිළිබඳව සඳහන් කර නොතිබීමෙන් 2023 වර්ෂය තුළ එක් පාලක මණ්ඩල රැස්වීමක් පමණක් පවත්වා තිබුණු අතර පෙර වර්ෂයන්හි තත්ත්වය ද ඒ ආකාරයෙන්ම විය. ඒ අනුව, චිත්‍රපට කර්මාන්තය සංවර්ධනය කිරීමේ අරමුණින් මෙම අරමුදල පිහිටුවා තිබුණ ද පාලක මණ්ඩලය විසින් සිනමා කර්මාන්තයේ උන්නතිය උදෙසා | 2023<br>2022 | නියෝග සංශෝධනය කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. | පාලක මණ්ඩලයේ උපදෙස් පරිදි ඉදිරියේදී සංවර්ධන අරමුදලේ ගැසට් පත්‍රය සංශෝධනය කර එළදායි කාර්යයක් කිරීමට බලාපොරොත්තු වේ. | වර්තමානය වන විටද විගණන නිර්දේශය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | සක්‍රීය දායකත්වයක් ලබාදී නොතිබුණි. | | | | |
| 6. | 1996 ඔක්තෝබර් 24 දිනැති අංක 946/9 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් සංශෝධිත 1971 අංක 47 දරන ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 61 වන හා 05 වන වගන්තිය යටතේ වන නියෝග අංක(4) (අ), (ආ), (ඇ), (ඈ), (ඉ), (ඊ), (උ), (ඌ) (එ),(ඒ) සහ (ඔ) අනුව පහත කාර්යයන් ඉටු කිරීමට කටයුතු කර නොතිබුණි. | 2021<br>2022<br>2023 | කළමනාකරණය විසින් පනතේ නියෝග ප්‍රකාරව අරමුදලේ කාර්යයන් ඉටු කිරීමට කටයුතු කළ යුතුය. | ඉදිරියේදී පෙන්වා දී ඇති කරුණු කෙරෙහි අවධානය යොමුකර කටයුතු කරන බව දන්වා තිබුණි. | නව පාලක මණ්ඩලයක් පත් වූ පසු චිත්‍රපට සංවර්ධන අරමුදලේ ගැසට් පත්‍රය සංශෝධනය සිදුකර දේශීය චිත්‍රපට කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා කටයුතු කිරීමට නියමිත බව දන්වා ඇත. |
| 7. | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15.1 මඟින් ප්‍රකාශිත මුදල් රෙගුලාසි 877(1) (ඈ) සහ (ඇ) ප්‍රකාරව අරමුදල විසින් 2023 වර්ෂය සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණු අතර අයවැය ලේඛනයක් අනුමත කර ගැනීමකින් තොරව අරමුදලේ වියදම් දරා තිබුණි. | 2022<br>2023 | අරමුදලේ අරමුණු වලට අනුකූලව අයවැය ලේඛනයක් පිළියෙල කළ යුතු අතර අනුමත අයවැයකින් තොරව වියදම් නොදැරිය යුතුය. | අයවැය ලේඛනයක් සකස් කර නැත. 2023 වර්ෂයේදී සංවර්ධන අරමුදලින් කිසිදු ගෙවීමක් සිදුකර නොමැත. | 2024 සැප්තැම්බර් 30 වන විටත් අයවැය ලේඛන සකස් කර නොතිබුණද රු.191,868 ක වියදමක් දරා තිබුණි. |

## 3.9 ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | බදු පෙර අතිරික්තය (ඌණතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 2,707,261,360 | 1,247,522,116 | 1,459,739,244 | 310,233,611 | තත්ත්වාගණනය කළ |
| **2022** | 2,600,464,086 | 853,145,475 | 1,747,318,611 | 285,269,552 | තත්ත්වාගණනය කළ |
| **2023** | 2,869,316,518 | 786,621,499 | 2,082,695,019 | 332,685,658 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| **01.** | **ලැබිය යුතු මුදල්** | | | | |
| (අ) | 2023 දෙසැම්බර් 31 දිනට අරමුදල විසින් බිල්පත් වට්ටම් කර කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා තිබූ මුදලින් සේවායෝජකයින් විසින් බිල්පත් සඳහා මුදල් නොගෙවීම නිසා පියවා ගත නොහැකි වූ මුදල් ශේෂය රු. මිලියන 10.30 ක් විය. එයින් රු. මිලියන 10.21 ක් හෙවත් සියයට 98 ක් එක් කොන්ත්‍රාත් ආයතනකින් ද ඉතිරි සියයට 02 ක් හෙවත් රු. 92,019 ක් වෙනත් ආයතනයකින්ද වසර 04 කට අධික කාලයක සිට අයකර ගැනීමට අපොහොසත්ව තිබුණි. | 2021, 2022, 2023 | බිල්පත් වට්ටම් කරදුන් කොන්ත්‍රාත්කරුවන්ගෙන් හිඟ මුදල් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතු වේ. | බිල්පත් වට්ටම් කළ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලද කොන්ත්‍රාත්කරුවන් සම්බන්ධ ගැටලු බේරුම්කරණයට යොමු කර ඇත. අදාළ වට්ටම් කිරීම්ද එමගින් අයකර ගැනීමට දැනටමත් කටයුතු කරමින් පවතී. | කොන්ත්‍රාත්කරුවන්ගෙන් හිඟ මුදල් මේ දක්වා අයකර ගෙන නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) | අරමුදල විසින් කිසිදු සුරැකුමක් තබානොගෙන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් වෙත ඇපකර නිකුත් කරන අතර කොන්ත්‍රාත්කරුවන් ගේ කාර්යයසාධනය අඩුවන අවස්ථාවලදී සේවායෝජකයන් ඇපකර මුදල් අරමුදලෙන් ඉල්ලුම් කරනු ලැබේ. 2011 සිට 2019 වර්ෂය දක්වා අවස්ථා 22 දී එලෙස රු. මිලියන 87.65 ක මුදලක් සේවායෝජකයින් වෙත ගෙවා තිබුණු අතර එයින් රු. මිලියන 4.67 ක් අයකර ගත නොහැකිව 2019 වර්ෂයේදී භාරකාර මණ්ඩලයේ අනුමැතියෙන් කපාහැර තිබුණි. තවද 2020 සිට 2022 දක්වා සේවායෝජකයින් වෙත ගෙවා අරමුදලට අයවිය යුතු මුදල රු. මිලියන 30.16 ක් විය. මීට අමතරව 2023 වර්ෂයේ දී රු. මිලියන 26.67 ක් ඇපකර මුදල් කිරීමට අරමුදලට සිදුවී තිබුණි. ඒ අනුව සේවායෝජකයන් වෙත අරමුදල විසින් | 2022, 2023 | කොන්ත්‍රාත්කරුවන්ගේ කාර්යසාධනය වර්ධනය කර ගැනීම සම්බන්ධයෙන් නිසි අධීක්ෂණයක් සිදු කළ යුතු අතර අරමුදලට අයවිය යුතු මුදල කඩිනමින් අයකර ගත යුතුය. | මෙතෙක් ඇපකර මුදල් කිරීම වෙනුවෙන් වැයවූ මුදල ප්‍රතිපූර්ණයට දැනටමත් යොමු වුවද සැලකිය යුතු මුදලක් වැයකර ක්‍රියාවලියට වර්ෂ කීපයක් ගත වී ඇතත්, ධනාත්මක ප්‍රතිඵලයක් ලැබී නොමැත. කෙසේවෙතත් මෙම උත්සාහයට ඔබ විසින් ලබා දුන් උපදෙස් පරිදි ආර්ථිකමය වශයෙන් සාධාරණ විනිශ්චයක් කරගැනීම පිණිස එකී ක්‍රියාවලිය අඛණ්ඩව කරගෙන යනු ලබයි. | මුදල් අයකරගෙන නොතිබුනි. දේපල තහනම් කිරීම සඳහා පිස්කල් නියෝගය භාරදීමට නොහැකිව ඇති බැවින් මේ දක්වා නිරවුල් වී නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ගෙවා තිබුණු එකතුව රු. මිලියන 139.80 ක් 2023 දෙසැම්බර් 31 දින වන විට නැවත අරමුදලට අයකර ගත නොහැකිව තිබුණි. මේ සම්බන්ධයෙන් බේරුම්කරණය ඇතුළු නීතිමය ක්‍රියාමාර්ගවල තීන්දු අරමුදලේ වාසියට ලැබී තිබුණද අදාල මුදල් අයකර ගැනීමට නොහැකිව තිබුණු අතර මේ සම්බන්ධ නෛතික කටයුතු සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 0.85 ක් වැය කර තිබුණි. | | | | |

**02. ගෙවිය යුතු මුදල්**

| | | | | | |
|---|---|---|---|---|---|
| (අ) | කිලෝමීටර් 100,000 ක ග්‍රාමීය මාර්ග ව්‍යාපෘතිය යටතේ වන ඉදිකිරීම් කර්මාන්ත සිදු කරන කොන්ත්‍රාත්කරුවන් 314 කගේ සහතික කරන ලද බිල්පත්වලට ගෙවීම සඳහා මාර්ග හා මහාමාර්ග අමාත්‍යාංශය විසින් 2020 සිට 2023 වසර දක්වා අරමුදල වෙත රු.මිලියන 33,389 ක් ලබාදී තිබුණු අතර එයින් රු. මිලියන 32,782.47 ක් කොන්ත්‍රාත්කරුවන් වෙත නිදහස් කර තිබුණි. තවද, එම මුදලින් අදාළ | 2021, 2022, 2023 | මේ සම්බන්ධයෙන් පැහැදිලි කොන්දේසි ඇතුළත් කරමින් මාර්ග හා මහාමාර්ග අමාත්‍යාංශය සමඟ ගිවිසුම් හෝ අවබෝධතා ගිවිසුමකට (MOU) එළඹිය යුතු අතර රඳවාගත් මුදල් කාලීනව නිරවුල් කල යුතුය. | සේවායෝජක වගකීම අඛණ්ඩව සිදු නොවුහෙයින් ව්‍යාපෘතීන් අතරමග අත්හිටුවීම සහ ඇපකරයන් කිහිපයක නීත්‍යානුකූල වගකීම ඉක්ම ගොස් ඇති වුවද සේවායෝජකයා හා කොන්ත්‍රාත්වරයා ව්‍යාපෘතිය පිළිබඳ දෙපාර්ශවයේ වගකීම තවදුරටත් සාකච්ඡා කරන හෙයින්, පූර්ණ සමාලෝචනයකින් පසුව ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල තම වගකීම්වලින් පූර්ණ ලෙස නිදහස ලැබෙන තෙක් සීමිත මුදල් ප්‍රමාණයක් | වගකීම් කාලය පවතින කොන්ත්‍රාත්කරුවන් ගේ රු.මිලියන 220.62 ක් නිරවුල් කර නැත. |

කොන්ත්‍රාත්කරුවන් වෙත මුදා නොහැර රු. මිලියන 220.62 ක මුදලක් 2023 දෙසැම්බර් 31 දිනට අරමුදල විසින් මාර්ගස්ථ මුදල් ගිණුමේ රඳවාගෙන තිබුණි. මෙයින් රු. මිලියන 88.10 ක් වසර 01 - 03 ක කාලයක සිටද, රු. මිලියන 3.43 ක් වසර 03- 05 ක කාලයක සිටද රඳවාගෙන තිබුණු බව නිරීක්ෂණය විය. මෙම රඳවාගත් මුදලින් සම්පූර්ණයෙන් වැඩ නිමවා තිබූ ව්‍යාපෘතීන් 123 කට අදාල රු. මිලියන 60.55 ක මුදල කොන්ත්‍රාත්කරුවන් වෙත මුදා නොහැර අරමුදල රඳවාගෙන තිබුණි. තවද කොන්ත්‍රාත්කරුවන් වෙත මුදා හැරීම සඳහා වෙනත් විවිධ පාර්ශ්වයන් විසින් අරමුදලට ලබාදී තිබූ මුදල්වලින් 2023 දෙසැම්බර් 31 දිනට අදාල කොන්ත්‍රාත්කරුවන් වෙත පියවා නොතිබුණු මුදල රු. මිලියන 27.77 ක් විය. මෙම ශේෂයෙන් එකතුව රු. මිලියන 7.08 ක් සහ රු. මිලියන 11.89 ක් වූ මුදල් පිළිවෙලින් වසර 01 - 03 අතර සහ

රඳවාගෙන ඇත. මේ වන විටත් සංක්‍රමණ මුදලින් 97% වැඩි ප්‍රමාණයක් නිදහස් කර ඇති අතර, පාර්ශවකරුවන්ගේ සමාලෝචනය අවසන් වූ පසු ඉදිරි කාලය තුළ රඳවා ඇති මුදල ක්‍රමවත්ව නිශ්කාශනය කිරීමට හැකිවනු ඇත.

| | | | | | |
|---|---|---|---|---|---|
| | වසර 03- 07 අතර කාල පරාසයන් තුළ වූ අතර අදාළ ව්‍යාපෘතිවල වර්තමාන කාර්යසාධනය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් අරමුදල විසින් රඳවාගෙන තිබුණු බැවින් මෙම මුදල්වල අනාගත පියවීම් සඳහා වන වගකීම විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය. මෙසේ කොන්ත්‍රාත්කරුවන් ගේ බිල්පත් පියවීම සඳහා සේවායෝජකයන් විසින් ලබා දී තිබූ මුදල්, මාර්ගස්ථ මුදල් ලෙස (Transit Money) දීර්ඝ කාල පරාසයන් තුල රඳවා ගැනීම ගැටලු සහගත විය. | | | | |
| **03.** | **නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම** | | | | |
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41(1) ඡේදය අරමුදලේ මෙහෙයුම් ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් අඛණ්ඩව සමාලෝචනය කර කාලීනව පාලක මණ්ඩලයට වාර්තා කිරීම සඳහා විගණන හා කළමනාකරන කමිටු පැවැත්විය යුතු | 2021, 2022, 2023 | ජාතික විගණන පනත ප්‍රකාරව විගණන හා කළමනාකරන කමිටු රැස්වීම් පැවැත්විය යුතුය. | අරමුදලේ මෙහෙයුම් නිරන්තර සමාලෝචනයට හා අභ්‍යන්තර විගණනයට ලක්කිරීම නිරන්තරයෙන් සිදු කරන අතර කළමනාකරණ කමිටු මඟින් අවශ්‍ය සියලු අවස්ථාවන්හි පොදු කළමනාකරණ තීරණ මත නිවැරදිව | විගණන හා කළමනාකරන කමිටු පවත්වා නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | වුවත් අරමුදල කිසිදු දිනක විගණන හා කළමනාකරන කමිටු රැස්වීමක් පවත්වා නොතිබුණි. එමෙන්ම මුදල් අමාත්‍යාංශයේ හෝ ඉදිකිරීම් අමාත්‍යාංශයේ හෝ විගණන හා කළමනාකරන කමිටු සඳහාද සහභාගීත්වයක් නොවුණි. | | | හා විනිවිදව සිදු කිරීමට සෑම අවස්ථාවකම කටයුතු කරයි. | |
| (ආ) | 1999 අගෝස්තු 05 දිනැති අරමුදලේ භාර ඔප්පුවේ 9 (ඊ) වගන්තිය භාරකාර මණ්ඩලයට වැටුප්, දීමනා හෝ ගරු වැටුප් ලබා ගැනීමට අයිතියක් නොමැති නමුත් ඔවුන්ගේ රාජකාරි ඉටු කිරීමේදී දරන ලද වියදම් ප්‍රතිපූරණය කළ හැකි වේ. නමුත් ඊට පටහැනිව, අරමුදල විසින් මණ්ඩලයේ වෘත්තීය හැකියාව මත අමතර සේවාවන්හි යෙදීම වශයෙන් රාජකාරි ඉටුකිරීම සඳහා මාසිකව රු.50,000 බැගින් වූ ස්ථාවර මුදලක් ලෙස එකතුව රු. මිලියන 2.5ක්, රු. මිලියන 2.3 ක් හා රු. මිලියන 2.5 ක් පිළිවෙලින් 2021, 2022 සහ 2023 වර්ෂයන් තුලදී ගෙවා තිබුණි. කෙසේ | 2021, 2022, 2023 | අරමුදලේ භාර ඔප්පුවේ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතුය. | භාරකරුවන් වෙත භාර ඔප්පුවේ විෂයය අංක 07, 08 හා 11 කටයුතු වෙනුවෙන් සෘජුවම බැඳී ඇති අතර, ඔවුන්ගේ අතිරේක කාර්යයභාරයන් හඳුනාගෙන ඇත. එම කාර්යයභාරයන් වෙනුවනේ රාජකාරිය ඉටු කිරීමේදී දරණ ලද වියදමක් ලෙස සැලකිය යුතුය. භාරකාර මණ්ඩලයේ කාර්ය සාධනය වෙනුවෙන් භාර ඔප්පුවේ 9(F) ප්‍රතිපාදන අනුව මෙම වියදම් මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇත. | භාර ඔප්පුවේ විධිවිධාන අනුව වියදම් ප්‍රතිපූර්ණයක් සිදුකර නොතිබුණ අතර මාසිකව ස්ථාවර මුදලක් ගෙවා තිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | වෙතත්, භාරකාර මණ්ඩලය විසින් රාජකාරි ඉටු කිරීම සඳහා දරන ලද වියදම් පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශන තුල දක්වා නොතිබුණි. මෙම සම්බන්ධිත පාර්ශව ගණුදෙනු සම්බන්ධව මූල්‍ය ප්‍රකාශන මගින් කිසිදු හෙළිදරව් කිරිමක් සිදු කර නොමැති බවද වැඩිදුරටත් නිරීක්ෂණය විය. | | | | |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 2020 අගෝස්තු 28 දිනැති අංක 1/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මඟින් නිකුත් කරන ලද මුදල් රෙගුලාසි 876 (3) කිසියම් ව්‍යවස්ථාපිත නොවන අරමුදලක් තවදුරටත් පවත්වාගෙන යාමට සාධාරණ හේතු තිබේ නම්, එම අරමුදල පාර්ලිමේන්තු පනතක් මඟින් නීතිගත කළ යුතුය. කෙසේ වෙතත්, අරමුදල 2024 මාර්තු 31 දින වන විටත් මෙම අවශ්‍යතාවයට අනුකූල වී නොතිබුණි. | 2021, 2022, 2023 | මුදල් රෙගුලාසි අනුව කටයුතු කල යුතුය. | මේ සම්බන්ධයෙන් බේරුම්කරු ලෙස භාණ්ඩාගාර ලේකම් සුදුසු අවස්ථාවේ කටයුතු කරනු ඇතැයි අරමුදල බලාපොරොත්තු වේ. | මේ දක්වා පාර්ලිමේන්තු පනතක් මඟින් නීතිගත කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. |

**04. කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | | | | |
|---|---|---|---|---|
| (අ) අරමුදල සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතියක් (MIS) නිර්මාණය කර සංවර්ධනය කිරීම වෙනුවෙන් අරමුදල විසින් 2015 වර්ෂයේදී ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය සමඟ රු. මිලියන 2.98 ක වටිනාකමකට ගිවිසුමකට එළඹ තිබුණි. ගිවිසුම පරිදි පළමු වාරිකය සහ සංවර්ධනය කිරීමෙන් පසු ගෙවිය යුතු දෙවන වාරිකයද වශයෙන් එකතුව රු. මිලියන 2.08 ක් හෙවත් කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 70 ක් 2015 සහ 2016 වර්ෂවල දී අදාළ ආයතනය වෙත ගෙවා තිබුණු අතර එය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මෘදුකාංග සංවර්ධන අත්තිකාරම් මුදල් ලෙස ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණි.මුදල් ගෙවා වර්ෂ 08 ක් පමණ ගත වුවද 2024 මාර්තු 31 වන දින දක්වාම මෙම කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS) සකස් කිරීම අවසන් කර නොතිබුණි. ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර කාර්යය සම්පූර්ණ කර | 2021, 2022, 2023 | කළමනාකරණ තොරතුරු පද්ධතිය ගිවිසුම් ප්‍රකාරව සාර්ථකව සකස් කරවා ගැනීමට කටයුතු කළ යුතු බව. | 2015 සිට ආරම්භ කරන ලද පද්ධතිය 2023 වනතෙක් අවසන් කරගැනීමට නොහැකි වුවද පළමුව එකඟවූ මුදලටම වර්තමානයේදී අලාභයක් ඇති නොවන සේ අවසන් කිරීමට කටයුතු කරන බව දක්වා තිබුණි. | 2024 මැදභාගය වන විට සේවාව 50% ප්‍රතිශතයක් නිමකර තිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද අරමුදල අපොහොසත්ව තිබුණි. | | | | |
| (ආ) | අරමුදල 1999 දී ආරම්භ කර තිබූ අතර 2000 සිට 2005 දක්වා කාලය තුළ අවස්ථා හතරකදී මහා භාණ්ඩාගාරයෙන් රු. මිලියන 55 ක ප්‍රාග්ධන ප්‍රදානයක් ලබාදී තිබුණි. එහෙත් වාර්ෂික ලාභ මහා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොතිබුණි. මේ අතර, 2020 දෙසැම්බර් 31 දිනට පැවති රු. මිලියන 949.79 ක් වූ රඳවා ගත් ඉපැයීම්වලින් රු. මිලියන 500 ක් “යටිතල පහසුකම් සඳහා ප්‍රතිපාදන” නම් සංචිත ගිණුමකට මාරු කර නිෂ්කාර්යව පවතින බවද නිරීක්ෂණය විය. 2023 දෙසැම්බර් 31 දිනට රඳවා ගත් ලාභ හා සංචිත රු. මිලියන 912.95 ක් වූ අතර එදිනට පැවති දිගුකාලීන ආයෝජන රු. මිලියන 1,208.91 ක් ද කෙටිකාලීන ආයෝජන රු.මිලියන 1,041.61 ක් වී තිබුණි. | 2022, 2023 | චක්‍රලේඛය ප්‍රකාරව උපයන ලද අතිරික්තය හෝ අතිරික්තයේ කොටසක් වාර්ෂිකව මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීමට ක්‍රමවේදයක් සකස් කළ යුතුය. | ආයතනය වසර 25ක කාලයක් මාසික කුලියට පවත්වාගෙන යාම හේතුවෙන් මෙහෙයුම් කටයුතු පුළුල් කිරීම සඳහා ද තමන්ගේම සේවා ස්ථානයක් ඉදිකිරීමට භාර ඔප්පුවේ වගන්ති අංක 8(සී) යටතේ බලතල ලැබී ඇති හෙයින්ද අප ආයතනය උපයාගත් මුදලින් ඒ සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම සිදුකර ඇත. | කිසිදු ප්‍රේෂණයක් භාණ්ඩාගාරය වෙත යොමු කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | අරමුදල බැඳුම්කර හා ඇපකර ආදායම (Bond and Guarantee Levy Income) ගණනය කිරීමේ දී කිලෝමීටර් 100,000 මාර්ග ව්‍යාපෘති සඳහා බැඳුම්කරයේ වටිනාකමෙන් 2% ක් හා 2.5% ක් පිළිවෙලින් අත්තිකාරම් බැඳුම්කර (Advance Bond) හා කාර්යය සාධන බැඳුම්කර (Performance Bond) සඳහා අයකර ඇති අතර බැඳුම්කර කාලය දීර්ඝ කිරීමේ දී අයකරන සේවා ගාස්තුව අත්තිකාරම් බැඳුම්කර හා කාර්යය සාධන බැඳුම්කර සඳහා පිළිවෙලින් 1.5% හා 1.75% ක් වුවත් මෙම ගාස්තු අයකිරීම සම්බන්ධයෙන් විශේෂ කළමනාකරණ වාර්තා පිටපතක් විගණනයට ඉදිරිපත් කළද භාරකාර මණ්ඩලයේ අනුමැතිය සහිත රැස්වීම් වාර්තා පිටපත් විගණනයට ඉදිරිපත් නොවීය. තවද, බැඳුම්කර හා ඇපකර ආදායමට පවතින අවදානම අනුව යම් මුදලක් අමතරව එකතු කර තිබුණු අතර මෙම අගය කළමනාකරණය | 2021, 2022, 2023 | භාරකාර මණ්ඩලයේ අනුමැතියෙන් මෙන්ම කළමනාකරණය හෝ කමිටු විසින් ගනු ලබන තීරණ බැඳුම්කර හා ඇපකර ආදායම් ලිපිගොනු වල ඇතුලත් විය යුතුය. | භාරකාර මණ්ඩලය ප්‍රතිපත්තිමය තීරණ ගනු ලබන අතර කළමනාකරණය අවධානම මත ගාස්තු නිර්ණය කිරීමද අනෙකුත් ක්‍රියාකාරකම්ද සුදුසු ලෙස එක් එක් ව්‍යාපෘතිය වෙනුවෙන් වෙන් වෙන් වශයෙන් පියවර ගනු ලබයි. මේ පිළිබඳ පොදු වාර්තාවක් නඩත්තු කරනු ලබයි. | සම්මත අවම ගාස්තුව හෝ ඊට වැඩි ප්‍රමාණයක් අවධානම් දැරීම මත තීරණය වුවද ඒ සම්බන්ධ සාකච්ජා සටහන් හෝ සේවා ගාස්තු පිලිබඳ කිසිඳු සටහනක් පවත්වා නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | විසින් පවතින අවදානම් තක්සේරු කොට බැඳුම්කර හා ඇපකර ආදායමට එකතු කරයි. අවදානම් තක්සේරුව පිළිබඳ කිසිදු ලියවිල්ලක් හෝ සාකච්ඡා සටහන් ලිපිගොනු වල ලේඛන ගත වී නොමැත. මීට අමතරව අරමුදල 2020 සිට 2023 දක්වා වූ වාර්ෂික වාර්තාවන් වල සේවාගාස්තු සම්බන්ධයෙන් සඳහන් පරිච්ඡේදයේ මේ සම්බන්ධව කිසිදු සටහනක් නොවීය. | | | | |
| **05.** | **ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය** | | | | |
| | 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 01/2020 මගින් නිකුත් කරන ලද 877(2)(ඉ) මූදල් රෙගුලාසියට අනුව, අරමුදලේ ගණන් දීමේ නිලධාරියා විසින් නියමිත විධිවිධාන යටතේ භාෂා තුනෙන්ම වාර්ෂික කාර්ය සාධන වාර්තාව සකස් කළ යුතු අතර එක් එක් මුදල් වර්ෂය අවසන් වී දින 150ක් ගත වීමට පෙර ඉහත වාර්තාව සභාගත කිරීමට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, 2024 | 2021, 2022, 2023 | චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. | අදාළ වාර්ථාව පිළියෙළ කිරීමේදී රජයේ මාර්ගෝපදේශ අනුව අවශ්‍ය සියළු තොරතුරු ක්‍රමානුකූලව වාර්තාවට ඇතුළත් කර ඇත. මෙම වාර්තාව සුදුසු කටයුතු සඳහා ආයතනයේ බේරුම්කරු ලෙස මුදල් අමාත්‍යාංශයේ - භාණ්ඩාගාර ලේකම් වෙත වර්ෂය අවසන් වූ ප්‍රථම දින 60 තුළ යැවීමට නිරන්තරයෙන් කටයුතු කළ බවට සහතික කර ඇත. | වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | මාර්තු 31 දිනය දක්වා අරමුදල විසින් 2020, 2021 සහ 2022 වසර සඳහා වන වාර්ෂික කාර්ය සාධන වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි. | | | | |
| **06.** | **අයවැය පාලනය** | | | | |
| | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය මගින් නිකුත් කරන ලද 877 (1) (ඇ) මූල්‍ය රෙගුලාසියට අනුව, ඉදිරි වර්ෂය සඳහා භාරකාර මණ්ඩලය විසින් සකස් කරන ලද අයවැය මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීම සඳහා ප්‍රවර්තන වර්ෂයේ සැප්තැම්බර් 30 වන දිනට පෙර ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කළ යුතුය. කෙසේ වෙතත් 2023 වර්ෂය සඳහා අරමුදලේ අයවැය වෙනුවෙන් ඉහත පරිදි අනුමැතිය ලබාගෙන නොතිබුණි. | 2021, 2022, 2023 | රාජ්‍ය මූල්‍ය රෙගුලාසි වලට අනුකූලව කටයුතු කළ යුතුයි. | සෑම වර්ෂයකම නියමිත හෝ ආසන්න වකවානුවකදී අයවැය ලේඛණ භාණ්ඩාගාරයට ඉදිරිපත් කරයි. ඒ පිළිබඳ මෙතෙක් කිසිදු විමර්ෂනයක් නොකළ හෙයින් එය සම්මත වූ බවට පිළිගත යුතුය. | අයවැය භාණ්ඩාගාරයට ඉදිරිපත් කර තිබුණ ද එය අනුමත වූ බවට තොරතුරු වාර්තා වී නොතිබුණි. |

## 3.10 ධීවර ත්‍යාග අරමුදල

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 11,497,024 | 1,658,092 | 9,838,932 | 197,872 | තත්ත්වාගණනය කළ |
| **2022** | 11,850,950 | 1,907,760 | 9,943,190 | 3,637,671 | තත්ත්වාගණනය කළ |
| **2023** | 12,717,378 | 2,955,290 | 9,762,088 | 372,570 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| 1. | 2015, 2016, 2017, 2018, 2019, 2020, 2021, 2022 හා 2023 වර්ෂවල වැටලීම් කටයුතු සිදුකර පිළිවෙලින් නඩු 348, 488, 427, 327, 604, 536 ,692 ,293 හා 719ක් ගොනුකර තිබුණි. එසේ වුවත් 2017,2018 හා 2020 වර්ෂවල දී වැටලීම් කළ නිලධාරීන්ට කිසිදු ත්‍යාග මුදලක් ගෙවා නොතිබුණු අතර 2023 වර්ෂය තුල ගොනුකල නඩු 719 න් නඩු 03 කට අදාලව වැටලීම් කළ නිලධාරීන්ට ගෙවා තිබු ත්‍යාග මුදල රු.250,165 ක් විය. පසුගිය වර්ෂයන්ට අදාළ ගෙවිය යුතු රු. 9,848,765ක මුදලින් කිසිදු මුදලක් සමාලෝචිත වර්ෂය | 2021, 2022, 2023 | ත්‍යාග මුදල් ලබාදීම සඳහා කඩිනම් ක්‍රමවේදයක් සකස් කළ යුතුය. | තොරතුරු ලබා ගෙන කඩිනමින් දීමනා ගෙවීමට කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කරන ලදී. | ත්‍යාග ලබාගැනීමට අදාළ නඩුවේ ලිපිගොනු විමර්ශනගත හා පුහුණු අංශයට ගෙන්වා ගැනීමටත්, ඒ අනුව ත්‍යාග මුදල් ගෙවීම කඩිනම් කිරීමක් සඳහා අංක DFAR/INV/2024/01 දරන අභ්‍යන්තර චක්‍රලේඛයක් නිකුත් කර තිබුණ ද ත්‍යාග මුදල් ලබා දී නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | තුළ ත්‍යාගලාභීන්ට ගෙවා නොතිබුණි.මේ අනුව නිලධාරීන් වෙත ත්‍යාග මුදල් ලබාදීම සඳහා කඩිනම් ක්‍රමවේදයක් සකස් නොකිරීම හේතුවෙන් නීති විරෝධී ධීවර කටයුතු වැටලීම් සඳහා නිලධාරීන් දිරිගැන්වීමක් සිදුනොවන බව නිරීක්ෂණය විය. | | | | |
| 2. | 2023 වර්ෂය තුල සියලුම දිස්ත්‍රික් ධීවර කාර්යාල හරහා නඩු 719 ක් පවරා තිබුණි. දිස්ත්‍රික් ධීවර කාර්යාල 04කින් පමණක් රාජසන්තක භාණ්ඩ විකුණුම් ආදායම් ත්‍යාග අරමුදලට බැර වී තිබුණු නමුත් අනෙකුත් දිස්ත්‍රික් ධීවර කාර්යාල කිසිවකින් ත්‍යාග අරමුදලට ආදායම් ලැබී නොතිබීම සම්බන්ධයෙන් කළමනාකරණය විසින් අවධානය යොමු කළ බවක් අනාවරණය නොවීය. | 2021, 2022, 2023 | නඩු අවසන් වූ පසු රාජසන්තක භාණ්ඩ විකිණීම කඩිනම් කළ යුතුය. | ධීවර ත්‍යාග අරමුදලට බැරකළ හැකි මුදල් ඇත්නම් ඒවා නැවත ලබාගෙන වැටලීම් හා අධිකරණ කටයුතුවලට සම්බන්ධ නිලධාරීන්ට දීරි දීමනා ලබාගැනීම සඳහා කටයුතු කරන ලෙස උපදෙස් ලිපි නිකුත් කර ඇත. | රාජසන්තක භාණ්ඩ විකිණීමෙන් ධීවර ත්‍යාග අරමුදලට බැර කළ හැකි මුදල් කඩිනමින් අරමුදලට ලබාගෙන අධිකරණ කටයුතුවල සම්බන්ධ නිලධාරීන්ට දීමනා ගෙවීම් කිරීම සඳහා වන චක්‍රලේඛ උපදෙස් ලිපි නිකුත් කර තිබුණ ද, රාජසන්තක භාණ්ඩ විකිණීම කඩිනම් වී නොමැත. |
| 3. | දිස්ත්‍රික් ධීවර කාර්යාල විසින් පවරා තිබූ නඩු, ක්‍රියාත්මක නඩු, ඒ ඒ කාර්යාලවල අත්අඩංගුවේ පවතින භාණ්ඩ, අධිකරණවල පවතින නඩු, අවසන් වූ නඩුවලින් ත්‍යාග | 2022, 2023 | අධිකරණවල පවතින නඩු සහ නඩුවලින් ත්‍යාග අරමුදලට ලැබිය යුතු මුදල් පිළිබඳ සියලුම විස්තර කාර්යසාධන වාර්තාවට ඇතුළත් | නීති විරෝධී ධීවර කටයුතු වැටලීම් වලින් සහ නඩු පැවරීම් මඟින් අරමුදලට ලැබිය යුතු මුදල් පිළිබඳ විස්තර කාර්යසාධන වාර්තාවට ඇතුළත් | නීති විරෝධී ධීවර කටයුතු වැටලීම් පිළිබඳ විස්තර 2024 කාර්යසාධන වාර්තාවට ඇතුළත් කිරීමට උපදෙස් ලබා දී ඇත. |

| | | |
|---|---|---|
| අරමුදලට ලැබිය යුතු මුදල් පිළිබඳ තොරතුරු ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් යාවත්කාලීනව පවත්වාගෙන නොයාම නිසා, ධීවර ත්‍යාග අරමුදලේ කාර්යසාධන වාර්තාව මඟින් නිවැරදි තොරතුරු හෙළිදරව් නොවන බව විගණනයේ දී නිරීක්ෂණය විය. | කළ යුතුය. | කිරීමට උපදෙස් දෙන ලදී. |

## 3.11 පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳපල සංකීර්ණ කළමනාකරණ භාරය

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 2,127,567,170 | 220,536,801 | 1,907,030,369 | (29,620,704) | තත්ත්වාගණනය කළ |
| **2022** | 2,112,203,741 | 224,111,820 | 1,888,091,921 | (17,851,060) | තත්ත්වාගණනය කළ |
| **2023** | 2,083,555,437 | 203,589,493 | 1,879,965,944 | (8,063,877) | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| 1. | රු.81,141,044 ක් වූ ණයගැතියන් සඳහා භාරය විසින් අඩමාණ ණය වෙන් කර නොතිබුණු අතර ණයගැතියන්ගෙන් රු.55,152,854 ක් එනම් ණයගැතියන්ගෙන් සියයට 68 ක ප්‍රමාණයක් වර්ෂ 3 ක් ඉක්මවූ ණයගැතියන් විය. | 2022 | හිඟ ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර කල්ගත වූ ණයගැතියන් සඳහා අඩමාණ ණය වෙන් කළ යුතුය. | අඩමාණ ණය වෙන් කිරීම සඳහා මෙම ණයගැතියන් පිළිබඳ හොඳින් අධ්‍යනය කළ යුතු වේ. මේ පිළිබඳව කමිටුවක් පත්කර ඇති අතර එහි තීරණය අනුව ඉදිරියේ දී කටයුතු කරනු ඇත. | හිඟ ණය ශේෂ අයකර ගැනීමක් සිදු වී නොමැත. |
| 2. | මු.රෙ. 502(2) ප්‍රකාරව ස්ථාවර වත්කම් රෙජිස්ටරයක් පවත්වාගෙන ගොස් නොතිබුණු අතර 2022 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණයක් ද සිදුකර නොතිබුණු බැවින් රු.2,341,721,086 ක් වූ ස්ථාවර වත්කම්වල නිවැරදිතාවය තහවුරු කර ගැනීමට නොහැකි | 2021, 2022 | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන යා යුතු අතර එම වත්කම් සමීක්ෂණය කළ යුතුය. | භාරය මඟින් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යනු ලැබේ. විගණනයෙන් පෙන්වා දී ඇති කරුණු ද සැලකිල්ලට ගෙන එම ලේඛන තවදුරටත් වැඩිදියුණු කිරීමට කටයුතු කරන ලෙස අදාළ විෂයභාර | යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යනු නොලැබේ. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | විය. | | | නිලධාරීන්ට උපදෙස් ලබාදෙන ලදී. තව ද 2022 සහ 2023 වර්ෂයන් සඳහා භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකර ඇත. | |
| 3. | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මඟින් ඇතුළත් කරන ලද මු.රෙ. 876(2)(අ) ප්‍රකාරව අරමුදල තවදුරටත් පවත්වාගෙන යාමට සාධාරණ හේතු ඇත්නම් පාර්ලිමේන්තු පනතක් මඟින් එම අරමුදල නීතිගත කළ යුතු වුවත් මෙම විගණන වාර්තාවේ දිනය දක්වා පාර්ලිමේන්තු අනුමැතියක් ලබාගෙන නොතිබුණි. | 2021, 2022 | පාර්ලිමේන්තු පනතක් මඟින් අරමුදල නීතිගත කිරීමට කටයුතු කළ යුතුය. | අරමුදල පනතක් මඟින් සම්මත කර ගැනීම සඳහා කෙටුම්පතක් සකස් කර අවසන් නිරීක්ෂණය සඳහා නීති නිලධාරි වෙත යොමු කර ඇත. | අරමුදල සඳහා පනතක් සම්මත කර නැත. |
| 4. | 2010 අගෝස්තු 10 දිනැති භාර ඔප්පුවේ වගන්ති 7(ඉ) ප්‍රකාරව භාරයට අයත් තොග වෙළඳසැල් 154 ක් හා සිල්ලර වෙළඳසැල් 128 ක් බදු දීම සඳහා භාර මණ්ඩලය විසින් අනුමත ලිඛිත නිර්ණායක සකස් කළ යුතු වුවත් එබඳු නිර්ණායක සකස් නොකර විනිවිදභාවයකින් තොරව 2011 වර්ෂයේ | 2021, 2022 | වෙළඳසැල් විනිවිදභාවයකින් යුතුව බදුදීම සඳහා ලිඛිත නිර්ණායක හඳුන්වාදිය යුතුය. | කළමනාකරණ භාර අධ්‍යක්ෂක මණ්ඩලයේ තීරණයකට අනුව සාමාජිකයින් 06 දෙනෙකුගෙන් යුතු කමිටුවක් පත්කර ඇත. | වෙළඳසැල් බදු දීමට අදාළ ලිඛිත නිර්ණායක සකස් කර නැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | සිට 2022 වර්ෂය දක්වාම බදුදීම සිදුකර තිබුණි. | | | | |
| 5. | භාරයේ කාර්ය මණ්ඩලය අනුමත වී වසර 6 කට ආසන්න කාලයක් ගත වී තිබුණ ද භාරයේ කළමනාකරු, ගණකාධිකාරි හා අභ්‍යන්තර විගණක යන තනතුරු සඳහා 2022 දෙසැම්බර් 31 වන විටත් බඳවා ගැනීම් සඳහා වන පරිපාටිය අනුමත කරවාගෙන බඳවා ගැනීම් සිදුකර නොතිබුණි. | 2022 | බඳවා ගැනීම් පරිපාටිය අනුමත කරවා ගෙන අනුමත තනතුරුවලට ස්ථිර පදනමින් බඳවා ගැනීම් සිදුකළ යුතුය. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් කාර්ය මණ්ඩලය අනුමත කරවාගෙන ඉන් කොටසක් බඳවාගැනීම් සිදුකර ඇත. | අනුමත තනතුරුවලට බඳවාගෙන නොමැත. |
| 6. | වෙළඳසැල් 128 කින් යුත් සිල්ලර වෙළඳ සංකීර්ණයේ වෙළඳසැල්වලින් 64 ක් 2012 වර්ෂයේ දී රු.9,625,540 ක් වැයකර තොග වෙළඳසැල් බවට පරිවර්තනය කර තිබුණි. විගණිත දිනය වූ 2022 දෙසැම්බර් 31 දින වන විටත් එම සංකීර්ණයේ සිල්ලර වෙළඳසැල් 35 ක් සහ පරිවර්තනය කළ තොග වෙළඳසැල් 9 ක් අලෙවි කටයුතු සඳහා යොදා ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2021 | අලෙවි කටයුතු සඳහා යොදා නොගත් වෙළඳසැල් මෙහෙයුම් කටයුතු සඳහා යොදාගත යුතුය. | අදාළ වෙළඳ කුටි පිළිබඳ සොයා බලා සුදුසු ඉල්ලුම්කරුවන් වෙත ලබාදීමට කටයුතු සිදුකරනු ලබයි. | අදාළ වෙළඳසැල් කුලියට දීමට නොහැකි වී ඇත. |

## 3.12 කැලෑ දෙපාර්තමේන්තු අරමුදල

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 228,229,472 | - | 228,229,472 | 18,927,751 | තත්ත්වාගණනය කළ |
| **2022** | 229,673,194 | - | 229,673,194 | 1,443,722 | අභිතකර |
| **2023** | 258,217,616 | - | 258,217,616 | 27,950,146 | අභිතකර |

| | **විගණන නිරීක්ෂණය** | **වාර්තාවේ වර්ෂය** | **විගණකාධිපති නිර්දේශය** | **විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග** | **වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය** |
|---|---|---|---|---|---|
| 1. | ත්‍යාග වටිනාකම් ප්‍රමාණවත් නොවීම, අරමුදලේ කාර්යයන් කාර්යක්ෂමව පවත්වාගෙන යාම කෙරෙහි අවධානය යොමු නොකිරීම, තෑගි මුදල් ගෙවීම ප්‍රමාද වීම, වන ආරක්ෂණය සඳහා කළයුතු වියදම් කාලීනව හඳුනාගෙන නොතිබීම යනාදි කරුණු අනුව අරමුදලේ අරමුණ නිසි පරිදි ඉටු නොවී අරමුදල තුළ විශාල මුදලක් රැස් වී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එම මුදල රු.251,648,896 ක් විය. | 2023 | අරමුදල පිහිටුවීමේ අරමුණු මනා අයුරින් ඉටු කිරීමට කටයුතු කළ යුතුය. | ත්‍යාග අයදුම් කළ සියලු නිළධාරීන්ට මේ වන විට අරමුදලෙන් ගෙවීම් කර ඇත. අරමුදල කාර්යක්ෂමව උපයෝජනය සම්බන්ධව සැලසුම් සකස් කරමින් පවතී. | 2024 සැප්තැම්බර් 30 දින දක්වා ත්‍යාග වටිනාකම් සම්බන්ධයෙන් සමාලෝචනය කර නොතිබීම, අරමුදලේ කාර්යයන් කාර්යක්ෂමව පවත්වාගෙන යාම කෙරෙහි අවශ්‍යතා හඳුනාගෙන නොතිබීම, වන ආරක්ෂණය සඳහා කළයුතු වියදම් කාලීනව හඳුනාගෙන නොතිබීම පැවතීමෙන් අරමුදල තවදුරටත් කාර්යක්ෂමව උපයෝජනය වී නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2. | අරමුදලේ ප්‍රධාන ආදායම් ප්‍රභවය වූ උසාවි දඩ මුදල් උපචිත පදනමට ගිණුම්ගත කිරීම අරමුදලේ ප්‍රතිපත්තිය වුවද, ක්‍රියාකිරීම අවසන් කළ නඩු වෙනුවෙන් අයවිය යුතු සියළු දඩ මුදල් උසාවි මගින් ප්‍රේෂණය කර තිබේ ද යන්න පිළිබඳ පසු විපරම් ක්‍රියාවලියක් ක්‍රියාත්මක කර නොතිබුණි. | 2023 | අවසන් වු නඩු වෙනුවෙන් ලැබිය යුතු උසාවි දඩ මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. | නඩු සම්බන්ධ වාර්තාවක් ආරක්ෂණ හා නිති ක්‍රියාත්මක කිරිමේ අංශය විසින් නඩත්තු කරනු ලබයි. තවද එම විස්තර සමඟ අවසන් වූ නඩුවලට අදාල තැගි අරමුදල් ලැබීම් පිලිබඳ තොරතුරු සමඟ සැසදීම සිදු කරයි. උසාවි මගින් තැගි අරමුදල සඳහා ලැබිය යුතු මුදල් ගෙන්වා ගැනිමට අවශ්‍ය කටයුතු සිදු කරයි. | අවසන් කළ නඩු වෙනුවෙන් අයවිය යුතු දඩ මුදල් පිළිබඳ තොරතුරු මාසිකව දිසා වන කාර්යාල වලින් ලබා ගැනීමට 2024 සැප්තැම්බර් 30 කටයුතු කර නොතිබීමෙන් පසු විපරම් ක්‍රියාවලියේ ප්‍රගතිය පරීක්ෂා කිරීමට නොහැකි විය. |
| 3. | අරමුදල ආරම්භයේ සිටම වාර්ෂික කාර්යසාධන වාර්තා සකස් කර පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි. | 2023 | වාර්ෂික කාර්යසාධන වාර්තා පිළියෙල කොට පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කළ යුතුය. | 2023 වර්ෂය සඳහා කාර්ය සාධන වාර්තාව සකස් කර ඇති අතර එය පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කරමින් පවති. | 2024 සැප්තැම්බර් 30 දින දක්වා 2023 කාර්ය සාධන වාර්තාව පාර්ලිමේන්තුවෙහි සභාගත කර නැත. |

## 3.13 වන සත්ව සංරක්ෂණ අරමුදල

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 8,543,424,383.00 | 201,306,195.00 | 8,342,118,187.00 | (710,716,619.00) | තත්වාගණනය කළ |
| **2022** | 9,038,278,706.00 | 422,528,193.00 | 8,615,750,512.00 | 248,108,226.00 | තත්වාගණනය කළ |
| **2023** | 11,788,201,481.00 | 585,497,888.00 | 11,202,703,593.00 | 2,517,770,342.00 | තත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්වය |
|---|---|---|---|---|---|
| 1. | මුදල් රෙගුලාසි 625(3) ප්‍රකාරව විදේශීය පුද්ගලයකු විසින් පරිත්‍යාග වශයෙන් සෘජුවම දෙපාර්තමේන්තු බැංකු ගිණුමට බැර කරන ලද රු.10,079,912 ක මුදලක් මුදල් රෙගුලාසිවල විධිවිධාන අනුගමනය කිරීමකින් තොරව වන සත්ත්ව සංරක්ෂණ අරමුදලට ආදායමක් වශයෙන් ගිණුම්ගත කර තිබුණි. | 2021 | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | විදේශ සම්පත් දෙපාර්තමේන්තුවෙන් ලැබෙන උපදෙස් හා ගැසට් පත්‍රයේ කරුණුද සැලකිල්ලට ගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. | 2024 සැප්තැම්බර් 30 දින වන විටත් පරිත්‍යාග සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| 2. | අලි අගල් කැපීම සඳහා අදාළ නොවන ගොඩනැගිලි ඉදිකිරීමේ රේටයන් පදනම් කරගෙන ඇස්තමේන්තු සකස් කර තිබීම හේතුවෙන් වාරිමාර්ග රේටය සමඟ සැසඳීමේදී කියුබික් මීටරයක් | 2021 | නියමිත රේටයන් භාවිතා කර ඇස්තමේන්තු සකස් කළ යුතුය. | ඉදිරියේදී ඇස්තමේන්තු සකස් කිරීමේදී නියමිත රේටයන් භාවිතා කරන ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කරඇත. | අලි අගල් කැපීම මේ වන විට නවතා ඇති අතර ඉදිරියේදී මෙවැනි කාර්යයන් වලදී නියමිත රේටරයන් භාවිතා කරන ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කර ඇත. එසේ වුවද වැඩිපුර ගෙවා තිබූ |

| | | | | | |
|---|---|---|---|---|---|
| | රු.312 කින් ඇස්තමේන්තුව වැඩි වී තිබුණු අතර ඉංජිනේරු ඇස්තමේන්තුව රු.49,534,056 කින් වැඩියෙන් සිදුකර තිබුණි. මේ හේතුවෙන් කියුබික් මීටර් 91,278.09 ක් සඳහා නියමිත පිරිවැයට වඩා රු.28,478,736 ක් ගෙවා තිබුණි. | | | | මුදලින් අරමුදලට පාඩුවක් සිදු වී තිබුණි. |
| 3. | 1982 අංක 41 දරන වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතේ 469 වන අධිකාරයේ(6)(1)(ඇ) වගන්තිය ප්‍රකාරව ජාතික උද්‍යානයක් තුල යම් පැළෑටියක් කැපීම, පොතු ගැසීම, සිඳීම, බැඳීම, පිළිස්සීම හෝ යම් ආකාරයකින් එයට හානි කිරීම් හෝ එය විනාශ කිරීම නොකළ යුතු වුවද අලිවැට ඉදි කිරීමේදී ගස් විශාල ප්‍රමාණයෙන් ඉවත් කර තිබුණු අතර ඒ පිළිබඳව සමීක්ෂණය කර ඉවත් කළ යුතු ගස් ප්‍රමාණය හඳුනාගෙන ඒවා ඉවත් කිරීමට අවශ්‍ය අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | 2021 | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ඉදිරි ව්‍යාපෘති සිදු කිරීමේදී පනතේ නියෝග ප්‍රකාරව කටයුතු කරන ලෙස නිලධාරීන් වෙත උපදෙස් ලබා දීඇත. | යෝජිත ලුණුගම්වෙහෙර අලි රැඳවුම් මධ්‍යස්ථානය අගල් කැපීමට පෙර ශක්තිමත් විදුලි වැටක් ඉදිකිරිම සඳහා හඳුනාගත් විදුලි වැට මාර්ගය ශුද්ධ කිරීමේදී ගස්වලට අවම හානී වන පරිදි ලඳු කැලෑ වගා තණ බිම් පිට්ටනි ඔස්සේ විදුලි වැට මාර්ගය ශුද්ධ කර ඇත. ඒසේම පනත ප්‍රකාරව කටයුතු කරන ලෙස නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| 4. | 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23(ප) වගන්තියෙන් සංශෝධිත 1995 පෙබරවාරි 16 දිනැති අංක 859/14 දරන ගැසට් පත්‍රයේ පළ කර ඇති විධිවිධාන ප්‍රකාරව රක්ෂිත ප්‍රදේශයන් එළිපෙහෙලි කිරීම හා ව්‍යාපෘතියක් සිදු කිරීමට පෙර පාරිසරික ඇගයුම් වාර්තාවක් ලබා ගත යුතු වුවත් මේ පිළිබඳව පාරිසරික ඇගයුම් වාර්තාවක් ලබා ගෙන නොතිබුණි. | 2021 | පනත ප්‍රකාරව පාරිසරික ඇගයීම් වාර්තාවක් ලබා ගැනීමට කටයුතු කළ යුතු අතර අලි වැටට අදාළ පාරිසරික වාර්තාව අලි අගල සඳහා යොදා ගැනීමට කටයුතු නොකළ යුතුය. | ඉදිරි ව්‍යාපෘති සිදු කිරීමේදී පනතේ නියෝග ප්‍රකාරව කටයුතු කරන ලෙස නිලධාරීන් වෙත උපදෙස් ලබා දීඇත. | අගල් කැපීමට පෙර විදුලි වැට ඉදිකිරීම සඳහා පරිසරයට අවම හානි වන පරිදි විදුලි වැට මාර්ගය ශුද්ධ කිරීමට කටයුතු කර තිබීම හේතුවෙන් අගල් කැපීමට පාරිසරික ඇගයීමක් සිදුකර නොතිබුණි. |
| 5. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 137(5) ප්‍රකාරව සැපයීම් සම්බන්ධයෙන් වන අවස්ථාවලදී ඒවා පරීක්ෂා කර නිවැරදි ලෙස භාර ගෙන තිබෙන බවට ගෙවීම් අනුමත කරන නිලධාරියා සෑහීමකට පත් විය යුතු වුවත් අලිවැට ඉදි කිරීම සඳහා රේල්පීලි කොටස් 4,333 ක් ලබා ගැනීම සඳහා රු.15,815,099 ක් භාණ්ඩ ලැබීමට පෙර ගෙවා තිබුණු අතර 2022 අප්‍රේල් වන | 2021 | මුදල් රෙගුලාසි සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මෙම මුදල රේල්පීලි ප්‍රවාහනය සඳහා දුම්රිය දෙපාර්තමේන්තුව වෙත ලබා දී ඇත. හැකි ඉක්මනින් රේල් පීලි ලබා ගැනීමට කටයුතු කරන අතර, ඉදිරියේදී විගණනයේ උපදෙස් අනුව කටයුතු කිරීමට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දීඇත. | මේ දක්වා සපයා ඇති රේල්පීළි 725ට අමතරව තවත් රේල්පීළි 518 ක් දුම්රිය දෙපාර්තමේන්තුව විසින් බෙලිඅත්ත දුම්රිය ස්ථානයට ලබා දී ඇති අතර,ඒවා එම දුම්රිය ස්ථානයේ සිට ලුණුගම්වෙහෙර ජාතික උද්‍යානය වෙත ප්‍රවාහනය කළ යුතුය. ඒ සඳහා ප්‍රවාහන පහසුකම් සපයන ආයතන වෙතින් 2023.07.30 දින මිල ගණන් කැඳවා ඇති අතර 2023.08.14 දිනයට කිසිදු ආයතනයක් |

| | | | | | |
|---|---|---|---|---|---|
| | විටත් සපයා තිබුණේ රේල් පීලි කොටස් 660 ක් පමණක් විය. | | | | වෙතින් මිල ගණන් ඉදිරිපත් නොකළ හෙයින් නැවත මිල ගණන් කැඳවා ලැබුණු ලංසු අනුව එක් ප්‍රවාහන ආයතනයක් තෝරා ගෙන එම ආයතනයට රේල්පීළි ප්‍රවාහනයට කොන්ත්‍රාත්තුව 2023 සැප්තැම්බර් 02 දින ලබා දී ඇත. දුම්රිය දෙපාර්තමේන්තුව විසින් රේල්පීළි ගලවා ඉවත්කර එකතු වන පරිදි ඉතිරි රේල්පීළි ලබා දීමට කටයුතු කරමින් පවතී. |
| 6. | 2009 අංක 22 දරන වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක (සංශෝධන) පනතේ II වන උපලේඛනයට ඇතුළත් වන දැඩි ලෙස ආරක්ෂිත ක්ෂීරපායී සතුන් සහ උරගයින් වර්ගයට අයත් කැස්බෑවන්, තල්මසුන් සහ ඩොල්ෆින් සතුන් 439 ක් පර්ල් එක්ස්ප්‍රස්වේ නෞකාව ගිනි ගැනීම හේතුවෙන් මිය ගොස් තිබුණි. මිය ගිය සතුන් සොයා ගැනීමේ පරීක්ෂණ වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් රු.2,378,249 | 2021 | මෙම මුදල් ප්‍රතිපූර්ණය කර ගැනීමට සහ විධිමත් පරිදි ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. | මෙම මුදල වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ප්‍රතිපූර්ණය කර දෙන ලෙස මහා භාණ්ඩාගාරයට හා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ සභාපති වෙත පිටපත් සහිතව නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම් වෙත මගේ අංක WL/06/04/66(වෙළුම ii) හා 2023.06.15 දිනැති ලිපිය මඟින් දන්වා ඇත. එසේම සමුද්‍රීය පරිසර | 2024 සැප්තැම්බර් 30 දින වන විටත් අදාළ මුදල ප්‍රතිපූර්ණය කර ගෙන නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ක් දරා තිබුණද එම මුදල ප්‍රතිපූර්ණය කර ගැනීමට 2022 අප්‍රේල් වන විටත් කටයුතු කර නොතිබුණි. එසේම එම මුදල ලැබිය යුතු මුදලක් ලෙස අරමුදලේ ගිණුම්වල දක්වා නොතිබුණි. | | | ආරක්ෂණ අධිකාරියේ සභාපතිගේ අංක 06/MEPA/ 03/EC /2023 හා 2023.06.23 දිනැති ලිපිය අනුව, මෙම මුදල් භාණ්ඩාගාරයෙන් මෙම දෙපාර්තමේන්තුව වෙත සෘජුවම ලබා ගැනීමට හැකියාවක් පවතී නම් එය වඩා යෝග්‍ය බවත්, එම මුදල් ලබා ගැනීමට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් භාණ්ඩාගාරය දැනුවත් කොට මුදල් ලබා ගැනීමට විමසීම් සිදු කිරීම වඩා සුදුසු බවත්, එම අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2023.06.23 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී උපදෙස් ලබා දී ඇත. | |
| 7. | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ පවතින ජාතික රක්ෂිත ප්‍රදේශ සඳහා ඇතුල්වීමේ ගාස්තු 2022 අගොස්තු 08 දිනැති අංක 2292/11 දරන ගැසට් පත්‍රය මඟින් එදින පටන් සංශෝධනය කර තිබුණ ද, එම ගාස්තු සංශෝධනය 2022 සැප්තැම්බර් මස 02 | 2022 | ගැසට් පත්‍රයේ සඳහන් දිනයේ සිට සංශෝධිත ගාස්තු අය කළ යුතුය. | ඉදිරි සංශෝධන වලදී ගැසට්පත්‍රය අනුමත කරනු ලබන දින සිටම සංශෝධිත ගාස්තු අයකිරීමට කටයුතු කරනු ලැබේ. | ඉදිරි සංශෝධනවලදී ගැසට්පත්‍රය අනුමත කරනු ලබන දින සිටම සංශෝධිත ගාස්තු අය කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | වන දින සිට අදාළ කර ගෙන ඒ දක්වා පැරණි ගාස්තුව අය කර තිබීම හේතුවෙන් පරීක්ෂාවට ලක්කළ යාල, කුමන, ලාහුගල, මාදුරු ඔය, ගල්ඔය, විල්පත්තුව, ගැල්වෙස්ලෑන්ඩ් යන ජාතික උද්‍යාන 07 ක පමනක් එම කාලයට අදාළව රු.16,844,205 ක ආදායමක් අහිමි වී තිබුණි. | | | | |
| 8. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3 මාර්ගෝපදේශය ප්‍රකාරව මූලික පාරිසරික පරීක්ෂණයක්, පාරිසරික බලපෑම් තක්සේරුවක් සහ සමාජයීය බලපෑම් තක්සේරුවක් සිදු නොකර රු.241,229,637 ක කොන්ත්‍රාත් වටිනාකමකට අනුරාධපුර දිස්ත්‍රික්කයේ කලාප අංක 01 සඳහා කිලෝමීටර් 123 ක දිගින් යුත් විදුලිවැට ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබීම හේතුවෙන් විදුලි වැට ඉදිකරගෙන යාමේදී මහජන විරෝධතා, අලිමංකඩ අවහිර වීම්, ඉඩම් ගැටලු ඇති වීම යනාදී කරුණු මත | 2022 | අයවිය යුතු මුදල් අයකර ගැනීමටත්, ව්‍යාපෘතිය ඵලදායී ආකාරයට අවසන් කිරීමටත් කටයුතු කළ යුතු අතර සියලුම ගෙවීම් වවුචර්වලින් සනාථ විය යුතුය. | කාර්යසාධන බැඳුම්කරය හා අත්තිකාරම් බැඳුම්කරය කල් ඉකුත් වන 2021.12.31 දිනට ප්‍රථම එම බැඳුම්කර නිදහස් කර මුදල් ලබා දෙන ලෙස ඉල්ලා ලංකා බැංකුවෙහි ශාඛාව වෙත ඉදිරිපත් කරන ලදී. එහිදී කොන්ත්‍රාත්කරු අධිකරණයෙන් වාරණ නියෝගයක් ලබා ගෙන එය දෙපාර්තමේන්තුවට ගෙවීම නවතා ඇත. අධිකරණ තීරණය මත එම ඇපකර මෙම දෙපාර්තමේන්තුව වෙත ලබා ගැනීමට කටයුතු කරන අතර, ඉදිරි ව්‍යාපෘති වලදී මෙවැනි අඩුපාඩු සිදු නොවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග | අධිකරණ තීරණය මත ඉදිරියේදී එය ලබා ගැනීමට කටයුතු කරමින් සිටී. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 2020 ජනවාරි 28 දින වැඩ අවසන් කළ යුතුව තිබූ කොන්ත්‍රාත්තුවේ භෞතික ප්‍රගතිය සියයට 37 ක් ව තිබියදී අතරමග නවතා දමා තිබුණි. මෙම කොන්ත්‍රාත්තුව සඳහා ලබා දී තිබුණු වැඩ මූලික අත්තිකාරමෙන් රු.28,327,073 ක් අය විය යුතුව තිබියදී ඒ සඳහා ලබා ගෙන තිබූ රු.48,245,927 ක බැදුම්කරය 2021 දෙසැම්බර් 31 දින කල් ඉකුත් වී යාමට ඉඩ ලබා දී තිබුණු අතර කාර්යසාධන ඇපකරය රජයට පවරා ගැනීමට එරෙහිව අදාළ කොන්ත්‍රාත්කරු විසින් 2021 නොවැම්බර් 16 දින අධිකරණයේ නඩු පවරා තිබුණි. | | | ගනුලැබේ. | |
| 9. | 2020 අගෝස්තු 28 දිනැති අංක 1/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි අංක 877 (1)(ඇ) ඡේදය ප්‍රකාරව අරමුදලේ 2023 වර්ෂයේ අයවැය ලේඛනය සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | 2023 | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ඉදිරියේදී විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලද අයවැය ලේඛනය මුදල් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ඇත. | 2024 සැප්තැම්බර් 30 දින වන විටත් 2024 අයවැය ලේඛනය මහා භාණ්ඩාගාරයේ අනුමැතිය සඳහා යවා නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| 10. | උඩවලව ප්‍රදේශයේ මීටර් 500 කට ඇතිරීම සඳහා වනඅලි සංචරණ බාධක තැටි 6,000 ක් සහ කිලෝමීටර් 1,500 ක් දිග විදුලි වැට ඉදි කිරීම සඳහා අවශ්‍ය උපකරණ රු.87,308,715 කට දින 90 ක් තුළ රාජ්‍ය සමාගමක් වෙතින් සපයා ගැනීම සඳහා 2021 මාර්තු 15 දින අමාත්‍ය මණ්ඩල තීරණයක් ලැබී තිබුණි. ඒ අනුව රු.13,436,932 ක් වටිනා අයිතම පමණක් ලැබී තිබුණු අතර ඒවායේ තත්ත්ව පරීක්ෂාවන් සිදු කිරීමෙන් තොරව භාර ගැනීම නිසා සවි කිරීමට නොහැකිව ගබඩා කර තිබූ ස්ථානවල කැඩී බිඳී විනාශ වී ගොස් තිබුණි. නියමිත පරිදි සැපයුම් සිදු නොකිරීම නිසා 2022 දෙසැම්බර් 30 දින කොන්ත්‍රාත්තුව අවලංගු කර තිබුණු අතර ලබා දුන් වැඩ මූලික අත්තිකාරම් මුදල වූ රු.8,017,640 ක් ඊට අදාළ අත්තිකාරම් බැඳුම්කරයෙන් හෝ පියවා ගැනීමට නොහැකි වී තිබුණි. | 2023 | අය වීමට ඇති මුදල කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | තවදුරටත් අයවීමට තිබෙන මුදල් අයකර ගැනීම සඳහා අමාත්‍යාංශ මට්ටමින් උපදෙස් ඉල්ලා ඇත. එසේම ඉදිරියේදී මෙවැනි ප්‍රසම්පාදන ප්‍රසිද්ධ දැන්වීම් මඟින් මිල ගණන් කැඳවා සිදු කිරීමට කටයුතු කරනු ඇත. | අදාළ භාණ්ඩ කැඩී බිඳී විනාශ වී ගොස් තිබුණු අතර 2024 සැප්තැම්බර් 30 දින වන විටත් රු.8,017,640 ක මුදලක් අයකර ගෙන නොතිබුණි. |

## 3.14 සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධන අරමුදල

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | බදු පෙර ලාභය (අලාභය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 5,046,011,763.00 | 131,333,630.00 | 4,914,678,133.00 | (558,081,259.00) | තත්වාගණනය කළ |
| **2022** | 5,009,820,177.00 | 229,158,427.00 | 4,780,661,750.00 | (429,958,380.00) | තත්වාගණනය කළ |
| **2023** | 4,845,017,826.00 | 232,860,893.00 | 4,612,156,933.00 | (187,636,878.00) | තත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්වය |
|---|---|---|---|---|---|
| 1. | 2020 වර්ෂයේදී රු.මිලියන 66 ක වියදමකින් විදේශීය පක්ෂීන් 136 දෙනෙකු මිලදී ගෙන තිබුණු අතර මෙම පක්ෂීන් ප්‍රදර්ශනය කිරීම සඳහා ඉදිකිරීමට අපේක්ෂිත හම්බන්තොට සෆාරි උද්‍යානයේ පක්ෂි අරණෙහි ඉදිකිරීම් කටයුතු සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අවසන් කර නොතිබුණි. මේ හේතුවෙන් පක්ෂීන් 57 දෙනෙකු ප්‍රදර්ශනය කිරීමකින් තොරව සෆාරි උද්‍යානයේ වෙනත් කූඩුවල රඳවා තිබුණි. | 2021,2022,2023 | විශාල වියදමක් දරමින් පක්ෂීන් මිලදී ගැනීමේ අරමුණ ඉටු වන පරිදි එම පක්ෂීන් ප්‍රදර්ශනය කර ආදායම් ඉපයීමටත් එම පක්ෂීන් ආරක්ෂා කර වර්ධනය කර ගැනීමටත් කටයුතු කළ යුතුයි. | විදේශීය පක්ෂි අරණ ඉදිකිරීම සඳහා ආනයනය කළ යුතු දැල් හා කේබල් වල මිල මේ වන විට ඇස්තමේන්තු ගත මුදල මෙන් තුන් ගුණයක් පමණ ඉහළයාම නිසා ඇස්තමේන්තු යළි සැකසීම ඉංජිනේරු කටයුතු පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය වෙත පවරා ඇත. 2024 වසර තුළ විදේශීය පක්ෂි අරණ ව්‍යාපෘතිය යළි ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය. | ආනයනය කරන ලද නෙට් සහිත කූඩුවක් තුළ මෙම පක්ෂීන් ප්‍රදර්ශනය කර ආදායමක් ඉපයීම අරමුණු කරගෙන මෙම පක්ෂීන් මිලදී ගැනීම සිදුකළද 2024 සැප්තැම්බර් 30 වන විටත් එම අරමුණ ඉටුවන පරිදි පක්ෂීන් ප්‍රදර්ශනය කර නොතිබුණි. |
| 2. | ලෝක සත්වෝද්‍යාන හා මින් මැදුරු පිළිබඳ සංගමය විසින් 2015 වර්ෂයේදී | 2022 | මරණ පරීක්ෂණ නොපැවැත්වීමට හේතු දක්වමින් මිය ගිය සතුන් පිළිබඳ | මියයන සියලු සතුන් සඳහා මරණ පරීක්ෂණ පැවැත්වීමට කටයුතු | මරණ පරීක්ෂණ නොකිරීමට හේතු දක්වමින් මිය ගිය සතුන් පිළිබඳ |

| | | | | | |
|---|---|---|---|---|---|
| | යාවත්කාලීන කරන ලද සත්ව සුභසාධන උපාය මාර්ගයන්හි ඇතුළත් ආචාරධර්ම පද්ධතියේ 11 වන ඡේදය ප්‍රකාරව රැකවරණය තුළ සිටින සත්වයන්ගේ මරණ සම්බන්ධයෙන් මරණ පරීක්ෂණයක් සිදු නොකිරීමට ප්‍රබල හේතුවක් ඇති අවස්ථාවකදී හැර අනෙකුත් සෑම අවස්ථාවකදීම මරණ පරීක්ෂණයක් සිදු කළ යුතුය. එසේ වුවද, 2021 වර්ෂයේ වර්ග 13 කට අයත් සතුන් 18 දෙනෙකුගේ මරණවලට ප්‍රබල හේතුවක් ඇති බවට සනාථ කර නොතිබුණු අතර මරණ පරීක්ෂණයන් ද සිදු කර නොතිබුණි. | | වාර්තා පවත්වා ගත යුතුය. | සිදු කරමින් පවතී. | නිවැරදි වාර්තා පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| 3. | 2021 වර්ෂයේ දී නිකුත් කරන ලද සත්ව තක්සේරු වාර්තාවෙහි සත්ව මරණ 13 ක් ඇතුළත් කර නොතිබීමත්, මිය ගිය සත්ව වර්ග 09 ක ප්‍රමාණයන්හි වෙනස්කම් පවතින බවට නිරීක්ෂණය වීමත් හේතුවෙන් සත්ව තක්සේරු වාර්තාවෙහි ඇතුළත් සත්ව මරණ සංඛ්‍යාව නිවැරදි බවට සනාථ කළ නොහැකි විය. | 2022 | මරණ පරීක්ෂණ නොපැවැත්වීමට හේතු දක්වමින් මිය ගිය සතුන් පිළිබඳ වාර්තා පවත්වා ගත යුතුය. | මිය යන සියලුම සතුන් සඳහා මරණ පරීක්ෂණ පැවැත්වීමට කටයුතු කරනු ඇත. වාර්තා පවත්වාගේන යාමේදී සිදු වූ ප්‍රමාද දෝෂයන් මඟ හරවා ගැනීමට කටයුතු කරනු ලැබේ. | සත්ව මරණ සංඛ්‍යාව නිවැරදි බවට සනාථ කිරීම සඳහා වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| 4. | 2015 වර්ෂයේදී යාවත්කාලීන කරන ලද සත්ව සුභසාධන උපායමාර්ගයන්හි ඇතුළත් ආචාරධර්ම පද්ධතියේ 03 වන ඡේදයේ සඳහන් වන ප්‍රදර්ශන ප්‍රමිති ප්‍රකාරව සත්වෝද්‍යානය තුළ සතුන්ට ස්වභාවික හැසිරීම් සඳහා අවශ්‍ය පරිසරය සකස් කර දිය යුතුය. එසේ වුවද, 2022 වර්ෂයේ දෙසැම්බර් මස 20 දින වන විට දෙහිවල සත්වෝද්‍යානය තුළ තම කූඩුව තුළ තනිව ජීවත් වන සත්වයින් 15 දෙනෙක් ද, සහකරුවන් නොමැති සත්වයින් 35 දෙනෙක් හා සහකාරියන් නොමැති සත්වයින් 21 දෙනෙක් ද, සිටින බවට නිරීක්ෂණය වූ අතර 2022 මාර්තු 09 වන දින මිය ගිය ජපන් වඳුරා (ගැහැණු සතෙකු) වසර 15 ක සිට තනිව ජීවත්ව සිටීම නිසා මානසික අවපීඩන තත්ත්වයකට Depressive Condition ගොදුරු වී පිළිකා සෛල Urine Cancer උග්‍ර කිරීමට බලපෑ හැකි බවට පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාවෙහි සඳහන් කර තිබුණි. ඒ අනුව සතුන් තනිව ජීවත් වීම එම | 2021 | ආචාරධර්මන්ට අනුකූල වෙමින් සත්ත්ව සුබසාධනය වැඩි කළ යුතුය. | කොවිඩ් වසංගත තත්වය හමුවේ සත්ත්ව හුවමාරු කටයුතු වසර ගණනාවකින් අඩාල වී තිබූ නමුත් දැනට සත්ත්ව හුවමාරු වැඩසටහන් මඟින් සතුන් සත්වෝද්‍යානය වෙත රැගෙන එමින් පවතී. එසේම තනි තනිව සිටින සතුන් සඳහා විදේශ සත්වෝද්‍යානවලින් සතුන් ගෙන ඒම මේ වන විට ක්‍රියාත්මකව පවතියි.. | මේ වන විට සතුන් ගෙන ඒමේ කටයුතු සිදු වෙමින් පැවතියද නිරීක්ෂණයේ සඳහන් කරුණු සම්පූර්ණයෙන් විසඳී නොමැත. |

සත්වයින්ගේ මානසික හා ශාරීරික සෞඛ්‍යයට දැඩි බලපෑමක් කළ හැකි බවට නිරීක්ෂණය විය.

## 3.15 වෙරළ ආරක්ෂක ත්‍යාග අරමුදල

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 3,561,792 | - | 3,561,792 | (2,079,250) | තත්ත්වාගණනය නොකළ |
| **2022** | 3,215,697 | - | 3,215,697 | (346,095) | තත්ත්වාගණනය කළ |
| **2023** | 2,878,616 | - | 2,878,616 | (337,081) | වියාචනය කළ |

| | විගණන නිරීක්ෂණ | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාව දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්වය |
|---|---|---|---|---|---|
| 1. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 1 හි 21 වගන්තිය ප්‍රකාරව සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් සමන්විත විය යුතු ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයක් ඇතුළත් සටහන් හා අනෙකුත් විස්තරාත්මක සටහන් ඉදිරිපත් කර නොතිබුණි. තවද ලෙජර් ගිණුම් පවත්වා නොගෙන හා උපචිත පදනම අනුගමනය කිරීමෙන් තොරව මුදල් පදනම මත ආදායම් හා වියදම් ගිණුමක් සහ ශේෂ පත්‍රයක් පමණක් පිළියෙල කර තිබුණි. | 2022 2023 | ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කර අරමුදලේ වත්කම්, වගකීම්, ආදායම් හා වියදම්වලට අදාළ ලෙජර් ගිණුම් පවත්වා ඒ ආශ්‍රයෙන් මූල්‍ය ප්‍රකාශන කට්ටලය සකස්කර ඉදිරිපත් කළ යුතුය. | ලෙජර් ගිණුම් පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු කරන ලදී. | අදාල ලෙජර් ගිණුම් පවත්වා ගෙනයන අතරම 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව ගිණුම් කටයුතු පවත්වාගෙන යාමට කටයුතු කරමින් පවතී. |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2017 මැයි 09 දිනැති අංක 2018/11 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කරන ලද 1988 අංක 64 හා 2011 අංක 49 දරන පනත් මඟින් සංශෝධිත 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ පනතේ 31 (ඊ) වගන්තිය අනුව පිහිටුවන ලද වෙරළ ආරක්ෂක ත්‍යාග අරමුදලින් ත්‍යාග ගෙවීම් කිරීමේ මාර්ගෝපදේශ හා උපමාන 1 වගන්තිය ප්‍රකාරව ත්‍යාග අරමුදල වෙත 2014 සිට 2023 වර්ෂය දක්වා බැර කරන ලද රු.15,231,732 ක දඩ මුදලින් ත්‍යාග සඳහා ගෙවිය යුතු මුදල රු.7,615,866 ක් වුවද, එයින් රු.2,878,616ක් ගෙවීමට කටයුතු කර නොතිබුණි. අදාල නඩු පිළිබඳ විස්තර හා ගෙවිය යුතු මුදල් ප්‍රමාණය පිළිබද විස්තර නොතිබීම මේ සඳහා හේතු වී තිබුණි. | 2022<br>2023 | පොලිස් නිලධාරීන්ගේ නාම ලේඛන නියමිත වේලාවට ලබාගැනීමට අවශ්‍ය වැඩපිළිවලක් සකස් කර ගෙවිය යුතු ත්‍යාග මුදල් අප්‍රමාදව ගෙවීමට කටයුතු කළ යුතුය. | අදාල තොරතුරු එවන ලෙස දන්වා අදාල ප්‍රාදේශීය කාර්යාල වලට ලිපි යොමු කිරීමට කටයුතු කර ඇත. | නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා එවා ඇත |
| 3. | ත්‍යාග අරමුදල විසින් පවත්වාගෙන යන බැංකු ජංගම ගිණුම අනුව 2016 වර්ෂයේ | 2023 | පොලිස් දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කර ගෙවිය යුතු ත්‍යාග | නාම ලේඛන ගෙන්වා ගෙන ගෙවීම් කිරීමට කටයුතු කරමින් | ලැබී ඇති නාම ලේඛන අනුව ගෙවීම් කටයුතු සිදුකරමින් පවතින |

| | | | | | |
|---|---|---|---|---|---|
| | සිට 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය දක්වා කාලය තුළ අරමුදලෙන් කළ යුතු ගෙවීම් නිසි වේලාවට සිදු නොකිරීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දින වන විට ඉතිරි මුදල් ශේෂය රු. මිලියන 2.8 අධික විය. | | මුදල් ගෙවීමට කටයුතු කළ යුතුය. | පවතී. | අතර අනෙකුත් ගෙවීම් කිරීමට අදාල නිලධාරිගේ නාම ලේඛන ගෙන්වා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පැවතුණි. |
| 4. | අධිකරණ මඟින් එවා ඇති දඩ මුදල් පිළිබඳව හා පොලිස් ස්ථානාධිපතිවරුන් විසින් එවා ඇති ත්‍යාග මුදල් පිළිබඳව තොරතුරු ඇතුලත් ලේඛන වල සඳහන් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර ඇති ලැබීම් හා ගෙවීම් ගිණුම් සමඟ නොසැසඳීම, ලේඛන යාවත්කාලීන කර නොතිබීම, ගෙවීම් පිළිබඳ විස්තර පොදු තැන්පතු ලේඛනයේ සටහන් කර යාවත්කාලීන වී නොතිබීම යනාදී දෝෂ හේතුවෙන් ලැබීම් හා ගෙවීම් සම්බන්ධ අභ්‍යන්තර පාලනය සතුටුදායක නොවීය. | 2023 | ලේඛන වල නිවැරදි තොරතුරු ඇතුළත් කර යාවත්කාලීන කිරීමටත්, ගෙවීම් පිළිබඳ විස්තර පොදු තැන්පතු ලේඛනයේ සටහන් කිරීමටත්, පොදු තැන්පතු ලේඛනයේ සටහන් කර ඇති තොරතුරු ලැබීම් හා ගෙවීම් ලේඛනයේ ඇතුළත් කර ලැබීම් හා ගෙවීම් සම්බන්ධ අභ්‍යන්තර පාලනයක් ඇති කර ගැනීමටත් කටයුතු කළ යුතුය. | ලේඛන නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතී. | වෙරළ ආරක්ෂක ත්‍යාග අරමුදල ගෙවීම් සඳහා නම් කර ඇති නිලධාරීන්ගේ නම් හා තොරතුරු අදාල ලේඛන වල සටහන් කිරීමට කටයුතු කරමින් පවතී. |
| 5. | වරදකරුවන්ගෙන් අධිකරණ විසින් අයකරගනු ලබන සියළුම දඩ මුදල්, | 2022 2023 | නඩු කටයුත්ත අවසන් වූ වහාම අධිකරණය මඟින් දඩ මුදල් ලබාගෙන | දෙපාර්තමේන්තුව වෙත යොමු කර නොමැති දඩ මුදල් ගෙන්වා ගැනීමට | දෙපාර්තමේන්තුව වෙත යොමු කර නොමැති දඩ මුදල් ගෙන්වා ගැනීමට |

| | | | |
|---|---|---|---|
| අරමුදල වෙත අයකර ගැනීමටත්, එසේ අරමුදලට බැරවන මුදල් අදාළ පාර්ශව වෙත ත්‍යාග වශයෙන් වෙන්කර ලබාදීම සඳහාත් මහේස්ත්‍රාත් අධිකරණ, පොලිස් දෙපාර්තමේන්තුව හා වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව අතර තොරතුරු හුවමාරු කිරීමේ නිසි ක්‍රමවේදයක් නොතිබුණි. මේ හේතුවෙන් අධිකරණවලින් ලැබිය යුතු දඩ මුදල් සහ ත්‍යාග ලබා දිය යුතු පුද්ගලයින් පහසුවෙන් හා කඩිනමින් හඳුනාගෙන අදාළ තොරතුරු ලබාගැනීමටත්, භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කළ යුතු සියයට 40 ක දඩ මුදල් ප්‍රමාණය නිසි වේලාවට ප්‍රේෂණය කිරීමට නොහැකි වී ඇති බවටත් නිරීක්ෂණය විය. | ප්‍රමාදයකින් තොරව දඩ මුදල් ගෙවීම සඳහා පළාත් සභාව හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් අතර නිසි තොරතුරු හුවමාරු කර ගැනීමේ ක්‍රමවේදයක් සකස් කළ යුතුය. | අවශ්‍ය කටයුත මේ වන විට සිදු කරමින් පවතී. | අවශ්‍ය කටයුතු සිදු කරමින් පැවතුණද කාලීනව දඩ මුදල් ගෙන්වා ගැනීම හා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීම සිදුවී නොතිබුණි. |

### 3.16 සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදල

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 10,925,251,737 | 3,659,562 | 10,921,592,175 | (1,518,333,556) | තත්ත්වාගණනය කළ |
| **2022** | 12,244,673,402 | 126,968 | 12,244,546,433 | 1,328,591,826 | තත්ත්වාගණනය කළ |
| **2023** | 14,678,059,783 | 266,143 | 14,677,793,639 | 2,329,823,803 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතනය විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්වය |
|---|---|---|---|---|---|
| 1. | සමෘද්ධි සමාජ සංවර්ධන භාර අරමුදලේ භාර ඔප්පුවේ (සාධන පත්‍ර අංක 08) 6 (9) ඡේදයට අනුකූල නොවන ලෙස භාරකාර මණ්ඩල සභාපති වශයෙන් කටයුතු කරන සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් භාරකාර මණ්ඩල රැස්වීම් සඳහා ලබා ගන්නා දීමනාවට අමතරව 2020 පෙබරවාරි සිට සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් දක්වා රු. 984,323 ක් එනම් දෙපාර්තමේන්තුවේ නිත්‍ය තනතුරෙහි මූලික වැටුපෙන් ¼ ක් රාජකාරි ඉටු කිරිම වෙනුවෙන් වැඩ | 2022-3.1<br>2023-3.3 | අරමුදලේ භාර ඔප්පුව අනුව වැඩබැලීමේ දීමනාවක් නොගෙවිය යුතු අතර ඊට අනුකූල නොවන ලෙස හෝ මුදල් අයකල යුතුය. | මෙම දීමනා ගෙවීමට අදාලව ඉදිරියේ දී ඇති වන අවශ්‍යතාවයන් අනුව අවස්ථානුකූලව භාරකාර ඔප්පුව සඳහා සිදු කල යුතු සංශෝධන එකතු කිරිමට භාරකාර මණ්ඩල උපදෙස් පරිදි සිදු කිරීම. | සංශෝධනයන් මේ දක්වා සිදු කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | බැලීමේ දීමනා ලබාගෙන තිබූ අතර වර්තමාන සභාපතිවරයාද 2023 නොවැම්බර් සිට දෙසැම්බර් මස දක්වා එකතුව රු. 53,887 ක් ඉහත පරිදි වැඩ බැලීමේ දීමනා ලබා ගෙන තිබුණි. | | | | |
| 2. | 2020 අගෝස්තු 28 දිනැති අංක 1/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15 ඡේදයේ ඇතුළත් මුදල් රෙගුලාසි 877(1)(ඇ) ඉදිරි වර්ෂයේ අයවැය ලේඛණය සකස් කොට පවත්නා වර්ෂයේ සැප්තැම්බර් 30 ට පෙර අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය සහිතව මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගැනීම සඳහා ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමුකර එහි පිටපතක් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමුකළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | 2021-.4.2<br>2022- 4.1<br><br>2023-1.7(ඇ) | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුයි. | 2024 වර්ෂයට අදාල අයවැය ලේඛණ සකස් කර, අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය සහිතව මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීම සඳහා දෙපාර්තමේන්තු ප්‍රධාන ගණකාධිකාරි වෙත ඉදිරිපත් කිරීම. | 2024 වර්ෂයට අනුමැතිය ලබාගැනීම සඳහා මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කර ඇත |

### 3.17 සමෘද්ධි අරමුදල

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 2,190,678,505 | - | 2,190,678,505 | 103,549,896 | තත්ත්වාගණනය කළ |
| **2022** | 2,172,617,599 | - | 2,172,617,599 | 194,075,494 | තත්ත්වාගණනය නොකළ |
| **2023** | 2,631,220,651 | 20,769,510 | 2,610,451,140 | 437,833,541 | තත්ත්වාගණනය නොකළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතනය විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්වය |
|---|---|---|---|---|---|
| 1. | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15.1 ඡේදය මගින් ස්ථාපිත කර තිබුණු මුදල් රෙගුලාසි 876(3) අරමුදලක් තව දුරටත් පවත්වා ගෙන යාම අවශ්‍ය නොවේ යැයි පෙනී යන හෝ එම අරමුදල් මඟින් අපේක්ෂිත අරමුණු රජයේ විසර්ජන පනතින් අනුමත කරන රාජ්‍ය අයවැය යටතේ ඉටු කරගත හැකි බව පෙනී යන්නේ නම් එම අරමුදල්වල කටයුතු අවසන් කිරිමට වහාම පියවර ගත යුතු බව දක්වා තිබුණද සමෘද්ධි අරමුදලෙන් වර්ෂ ගණනක සිට ප්‍රමාණවත් කාර්යයක් | 2023-1.5.2<br>2022-1.5.2<br>2021-1.5.3 | චක්‍රලේඛ හා විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අරමුදලට අයවිය යුතු ශේෂ අයකරගත් පසු චක්‍රලේඛය අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව. | චක්‍ර ලේඛය ප්‍රකාරව මේ දක්වා අරමුදල් සම්බන්ධව කටයුතු කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ඉටු නොවුණද චක්‍රලේඛය පරිදි ක්‍රියාකර නොතිබුණි. | | | | |
| 2. | භාණ්ඩාගාර ප්‍රතිපාදන මත 2007 වර්ෂයේ ධීවර හා සත්ව පාලන ව්‍යාපෘති සඳහා නැවත අයකිරීම් පදනම මත සමෘද්ධි ප්‍රතිලාභීන්ට ණය ලබාදීම සිදුකර තිබූ අතර අදාළ ණය අයකිරීම් 2007 ජූලි 16 දිනැති අංක ස/අධි/10/ජාස.ගම් දරන චක්‍රලේඛය පරිදි ගම්පුබුදු චක්‍රීය ගිණුමට බැර කිරීමට තිරණය කර තිබුණි. ලැබිය යුතු මුදල් (ධීවර හා සත්ව පාලන) ලෙස රු. 14,947,065 ක ශේෂයක් සමෘද්ධි අරමුදලේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණද සමෘද්ධි බැංකු විසින් මේ දක්වා ප්‍රතිලාභීන්ගෙන් අයකරගත් ණය වාරික හා නැවත නිකුත් කිරීම් පිළිබඳ කිසිදු තොරතුරක් සමෘද්ධි අරමුදලට වාර්තා කර නොතිබුණි. මේ අනුව අරමුදලේ කාර්යයන් වන ආදායම් උත්පාදන ව්‍යාපෘතිවලින් ලැබෙන වාරික හා කුලී ආදායම් ඒකරාශි | 2023-3.1<br>2022-3.1<br>2021-3.1 | හිඟ මුදල් අයකරගැනීමට හා නිවැරදිව ගිණුම්ගත කිරිමට කටයුතු කල යුතුය. | සමෘද්ධි බැංකු විසින් අයකරගත් වාරික හා නැවත නිකුත් කිරීම පිළිබඳ වාරණයක් ලබා දෙන ලෙස බැංකු දැනුවත් කර ඇති බව හා වාරික හා පොලී ප්‍රති ආයෝජනය බැංකු මට්ටමින් සිදුවන අතර එම තොරතුරු වාර්තා කිරීමට පියවර ගැනීම. | ප්‍රතිලාභීන්ගෙන් අයකරගත් ණය වාරික හා නැවත නිකුත් කිරීම් පිළිබඳ මේදක්වා තොරතුරු ලබාගෙන නොමැත. |

කිරිම හා දිවයින පුරා ක්‍රියාත්මක ව්‍යාපෘතිවලින් ලැබෙන ඉහත ආදායම් ආයෝජනය/ ප්‍රති ආයෝජනය කිරිම අරමුදල විසින් ඉටුකර නොතිබුණි.

## 3.18 සමෘද්ධි නිවාස සංවර්ධන අරමුදල

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 2,460,749,786 | 132,671,500 | 2,328,078,286 | 221,057,494 | අහිතකර |
| **2022** | 3,118,384,928 | 134,339,500 | 2,984,045,428 | 652,757,142 | තත්ත්වාගණනය නොකළ |
| **2023** | 3,356,926,086 | 204,484,189 | 3,152,441,897 | 163,400,569 | තත්ත්වාගණනය නොකළ |

| | **විගණන නිරීක්ෂණය** | **වාර්තාවේ වර්ෂය** | **විගණකාධිපති නිර්දේශය** | **විගණිත ආයතනය විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග** | **වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්වය** |
|---|---|---|---|---|---|
| 1. | 2020 අගොස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 877 (1) (ඇ) සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනය සකස්කර තිබුණද අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය සහිතව මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීම සඳහා ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කර එහි පිටපතක් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | 2023-1.6(අ) 2022-1.5(අ) 2021-4.2 | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුයි. | 2024 වසරට අදාළව සැකසූ අයවැය ලේඛනය අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය සහිතව මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීම සඳහා ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කිරීම. | 2024 වර්ෂය සඳහා අනුමැතිය ලබාගැනීම සඳහා මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කර ඇත. |

## 3.19 සේවක අර්ථසාධක අරමුදල

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | බදු පෙර ලාභය (අලාභය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 3,191,743,853,000 | 25,608,073,000 | 3,166,135,780,000 | 340,728,410,000 | තත්ත්වාගණනය කළ |
| **2022** | 3,491,767,852,000 | 31,906,612,000 | 3,459,861,240,000 | 314,051,635,000 | තත්ත්වාගණනය කළ |
| **2023** | 3,895,119,583,000 | 37,713,758,000 | 3,857,405,825,000 | 467,192,949,000 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| 1. | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුල්‍ය ප්‍රකාශන සඳහා වූ ක්ෂය ගණනය කිරීමේ උප ලේඛනය අනුව, සම්පූර්ණයෙන් ක්ෂය අවසන් කර තිබූ ස්ථාවර වත්කම්වල වටිනාකම කම්කරු දෙපාර්තමේන්තුවට හා ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් අංශයට අදාලව පිළිවෙලින් රු.මිලියන 644.89ක් හා රු.මිලියන 167.01ක් විය. එම වත්කම් අතරින් තවදුරටත් භාවිතා කරනු ලබන වත්කම් හඳුනාගෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 51 ඡේදය ප්‍රකාරව වත්කම් සඳහා ඵලදායි ජීවිත කාලය සමාලෝචනය | 2021 2022 2023 | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කල යුතුය. | සම්පූර්ණයෙන් ක්ෂය කර අවසන් වූ ස්ථාවර වත්කම් සඳහා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සුදුසු පරිදි කටයුතු කිරීමටත්, භාවිතයට නොගන්නා ස්ථාවර වත්කම් ඉදිරි වසර තුළදී සුදුසු පරිදි අපහරණය කිරීමටත් සැලසුම් කර ඇති බව | ක්‍රියාත්මක කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | නොකිරීමෙන් සිදු වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 ප්‍රකාරව නිවැරදි කිරීමටත් තවදුරටත් භාවිතයට ගනු නොලබන වත්කම් සුදුසු පරිදි අපහරණය කිරීමටත් කටයුතු කර නොතිබුණි. | | | | |
| 2. | අරමුදල විසින් පවත්වාගෙන යන බැංකු ගිණුම් 09කට අදාලව 2023 දෙසැම්බර් 31 දිනට සකස් කර තිබූ බැංකු සැසඳුම් ප්‍රකාශන අනුව 2001 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදයට අදාලව මුදල් පොතේ සටහන් වූ නමුත් බැංකු ප්‍රකාශයේ සටහන් නොවූ ගනුදෙනු, බැංකු ප්‍රකාශයේ සටහන්වූ නමුත් මුදල් පොතේ සටහන් නොවූ ගනුදෙනු, අගරු වූ චෙක්පත්, ඍජු හර/බැර, පරිගණක ගිණුම්කරණ පද්ධතියේ දෝෂයක් ලෙස 2006 වර්ෂයේ සිට පවතින ශේෂය, තැන්පත් කල නමුත් උපලබ්ධි නොවූ මුදල් ඇණවුම් සහ චෙක්පත් හා නිකුත්කළ නමුත් | 2021<br>2022<br>2023 | දිර්ඝ කාලයක සිට පැවත එන මෙම බැංකු ගිණුම්වල ගනුදෙනු නිරවුල් කිරීමට කළමනාකරණය අවධානය යොමු කල යුතුය. | මේ සම්බන්ධයෙන් විශේෂ ව්‍යාපෘතියක් 2020 වර්ෂයේදී ආරම්භ කර ඇත. එම ව්‍යාපෘතිය මගින් බැංකු ගිණුම් 4කට අදාළ ගැටලු හඳුනාගෙන අදාල බැංකු සැසඳුම් ප්‍රකාශන සහ ගැලපීම් පිළිබඳ විස්තර සකස් කළද ලංකා බැංකුවේ ප්‍රධාන ගිණුමේ නිරවුල් කිරීම් කරන විට මෙම බැංකු ගිණුම් 4 හි තවත් නිරාකරණ වීම් සිදු විය හැකි බැවින් අදාළ ගැලපීම් 2023 අවසන් ගිණුම් සැකසීමට යොදා නොගත් බව සහ 2018 වර්ෂයට පෙර සැසඳීමට නොහැකි වූ ශේෂ සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලබන බව. | නිරවුල් කිරිමේ කටයුතු සිදුකරමින් පැවතියද, 2018 වර්ෂයට පෙර සිට පැවත එන ශේෂ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ඉදිරිපත් නොවූ චෙක්පත් ලෙස ගැලපුම් කල පසු ශුද්ධ ශේෂයන්හි එකතුව රු.මිලියන 4,757.69 ක් නිරවුල් නොකරන ලද ශේෂ ලෙස පැවතුණි. ඉන් රු.මිලියන 1,336.98ක ශුද්ධ ශේෂයක් 2024 අප්‍රේල් 30 වන විටත් නිරවුල් කර නොතිබුණි. මෙම නිරවුල් නොකරන ලද ශුද්ධ ශේෂය තුල ඇතුලත් රු.මිලියන 273.72ක් මුදල් පොතෙහි නිරවුල් නොකල රු.මිලියන 5,175.11ක ගනුදෙනු හා බැංකු ප්‍රකාශනයෙහි නිරවුල් නොකල රු.මිලියන 5,448.83ක ගනුදෙනු එකිනෙකට හිලව් කර දක්වා තිබූ අගයක් වූ අතර එම ශේෂයන් 2018 වර්ෂයට පෙර සිට පැවත එන ශේෂයන් වේ. | | | | |
| 3. | 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව මෝටර් රථ පිරිවැය රු.මිලියන 97.20ක් විය. විගණනය වෙත ලබා දුන් තොරතුරු අනුව අරමුදලින් මේ දක්වා මූල්‍යනය කරන ලද මෝටර් රථ 42ක් පවතින අතර එහි පිරිවැය එකතුව | 2021<br>2022<br>2023 | අරමුලෙහි ප්‍රතිපාදන මඟින් මූල්‍යනය කරන සියලුම වත්කම් අරමුදලෙහි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට ඇතුලත් කළ යුතුය. | දෙපාර්තමේන්තුවට අයත් සියලුම වාහන හඳුනාගෙන එකී වාහන අත්පත් කර ගැනීමේ වැය විෂයය අනුව හෝ පවරා දීම අනුව නිවැරදි වාහන සංඛ්‍යාව මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කල හැකි බව සහ ඒ අනුව නිවැරදි කිරීමේ කටයුතු කරනු ලබන | නිවැරදි කිරීම් සිදු කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | රු.මිලියන 140.58ක් වේ. ඒ අනුව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි සඳහන් මෝටර් රථ පිරිවැයෙහි සහ අරමුදලින් මූල්‍යනය කරන ලද මෝටර් රථ පිරිවැයෙහි රු.මිලියන 43.38ක වෙනසක් නිරීක්ෂණය විය. | | | බව. | |
| 4. | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව සාමාජික ගිණුම් ශේෂය තුල නිරූපිත උපගිණුම් 5ක ශේෂයන්හි එකතුව රු.මිලියන 94,633ක් වුවද, එම ගිණුම් සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද උපලේඛන අනුව එම ශේෂයන්ගේ එකතුව රු.මිලියන 78,693ක් වුයෙන් රු.මිලියන 15,940ක වෙනසක් නිරීක්ෂණය වූ නමුත් ඒ සඳහා සැසඳුම් ප්‍රකාශන විගණනයට ඉදිරිපත් නොවුණි. | 2021 2022 2023 | වෙනස සඳහා සැසඳුම් ප්‍රකාශන සකස් කළ යුතුය. | කේවල ගිණුම් මුදල් පදනමින් පවත්වා ගෙන ගියද පොදු ලෙජරය තුල ගනුදෙනු උපචිත පදනමින් වාර්තා කිරිම හේතුවෙන් මෙම පද්ධති දෙකෙහි ශේෂයන්හි වෙනසක් ඇතිවන බැවින් සියලූම ගනුදෙනු වාර්තා වීම තහවුරු කිරිම පිණිස දෛනිකව මෙම පද්ධති දෙකෙහි ගිණුම් සැසඳීමට කටයුතු කරන බව. | අදාල වෙනස සඳහා සැසඳිම් ප්‍රකාශයක් සකස් කර නොමැත. |
| 5. | මූල්‍ය ප්‍රකාශන අනුව කම්කරු දෙපාර්තමේන්තුවේ සේවක අර්ථසාධක අරමුදල් අංශයට අදාලව 2023 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.මිලියන1,154.03ක් වූ ස්ථාවර වත්කම් පැවතියද, එම ස්ථාවර | 2021 2022 2023 | අරමුදලෙහි වත්කම් සම්බන්ධයෙන් විධිමත් ලේඛන නඩත්තු කළ යුතුය. | සියලුම ස්ථාවර වත්කම් සහිත ලේඛනයක් නොමැති අතර 2016 සිට අරමුදල යටතේ මිලදී ගත් වත්කම්, කාණ්ඩ අනුව සිගාස් මාදුකාංගයේ ඇතුළත් කර ලේඛනගත කර ඇති බව. | නිවැරදි කිරිමට කටයුතු කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | වත්කම්වල කේත අංකය, මිලදී ගත් දිනය, ස්ථාවර වත්කම් පිරිවැය සහ වත්කම් ස්ථාපිත කර ඇති ස්ථානය ආදී මූලික තොරතුරු ඇතුලත් ලේඛනගත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය. | | | | |
| 6. | 1999 පෙබරවාරි 11දිනැති අංක 01/99 දරන කම්කරු දෙපාර්තමේන්තු චක්‍රලේඛයට පටහැනිව 2018 සිට 2023 දක්වා වර්ෂවලට අදාලව ආයතන පරීක්ෂා කටයුතු සිදු කර එකතුව රු.මිලියන 103ක අධිභාර හා දායක මුදල් අය කර ගැනීමේ ප්‍රථම නිවේදනය නිකුත් කිරීම සඳහා දින 22 සිට දින 1438ක් දක්වා වූ කාලයක් ගත වී තිබූ අවස්ථා 70ක් ගම්පහ දිස්ත්‍රික් කම්කරු කාර්යාලය සම්බන්ධයෙන් සිදු කල විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. තවද අවස්ථා 05කට අදාලව අය විය යුතු රු.මිලියන 13.46ක් අය කර ගැනීමට අවසන් නිවේදන නිකුත් කර නොතිබුණි. | 2023 | දායක මුදල් හා අධිභාර අයකර ගැනිම සඳහා නිවේදන ප්‍රමාදයකින් තොරව යැවිම තුලින් සාමාජිකයින්ට ප්‍රශස්ථ සේවයක් ඉටු කල යුතුය. | මෙම ආයතන වල තොරතුරු කම්කරු නිලධාරින් වෙත ලබාදී අදාල මුදල් අයකර ගැනිමටත්, අවසාන නිවේදන නිකුත් කිරිමටත්, නඩු පැවරිය යුතු ආයතන වලට එරෙහිව නඩු පැවරීමටත් කටයුතු කරන බව. | තවදුරටත් ප්‍රමාදයන් නිරීක්ෂණය වේ. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | උතුරු කොළඹ, ගම්පහ හා කළුතර දිස්ත්‍රික් කම්කරු කාර්යාල වලට අදාලව 2020 සිට 2023 දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් දායක මුදල් හා අධිභාර ලෙස පිළිවෙලින් ආයතන 61කට, 16කට හා 8කට අදාලව රු.මිලියන 52.73ක්, රු.මිලියන 95.22ක් හා රු.මිලියන 7.96ක් අයකර ගැනීමට පැවතුණි. | | | | |
| 7. | 2000 පෙබරවාරි 10 දිනැති අංක 6/2000 දරන කම්කරු දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 1(IV) වගන්තිය ප්‍රකාරව 2023 සැප්තැම්බර් 11 දිනට අරමුදලෙහි අධීක්ෂණ දත්ත පද්ධතියට අනුව ගම්පහ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයට අදාලව ලියාපදිංචි සක්‍රිය ආයතන 4835ක් හා අක්‍රීය/ වැසූ ආයතන 411ක් විය. ආයතන පරීක්ෂාවන් සිදු කිරිමේදී දිගු කාලයකින් පරීක්ෂාවට භාජනය නොවූ ආයතන පරික්ෂාව සඳහා තෝරා ගත යුතු බවට චක්‍රලේඛය මඟින් උපදෙස් ලබා දී තිබුණද උක්ත | 2023 | දිගුකාලයකින් පරික්ෂාවට ලක් නොවූ ආයතන සම්බධයෙන් පරික්ෂාවන් සිදු කිරීමටත් උප කලාපවලට වෙන් නොකළ ආයතන උප කලාපවලට වෙන් කර පරීක්ෂාවන් සිදු කිරීමටත් කටයුතු කල යුතුය. | කම්කරු නිලධාරීන් සතියකට දින 03ක් ක්ෂේත්‍ර කටයුතුවල නිරතවන අතර මාසයකට ආයතන 20කට ආසන්න ප්‍රමාණයක් එක් නිලධාරියෙකු විසින් පරික්ෂා කරනු ලබන බව සහ සහකාර කම්කරු කොමසාරිස් විසින් සෑම කම්කරු නිලධාරියෙකුගේම පරීක්ෂා කළ යුතු ආයතන ලැයිස්තුවට අක්‍රීය ආයතන 05ක් ඇතුලත් කරන බව. | පරික්ෂාවන් සිදු කර නොමැති ආයතන තවදුරටත් පවතී. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ආයතන අතරින් සියයට 84ක් 2018 වර්ෂයේ සිට 2023 සැප්තැම්බර් 11 දක්වා කාල පරිච්ඡේදයේදී පරීක්ෂා කර නොතිබුණි. තවද, ගම්පහ කලාපයට අයත් ලියාපදිංචි ආයතන අතරින් ආයතන 8,483ක් උපකලාපවලට විභජනයකර නොතිබීම හේතුවෙන් එම ආයතන සම්බන්ධයෙන් අධීක්ෂණයක් සිදු නොවන බව නිරීක්ෂණය විය. | | | | |
| 8. | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදලේ 15 වන වගන්තිය ප්‍රකාරව යම් ආයතනයක සේවකයින්ට අදාල දායක මුදල් සෑම මාසයක් අවසාන වී එළඹෙන මාසයේ අවසාන දිනට පෙර අරමුදල වෙත ප්‍රේෂණය කල යුතු වුවත්, උතුරු කොළඹ හා ගම්පහ දිස්ත්‍රික් කම්කරු කාර්යාල බල ප්‍රදේශයට අයත් 2022 වර්ෂයේදී ලියාපදිංචි කරන ලද ආයතන පිළිවෙලින් 89ක් හා 109ක් වෙතින් 2023 දෙසැම්බර් 31 දින වන විටත් ලියාපදිංචි දින සිට අදාල දායක මුදල් | 2023 | පසු විපරම් කටයුතු විධිමත්ව කළ යුතුය. | ලියාපදිංචි ආයතනවලින් දායක මුදල් ගෙවා නොතිබූ ආයතන හඳුනාගෙන කම්කරු නිලධාරීන්ලවා පසු විපරම් කිරීම සඳහා සුදුසු පියවර ගෙන ඇති බව | උතුරු කොළඹ හා ගම්පහ දිස්ත්‍රික් කම්කරු කාර්යාලවලට අදාලව ආයතන පිළිවෙලින් 35කින් හා 56කින් 2024 සැප්තැම්බර් 27 දින වන විටත් දායක මුදල් ලැබී නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ගෙවා නොතිබුණද ඒ සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු සිදු කර නොතිබුණි. | | | | |
| 9. | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 3.4 වගන්තිය ප්‍රකාරව ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී ලියාපදිංචි සැපයුම්කරුවන් හෝ දුරකථන නාමාවලියේ කහ පිටුවල සහ රේන්බෝ පිටුවල ලියාපදිංචි වී ඇති සැපයුම්කරුවන් තෝරාගෙන මිල ගණන් කැඳවිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 27.89ක් වූ පරිගණක, කැමරා සහ ප්‍රින්ටර් මිලදී ගැනීමේදී මිල ගණන් කැඳවීම සඳහා සැපයුම්කරුවන් තෝරා ගත් ක්‍රමවේදය හෙළිදරව් නොවීය. | 2023 | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුගතව විනිවිදභාවයකින් යුතුව ප්‍රසම්පාදනයන් කළ යුතුය. | මෙම සැපයුම්කරුවන් අදාළ ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් දිගුකාලීනව නියැලෙන සැපයුම්කරුවන් වන බැවින් මිළ ගණන් කැඳවන ලද අවස්ථාව වන විට රේන්බෝ පිටුවල ලියාපදිංචි වී ඇති බවට තහවුරුවක් ලබා දීමට කටයුතු කරන බව. | සැපයුම්කරුවන් තෝරාගත් ක්‍රමවේදය හෙළිදරව් වන සාක්ෂි සපයා නොමැත. |
| 10. | ලැයිස්තුගත නොවූ සමාගම්වල කොටස් ආයෝජනයෙන් රු.මිලියන 5,000ක් එනම් සියයට 52ක් 2013 වර්ෂයේදී පුද්ගලික සමාගමක ආයෝජනය කර තිබූ අතර එම සමාගම යටතේ ක්‍රියාත්මක කිරිමට පැවති ගෘන්ඩ් හයට් කොළඹ ව්‍යාපෘතියේ ඉදිකිරිමේ | 2021<br>2022<br>2023 | අවධානම අවම වන ප්‍රශස්ථ ආයෝජනයන් සිදු කළ යුතු අතර ආයෝජනය කළ මුදල නැවත ලබාගැනීමට කටයුතු කළ යුතුය | මෙම සමාගම විකුණා දැමීම සඳහා අමාත්‍ය මණ්ඩලය තීරණය කර ඇති බව සහ ඒ අනුව මුදල්, ආර්ථික ප්‍රතිසංස්කරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය යටතේ පවතින රාජ්‍යය ආයතන ප්‍රතිසංස්කරණ ඒකකය විසින් මෙම සමාගම විකුණා | සමාගම විකුණා දැමීමට අදාලව අභිලාෂ ප්‍රකාශයන් (Expression of Interest) කැඳවා ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | කටයුතු 2021 දෙසැම්බර් 27 වන විට අවසන් කල යුතුව පැවතුන ද එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කල නොහැකි බව අදාල සමාගම විසින් දන්වා තිබුණි. එසේම, රාජ්‍ය ආයතන ප්‍රතිසංස්කරණ ඒකකය විසින් මෙම සමාගම විකුණා දැමීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදන කරමින් පවති. එබැවින් යථෝක්ත ආයෝජනය සිදු කර වර්ෂ 11ක් ගත වුවද ආයෝජනයෙන් කිසිදු ප්‍රතිලාභයක් අරමුදලට ලැබී නොතිබුණි. | | | දැමීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කරමින් සිටින බව. | |
| 11. | සේවක අර්ථසාධක අරමුදලෙහි ලියාපදිංචි නොවී සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලයෙහි පමණක් ලියාපදිංචි වී තිබූ සේවායෝජකයින් සංඛ්‍යාව 2023 දෙසැම්බර් 31 දිනට 28,994ක් වූ අතර එම සේවායෝජකයන්ගෙන් එදිනට සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට ලැබී තිබූ දායක මුදල්වල එකතුව රු.මිලියන 401.25ක් විය. ඒ අනුව එම සේවායෝජකයින් අතරින් අරමුදලෙහි ලියාපදිංචි විය යුතු | 2023 | ආයතන දෙක අතර මනා සම්බන්ධීකරණයක් තුලින් පනත ප්‍රකාරව අරමුදලෙහි ලියාපදිංචි විය යුතු ආයතන ලියාපදිංචි කර ගැනිමට කටයුතු කළ යුතුය. | සේවක අර්ථසාධක අරමුදල් පනතින් ආවරණය වන සේවායෝජකයන් හඳුනාගෙන ඔවුන්ගේ ආයතන පිහිටි ප්‍රදේශය භාර කම්කරු නිලධාරීන් ලවා එම සේවායෝජකයන් සේවක අර්ථසාධක අරමුදලට බඳවා ගැනීම සඳහා කටයුතු කරනු ලබන බව. | ආයතන දෙක අතර මනා සම්බන්ධිකරණයක් සඳහා විධිමත් වැඩ පිළිවෙළක් සකස් කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | එහෙත් ලියාපදිංචිවීම පැහැර හැර ඇති සේවායෝජකයින් හඳුනාගෙන අරමුදෙලහි ලියාපදිංචි කිරීම සඳහා මණ්ඩලය සමඟ සම්බන්ධීකරණය වී සුදුසු වැඩ පිළිවෙලක් සකස් කර නොතිබුණි. | | | | |
| 12. | අරමුදලෙහි බැංකු සැසඳුම් ප්‍රකාශනවල 2001 වර්ෂයේ සිට පැවත එන නොසැසඳුනු බැංකු ගිණුම් ශේෂ නිරවුල් කිරීම සඳහා 2020 ජනවාරි 09 වන දින පෞද්ගලික ආයතනයක් සමඟ ගිවිසුමකට එළඹ තිබුණු අතර ගිවිසුම්ගත දින සිට සති 08ක් තුල අවසන් වාර්තාව ඉදිරිපත් කළ යුතුව පැවතියත්, අදාළ ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු මෙම වාර්තාවේ දින වන විටත් අත්කර ගෙන නොතිබුණි. 2020 දෙසැම්බර් 31 දිනවන විට ගිවිසුම්ගත මුදලින් සියයට 50ක් එනම් රු. මිලියන 1.56ක් ගෙවා තිබුණි. | 2022<br>2023 | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර ප්‍රධාන බැංකු ගිණුමෙහි පවතින ගැටලු නිරාකරණය කළ යුතුය. | අදාල ආයතනයේ අතුරු වාර්තාවක් 2020 ඔක්තෝබර් 30 වන දින ඉදිරිපත් කර අතර ප්‍රධාන බැංකු ගිණුම නිරවුල් කිරීමේ කටයුතු අවසන් කර නොමැති බැවින් අදාළ ගැලපීම් 2023 අවසන් ගිණුම් සැකසීමට යොදා නොගන්නා ලද බව. | ප්‍රධාන බැංකු ගිණුමෙහි පවතින ගැටලු නිරාකරණය කර නොමැත. |
| 13. | 2010 වර්ෂයේ දී ගුවන් සමාගමක් වෙත කරන ලද රු.මිලියන 500 ක ආයෝජන සඳහා මේ දක්වාම කිසිදු | 2021<br>2022 | ආයෝජනයන් සිදු කිරීමේදි සාමාජිකයන්ට ඉහල ප්‍රතිලාභ ලබා දීමට හැකි වන පරිදි | මෙය මුළුමනින්ම පාහේ රජයේ හිමිකාරීත්වය යටතේ පවතින සමාගමක් වන අතර, දිගින් | ආයෝජිත මුදල් නැවත ලබා ගෙන නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ආදායමක් අරමුදලට ලැබී නොතිබුණි. | | ප්‍රශස්ථ ආයෝජනයන් කිරිමට කටයුතු කළ යුතුය. | දිගටම පාඩු ලැබීම හේතුවෙන් රජය විසින් භාණ්ඩාගාරය හරහා ලබාදෙන ලද මූල්‍ය ප්‍රතිපාදන මත පවත්වාගෙන යන සමාගමක් බව. | |
| 14. | 2021 දෙසැම්බර් 31 දින “ද ෆිනෑන්ස් සමාගමෙහි” බලපත්‍රය අවලංගු කිරීම හේතුවෙන් අරමුදලට රු.මිලියන 205.49 ක් අහිමි වී තිබුණි. | 2021 2022 | ආයෝජනයන් සිදු කිරිමේදි සාමාජිකයන්ට ඉහල ප්‍රතිලාභ ලබා දීමට හැකි වන පරිදි ප්‍රශස්ථ ආයෝජනයන් කිරිමට කටයුතු කළ යුතුය. | 2020 මැයි 22 දින ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෙම සමාගමට නිකුත් කර තිබූ කල්බදු ව්‍යාපාර බලපත්‍රය අවලංගු කිරීමෙන් අනතුරුව, 2020 දෙසැම්බර් 28 වන දින කොළඹ කොටස් වෙළඳපොළ මගින් මෙම සමාගමේ කොටස් ගනුදෙනු අත්හිටුවා ඇති බවත්, එම නිසා සමාගම ඈවර කිරීමකදී, අරමුදලට එහි ආයෝජනය හෝ කොටසක්, ඉතිරි වටිනාකම ලෙස ලැබිය හැකි බව. | ආයෝජිත මුදල් නැවත ලබා ගෙන නොමැත. |
| 15. | අරමුදලේ සාමාජිකයන්ට නව හැඳුනුම්පත් නිකුත් කිරීම සහ නැවත ලියාපදිංචි කිරීමේ කටයුතු සඳහා ආරම්භ කළ ව්‍යාපෘතිය වෙනුවෙන් රු.මිලියන 12.61 ක් වැයකර කාඩ්පත් 15,000 ක් ද, රු.මිලියන 17.67 ක් වැයකර ගිණුම් ශේෂ පිරික්සීමේ යන්ත්‍ර | 2021 2022 | මනා සැලැස්මක් හා අධ්‍යයනයක් සහිතව ව්‍යාපෘති ආරම්භ කළ යුතු වීම හා සාමාජික අරමුදලින් වියදම් දැරීමේදී ඵලදායී ලෙස වියදම් දැරීමට කටයුතු කළ යුතුය. | කාඩ්පත් 15000 වෙනත් කාර්යයන් සඳහා ප්‍රයෝජනයට ගත නොහැකි බව සහ KIOSK යන්ත්‍රවල ඇතුලත් ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කළ හැකි බැවින් එම යන්ත්‍ර ගලවා ඉවත් කර දිස්ත්‍රික් කාර්යාල වලට බෙදා හැරිමට කටයුතු කරන බව. ඒ අනුව මේ වන විට | ව්‍යාපෘතිය අසාර්ථක වීම හේතුවෙන් දරන ලද සම්පූර්ණ වියදම නිෂ්කාර්ය වියදමකි. යන්ත්‍ර 28 ක් භෞතික පරික්ෂාවේදී නිරීක්ෂණය විය. මුද්‍රණය කරන ලද කාඩ්පත් වලින් කිසිදු ප්‍රයොජනයක් ගත නොහැක. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | (KIOSK) 35 ක් ද මිල දී ගෙන තිබුණි. මිලදී ගත් මෙම කාඩ්පත් 15,000 අදාළ කාර්ය සඳහා උපයෝගී කර නොගෙන විගණිත දින වනවිටත් නිෂ්කාර්යව තොරතුරු තාක්ෂණ අංශයේ රඳවාගෙන තිබුණු අතර යන්ත්‍ර 35 කින් යන්ත්‍ර 2 ක් අපහරණය කර තිබුණි. අක්‍රීය තත්ත්වයේ පවතින ඉතිරි යන්ත්‍ර 33 න් 25 ක් අපහරණය සඳහා ප්‍රධාන කාර්යාලයට රැගෙන විත් තිබුණි. වර්තමානයේ ක්‍රියාත්මක නොවන මෙම ව්‍යාපෘතිය සඳහා නිසි අවශ්‍යතා හඳුනා ගෙන වත්කම් මිලදී ගැනීමටත්, කාර්යක්ෂම ලෙස උපයෝජනය කිරීමටත් කටයුතු කර නොතිබීම හේතුවෙන් අරමුදලේ මුදල් නිශ්කාර්යව වැයකර ඇති බව නිරීක්ෂණය විය. | | | ඇඟිලි සලකුණු යන්ත්‍ර 13ක් බෙදාහැර ඇති බව සහ යන්ත්‍රයේ අනෙකුත් කොටස් අබලි ලෙස වෙන්දේසි කිරිමට යෝජනා කර ඇති බව. | |
| 16. | ඡායාරූප හා ඇඟිලි සලකුණු ව්‍යාපෘතිය සඳහා 2017 වර්ෂයේ මිලදී ගත් Logitech Quick Camera 12 ක් සහ 2019 වර්ෂයේ රු.මිලියන 1.7 ක් වැය කර මිලට ගත් | 2022 | මනා සැලැස්මක් හා අධ්‍යයනයක් සහිතව ව්‍යාපෘති ආරම්භ කළ යුතු වීම හා සාමාජික අරමුදලින් වියදම් දැරීමේදී ඵලදායී ලෙස වියදම් | මෙම උපකරණ අවශ්‍යතාවය අනුව කාර්යාල වෙත වෙන් වෙන්ව බෙදා හැරීමට කටයුතු කරන ලද බව. | කැමරා 16 ක් නිකුත් කිරිමෙන් තොරව ගබඩාවෙහි පවතින බව 2024 සැප්තැම්බර් 22 දින සිදු කල භෞතික පරික්ෂාවේදී නිරික්ෂණය විය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | Logitech Quick Camera 50 න් 35 ක් ද, 2018 වර්ෂයේ රු.මිලියන 3.3 ක් වැය කර මිලදී ගත් ලැප්ටොප් පරිගණක 24 න් 2 ක් තවදුරටත් නිශ්කාර්යව පවතින බව තොග පොත් පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | | දැරීමට කටයුතු කළ යුතුය. | | තවද, අදාල ව්‍යාපෘතිය සාර්ථක නොවීම හේතුවෙන් වියදමින් අපේක්ෂිත අරමුණ ඉටු වී නොතිබුණි. |
| 17. | 2023 දෙසැම්බර් 31 දිනට අරමුදලෙහි සාමාජික ගිණුම තුල “කම්කරු කොමසාරිස් ජනරාල්“ නමින් පැවති ගිණුමෙහි සේවායෝජකයින්ට එරෙහිව නඩු පැවරීමෙන් අයකරගෙන ශ්‍රී ලංකා මහ බැංකුවෙහි රඳවාගෙන ඇති රු.මිලියන 12,237ක් වූ මුදල, කම්කරු දෙපාර්තමේන්තුවේ පොදු තැන්පතු ගිණුමක රඳවාගෙන තිබූ රු.මිලියන 440ක් වූ මුදල,"ජංගම වර්ෂයේ දායක මුදල් අංක 01” නමින් වූ ගිණුමේ පැවති රු.මිලියන 78,797ක ශේෂය, විවිධ හේතු මත සාමාජිකයින්ට නොගෙවා රඳවාගත් ප්‍රතිලාභ හා හිමිකම් නොපෑ ප්‍රතිලාභ වශයෙන් පවතින රු.මිලියන 1,009ක ශේෂය, | 2021<br>2022<br>2023 | නිරවුල්කර නොමැති දායක මුදල් කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය | මෙම ශේෂ නිරාකරණය කිරීම සඳහා, සාමාජික නම් හා අංක විෂමතා සහිත දායක මුදල් විස්තර වාර්තා පිළිබඳව සේවායෝජකයන් දැනුවත් කිරීම, දෝෂ සහිත "සී" වාර්තා සඳහා මුළු මුදල මත 2% අධිභාරයක් පැනවීම, මංගත ක්‍රමය හරහා මුදල් විස්තර වාර්තා රැස් කිරීම, ස්වයංක්‍රිය සාමාජික ගිණුම් යාවත්කාලීන කිරීමේ ක්‍රමවේදයන් හඳුන්වාදීම ආදී ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | 2024 අගොස්තු 30 දින වන විට මෙම ගිණුම්වල එකතුව රු. මිලියන 63,040 ක මුදලක් සමාජිකයින්ගේ කේවල ගිණුම්වලට බැර කිරිමට පැවතුනි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ඌන/අතිරික්ත දායක මුදල් වශයෙන් පවතින රු.මිලියන 2,590ක ශේෂය සහ ඌන/අතිරික්ත ප්‍රතිලාභ ගෙවීම් වශයෙන් පවතින රු.මිලියන 552ක ශේෂය ලැබිය යුතු සාමාජිකයන් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. ඉහත සඳහන් සාමාජික ගිණුම්වලට බැර නොකර පවතින ගිණුම් කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කරන ලෙස 2013, 2016 හා 2017 වර්ෂවලදී රාජ්‍ය ගිණුම්කාරක සභාව විසින් ද නියෝග කර තිබුණි. | | | | |
| 18. | කළුතර දිස්ත්‍රික් කම්කරු කාර්යාල බල ප්‍රදේශයට අයත් සේවායෝජක ආයතනයක් විසින් 2019 ඔක්තෝබර් සිට 2022 අප්‍රේල් දක්වා කාලපරිච්ඡේදයට අදාල දායක මුදල් ගෙවීම පැහැර හැරීම හේතුවෙන් රු.මිලියන 3.27ක් අයකර ගැනීමට පැවතුණි. එම මුදල වාරික 32කින් ගෙවීම සඳහා 2022 දෙසැම්බර් 30 දින අනුමැතිය ලබා දී තිබුණද 2024 ජුනි 30 | 2023 | පසුවිපරම් කටයුතු සිදුකර හිඟ වාරික අයකර ගැනිමට කටයුතු කළ යුතුය. | ඉතිරි හිඟ වාරික කඩිනමින් අයකර ගැනීමට ඉදිරි ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | අයකර ගෙන නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | දින වන විට ඉන් වාරික හතරක් එනම් 510,000 ක් පමණක් අරමුදල වෙත ගෙවා තිබූ අතර තවදුරටත් අයවිය යුතු රු. මිලියන 2.76 ක් අයකර ගැනීම සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | | | | |
| 19. | කළුතර දිස්ත්‍රික් කම්කරු කාර්යාල බල ප්‍රදේශයට අයත් සේවායෝජක ආයතනයක් විසින් 2011 ජනවාරි සිට 2020 දෙසැම්බර් දක්වා කාලය තුල දායක මුදල් නොගෙවීම මත විභාග වූ නඩුවක තීන්දුව ප්‍රකාරව රු.මිලියන 5.89ක මුදලක් අය කර ගෙන තිබූ නමුත් 2023 දෙසැම්බර් 31 වන විටත් සාමාජිකයින් 7 දෙනෙකුට විභජනය කල යුතු එකතුව රු.මිලියන 1.14ක් විභජනය කර නොතිබුණි. | 2023 | පසුවිපරම් කටයුතු සිදුකර අදාල සාමාජිකයන්ට මුදල් විභජනය කළ යුතුය. | සාමාජික නම් හා අංකවල පවතින දෝෂ අදාල ආයතනය විසින් නිරාකරණය කළ යුතු බැවින් ඒ සම්බන්ධව ආයතනය ලිඛිතව දැනුවත් කර ඇති බව සහ තොරතුරු ලද වහාම නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව. | අදාල සමාජිකයන්ට විභජනය කර නොමැත. |
| 20. | සේවායෝජකයන්ට එරෙහිව නඩු පැවරීමෙන් අය කර ගත් මුදල් නිරවුල් කරන තුරු පොදු තැන්පතු ගිණුමක රඳවා තබා ගන්නා අතර 2023 දෙසැම්බර් 31 දිනට එහි ශේෂය | 2023 | අදාල සාමාජිකයන්ගේ හිමිකම තහවුරු කිරීමටත් එම හිමිකම මත සාමාජිකයන්ට ප්‍රශස්ථ ප්‍රතිලාභයක් ලබාදීමටත් | එක් එක් දිස්ත්‍රික් කාර්යාලවල විෂයභාර නිලධාරින් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීමටත්, කොළඹ ප්‍රධාන කාර්යාලයේ පවතින සියලු දිස්ත්‍රික් | 2024 ජුලි 31 දිනට රු. මිලියන 120.75 ක් තවදුරටත් නිරවුල් කිරිමට පැවතුනි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | රු.මිලියන 440.36ක් විය. ඉන් රු.මිලියන 87.06ක් 2009 වර්ෂයත් 2022 වර්ෂයත් අතර කාලපරිච්ඡේදයේදී අය කර ගන්නා ලද මුදල් වේ. මෙම මුදල් ලැබිය යුතු සාමාජිකයින් හඳුනාගෙන එම සාමාජිකයින්ගේ කේවල ගිණුම්වලට බැර කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ප්‍රේෂණය නොකිරීම හේතුවෙන් එම මුදල් ආයෝජනයෙන් ඉපයිය හැකිව පැවති ආයෝජන ආදායම සාමාජිකයින්ට අහිමි වී තිබුණි. | | කටයුතු කළ යුතුය. | කාර්යාලයන්ට අදාලව අධිකරණ මඟින් අයකර ගනු ලබන මුදල් ඍජුවම අදාල දිස්ත්‍රික් කාර්යාල වෙත යොමු කිරිමටත්, වාරික මඟින් ගෙවීම් කිරිමේදී සමානුපාතික ක්‍රමය යටතේ දායක මුදල් ගිණුම් ගත කිරිමටත් කටයුතු කරන බව. | |
| 21. | 2023 දෙසැම්බර් 31 දිනට අරමුදල විසින් එකතුව රු.මිලියන 12,755.09ක් අයකර ගැනීම සඳහා බාහිර ආයතනවලට එරෙහිව නඩු 14,096ක් පවරා තිබුණි. ඉන් එකතුව රු. මිලියන 2,420 ක් අයකර ගැනීම සඳහා පවරන ලද නඩු 4,381 ක් අක්‍රිය තත්ත්වයේද, එකතුව රු. මිලියන 1,232 ක් අයකර ගැනීම සඳහා පවරන ලද නඩු 2,138 ක් විවෘත වරෙන්තු තත්ත්වයේද පැවතුණි. තවද, බාහිර ආයතන විසින් අරමුදලට | 2022<br>2023 | අවශ්‍ය කටයුතු ඉටු කර හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | සක්‍රිය නඩු ගොනු අක්‍රිය වීම වලක්වා ගැනීම සඳහා සහ නඩු ලේඛන මනාව නඩත්තු කර කාර්යක්ෂම අවසන් කිරිම සඳහා උපදෙස් ලබා දෙමින් අංක 06/2024 හා 2024 සැප්තැම්බර් 03 දිනැති චක්‍රලේඛය නිකුත් කළ බව. | අධිකරණ කටයුතු සිදු කරමින් පවතී. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | එරෙහිව එකතුව රු. මිලියන 201.3 ක් ඉල්ලුම්කර නඩු 62 ක් අධිකරණයෙහි පවරා තිබුණි. | | | | |
| 22. | 2024 මැයි 08 දිනට සාමාජිකයින් විසින් ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා අරමුදල වෙත ඉදිරිපත් කල අයදුම්පත් අතරින් එදින වන විට ප්‍රතිලාභ නිදහස් කර නොතිබූ මුලු අයදුම්පත් සංඛ්‍යාව 5,559ක් විය. එම අයදුම්පත් අතරින් අයදුම්පත් 1344 ක් 2012සිට 2023 දක්වා වර්ෂවලදී භාර ගන්නා ලද අයදුම්පත් වන අතර ඉන් අයදුම්පත් 463ක් දත්ත පද්ධතියට ඇතුලත් කිරීම පමණක් සිදු කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනිමෙන් තොරව පැවතුනි. තවද, අයදුම්පත් 81 හා 172 ක් පිළිවෙලින් ප්‍රතිලාභ ගෙවීම සඳහා බලය දීම (Claims for Authorization) සහ අනුමත කිරිම (Claims for Approval) යන අදියරයන්හි පැවතුනි. ප්‍රතිලාභ නිදහස් කිරිමේ ක්‍රියාවලිය සඳහා දිගු කාලයක් ගත කිරිම හේතුවෙන් සාමාජිකයන්ට අරමුදල් නිදහස් කිරීම ප්‍රමාද වීම තුලින් ඔවුන් | 2022 2023 | ප්‍රමාද වීම් වළක්වා සමාජිකයන්ට ප්‍රශස්ථ සේවයක් ඉටුකිරිමට කටයුතු කළ යුතුය. | 2024 අගෝස්තු වන විට ආදල අයදුම්පත් අතරින් අයදුම්පත් 3980 ක් අවසන් කිරිමට පියවර ගන්නා ලද බව. | 2022 ත් 2024 වර්ෂයත් අතර ලද අයදුම්පත් සම්බන්ධයෙන් යම් ප්‍රගතියක් දක්නට ලැබුණද 2012 ත් 2021 වර්ෂයත් අතර කාලපරිච්ඡේදයේ ලද අයදුම්පත් 436න් 432ක් සම්බන්ධයෙන් ප්‍රගතියක් නිරික්ෂණය නොවීය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | හට අවාසිදායක තත්ත්වයක් උද්ගතවන බව නිරීක්ෂණය විය. | | | | |
| 23. | මෙහෙවර පියස ගොඩනැගිල්ලෙහි 2023 ඔක්තෝම්බර් මාසය වෙනුවෙන් පහසුකම් කළමනාකරණ හා සේවා ගාස්තු සහ අභ්‍යන්තර පිරිසිදු කිරීම් සඳහා සේවා සපයන ආයතනය විසින් රු.මිලියන 6.55ක බිල්පතක් ඉදිරිපත් කර තිබූ අතර, එය ගොඩනැගිල්ලෙහි ස්ථාපිත සියළුම ආයතනවලට විභජනය කිරීමෙන් තොරව සම්පූර්ණ මුදලම අරමුදලෙන් දරා තිබුණි. | 2023 | එක් එක් ආයතන සමඟ එළඹි ගිවිසුම් ප්‍රකාරව පොදුකාර්ය වියදම් විභජනය කළ යුතුය. | දෙපාර්තමේන්තුව වෙත වෙන්වී ඇති වාර්ෂික ප්‍රතිපාදන උපයෝජනය කරමින් ගෙවීම මත පැන නැගුනු තත්ත්වයක් බව. | වැඩිපුර ගෙවූ මුදල නැවත අයකර ගැනිමට කටයුතු කර නොමැත. |
| 24. | අරමුදලේ සාමාජිකයන් නැවත ලියාපදිංචි කිරීමේ ව්‍යාපෘතිය සඳහා එකතුව රු.මිලියන 27.89ක් වූ පරිගණක 60ක්, කැමරා 60ක් සහ මුද්‍රණ යන්ත්‍ර 60ක් මිලදී ගෙන තිබුණි. උක්ත පරිගණක 60න් පළමු පරිගණක 30 මිලදී ගැනීමේදී යොදාගත් "මතක ධාරිතාව" පිරිවිතරය අවසන් පරිගණක 30 මිලදී ගැනීමේදී | 2023 | ප්‍රසම්පාදනයන් ප්‍රශස්ථ අයුරින් සැලසුම් කල යුතු වීම සහ සමාජික අරමුදලින් වියදම් දැරිමේදී ඵලදායි ලෙස අරමුදල් උපයෝජනය කල යුතුය. | 2024 තෙවන කාර්තුව අවසන් වන විට මෙම උපකරණ අදාල ප්‍රදේශිය කාර්යාල වෙත බෙදාහැරීමට සැලසුම් කර ඇති බව. | පරිගණක 35 ක්, කැමරා 7 ක් සහ මුද්‍රණ යන්ත්‍ර 6ක් 2024 සැප්තැම්බර් 27 දින වන විට ගබඩාවෙහි පැවතුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | වෙනස්කර මිලගණන් කැඳවා තිබූ අතර දෙවන අවස්ථාවේදී සඳහන් කර තිබූ පිරිවිතරය උක්ත ව්‍යාපෘතිය සඳහා ප්‍රමාණවත් බව ලිපිගොනු තුලින් තහවුරු විය. ඒ අනුව පළමු අවස්ථාවේ ඒකකයක් රු.335,328 ක් ද, දෙවන අවස්ථාවේ ඒකකයක් රු.141,400ක් ද බැගින් මිලදී ගෙන තිබීමෙන් එක් ඒකකයකට දළ වශයෙන් රු. 193,928ක් බැගින් රු.මිලියන 5.82ක් ඉතිරි කර ගැනීමේ හැකියාව පළමු අවස්ථාවේදී අහිමි කර ගෙන තිබුණි. තවද, 2022 ජුනි 01 දින මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා සැලසුම් කර තිබුණද, පරිගණක 51ක් කැමරා 53ක් හා මුද්‍රණ යන්ත්‍ර 50ක් 2024 මාර්තු 14 දින වන විටත් බෙදාහැරීමෙන් තොරව ගබඩාවෙහි පැවතීම හේතුවෙන් දරන ලද වියදමෙන් අපේක්ෂිත ප්‍රතිඵල ලබා කර ගෙන නොතිබුණි. | | | | |
| 25. | සේවක අර්ථසාධක අරමුදලට ස්වාධීන වූ අභ්‍යන්තර විගණන | 2021 2022 | අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කිරීමට අවශ්‍ය | ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලක මණ්ඩලයෙහි | කම්කරු දෙපාර්තමේන්තුවෙහි අභ්‍යන්තර |

| | | | |
|---|---|---|---|
| අංශයක් ස්ථාපිත කර නොතිබූ අතර ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් අංශයේ අභ්‍යන්තර විගණන කටයුතු ශ්‍රී ලංකා මහ බැංකුවේ අභ්‍යන්තර විගණන අංශය මගින් ඉටු කරනු ලබයි. අරමුදලේ පරිපාලන කටයුතු සිදු කරනු ලබන කම්කරු දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශයේ අනුමත කාර්ය මණ්ඩලය 14 ක් වුවත්, තථ්‍ය සංඛ්‍යාව 8 දෙනෙකුට සීමා වීතිබුණි. අරමුදල විසින් රු.ට්‍රිලියන 3.4 ක පමණ සාමාජික අරමුදලක් කළමණාකරණය කරනු ලබන තත්ත්වයක් තුළ දෙපාර්තමේන්තු අභ්‍යන්තර විගණනය ශක්තිමත් කල යුතු බවට 2013 වර්ෂයේ සිට දිගින් දිගටම රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවමගින් නියෝග කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කිරීමට හා අරමුදලේ විගණන කටයුතු සඳහා වැඩි අවධානයක් යොමු කිරීමට පියවර ගෙන | පියවර ගත යුතුය. | සාමාජිකයකු විසින් සහභාගිත්වය දරන උපදේශනාත්මක විගණන කමිටුව මඟින් සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ විගණන කටයුතු සමාලෝචනය කරන බව. | විගණන අංශයෙහි පුරප්පාඩු සම්පූර්ණ කර නොමැත. |

නොතිබුණි. අරමුදලේ 2022 වර්ෂය සඳහා සකස් කල අනුමත අභ්‍යන්තර විගණන සැලැස්ම හා වර්ෂයට අදාලව නිකුත් කරන ලද අභ්‍යන්තර විගණන වාර්තා ද විගණකාධිපති වෙත ඉදිරිපත් නොවීය.

## 3.20 ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 2,481,847,180 | - | 2,481,847,180 | 295,472,900 | තත්ත්වාගණනය කළ |
| **2022** | 2,819,539,721 | - | 2,819,539,721 | 337,692,542 | තත්ත්වාගණනය කළ |
| **2023** | 3,257,173,026 | - | 3,257,173,026 | 437,633,305 | තත්ත්වාගණනය නොකළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| 1. | 1953 අංක 44 දරන පාඨශාලීය ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනතේ නියෝග අංක 04 ප්‍රකාරව ගුරු වැන්දඹු අනත්දරු දායක මුදල්වලින් අරමුදලක් ගොඩනගා එමඟින් ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම් කල යුතුය. එසේ වුවද, දායක මුදල් රැස්කිරීම හා ගෙවීම් කිරීම සඳහා අරමුදල වෙනුවෙන් වෙනම බැංකු ගිණුමක් පවත්වාගෙන ගොස් නොතිබුණි. දායක මුදල් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ බැංකු ගිණුමට රැස්කර තිබුණු අතර විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ ගෙවීම් | 2021 2022 2023 | පනතේ නියෝග ප්‍රකාරව කටයුතු කල යුතු වීම. | පිරිවෙන් හා පෞද්ගලික පාසල් ගුරුවරුන් සඳහා වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම වාර්ෂික විසර්ජන පනත මඟින් වෙන් වන ඒකාබද්ධ අරමුදලේ 253 දරන විසර්ජන ශීර්ෂයෙන් සිදු කෙරේ. | පනතේ නියෝග ප්‍රකාරව කටයුතු කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | කර තිබුණි. (යොමුව-2023-1.5(i), 2022-1.6(අ), 2021-1.6(අ)) | | | | |
| 2. | 1953 අංක 44 දරන පාඨශාලිය ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනතේ නියෝග අංක 9(අ) ප්‍රකාරව එක් එක් දායක මුදල් ගෙවීමට සුදුසුකම් ලැබූ හා දායක මුදල් ගෙවන්නන් පිළිබඳ තොරතුරු ඇතුළත් ලේඛනයක් පවත්වා නොතිබුණි. තවද පළාත් 09 න් පළාත් 06 කින් පමණක් දායක මුදල් අරමුදලට ලැබී තිබුණු අතර අනෙක් පළාත්වලින් දායක මුදල් නොලැබීමට හේතු හෙළිදරව් නොවුණි. (යොමුව- 2023-1.5(ii), 2021-1.6(ආ)) | 2021 2022 2023 | දායක මුදල් ගෙවන්නන් පිළිබඳ විධිමත් තොරතුරු පද්ධතියක් පවත්වා ගැනීම කළ යුතු වීම. | පළාත් වලින් බැර කරනු ලබන වට්නාකම් පමණක් බැර නිවේදන මඟින් එවනු ලබන අතර ලියාපදිංචි පිරිවෙන් හා රජයේ ආධාර ලබන පෞද්ගලික පාසල් වල සේවය කරනු ලබන ගුරුවරුන් වෙනුවෙන් පාසලේ නමින් වෙන් වෙන් වශයෙන් ඔවුන්ගේ තොරතුරු ඇතුලත් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ලිපිගොනුවක් පවත්වාගෙන යනු ලැබේ. | දායක මුදල් ගෙවන්නන් පිළිබඳ විධිමත් තොරතුරු පද්ධතියක් පවත්වා ගෙන නොතිබුණි. |

### 3.21 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 1,117,718,219 | 541,782 | 1,117,176,437 | (22,710,992) | තත්ත්වාගණනය කළ |
| **2022** | 1,090,156,001 | 640,953 | 1,089,515,048 | (27,070,918) | ව්‍යාචනය කළ |
| **2023** | 1,073,077,382 | 1,032,608 | 1,072,044,775 | (16,701,878) | ව්‍යාචනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| 1. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ප්‍රකාරව අරමුදල විසින් උපචිත පදනම මත ගිණුම් තැබිය යුතු වුවද , පූර්ව වර්ෂවලට හා සමාලෝචිත වර්ෂයට අදාලව දායක මුදල් ලැබීම් මුදල් පදනමට ගිණුම් ගත කර තිබුණි. මුදලින් ලද දායක මුදල 2021 වර්ෂයේදී රු. 91,246,749 , 2022 වර්ෂයේදී රු.91,670,745, 2023 වර්ෂයේදී රු.77,965,865 විය.<br><br>(යොමුව 2023-1.5.1,2022-1.5.1, 2021-1.5.2) | 2021, 2022, 2023 | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ප්‍රකාරව ආදායම් වියදම් උපචිත පදනම මත ගිණුම් ගත කළ යුතුය. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතය අනුගමනය කරනු නොලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතය අනුගමනය කර නොමැත. |
| 2. | 2021 වර්ෂයට අදාලව පළාත් පාලන ආයතන 123 ක එකතුව | 2021,2022, 2023 | ශේෂ සනාථ කර ගැනීම තුළින්ලැබිය යුතු දායක මුදල | මාසික බිල්පත් මඟින් ත්‍රෛමාසිකව ඒ ඒ ආයතන විසින් | ශේෂ තහවුරු කිරීම් ලබා ගැනීමට කටයුතු කර |

| | | | | | |
|---|---|---|---|---|---|
| | රු.566,236,315 ක ලැබිය යුතු ශේෂ සඳහාද, 2022 වර්ෂයට අදාලව පළාත් පාලන ආයතන 56 ක එකතුව රු.103,587,376 ක ලැබිය යුතු ශේෂ සඳහාද, 2023 වර්ෂයට අදාලව පළාත් පාලන ආයතන 59 ක එකතුව රු. 74,922,370 ක ලැබිය යුතු ශේෂ සඳහාද ශේෂ තහවුරු කිරීම් ලැබී නොතිබුණි.<br><br>(යොමුව 2023-1.5.4,2022-1.5.4, 2021-1.5.4) | | තහවුරු කර ගැනීමට පියවර ගත යුතුය. | ගෙවීමට ඇති මුදල් පිළිබඳ දැනුම්දීමක් සිදුකරනු ලැබේ. | නොතිබුණි. |
| 3. | අරමුදලේ මූල්‍ය ප්‍රකාශන අනුව පලාත් පාලන ආයතන 152 කින් 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු දායක මුදල හා අදාළ පළාත් පාලන ආයතනයන්හි මූල්‍ය ප්‍රකාශන අනුව ගෙවිය යුතු දායක මුදල් අතර රු.712,143,081 ක වෙනසක් නිරීක්ෂණය විය.<br><br>(යොමුව 2023- 1.5.3) | 2023 | ශේෂ සනාථ කර ගැනීම තුළින්ලැබිය යුතු දායක මුදල තහවුරු කර ගැනීමට පියවර ගත යුතුය | ශේෂ සනාථ කර ගැනීම තුළින්ලැබිය යුතු දායක මුදල තහවුරු කර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | ශේෂ තහවුරු කිරීම් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. |

## 3.22 රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 83,475,610,651 | 236,938,863 | 83,238,671,788 | 6,570,594,169 | ව්‍යාවනය කළ |
| **2022** | 91,234,411,455 | 445,396,408 | 90,789,015,047 | 8,273,969,785 | ව්‍යාවනය කළ |
| **2023** | 107,919,406,725 | 569,137,237 | 107,350,269,487 | 17,102,563,543 | ව්‍යාවනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| 1. | 2022 හා 2023 මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබූ පිළිවෙළින් රු.212,203,695 හා රු.221,198,964 ක්වූ ලැබිය යුතු රජයේ දායක මුදල සඳහා උපලේඛන ඉදිරිපත් කර නොතිබූ බැවින් කවර ආයතනයන්ගෙන් කුමන දායකයින් සඳහා ලැබිය යුතු දායක මුදල්ද යන්න තහවුරු නොවුණි. (යොමුව-2022-1.5.1(ආ), 2023-1.5.1(ආ)) | 2022, 2023 | දායකයින්ගේ කේවල ගිණුම් පිළිබඳ විධිමත් දත්ත පද්ධතියක් පවත්වා ගැනීම මඟින් ශේෂයන්හි නිවැරදිතාවය තහවුරු කරගත යුතුය. | 2024 වසරේ සිට ඉදිරියට, වෙක්පත් මඟින් ආයතන මට්ටමින් ලැබෙන දායක මුදල් විශ්ලේෂණයක් ඇතුළත් කිරීමේ ක්‍රම වේදයක් මේ වන විට ආරම්භ කර ඇත. | දායකයින්ගේ කේවල ගිණුම් පිළිබඳ විධිමත් දත්ත පද්ධතියක් පවත්වා ගැනීමට කටයුතු කර නොමැත. |
| 2. | එක් එක් දායකයා අනුව වෙන් කළ හැකි පරිදි කේවල ශේෂ උපලේඛන ඉදිරිපත් කර නොතිබූ බැවින් 2021,2022,2023 | 2021, 2022, 2023 | දත්ත පද්ධතියක් පවත්වා ගැනීම මඟින් ශේෂයන්හි නිවැරදිතාවය තහවුරු කරගත යුතුය. | මෙතෙක් පවතින ශේෂය පසුව නිරවුල්ව විශ්ලේෂණය කර ගැනීමේ බලාපොරොත්තුවෙ | දත්ත පද්ධතියක් මඟින් කේවල ශේෂ පවත්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | වර්ෂයන්ට අදාලව පිළිවෙළින්රු.31,284,678,563,රු.33,593,599,143 හා රු. 36,705,629,449ක්වූ අනිවාර්ය දායක මුදල් ගිණුමේ ශේෂයන්ගේද,රු. 48,313,024,475 ,රු. 51,808,746,221 හා රු.56,522,311,342 ක්වූ රජයේ දායක මුදල් ගිණුමේ ශේෂයන්ගේද , රු.48,191,933, රු.51,986,116 හා රු.56,462,571 ක්වූ ස්වේච්ඡා දායක මුදල් ගිණුමේ ශේෂයන්ගේද නිවැරදිතාවය තහවුරු නොවුණි. (යොමුව-2021- 1.5.4(අ), 2022- 1.5.1(ආ) 2023- 1.5.1(ආ)) | | | න් දැනට 2024 වසරේ සිට ඉදිරියට, වෙක්පත් මඟින් ආයතන මට්ටමින් ලැබෙන දායක මුදල් විශ්ලේෂණයක් ඇතුළත් කිරීමේ ක්‍රම වේදයක් මේ වන විට ආරම්භ කර ඇත. | |
| 3. | 1942 රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් පනතේ 25 වන වගන්තිය ප්‍රකාරව එක් එක් මුදල් වර්ෂය අවසාන වීමෙන් පසු විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂක විසින් එම දිනයේ දී අරමුදලේ තමාගේ නමින් බැරට පවත්නා මුළු මුදල් ප්‍රමාණය එක් එක් දායකයා වෙත දැනුම් දිය යුතු වුවත් එම අවශ්‍යතාවය ඉටු | 2021 2022 2023 | පනතේ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතුය | මෙතෙක් පවතින ශේෂය පසුව නිරවුල්ව විශ්ලේෂණය කර ගැනීමේ බලාපොරොත්තුවෙන් දැනට 2024 වසරේ සිට ඉදිරියට, වෙක්පත් මඟින් ආයතන මට්ටමින් ලැබෙන දායක මුදල් විශ්ලේෂණයක් ඇතුළත් කිරීමේ ක්‍රම වේදයක් මේ වන විට ආරම්භ කර ඇත. | පනතේ විධිවිධාන අනුගමනය කිරීමට පියවර ගෙන නොතිබුණි. |

කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.
((යොමුව-2022- 1.6,
2023-1.6)

## 3.23 තේ ශක්ති අරමුදල

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | - | - | - | - | - |
| **2022** | - | - | - | - | - |
| **2023** | - | - | - | - | - |

| | විගණන නිරීක්ෂණය | වර්ෂය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| 1. | කර්මාන්තශාලා බදු දීම සම්බන්ධයෙන් එළඹ තිබූ ගිවිසුම් ප්‍රකාරව හොරණ පොහොර ගබඩාව, මාවරලවත්ත හා කම්හල් 12 කින් 2021 දෙසැම්බර් 31 දිනට බදු මුදල් නොගෙවා ඇති ප්‍රමාණය රු.127,148,022 ක් වේ. | 2021 | හිඟ වාරික අයකර ගැනීමට ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය. | හිඟ මුදල් අයකරගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කරන බවට ලිඛිතව බදු ගැණුම්කරුවන්ට දන්වා ඇත. | රු.120,736,964 ක හිඟ බදු මුදල් මේ වනවිට අයකරගෙන නොතිබුණි. |
| 2. | බදු ගිවිසුම් අනුව ගෙවිය යුතු මාසික බදු කුලිය ඊළඟ මස පළමු වන දින හෝ ඊට පෙර නොගෙවීම මත ගතවන සෑම දිනකටම බදු මුදලින් සියයට 1 ක් ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතු බැවින්, 2021 දෙසැම්බර් 31 දිනට බදු මුදල් නොගෙවීම මත ප්‍රමාද ගාස්තු | 2021 | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර ප්‍රමාද ගාස්තු අයකර ගත යුතුය. | කමිටුවක් පත්කොට ප්‍රමාද ගාස්තු අයකර ගැනීම පිළිබඳව සමාලෝචනය කර ඇත. | රු.1,529,889,861ක ප්‍රමාද ගාස්තු මේ වනවිට අයකරගෙන නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | වශයෙන් රු.740,132,354 ක් අයකර ගැනීමට පවතින බව නිරීක්ෂණය විය. | | | | |
| 3. | තේ ශක්ති අරමුදල විසින් ආරම්භ කරන ලද අක්‍රීය කම්හල් සක්‍රීය කිරීමේ ව්‍යාපෘතිය යටතේ උපරිම සීමාව රු. ලක්ෂ 07 කට යටත්ව ණය මුදලක් සපයා තිබුණු අතර අදාළ ගිවිසුම් කාලය අවසන් වූ පසුව තේ ශක්ති අරමුදලට අයවීමට තිබුණු මුදල් අයකර ගැනීමට තේ කම්හල් 05 කට එරෙහිව නඩු පවරා තිබුණි. | 2021 | නඩු නිමිති අවම වන පරිදි කළමනාකරණ කටයුතු සිදුකළ යුතුය. | හිඟ ණය මුදල් පැවති සියලු කළමනාකරණ කම්හල් වෙත නඩු පවරා ඇති අතර දැනට නඩුවලට අමාත්‍යාංශය පෙනී සිටී. | නඩු කටයුතු අවසන් වී නොමැති බැවින් තේ කම්හල් වෙතින් ලැබියයුතු ණය මේ දක්වා අයකරගෙන නොතිබුණි. |
| 4. | කොත්මලේ තේ ශක්ති කම්හල 2017 ජනවාරි 30 දින සිට 2027 ජනවාරි 29 දක්වා වසර 10 ක කාලසීමාවක් සඳහා තේ ශක්ති කර්මාන්තශාලාවේ කළමනාකාරීත්වය නුගේගොඩ රයිගම් ප්ලාන්ටේෂන් පුද්ගලික සමාගම වෙත අවබෝධතා ගිවිසුමක් මඟින් භාර දී තිබුණු අතර ගිවිසුම්ගත කාලසීමාව ආරම්භ කළ දින සිට කළමනාකරණ ගාස්තු ගෙවීමට මාස දෙකක | 2021 | මාසික කළමනාකරණ ගාස්තු ඊළඟ 10 වන දින බැංකු ගත කළ යුතු අතර මාස 02 ක කළමනාකරණ ගාස්තු ගෙවීම පැහැර හරින්නේනම් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර හිඟ බදු මුදල් අයකර ගත යුතුය. | අදාළ හිඟ මුදල් 2022.10.12 දිනට ප්‍රථම ගෙවන ලෙස දින ලබා දී ඇති අතර එසේ ගෙවීමට අපොහොසත් වන්නේ නම් ගිවිසුම අවලංගු කොට කම්හල නැවත පවරා ගැනීමට කටයුතු කරන බවත් ගෙවිය යුතු සියලු හිඟ මුදල් අයකර ගැනීමට නීතිමය කටයුතු කරන බවත් ලිඛිතව කළමනාකරණ ගැනුම්කරු දැනුවත් කොට ඇත. | ගිවිසුම් ප්‍රකාරව හිඟ බදු මුදල් මේ දක්වා අයකරගෙන නොතිබුණු අතර 2023 ජනවාරි 25 දින කර්මාන්තශාලාව අරමුදල වෙත පවරාගෙන වේවැල් කඳුර තේ ෆැක්ටරි සමාගමට 2024 මාර්තු 06 දින බදු වශයෙන් ලබා දී තිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | සහන කාලයක් ලබා දී තිබුණු අතර මසකට ගෙවීමට නියමිත කළමනාකරණ ගාස්තු මුදලින් ප්‍රමාද වන සෑම දිනකටම සියයට 1 ක් බැගින් ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට මෙම අවබෝධතා ගිවිසුම මඟින් දෙපාර්ශවය එකඟවී තිබුණි. එසේ වුවද මෙම කර්මාන්තශාලාව බදු ලෙස පවරා දුන් දින සිට 2022 ජූලි 31 දක්වා අයවිය යුතු මුළු වාරික මුදල රු.40,185,000 කින් අරමුදලට ලැබී තිබුණු මුදල රු. 4,617,000 ක් එනම් සියයට 11 ක් පමණක් විය. බදු ගැනුම්කරු අවසන් වරට 2019 ජූලි 11 දින රු. 627,000 ක බදු කුලියක් ගෙවා ඇති අතර ඉන් පසු වසර 02 ක කාලයක් තුළ කිසිදු බදු මුදලක් ගෙවා නොතිබුණි. ඒ අනුව මෙම කර්මාන්තශාලාව වෙනුවෙන් 2022 ජූලි 31 දිනට හිඟ වාරික හා හිඟ ප්‍රමාද ගාස්තු එකතුව රු. 322,718,895 ක් වී තිබුණි. | | | | |
| 5. | 2017 අප්‍රේල් 28 දින මාවරල තේ කම්හලේ කළමනාකාරීත්වය | 2021 | ගිවිසුම් ප්‍රකාරව නෛතික කටයුතු කර | අදාළ හිඟ මුදල නැවත අයකර ගැනීම සම්බන්ධයෙන් | මාවරල තේ කම්හල අරමුදල වෙත පවරාගෙන තිබුණද, |

| | | | | | |
|---|---|---|---|---|---|
| | වලහන්දූව ග්‍රීන්ලයින් ෆස්ට් පුද්ගලික සමාගම වෙත වසර 10 ක කාලයක් සඳහා පවරා දී තිබුණි. මෙම කර්මාන්තශාලාව බදු දුන් දින සිට 2022 ජනවාරි 31 වැනි දිනට අය විය යුතු මුළු වාරික මුදල රු.23,652,000 කින් තේ ශක්ති අරමුදලට ගෙවා ඇති බදු මුදල රු. 810,000 ක් වන අතර එය මුළු මුදලින් සියයට 3.42 ක් බව විගණනයේදී නිරීක්ෂණය විය. | | වගකිව යුතු පාර්ශවයන්ගෙන් හිඟ බදු මුදල් අයකර ගත යුතුය | කමිටුවක් පත්කොට, එම කමිටුවේ එකඟතාවය අනුව අදාල බදු මුදල් ගෙවීම සම්බන්ධයෙන් ලිඛිතව කම්හල් දැනුවත්කර ඇත. | ගිවිසුම් ප්‍රකාරව හිඟ බදු මුදල් මේ දක්වා අයකරගෙන නොතිබුණි. |
| 6. | මාවරල වත්ත කළමනාකාරීත්වය වලහන්දූව ග්‍රීන්ලයින් ෆස්ට් පුද්ගලික සමාගම වෙත පවරා දී තිබූ අතර, එම සමාගම විසින් බදු මත ලබා ගෙන තිබුණු මෙම බදු දේපළ සම්බන්ධයෙන් 2022 අප්‍රේල් 30 දිනට බදුකරු විසින් ගෙවා ඇති බදු මුදල, මුළු බදු මුදලින් සියයට 52 ක් වන අතර තේ ශක්ති අරමුදලට අයවීමට ඇති මුළු හිඟ වාරික මුදල රු. 10,300,000 ක් වී තිබුණි. | 2021 | ගිවිසුම් ප්‍රකාරව නෛතික කටයුතු කර හිඟ බදු මුදල් අයකර ගත යුතුය. | අදාළ හිඟ මුදල නැවත අයකර ගැනීම සම්බන්ධයෙන් කමිටුවක් පත්කොට, එම කමිටුවේ එකඟතාවය අනුව අදාල බදු මුදල් ගෙවීම සම්බන්ධයෙන් ලිඛිතව සමාගම දැනුවත්කර ඇත. | 2023 වර්ෂයේදී මාවරල වත්ත අරමුදල වෙත පවරාගෙන තිබුණද ගිවිසුම් ප්‍රකාරව හිඟ බදු මුදල් මේ දක්වා අයකරගෙන නොතිබුණි. |
| 7. | තේ ශක්ති අරමුදල සතු අක්කර 100 ක බිම් ප්‍රමාණයක් සහිත මාවරල වත්තේ තේ වගාව අක්කර 42 ක් | 2021 | ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව තේ පැළ තවාන් හා තේ වත්ත මනාව | ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව අපේක්ෂිත අස්වැන්න ලබා ගැනීමට නොහැකි වී ඇති | මාවරල වත්ත අරමුදල වෙත පවරාගෙන තිබුණද නව බදු ගැණුම්කරුවෙකු |

වන අතරම තේ පැළ තවානක්ද සහිත වේ. එමෙන්ම ගිවිසුමේ 19 වන වගන්තිය ප්‍රකාරව මෙම භූමියේ තේ තවාන් දෙකක් පවත්වාගෙන යා යුතු අතර කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය පවත්වාගෙන යනු ලබන තේ තවාන එසේම පවත්වා ගෙන යාමටත් අනික් තවාන බදු ගැනුම්කාර පාර්ශවය විසින් පවත්වාගෙන යාමටත්,පවතින මව් වගාව එලෙසම පවත්වාගෙන යාමටත් බදුකරු විසින් එකඟ වී තිබුණි. බදුකරු සමඟ එකඟ වී ඇති ගිවිසුමේ 18 වන වගන්තිය ප්‍රකාරව බදු දේපළෙහි වසරකට අක්කර 02 බැගින් අක්කර 12 ක තේ නැවත වගාව සිදු කළ යුතු අතර තේ පැළ සිටුවීමට ද බදු ගැනුම්කාර පාර්ශවය එකඟ වී තිබුණි. ඒ අනුව සමාගම විසින් අස්වැන්න ලබා ගැනීමේදී අපේක්ෂිත අස්වැන්න ලබා ගැනීමට නොහැකි වී ඇති බව 2021 අගෝස්තු 04 දිනැති තේ ශක්ති අරමුදලේ උද්ගතවී ඇති වත්කම් කළමනාකරණය සහ බදු මුදල් රැස් කිරිම පිළිබඳ ගැටලු

නඩත්තු කරගෙන යන ලෙස බදුකරු දැනුවත් කළ යුතුය.

බැවින් වත්ත ආපසු අරමුදලවෙත පවරා ගැනීමට කටයුතු කර ඇත.

වෙත ලබාදීමට කටයුතු කර නොමැති බැවින් අපේක්ෂිත නැවත වගාව හා අස්වැන්න ලබාගැනීමට නොහැකි වී ඇත.

| | | | | | |
|---|---|---|---|---|---|
| | නිරාකරණය කිරීම සඳහා නිර්දේශ ලබා දීමේ කමිටු වාර්තාවේ දක්වා තිබුණි. | | | | |
| 8. | දෙනියාය තේ ශක්ති කම්හල වලහන්දූව ග්‍රීන් ලයින් ෆස්ට් පුද්ගලික සමාගම විසින් බදු ලෙස ලබා ගෙන තිබුණු මෙම කම්හල සම්බන්ධයෙන් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අනුමත නිමි තේ ධාරිතාවය මාසිකව කි.ග්‍රෑම් 35,000 ක් වේ. 2016 නොවැම්බර් 17 දින සිට 2026 නොවැම්බර් 16 දින දක්වා වසර 10 කාලයක් සඳහා බදුකරු විසින් මෙම කම්හල බදු ලෙස ලබා ගෙන තිබුණු අතර 2022 අප්‍රේල් 30 දිනට මුළු බදු වලින් ගෙවා ඇති බදු මුදල සියයට 37 කි. ඒ අනුව එදිනට හිඟ බදු වාරික මුදල රු. 24,187,837 ක් වී තිබුණි. | 2021 | ගිවිසුම ප්‍රකාරව නෛතිකව කටයුතු කර වගකිව යුතු පාර්ශවයන්ගෙන් හිඟ බදු මුදල් අයකර ගත යුතුය. | අදාළ හිඟ මුදල නැවත අයකර ගැනීම සම්බන්ධයෙන් කමිටුවක් පත්කොට, එම කමිටුවේ එකඟතාවය අනුව අදාල බදු මුදල් ගෙවීම සම්බන්ධයෙන් ලිඛිතව සමාගම දැනුවත්කර ඇත. | ගිවිසුම් ප්‍රකාරව හිඟ බදු මුදල් මේ දක්වා අයකරගෙන නොතිබුණි. |
| 9. | ගිලීමලේ තේ ශක්ති කම්හල 2016 නොවැම්බර් 24 දින රත්නපුර ප්‍රදේශයේ පෞද්ගලික ගැනුම්කාරියක වෙත මෙම කම්හලේ කළමනාකාරීත්වය වසර 10 ක කාලයක් සඳහා බදු පදනමට | 2021 | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර හිඟ බදු අයකර ගත යුතුය. | අදාළ හිඟ මුදල නැවත අයකර ගැනීම සම්බන්ධයෙන් කමිටුවක් පත්කොට, එම කමිටුවේ එකඟතාවය අනුව අදාල බදු මුදල් ගෙවීම සම්බන්ධයෙන් ලිඛිතව සමාගම | 2023 වර්ෂයේදී කම්හල අරමුදල වෙත පවරාගෙන තිබුණද ගිවිසුම් ප්‍රකාරව හිඟ බදු මුදල් මේ දක්වා අයකරගෙන නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ලබා දී තිබූ අතර,2022 මාර්තු 01 දිනට තේ ශක්ති අරමුදලට අයවිය යුතු වාරික මුදල රු. 9,775,500 ක් වී තිබුණු අතර වාරික මුදල් හා හිඟ වාරික සඳහා ප්‍රමාද ගාස්තු ඇතුළුව මුළු මුදල රු.76,973,660 ක් වී තිබුණි. මෙම බදු ගැනුම්කරු විසින් 2020 ජනවාරි මස සිට 2022 මාර්තු 01 දක්වා කිසිදු මුදලක් තේ ශක්ති අරමුදල වෙත ගෙවා නොතිබුණි. | | | දැනුවත්කර ඇත. | |
| 10. | ඇල්පිටිය තේ ශක්ති කර්මාන්තශාලාව 2022 මැයි 31 දින වන විට තේ ශක්ති අරමුදලට අයවිය යුතු හිඟ කළමනාකරණ ගාස්තු රු. 2,150,000 ක් වී තිබුණු බව නිරීක්ෂණය විය. | 2021 | නොපමාව හිඟ බදු මුදල් අය කර ගත යුතුය. | නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බවට ලිඛිතව දැනුවත කොට ඇත. | ගිවිසුම් ප්‍රකාරව හිඟ බදු මුදල් මේ දක්වා අයකරගෙන නොතිබුණි. |
| 11. | 2021 ජනවාරි 20 දින සිට 2031 ජනවාරි 19 දක්වා වසර 10 ක කාලයකට, රයිගම් කුඩා තේ වතු සංවර්ධන සමිතිය විසින් රයිගම් කෝරලේ තේ කර්මාන්තශාලාවේ කළමනාකාරීත්වය බදු පදනමට ලබා ගැනීමට අවබෝධතා ගිවිසුමකට එකඟ වී | 2021 | ගිවිසුම් ප්‍රකාරව නෛතිකව කටයුතු කර වගකිව යුතු පාර්ශවයන්ගෙන් හිඟ බදු මුදල් අයකර ගත යුතුය. | අදාළ හිඟ මුදල නැවත අයකර ගැනීම සම්බන්ධයෙන් කමිටුවක් පත්කොට, එම කමිටුවේ එකඟතාවය අනුව අදාල බදු මුදල් ගෙවීම සම්බන්ධයෙන් ලිඛිතව කම්හල් දැනුවත්කර ඇත. | ගිවිසුම් ප්‍රකාරව නෛතිකව කටයුතු කර වගකිව යුතු පාර්ශවයන්ගෙන් හිඟ බදු මුදල් අයකරගෙන නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | තිබුණි. බදු ගිවිසුමට අනුව මසකට රු.600,000 බැගින් කළමනාකරණ ගාස්තු ගෙවීමටත්, දික්හේන සමිතියෙන්, තේ දළු සැපයූ පාර්ශවවෙත ගෙවිය යුතු රු.23,302,826 ක මුදල එම පාර්ශව වෙත ගෙවීමටත් රයිගම් කුඩා තේ වතු සංවර්ධන සමිතිය එකඟ වී තිබුණ ද 2021 දෙසැම්බර් 31 දිනට මෙම සමිතියෙන් තේ ශක්ති අරමුදලට අයවිය යුතු බදු මුදල රු. 3,600,000 ක්වී තිබුණු අතර ඉහත හිඟ තේ දළු මුදල්ද ගෙවා නොතිබුණි. | | | | |
| 12. | මහවැලි තේ ශක්ති තේ කම්හලට අයත් ඉඩමේ කොටසක් පුද්ගලයකු විසින් අනවසරයෙන් අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් හා බලංගොඩ තේ ශක්ති තේ කම්හලට අයත් පර්චස් 5.41 ක ඉඩම් ප්‍රමාණයක පුද්ගලයකු විසින් ගරාජයක් ඉදිකිරීම නිසා ඒ අයට එරෙහිව අරමුදල විසින් නඩු දෙකක් පවරා තිබුණි. | 2021 | නඩු කටයුතු කඩිනමින් අවසන් කර ගත යුතුය. | නඩු කටයුතු සිදු කරමින් පවතී. | නඩු කටයුතු අවසන්කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| 13. | කර්මාන්තශාලා බදු දීමෙන් ලැබෙන ආදායමෙන් කොටස් හිමියන් වෙත ප්‍රතිලාභ ලබා දීමට හා සුබසාධන රක්ෂණ අරමුදලෙන් කර්මාන්තශාලාවල කටයුතු සඳහා යෙදවූ රු.මිලියන 135 ක මුදල් නැවත එම අරමුදල වෙත ලබා දීමට කටයුතු කිරීම සහ ඉන් අනතුරුව ඉතිරිවන බදුකුලී ආදායම ඒකාබද්ධ අරමුදල වෙත බැර කිරීම තේ ශක්ති අරමුදල ප්‍රතිව්‍යුහගත කිරීමේ අපේක්ෂාව විය. එසේ වුවද අපේක්ෂිත අයුරින් කර්මාන්තශාලා බදුකුලී ආදායම් ලබාගැනීමට අපොහොසත්වීම නිසා අරමුදල ප්‍රතිව්‍යුහගත කර වසර 5 ක් පමණ ගත වුවද උක්ත අරමුණු කරා ලඟාවීමට අරමුදලට නොහැකි වී තිබුණි. 2021 දෙසැම්බර් 31 දිනට තේ ශක්ති අරමුදලේ කළමනාකාරිත්වය සහ වත්කම් බදු දීමෙන් රු. 165,806,868 ක බදුකුලී ආදායමක් ලබා තිබුණද, සුභසාධන රක්ෂණ අරමුදලින් | 2021 | අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාර අරමුදල ප්‍රතිව්‍යුහගත කිරීමේ අරමුණු ඉටු කර ගැනීම සඳහා ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය. | සුභසාධන රක්ෂණ අරමුදලේ මිලියන 135ක් ස්ථාවර තැන්පතු ගිණුම් වල ආයෝජනය කර ඇත. | අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, රු.මිලියන 135 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණද ඉතිරි බදුකුලී ආදායම ඒකාබද්ධ අරමුදල වෙත බැර කිරීම සිදුකර නොතිබුණි. | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | කර්මාන්තශාලා කටයුතු සඳහා ලබා දුන් රු. මිලියන 135 ක මුදලින් සුඛසාධන රක්ෂණය අඛණ්ඩව පවත්වාගෙන යෑම සඳහා ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි. | | | | |
| 14. | අරමුදල ප්‍රතිව්‍යුහගත කිරීමට අනුමැතිය ලබාදෙන ලද 2016 ජූලි 13 දිනැති අංක අමප/16/1224/726/015-I දරන අමාත්‍ය මණ්ඩල තීරණය සඳහා මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණවල දක්වා ඇති පරිදි ස්ථිර කාර්යය මණ්ඩලය අමාත්‍යාංශය යටතේ පවත්නා වෙනත් ආයතනවලට අනුයුක්ත කිරීමේදී අදාළ ආයතනයේ කැමැත්ත මත සහ කාර්යය මණ්ඩල වැටුප් හා වේතන එකී ආයතනවල පවත්නා අයවැය ප්‍රතිපාදන මත ගෙවීමට කටයුතු කළ යුතුය. එසේ වුවද කළමනාකරණ සහකාර නිලධාරින් තිදෙනෙක් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවට ද, රියදුරකු කුඩා තේ වතු සංවර්ධන අධිකාරියටද, මුදාහැර | 2021 | බාහිර ආයතනයකට මුදාහළ නිලධාරීන්ට ගෙවන ලද වැටුප් ප්‍රතිපූර්ණය කරගත යුතුය. | අදාළ ආයතන වල පැවති පුරප්පාඩු මත අදාළ අනුයුක්ත කිරීම් සිදුකර ඇති අතර ඒ පිළිබඳව ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග සිදු කිරීමට අවශ්‍යය මූලික කටයුතු ආරම්භ කර ඇත. | බාහිර ආයතනයකට මුදාහළ නිලධාරීන්ට ගෙවන ලද වැටුප් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි. |

තිබුණු අතර 2018 සහ 2019 වර්ෂයන් හි එම නිලධාරීන් වෙනුවෙන් වැටුප් ලෙස රු.1,459,614 ක් හා රු.1,822,298 ක් අරමුදලෙන් ගෙවීම් කර තිබුණි. එමෙන්ම කළමනාකරණ සහකාර නිලධාරීන් දෙදෙනෙකු හා රියදුරකු වෙනුවෙන් 2020 වර්ෂයේදී රු.1,587,324 ක් හා 2021 වර්ෂයේදී රු.1,715,940 ක්ද ගෙවා තිබුණි.

## 3.24 තුරුසවිය අරමුදල

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 47,463,260 | 7,411,494 | 40,051,766 | 3,543,063 | තත්ත්වාගණනය කළ |
| **2022** | 44,591,405 | 9,020,825 | 35,570,580 | (3,978,820) | තත්ත්වාගණනය නොකළ |
| **2023** | 47,242,825 | 8,155,931 | 39,086,894 | (2,344,023) | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| 1. | 2020 ජනවාරි 05 දින ජනාධිපති ලේකම් කාර්යාලයෙන් තුරුසවිය අරමුදල වෙත ලැබී තිබුණු කාර් රථය රැගෙන ආ දිනයේ සිට ධාවන තත්ත්වයේ නොතිබුණු අතර වාහන අලුත්වැඩියාව සඳහා ප්‍රමාණවත් මුදලක් වෙන්කර නොමැති බැවින් අලුත්වැඩියා කිරීමට කටයුතු නොකර වසර තුනකට වැඩි කාලයක් තුරුසවිය අරමුදල පරිශ්‍රයේ ගාල්කර තිබුණි. | 2022 | වාහනය අලුත්වැඩියා කර උපයෝජනය කළ යුතුය. | මෙම වාහනයේ අලුත්වැඩියා වියදම අධික බැවින් අපහරණය කරන වාහන හඳුනාගැනීමේ කමිටුව වෙත ඉදිරිපත් කර ඇත. | 2023 දෙසැම්බර් 31 දිනට තුරුසවිය අරමුදල සතු වත්කම් බෙදා හැර වගකීම් කපා හැර අරමුදල අවසන් කර තිබුණද මේ දක්වා මෙම වාහනය අපහරණය කිරීමට තටයුතු කර නොමැත. |
| 2. | 2023 දෙසැම්බර් 14 දින පැවති තුරුසවිය සමිති අවසාන කළමනාකරණ මණ්ඩල රැස්වීමේ තීරණය පරිදි | 2023 | කළමනාකරණ මණ්ඩල රැස්වීමේ තීරණය ප්‍රකාරව සමිති බලාත්මක කිරීමට හා අහෝසි කිරීමට කටයුතු | මෙම සමිති බලාත්මක කිරීමට හා අහෝසි කිරීම සඳහා ගැසට් කිරීමට අවශ්‍ය සියලු ලේඛණ සකස් කර ඇත. | මේ දක්වා එම සමති ගැසට් කිරීමට කටයුතු කර නොමැත. |

| | |
|---|---|
| තුරුසවිය අරමුදල අහෝසි කර තුරුසවිය සමිති වෙනත් ආයතනයකට ලිඛිතව පවරා 2000 අංක 23 දරන තුරුසවිය පනතේ අංක 17(4) උප වගන්තිය අනුව ලියාපදිංචිය නිකුත් කර ඇති සමිති 212ක් බලාත්මක කිරීමටත්, ලියාපදිංචිය නිකුත් කර ඇති සමිති 152ක් අහෝසි කිරීමටත් කටයුතු කළ යුතු වුවද අදාළ කටයුතු 2024 මැයි මාසය අවසන් වන විටත් සිදු කර නොතිබුණි. | කළ යුතුය. |

## 3.25 රේගු අතිකාල, නැව් බඩු පරීක්ෂා කිරීමේ ගාස්තු සහ රේගු තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන අරමුදල

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | බදු පෙර ලාභය (අලාභය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 2,491,322,458 | 544,994,745 | 1,946,327,713 | (176,966,439) | තත්ත්වාගණනය කළ |
| **2022** | 2,261,405,536 | 500,943,271 | 1,760,462,265 | (181,023,338) | තත්ත්වාගණනය කළ |
| **2023** | 2,058,901,284 | 421,921,922 | 1,636,979,362 | (123,832,043) | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| 1. | අතිකාල ආදායම් රැස්කරන මධ්‍යස්ථාන සඳහා අතිකාල ආදායම් ඇස්තමේන්තු සකස් කිරීමේදී ඇස්තමේන්තුගත අතිකාල පැය හා අනුයුක්ත කරනු ලබන නිලධාරීන් සංඛ්‍යාව සම්බන්ධයෙන් අදාල ආයතනයන් සමඟ ඇතිකරගත් එකඟතාවයන් ඇතුලත් ගිවිසුම් විගණනයට ඉදිරිපත් නොවුණි. | 2021 | අදාල ආයතනයන් සමඟ විධිමත් ගිවිසුම්වලට එළඹීමට කටයුතු කළ යුතු බව | අතිකාල ආදායම් රැස් කරන ස්ථාන සඳහා සේවා සපයන නිලධාරීන් සංඛ්‍යාව නිශ්චිත නොමැති බවත් සේවා අවශ්‍යතාව මත යොදවනු ලබන නිලධාරීන් ගණන හා යොදවනු ලබන පැය ගණන තීරණය වන බවත් විගණනයට දන්වා තිබුණු අතර ගිවිසුම්වලට එළඹීමට කටයුතු කර නොතිබුණි. | අදාල ආයතනයන් සමඟ විධිමත් ගිවිසුම්වලට එළඹීමට කටයුතු කර නොතිබුණි. |
| 2. | 1967 වර්ෂයේ සිට 2007 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ ආයතන 75 ක් විසින් ශ්‍රී ලංකා රේගුවේ තැන්පත් කර තිබූ රු.253,314 ක | 2021 | වර්ථමානයේදී සේවා සැපයීම හා ආයතනවල පැවැත්ම පිළිබඳ විමර්ශනයකර නිසි ගිණුම් තැබීමක් සිදුකිරීම හෝ | මෙහි සඳහන් ආයතනවලට අදාල මුදල් රේගු දෙපාර්තමේන්තුව නමින් තැන්පත්ව නොමැති බවත් ඒ ඒ ආයතන | 2023 වර්ෂයේදී එම ආයතනවල පැවැත්ම, තවදුරටත් සේවා සැපයීම, දෙපාර්තමේන්තුව සමග ඇති බැඳියාව ආදිය පිළිබඳව කිසිදු |

| | | | | | |
|---|---|---|---|---|---|
| | මුදල බාහිර ආයෝජනවල යෙදවීම තුළින් උපයා තිබූ පොලී ආදායම රු.14,181,228 ක් සමඟ සමස්ථ ආයෝජනය රු.14,434,542 ක් විය. මෙම ආයතනවල පැවැත්ම මෙන්ම වර්තමානයේදී සේවා සැපයීම් පිළිබඳව කිසිදු විමර්ශනයක් සිදු නොකර අදාල ශේෂය වගකීම් සහ ආයෝජන යටතේ ගිණුම්වල ඉදිරියට ගෙන එමින් පැවතුණි. | | අවශ්‍ය වෙනත් කටයුතු සිදුකළයුතු බව. | නමින් ගිණුම්ගත කර ආරක්ෂිතයක් ලෙස අදාල ගිණුම් පොත් රේගු දෙපාර්තමේන්තුව භාරයේ තබාගෙන ඇති බවත් වැරදීමකින් අදාල බැංකු ගිණුම් හි ශේෂයන් (පොළිය සමඟ) රේගු දෙපාර්තමේන්තු ගිණුම් වලට ඇතුළත් කර ඇති බවත් විගණනයට දන්වා තිබුණි. | විමර්ශනයක් සිදු නොකර අදාල ශේෂ ගිණුම්වලින් ඉවත් කර තිබුණි. |
| 3. | 2017 අප්‍රේල් 17 දිනැති අංක 3/2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව සියළුම රාජ්‍ය සේවකයන් සිය පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා කළ යුතු වුවද ශ්‍රී ලංකා රේගුවේ සේවයේ නියුතු රජයේ නිලධාරීන් කිසිවෙකු එම අවශ්‍යතාවය ඉටු කර නොතිබියදී, 2021 වර්ෂය සඳහා රු.948,323,405 ක මුදලක් අතිකාල ලෙස ගෙවා තිබුණි. | 2021 | රාජ්‍ය අංශයේ සියළුම නිලධාරින්ට අදාල පොදු චක්‍රලේඛ අනුව රේගු කාර්ය මණ්ඩලයද කටයුතු කළයුතු බව. | ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර භාවිතය රේගු දෙපාර්තමේන්තුවේ කාර්ය ස්වභාවය අනුව ක්‍රියාත්මක කිරීම ප්‍රායෝගිකව දුෂ්කර වී ඇති බව දක්වමින් නිලධාරීන්ගේ පැමිණිම හා පිටවීම සටහන් කිරීම සඳහා පොදු 18 ආකෘති පත්‍රය අනුව අත්සන් ලේඛනයක් පවත්වා ගෙන ගොස් තිබුණි. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව රේගු කාර්ය මණ්ඩලය කටයුතු කර නොතිබුණි. |
| 4. | අතිකාල අරමුදලේ ඌණතාවය පසුගිය වර්ෂයට වඩා | 2021 | සමුච්චිත අරමුදලේ ශේෂය ක්‍රමයෙන් පිරිහීම පිළිබඳව | රේගු අතිකාල, නැව් බඩු පරීක්ෂා කිරීමේ ගාස්තු සහ රේගු | සමුච්චිත අරමුදලේ ශේෂය ක්‍රමයෙන් පිරිහීම පිළිබඳව |

| | | | | | |
|---|---|---|---|---|---|
| | රු. 35,191,543 කින් වැඩි වී තිබුණු අතර ඌණතාවය පියවා ගැනීම සඳහා සමුච්චිත අරමුදල් යොදා ගැනීම මත 2018 වර්ෂයේ සිට සමුච්චිත අරමුදලේ ශේෂය ක්‍රමයෙන් පිරිහෙමින් පැවතුණි. ඒ අනුව 2018 වර්ෂයේදී රු.2,331,074,672 ක්ව පැවති සමුච්චිත අරමුදලේ ශේෂය 2021 දෙසැම්බර් 31 දින වන විට රු. 1,946,327,712 ක් දක්වා අඩුවී තිබුණි. | | ප්‍රමාණවත් අවධානයක් යොමු කරමින් අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කළ යුතු බව. | තොරතුරු හා තාක්ෂණ සංනිවේදන අරමුදල යටතේ ආදායම් රැස් කිරීම සම්බන්ධයෙන් නැවත සලකා බලා යාවත්කාලීන කිරීම සඳහා ගාස්තු අයකිරීම් කමිටුවක් පත්කර තිබුණු අතර, එම කමිටු නිර්දේශ මත ඉදිරියේදී ඉහත රේටයන් යාවත්කාලීන කර අතිකාල අරමුදලේ ආදායම ඉහළ දැමීමට කටයුතු කරන බව දැනුම් දී තිබුණි. | ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි. ඒ අනුව 2019 වර්ෂයේදී රු.2,275,913,245 ක්ව පැවති සමුච්චිත අරමුදලේ ශේෂය 2023 දෙසැම්බර් 31 දින වන විට රු. 1,636,979,362 ක් දක්වා රු.638,933,884 න් අඩුවී තිබුණි |
| 5. | වර්ෂය තුළ දී රැස් කළ අතිකාල ආදායම ඉක්මවා රු.93,950,498 ක් අතිකාල වියදම් ලෙස නිලධාරීන්ට ගෙවා තිබුණි. තව ද පෙර වර්ෂයට සාපේක්ෂව රැස් කළ අතිකාල ආදායම ඉක්මවූ වියදම රු.32,434,768 කින් ඉහළ ගොස් තිබුණි. | 2021 | බාහිර ආයතනවලින් රැස්කරන අරමුදල් ඉක්මවා අතිකාල ගෙවීම් සිදු නොකිරීමට කළමනාකරණ විසින් පියවර ගත යුතු බව සහ ආදායම් ඉපැයීම් නිසි පරිදි කළමනාකරණය කළ යුතු බව. | මේ සම්බන්ධයෙන් නැවත සලකා බලා යාවත්කාලීන කිරීම සඳහා ගාස්තු අයකිරීම් කමිටුවක් පත්කර ඇති අතර, එම කමිටු නිර්දේශ මත ඉදිරියේදී ඉහත රේටයන් යාවත්කාලීන කර අතිකාල අරමුදලේ ආදායම ඉහළ දැමීමට කටයුතු කරමින් සිටී. | බාහිර ආයතනවලින් රැස්කරන ගාස්තු ඉක්මවා අතිකාල ගෙවීම් සිදු නොකිරිමට කළමනාකරණ විසින් පියවර ගෙන ආදායම් ඉපැයීම් නිසි පරිදි කළමනාකරණය කර නොතිබුණි. |
| 6. | අතිකාල අරමුදලේ 2021 ආදායම ලෙස රු.1,055,739,250 ක් ඇස්තමේන්තු ගත කර තිබුණ ද උපයාගත් සත්‍ය ආදායම රු.854,372,907 ක් වීම හේතුවෙන් ඇස්තමේන්තුගත | 2021 | අයවැය ලේඛනය නිසි පරිදි පිළියෙල කළ යුතු බව. | -එම- | අයවැය ලේඛනය නිසි පරිදි පිළියෙල කළ නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ආදායමට වඩා සත්‍ය ආදායමේ රු.201,366,343 ක අහිතකර විචලතාවයක් නිරීක්ෂණය විය. මෙය ඇස්තමේන්තුගත ආදායමේ ප්‍රතිශතයක් ලෙස සියයට 19 ක පිරිහීමකි. ඊට ප්‍රධාන හේතු වශයෙන් ‘‘කොළඹ’’ අනුශීර්ෂය යටතේ වූ ආදායම රු.207,450,430 කින් අඩුවීම බලපා තිබුණි. ඒ අනුව අතිකාල අරමුදලේ අයවැය ඇස්තමේන්තුව අනුව රු.165,325 ක අතිරික්ත ආදායමක් අපේක්ෂා කළද ප්‍රතිඵලය වී තිබුණේ රු.176,966,439 ක ඌනතාවයකි. | | | | |
| 7. | 2007 ඔක්තෝබර් 26 දිනැති අංක 17/1520 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය අනුව නැව් බඩු පරීක්ෂණ ගාස්තු ගිණුමෙන් රේගු නිලධාරීන්ට ගෙවීම් කිරීම සඳහා මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කරනු ලැබූ පටිපාටියක් පැවතිය යුතු වුව ද, එවැනි කාර්ය පරිපාටියක් අනුමත | 2023 | අති විශේෂ ගැසට් පත්‍රයට අනුකූල විය යුතු බව. | තවදුරටත් ගොනු පරිශීලනය කිරීමෙන් අනතුරුව මේ පිළිබඳව සොයා බැලීමට සටහන් කර ගත් බව දැනුම් දී තිබුණි. | අති විශේෂ ගැසට් පත්‍රයට අනුකූලව කාර්ය පරිපාටියක් සකස් කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | කරගෙන නොතිබුණි. | | | | |
| 8. | 2013 මාර්තු 01 දිනැති නියෝග අංක 855 මගින් 2004 වර්ෂයේදී අනුමත කරන ලද පැයක අතිකාල රේටය සියයට 45න් වැඩිකිරීමටත්, 2018 ඔක්තොබර් 01 දිනැති නියෝග අංක 1274 මගින් එවකට ගෙවූ පැයක අතිකාල රේටය සියයට 50න් වැඩිකිරීමටත් අතිකාල කමිටුවේ අවසාන නිර්දේශයට යටත්ව අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කර තිබුණ ද, මෙම නියෝගයන් දෙක සඳහා අතිකාල කමිටුවේ අවසාන නිර්දේශයන් ලද බවට හෝ මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය ලද බවට විගණනයට තහවුරු නොවුණි. | 2023 | මුදල් අමාත්‍යාංශයේ සහ අතිකාල කමිටුවේ අනුමැතිය ලබා ගත යුතු බව. | රේගු දෙපාර්තමේන්තුව මගින් රැස්කරන දැනට පවතින ගාස්තු, අය කිරීම් හා අතිකාල ප්‍රමාණයන් (රේටයන්) සංශෝධනය කිරීම සඳහා ගාස්තු හා අයකිරීම් අනුකමිටුව හා අතිකාල කමිටුවේ නිර්දේශ අනුව ගැසට් පත්‍රයක් පිළියෙළ කර මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට මේ වන විට කටයුතු කරමින් පවතී. | මුදල් අමාත්‍යාංශයේ සහ අතිකාල කමිටුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| 9. | නිලධාරීන් සාමාන්‍ය රාජකාරි වලින් පරිබාහිරව සේවයේ යෙදුනාද යන්න තහවුරුවකින් තොරව රේගු අතිකාල අරමුදලින් සියයට 90 ක් නිලධාරීන් වෙත අතිකාල වශයෙන් ගෙවා තිබුණු අතර 2021 වර්ෂයේ සිට 2023 කාල සීමාව ඇතුළත රැස්කල මුළු | 2023 | රාජ්‍ය ආදායමට බැර වන ප්‍රමාණය පිළිබඳව නැවත සමාලෝචනයක් සිදු කළ යුතු බව. | රේගු අතිකාල සහ නැව්බඩු ගාස්තු සම්බන්ධ 2007.10.26 දිනැති හා 1520/17 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි (4) 3 ප්‍රකාරව සහ රේගු තොරතුරු හා තාක්ෂණ සන්නිවේදන අරමුදලේ 2013.09.27 දිනැති | රාජ්‍ය ආදායමට බැර වන ප්‍රමාණය පිළිබඳව නැවත සමාලෝචනයක් සිදු කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | අතිකාල ආදායම රු.2,516,116,911 ක් අතරින් රු.251,611,691 ක් පමණ සුළු ප්‍රමාණයක් රාජ්‍ය ආදායමට බැරකර තිබුණි. ඒ අනුව රාජ්‍ය ආදායමට බැර වන ප්‍රමාණය පිළිබඳව නැවත සමාලෝචනයක් කළමනාකරණය විසින් සිදු කළ යුතුව පැවතුණි. | | | හා 1829/39 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ (3) 5 (අ) ප්‍රකාරව නිලධාරීන්ට ගෙවන මුදල හා රජයේ ආදායමට බැර කරන මුදල සම්බන්ධයෙන් තීරණය කර ඇති බව දැනුම් දී තිබුණි. | |
| 10. | 2017 පෙබරවාරි 27 දිනැති දෙපාර්තමේන්තු නියෝග අංක 1140 අනුව රේගු නැව් බඩු පරීක්ෂණ ගාස්තු ලැබීමට හිමිකම් පෑම සඳහා සතියේ දින වල පෙ.ව. 06.00 ට පෙර සහ සති අන්තයන්හිදී සහ රජයේ නිවාඩු දින වලදී පෙ.ව. 09.00 ට පෙර සේවයට වාර්තා කළ යුතු බවත්, එසේ නොමැති අවස්ථා වල පරීක්ෂණ ගාස්තු සඳහා හිමිකමක් නොමැති බවත් සඳහන් වුවද, ශ්‍රී ලංකා රේගුවෙහි කාර්යය මණ්ඩලය පැමිණීම/ පිටවීම පවත්නා චක්‍රලේඛ වලට අනුව තහවුරු කර ගැනීමකින් තොරව 2012 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා රු. 3,334,759,284 ක් | 2023 | පැමිණීම/ පිටවීම පවත්නා චක්‍රලේඛ වලට අනුව තහවුරු කර ගෙවීම් කිරීමට කටයුතු කළ යුතු බව. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 09/2009 අනුව නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම, ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර භාවිතය මඟින් සනාථ කළ යුතු වුවත්, රේගු දෙපාර්තමේන්තුවේ කාර්ය ස්වභාවය අනුව එය ක්‍රියාත්මක කිරීම ප්‍රායෝගිකව දුෂ්කර වී ඇත. එබැවින්, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා පොදු 18 ආකෘති පත්‍රය අනුව විධිමත් පරිදි අත්සන් ලේඛනයක් පවත්වා ගෙන යනු ලබන අතර, නිවාඩු ලේඛන සහ රේගු අතිකාල සඳහා වෙනම විධිමත් | පැමිණීම/ පිටවීම පවත්නා චක්‍රලේඛ වලට අනුව තහවුරු කර ගෙවීම් කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| | පරීක්ෂණ ගාස්තු වශයෙන් ගෙවා තිබුණි. | ලේඛනයක් ද පවත්වාගෙන යනු ලබන බවත් ඒ සඳහා මාණ්ඩලික නිලධාරියකු විසින් අනුමැතිය ලබා දීමෙන් සහ නිසි සනාථ කිරීමකින් පසු අතිකාල ගෙවීම් සිදු කර බැවින්, විගණන මතය හා එකඟ නොවන බව දන්වා තිබුණි. |
| 11. | 2023 වර්ෂය තුළ 2023 අරමුදලට අයකරගන්නා ලද ආදායම අතිකාල, නැව්බඩු පරීක්ෂණ හා තොරතුරු තාක්ෂණ කටයුතු වෙනුවෙන් පිළිවෙලින් රු.820,263,153 ක්, රු.243,393,910 ක් හා රු.14,976,000 ක් වී තිබුණි. එම කාර්යයන්ගේ කටයුතුවල නිරත වූ නිලධාරීන්ට අතිකාල ආදායමෙන් සියයට 105 ක් ලෙස රු.862,061,573 ක් ද, නැව්බඩු පරීක්ෂණ ආදායමෙන් සියයට 50 ක් ලෙස රු.121,696,955ක් ද හා තොරතුරු තාක්ෂණ ආදායමෙන් සියයට 80 ක් ලෙස රු.11,980,800 ක්ද ගෙවා තිබුණි. ඉහත ගෙවීම් ක්‍රියාවලිය තුල පහත සඳහන් කරුණු | |

නිරීක්ෂණය විය.

| | | | | | |
|---|---|---|---|---|---|
| (i) | අතිකාල අරමුදලේ ගෙවීම් විධිමත් පාලනයක් යටතේ සිදු නොවන බව ඉකුත් විගණන වාර්තාවල අඛණ්ඩව පෙන්වා දී තිබුණද, මෙම තත්ත්වය විධිමත් කිරීම සඳහා මේ දක්වා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2023 | වර්තමාන අතිකාල ගෙවීම් ක්‍රියාවලිය සමාලෝචනය කළ යුතු බව. | ඉකුත් විගණන වාර්තාවල පෙන්වා දී ඇති කරුණු ද විශ්ලේෂණය කරමින් ගෙවීම් ක්‍රමවේදය තවදුරටත් විධිමත් කිරීමට කටයුතු කරමින් පවතී. | මෙම තත්ත්වය විධිමත් කිරීම සඳහා මේ දක්වා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ii) | 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂය තුළ අතිකාල ආදායම රු.21,217,698 කින් අඩුවී තිබුණි. තවද, වර්ෂය තුළ දී රැස් කළ අතිකාල ආදායම ඉක්මවා රු.41,798,420 ක් අතිකාල වියදම් ලෙස නිලධාරීන්ට ගෙවා තිබුණි. | 2023 | ආදායම් නිසි පරිදි කළමනාකරණය කළ යුතු බව. | 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ අතිකාල වියදම ද රු. 76,811,047 කින් අඩුවී ඇති බව දන්වා තිබුණි. | ආදායම් නිසි පරිදි කළමනාකරණය කිරීමට කටයුතු කර නොතිබුණි. |

## 3.26 රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදල

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| 2021 | 10,099,832,072 | 1,509,174,581 | 8,590,657,491 | 855,371,840 | තත්ත්වාගණනය කළ |
| 2022 | 11,080,879,797 | 990,546,592 | 10,090,333,205 | 1,499,675,714 | තත්ත්වාගණනය කළ |
| 2023 | 12,570,781,850 | 80,379,402 | 12,490,402,448 | 2,400,069,243 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| 1. | රේගු නිලධාරීන්ගේ කළමනාකරණ සඵලතා වර්ධනය කිරීම හා නිලධාරීන්ට වන්දි ගෙවීම සඳහා නිශ්චිත නිර්ණායක හා අනාගත අපේක්ෂිත අරමුණුගත වියදම් නිවැරදිව සැලසුම් කිරීමකින් තොරව මෙම අරමුදලට මුදල් වෙන් කිරීම නිසා අරමුදලේ සමුච්චිත ශේෂය වාර්ෂිකව අඛණ්ඩව වර්ධනය වීමේ ප්‍රවණතාවයක් නිරීක්ෂණය විය. 2020 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 7,775 ක් වූ අරමුදලේ සමුච්චිත ශේෂය 2021 දෙසැම්බර් 31 දින වන විට රු. මිලියන 8,611 ක් දක්වා රු.මිලියන 836 කින් හෙවත් සියයට 11 | 2021 | රේගු ආඥා පනත මේ වන විට වසර 153 ක් පමණ පැරණි වන අතර වර්තමානයට ගැලපෙන පරිදි සංශෝධනය කළ යුතු බව. | රේගු ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව රේගු විමර්ශන වල විකුණුම් හා දණ්ඩන මගින් පනවන ලද දඩ මුදලින් අදාල වියදම් ඇතොත් එය අඩු කිරීමෙන් පසු සියයට 20 ක ප්‍රමාණයක් මෙම අරමුදලට බැර කෙරේ. ඒ අනුව සම්මුච්චිත ශේෂයක් අරමුලේ ඇති අතර වාර්ෂිකව ප්‍රවර්ථන ශේෂයන් ද එයට එකතු වේ. | මෙම වාර්තාවේ දින දක්වා ද අරමුදලේ සමුච්චිත ශේෂය අඛණ්ඩව වර්ධනය වීමේ තත්ත්වයක් වූ අතර සමුච්චිත ශේෂය 2023 දෙසැම්බර් 31 දින වන විට රු. මිලියන 12,490 ක් දක්වා වර්ධනය වී තිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | කින් වර්ධනය වී ඇති බවක් නිරීක්ෂණය විය. අරමුදලේ සමුච්චිත ශේෂය අඛණ්ඩව වර්ධනය සඳහා පහත සඳහන් හේතු ද මූලික ලෙස බලපා තිබුණි. | | | | |
| (i) | රේගු බදු වංචාවන් පාලනය කිරීම සඳහා ප්‍රමාණවත් පියවර අනුගමනය නොකිරීම හේතුවෙන් ඇතිවන විවිධ රේගු වැරදි සඳහා නිලධාරීන්ට ත්‍යාග ගෙවීමට සිදුවීමත් ඉන් සියයට 20 කට සමාන ප්‍රතිශතයක් මෙම අරමුදලට බැර වීමත් හේතුවෙන් මෙම අරමුදල අඛණ්ඩව වර්ධනය වී තිබුණි. ඉකුත් වර්ෂ 10 ක කාලය තුළ අරමුදලට රේගු විමර්ශන 2740 කින් මුදල් බැර වී තිබුණු අතර එම වටිනාකම රු. මිලියන 6,922 ක් පමණ වී තිබුණි. | 2021 | නිලධාරීන්ගේ සඵලතාවය වර්ධනය කර ගැනීම සඳහා වර්තමාන තත්ත්වයට ගැලපෙන ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතුබව. | නිරීක්ෂණය හා එකඟ වුවද රේගු බදු වංචාවන් පාලනය කිරීම සඳහා ප්‍රමාණවත් පියවර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම වාර්තාවේ දින වන විට ද රේගු බදු වංචාවන් පාලනය කිරිමට කෘතිම බුද්ධිය සහිත (Artificial Intelligence) නවීන තාක්ෂණික ක්‍රමවේද හඳුන්වා දී නොතිබුණි. |
| (ii) | රේගු වැරදි සඳහා දණ්ඩන පැනවීමේදී අහිමි වූ රජයේ බදු ආදායම ද එම දණ්ඩනයේ කොටසක් ලෙස සැලකීමත් එම දණ්ඩනය පදනම් කරගෙන නිලධාරීන්ගේ ත්‍යාග තීරණය කිරීමත් | 2021 | විමර්ශනයන් සිදු කර ලබා ගන්නා දඩ හා රාජසන්තක කළ භාණ්ඩ විකිණීමෙන් ලැබෙන මුදලින් සියයට 70 ක්ම (කළමනාකරණ හා වන්දි අරමුදලට සියයට 20 ක් සහ | මෙම ත්‍යාග මුදල් හේතුවෙන් නිලධාරීන් තුළ රේගු වැරදි අල්ලා ගැනීමට ඇති වන පෙළඹවීම ඉහළ මට්ටමක පවත්වා ගැනීමට හැකිවන බව දක්වමින් රාජ්‍ය ආදායමට බැර වන | රේගු ආඥා පනත හා අදාල අරමුදල්වල නෛතික විධිවිධාන විධිමත්ව හා කාලීනව සංශෝධනය කිරීමට අවශ්‍ය කටයුතු මේ දක්වා සිදුකර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | හේතුවෙන් ඒකාබද්ධ අරමුදලට බැර විය යුතු රාජ්‍ය ආදායම අහිමි වී රේගු නිලධාරීන්ට ගෙවනු ලබන ත්‍යාග මුදල් ප්‍රමාණයේ ඉහළ යාමක් මෙන්ම මෙම අරමුදලට වෙන්කරන මුදල් ප්‍රමාණයේ ඉහළ යාමක් ද සිදු වී තිබුණි. | | ත්‍යාග අරමුදලට සියයට 50 ක් වශයෙන්) ඒකාබද්ධ අරමුදලට නොඒම සම්බන්ධව සමාලෝචනයක් සිදුකර අවශ්‍ය පියවර ගත යුතු බව. | ප්‍රතිශතයන් හි සංශෝධනයන් සිදු කර නොතිබුණි. | |
| (iii) | වර්තමානයේ පවත්නා නිදහස් ආර්ථික ප්‍රතිපත්ති හේතුවෙන් ආනයන හා අපනයනවල ඇති වී ඇති සංකීර්ණතාවයට ගැලපෙන අයුරින් රේගු ආඥා පනත හා අදාල අරමුදල්වල නෛතික විධිවිධාන විධිමත්ව හා කාලීනව සංශෝධනය වී නොතිබීම මෙම වර්ධනයන් සඳහා මූලික වශයෙන් බලපා තිබුණි. | 2021 | රේගු ආඥා පනත වර්තමානයට ගැලපෙන පරිදි සංශෝධනය කළ යුතු බව. | 2018 වර්ෂයේ සිට රේගු ආඥා පනතට සංශෝධනයන් සිදු කිරීමට උත්සාහ දැරුව ද, 2024 ජූනි වන විට වෘත්තීය සංගම්වල නොඑකඟතාවයන් හේතුවෙන් එම කටයුතු අතරමඟ නැවතී තිබුණි. | -එම- |
| (iv) | 2021 වර්ෂය තුළ අරමුදලේ ආදායම රු. මිලියන 897 ක් වුවද අරමුදලේ මූලික අරමුණු වෙනුවෙන් වැයකර ඇති මුදල ආසන්න වශයෙන් රු. මිලියන 41 ක් විය. | 2021 | පනත සංශෝධනය කළ යුතු වීම හා රේගු නිලධාරීන්ට වන්දි ගෙවීම හා සේවක සුභසාධනය වර්ධනය කර ගැනීම සඳහා වර්තමාන තත්ත්වයට ගැලපෙන ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතු බව. | 2023 වර්ෂයේ දී ද, මුළු ආදායමෙන් සියයට 6 ක් පමණ වූ ඉතා අඩු ප්‍රතිශතයක් අරමුදලින් වියදම් කර ඉතිරි සියයට 94 ක් අරමුදලට එකතු කර තිබුණි. | වර්තමානයට ගැලපෙන ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2. | මෙම අරමුදලේ මූලික අරමුණුවලින් එකක් ලෙස රේගු නිලධාරීන් සිය රාජකාරීවල නිරතවීමේදී වන ආපදාවන්ට වන්දි ගෙවීම හඳුනාගෙන තිබුණ ද පරීක්ෂාවට භාජනය කරන ලද ඉකුත් වර්ෂ 08 ක කාල පරිච්ඡේදය තුළ එවැනි කිසිදු වන්දි ගෙවීමක් වාර්තා වී නොතිබුණි. ඒ අනුව එම අරමුණු ඉටු කර ගැනීම වෙනුවෙන් තවදුරටත් මෙම අරමුදලට අසාමාන්‍ය ලෙස මුදල් රැස්කිරීමක් සිදුවන බව විගණනයේදී නිරීක්ෂණය විය | 2021 | පනත සංශෝධනය කළ යුතු වීම හා රේගු නිලධාරීන්ට වන්දි ගෙවීම සඳහා වර්තමාන තත්ත්වයට ගැලපෙන ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතු බව. | 2023 වර්ෂය දක්වා ඉකුත් වසර 10 ක් තුළදී ද එවැනි ආපදාවන්ට ගෙවීම් සිදු නොකළ ද අරමුදලට සිදු කරන බැරකිරීම් අඛණ්ඩව සිදුකර තිබුණි. | -එම- |
| 3. | 1993 නොවැම්බර් 05 දිනැති අංක 792 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදලේ විධිවිධාන අනුව අරමුදලේ මුදල් බැහැර කළ හැකි ප්‍රධාන රීති 5ක් හඳුන්වා දී තිබුණු අතර එකී රීතිවලින් ප්‍රතිපාදන සලසා නැති එහෙත් රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අදහස අනුව දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සාපලාය සඳහා අවශ්‍ය | 2022 | ගැසට් පත්‍රයේ විධි විධානයන්ට අනුකූල වියයුතු බව. | මුදල් අමාත්‍යවරයාගේ විශේෂ අනුමැතිය ලබා ගැනීමේ අවශ්‍යතාවයක් නොමැති බව දක්වමින් එවැනි වියදම් දරා තිබුණි. | 2023 වර්ෂයේ දී ද සංග්‍රහ වියදම් සඳහා රු. 554,984 ක් මෙම අරමුදලින් දරා තිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | යම් විශේෂ වැඩ සටහනක් වෙතොත් මුදල් අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ඇතිව දැරිය හැකි බව දක්වා තිබුණ ද, කළමනාකරණ සාපල්‍යය ඉහළ යාමට ඍජු සම්බන්ධතාවයක් නොමැති නව වසරේ සමාරම්භක උත්සව වියදම්, සංග්‍රහ වියදම් ආදී විවිධ වියදම් සඳහා රු.4,705,715 ක් මෙම අරමුදලින් දරා තිබුණි . | | | | |
| 4. | දෙපාර්තුමේන්තුවේ කළමනාකරණ සාපල්‍ය අරමුණු කරගනිමින් 2017 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වර්ෂ 6ක කාලපරිච්ජේදයක දී පශ්චාත් උපාධි පාඨමාලා සඳහා කළමනාකරණ හා වන්දි අරමුදලෙන් වැය කළ මුදල රු. 127,466,286 ක් වූ අතර 2022 දෙසැම්බර් 31 දින වන විට පාඨමාලා හැදෑරූ නිලධාරීන් 323 ක් වුවද, පාඨමාලා අවසන් කර සහතික පත්‍ර ඉදිරිපත් කර තිබුණේ 149 දෙනෙක් පමණි. ඉතිරි නිලධාරීන් එම පාඨමාලාව සාර්ථකව අවසන් කළාද, අත්හැරියේද යන්න පිළිබඳ තොරතුරු | 2022 | පාඨමාලා අවසන් කළ බවට තහවුරු කර ගත යුතු බව. | පශ්චාත් උපාධි පාඨමාලා සඳහා මානව සම්පත් සංවර්ධන අංශයේ ලියාපදිංචිවූ සියළුම නිලධාරීන්ගේ විස්තර පරිගණක ගතකිරීමට ක්‍රියා කර තිබුණි. | 2023 වර්ෂයේ දී පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරීමට අරමුදලින් මුදල් ලබා ගත් නිලධාරීන් 13 ක් 2024 මාර්තු 28 දින වන විට පාඨමාලා සම්පූර්ණ කර සහතිකපත් ඉදිරිපත් කර ඇති බව විගණනයට දන්වා තිබුණ ද පෞද්ගලික ලිපිගොනු පරීක්ෂා කිරීමේදී ඉන් නිලධාරීන් 08 ක් පාඨමාලා අවසන්කර අදාළ සහතික පත්‍ර ආයතනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | දෙපාර්තමේන්තුව සතුව නොපැවතුණු අතර පසු විපරම් කිරීමේ ක්‍රමවේදයක් ද නොතිබුණි. | | | | |
| 5. | වත්කම් කාණ්ඩ 02ක් යටතේ පිරිවැය රු.123,465,297 ක් සහ සමුච්චිත ක්ෂය රු.118,179,542 ක් වූ දේපල පිරියත හා උපකරණ ජංගම නොවන වත්කම් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණ ද, එකී වත්කම් සන්නිරීක්ෂණය කිරීමට අවශ්‍ය ස්ථාවර වත්කම් ලේඛණ, භාණ්ඩ සමීක්ෂණ වාර්තා, ආදි තොරතුරු කිසිවක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2023 | වත්කම් සන්නිරීක්ෂණය කිරීමට අවශ්‍ය ලිපි ලේඛන නඩත්තු කළ යුතු බව. | වත්කම් සත්‍යාපනය හා සංනිරීක්ෂණය කිරීමට අවශ්‍ය වන පරිදි ලේඛණ සකස් කර නොතිබුණි. | මෙම වාර්තාවේ දිනය දක්වා ද අවශ්‍ය ලේඛණ නඩත්තු කර නොතිබුණි. |

**3.27 ශ්‍රී ලංකා රේගුව - රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදල**

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 3,777,907,755 | 2,780,677,643 | 997,230,112 | 122,199,633 | තත්ත්වාගණනය කළ |
| **2022** | 3,364,783,771 | 2,164,047,182 | 1,200,736,589 | 217,437,608 | තත්ත්වාගණනය කළ |
| **2023** | 2,045,581,184 | 514,799,292 | 1,530,781,892 | 424,344,028 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| 1. | 1968 අංක 17 දරන රේගු ආඥා පනතේ 153 (2) (ආ) වගන්තිය ප්‍රකාරව ත්‍යාග අරමුදලින් මුදල් බෙදා හැරීම සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගෙන ඒ සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කල යුතු වුවද, 1988 ජනවාරි 28 දිනැති අංක පීඑල් 118 දරන දෙපාර්තමේන්තු නියෝගය සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගෙන ඇති බවට තහවුරු කර ගැනීමකින් තොරව 1999 වසරේ සිට 2021 වර්ෂය දක්වා වූ වර්ෂ 23 ක් තුළ ත්‍යාග අරමුදල් ලෙස නිලධාරීන් සඳහා රු.18,624,256,063 | 2021 | රේගු ආඥා පනතේ විධිවිධානයන්ට අනුගත විය යුතු බව. | මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන ඇති ලියකියවිලි ආයතනය තුළින් සොයා ගැනීමට මේ වන විට නොහැකිවී ඇති බව රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විගණනය වෙත දන්වා තිබුණි. | මෙම වාර්තාවේ දිනය දක්වා ද අදාල දෙපාර්තමේන්තු නියෝගය සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. |

ක්ද, ඔත්තුකරුවන් සඳහා රු.2,422,648,345 ක් ද බෙදා හැර තිබුණි.

2. **රජයට ලැබිය යුතු බදු ආදායම ත්‍යාග ලෙස ගෙවීම**

රේගු වැරදි සම්බන්ධව සිදු කරන රේගු විමර්ශනවලදී එම වැරදිවලට අදාල ආනයනයන් මත රජයට ලැබිය යුතුව පැවති අවම බදු ආදායමේ ප්‍රමාණය අයකර, රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු නොකර එම අහිමි වූ බදු ආදායම දණ්ඩනයක් සේ පනවා ඉන් සියයට 50 ක් නිලධාරීන්ට හා ඔත්තුකරුවන්ට ත්‍යාග ගෙවීමට යොදා ගැනීම හේතුවෙන් රාජ්‍ය ආදායමට සිදු කරන අහිතකර බලපෑම පිළිබඳව වර්ෂ ගණනාවක සිට විගණනය විසින් පෙන්වා දී තිබුණි. එහෙත් ඒ පිළිබඳව කිසිදු සොයා බැලීමක් සිදු කර නොතිබුණි. මෙම තත්ත්වය නොසලකා හැරීම නිසා නිලධාරීන් වෙත බෙදාහරින ත්‍යාග මුදල්වල ප්‍රමාණය දිගින් දිගටම ඉහලයාමක්

| | | | | | |
|---|---|---|---|---|---|
| | නිරීක්ෂණය වන අතර මේ සම්බන්ධයෙන් වැඩිදුර නිරීක්ෂණ පහත දැක්වේ. | | | | |
| (i) | රටේ පවත්නා නිදහස් ආර්ථික ප්‍රතිපත්ති මත ආනයනයන්ගේ හා අපනයනයන්ගේ ඇති වී ඇති සංකීර්ණතාවයට ගැලපෙන අයුරින් රේගු ආඥා පනත මෙන්ම මෙම අරමුදල්වල නෛතික ප්‍රතිපාදන විධිමත්ව හා කාලීනව සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය පැවතුණි. | 2021 | රාජ්‍ය ආදායම සුරක්ෂිත කිරීම පිළිබඳව අවධානය යොමු කළ යුතු බව. | අමාත්‍ය මණ්ඩලය විසින් රේගු ආඥා පනතේ අංක 08, 47, 51, 101, 117, 153, 164 සහ 165 යන වගන්ති සංශෝධනය කිරීමට අනුමැතිය ලබා දී තිබුණු අතර සංශෝධිත රේගු ආඥා පනත 2024 ජූලි 01 දින සිට බලාත්මක කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේවුවද, එම සංශෝධන පිළිබඳව රේගු වෘත්තීය සමිති විසින් ඉදිරිපත් කරන ලද වැඩ වර්ජන හේතුවෙන් එය තාවකාලිකව නතර කර තිබුණි. | රේගු ආඥා පනතේ නෛතික ප්‍රතිපාදන විධිමත්ව හා කාලීනව සංශෝධනය වී නොතිබුණි. |
| (ii) | රේගු ආඥා පනතේ 162 වගන්තියේ දැක්වෙන පරිදි රේගු නියමයන් කඩකිරීම සම්බන්ධයෙන් අදාල වන දඩ පිළිබඳව රේගු අධ්‍යක්ෂවරයාට සුදුසු පරිදි ක්‍රියා කිරීමට බලය පවරා තිබුණි. එහෙත් රාජ්‍ය ආදායම සුරක්ෂිත කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රේගුව විසින් දක්වන අවධානය සතුටුදායක මට්ටමක | 2021 | රාජ්‍ය ආදායම සුරක්ෂිත කිරීම පිළිබඳව අවධානය යොමු කළ යුතු බව. | -එම- | -එම- |

| | | | | | |
|---|---|---|---|---|---|
| | නොපැවතුණි. | | | | |
| 3. | ත්‍යාග අරමුදලේ උප අරමුදලක් වන ඉන්ධන අරමුදලට 2021 වර්ෂයේදී රු.62,611,784 ක් බැර කර තිබුණි. එම අරමුදල පිහිටුවීමේ අරමුණ “රේගු විමර්ශන සඳහා අවශ්‍ය ඉන්ධන වියදම් පියවා ගැනීම” බව දක්වා තිබුණ ද, විමර්ශන කටයුතු සඳහා දරන ඉන්ධන පිරිවැය දෙපාර්තමේන්තුවේ පොදු වැය ශිර්ෂයට වැය බරක් වී තිබීම හේතුවෙන් 2021 වර්ෂය තුළ එම අරමුදලෙන් කිසිදු වියදමක් දරා නොතිබුණි. එසේ වුවද සාධාරණ අවශ්‍යතාවයන් නොසලකා දිගින් දිගටම මෙම අරමුදලට මුදල් රැස්කර තිබීම හේතුවෙන් 2021 වර්ෂය අවසානයට එහි ශේෂය රු.651,419,513 ක් වී තිබූ අතර අරමුදලට කිසිදු වැය බරක් නොකර පොදු වැය ශීර්ෂයට අදාල ප්‍රතිපාදනවලින් එම වියදම දරා ඉතිරි කර ගත් මෙම මුදල් අරමුදලෙහි අතිරික්තයක් ලෙස පෙන්වා දී තිබුණි. | 2021 | අරමුදල් පරිහරණය පිළිබඳව අවධානය යොමු කළ යුතු බව. | මෙම ඉන්ධන අරමුදල පිහිටුවීමේ මූලික අරමුණ රේගු විමර්ශන සඳහා යම් අතිරික්ත ඉන්ධන අවශ්‍යතාවයක් ඇති වුවහොත් ඒ සඳහා යොදා ගැනීමටත්, LTTE යුදමය තත්ත්වය ඇතිවීමට පෙර දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කළ රේගු නිවාරණ කටයුතු සඳහා යොදා ගන්නා ලද නාවික අංශයෙහි (Marine Unit) ඉන්ධන අවශ්‍යතාවය සපුරා ගැනීමටත් බව දන්වා තිබුණි. | 2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වාම මෙම අරමුදලෙන් කිසිදු වියදමක් දරා නොතිබුණු අතර 2023 වර්ෂයේ දී පමණක් රු.554,500 ක වියදමක් දරා තිබුණි. විමර්ශන කටයුතු සඳහා දරන ඉන්ධන පිරිවැය රේගුවේ පොදු වැය ශිර්ෂයට වැය බරක් වී තිබුණු නමුත් අරමුදලේ අවශ්‍යතාවයන් සමාලෝචනයට ලක් කිරීමට මෙම වාර්තාවේ දිනය දක්වා ද කටයුතු කර නොතිබුණි. ඒ අනුව 2023 වර්ෂය අවසාන දිනට අරමුදලේ සමුච්චිත ශේෂය රු.940,499,772 ක් වී තිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| 4. | ත්‍යාග අරමුදලේ උප අරමුදලක් වන මත්ද්‍රව්‍ය වැටලීම් සඳහා සහභාගි වන නිලධාරීන් වෙනුවෙන් ගෙවීම් සඳහා වන මත්ද්‍රව්‍ය නිවාරණ අරමුදලේ (නාකොටික් අරමුදල) 2021 වර්ෂය තුළ දී රු. 22,847,367 ක වර්ධනයක් දක්නට ලද නමුත් වර්ෂය තුළ ගෙවා ඇති මුදල රු.7,910,000 ක් පමණක් විය. | 2021 | අරමුදල් පරිහරණය පිළිබඳව අවධානය යොමු කළ යුතුය. | කළමනාකරණය විසින් විගණන නිරීක්ෂණය හා එකඟ වුවද අරමුදලට මුදල් රැස්වීම එපරදිම සිදු වී තිබුණි. | 2023 වර්ෂයේදී ද රු.61,565,304 ක් මෙම අරමුදලට බැර කර තිබුණු නමුත් වර්ෂය තුළ ඉන් කිසිදු මුදලක් ගෙවා නොතිබුණි. |
| 5. | විමර්ශන කටයුතු සඳහා ඍජුව දායක නොවන නමුත් සහායක සේවා සපයන අංශවල නිලධාරීන් සඳහා ගෙවීම් වෙනුවෙන් ත්‍යාග අරමුදලේ උප අරමුදල් වශයෙන් පිහිටුවා ඇති සියයට 2.5 ක අරමුදල සඳහා 2022 වර්ෂයේදී රු.56,257,455 ක් බැරකර තිබුණු අතර 2022 දෙසැම්බර් 31 දිනට එම අරමුදලේ සමුච්චිත ශේෂය රු.271,086,409 ක් විය. මෙම අරමුදලින්ද 2019 වර්ෂයේ සිටම කිසිදු ගෙවීමක් සිදු කර නොතිබුණු අතර අවශ්‍යතාවය සමාලෝචනය කිරීමකින් තොරව කළමනාකරණය විසින් මෙම උප | 2022 | අරමුදල් බෙදා වෙන් කිරීම පිළිබඳව අවධානය යොමු කළ යුතු බව. | අරමුදල පිහිටුවා ඇත්තේ යම්කිසි විමර්ශනයකට අදාලව දඩ හෝ විකුණුම් ලෙසින් මුදල් ලැබී නොමැති අවස්ථාවල එම විමර්ශන කටයුතු සඳහා සහභාගිවූ අය වෙත ඔවුන්ගේ කැපවීම සහ සේවය ඇගයීම උදෙසා යම් ත්‍යාගයක් පිරිනැමීම අවශ්‍ය යැයි රේගු අධ්‍යක්ෂ ජනරාල් අදහස් කරන්නේ නම් එවැනි අවස්ථාවල ත්‍යාග මුදලක් පිරිනැමීම සඳහා බව දන්වා තිබුණි. | දිගින් දිගටම මෙම අරමුදලට මුදල් රැස්කර තිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | අරමුදලද දිගින් දිගටම පවත්වාගෙන ගොස් තිබුණි. | | | | |
| 6. | 2015 වර්ෂයේ සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා දෙපාර්තමේන්තුවේ අංශ (Directorate) 40 ට අදාලව රේගු විමර්ශන 9754 ක් පැවතුණු අතර, ඉන් ආදායම් අධීක්ෂණ ඒකකයට (RTF) අදාළව විමර්ශන 3199 ක් ද, නිවාරණ අංශයට (Preventive) අදාළව විමර්ශන 1593 ක් ද, මධ්‍යම විමර්ශන අංශයට අදාළව විමර්ශන 738 ක් ද, අනෙකුත් අංශ 37ට අදාලව විමර්ශන 4224ක් ද විය. 2022 වර්ෂය අවසාන දිනට සමස්ත විමර්ශන සංඛ්‍යාවෙන් වසර 07 ට වඩා පැරණි 1518 ක් ද, වසර 06 ට වඩා පැරණි 1026 ක් ද, වසර 05 ට වඩා පැරණි 1038 ක් ද, වසර 04 ට වඩා පැරණි 852 ක් ද, වසර 03 ට වඩා පැරණි 1009 ක් ද, වසර 02 ට වඩා පැරණි 1442 ක් ද, වසරකට වඩා පැරණි 1417 ක් ද සහ වසරක් ඇතුළත වූ විමර්ශන 1452 ක් ද විය. | 2022 | විමර්ශන කඩිනමින් අවසන් කිරිමට පියවර ගතයුතු බව. | ප්‍රමාදයන් අවම කර ගනිමින් විමර්ශන කඩිනම් කිරීමට අවශ්‍ය පියවර ගනිමින් සිටින බව විගණනයට දැනුම් දී තිබුණි. | 2023 දෙසැම්බර් 31 දින වන විට විවිධ අංශ යටතේ සිදු කරන විමර්ශන 8450 ක් පැවතුණු අතර ඉන් විමර්ශන 3080 ක් වසර 05කට වඩා ද, විමර්ශන 4348 ක් වසර 02 සිට වසර 04ක් දක්වා ද, විමර්ශන 1022 ක් වසරක් තුළද නොවිසඳී ප්‍රමාද ව පැවතුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| 7. | 1968 අංක 17 දරන රේගු ආඥා පනතේ 153(2) (ආ) වගන්තිය ප්‍රකාරව මුදල් අමාත්‍යවරයා විසින් අනුමත කළ යෝජනා ක්‍රමයකට අනුව ත්‍යාග මුදල් අදාල නිලධරයන් සහ තොරතුරු සපයන්නන් අතර බෙදා දීම සිදුවිය යුතු වුවද, අංක පීඑල් 118 දරන දෙපාර්තමේන්තු නියෝගයට මේ දක්වා සංශෝධන 19ක් පමණ ගෙන එමින් රාජ්‍ය සන්තක මුදල් සහ දණ්ඩන මුදල් එකී විමර්ශන කාර්යයන්ට සෘජුව දායකත්වය නොසපයන රේගුවේ අනිකුත් අංශ 18 ක නිලධාරීන්ට ද බෙදා දීමට කළමනාකරණය කටයුතු කර තිබුණි. ඒ අනුව, 2023 වර්ෂය සඳහා එවැනි අංශවල නිලධාරීන්ට වෙන්කළ ත්‍යාග අරමුදල් වටිනාකම රු.444.437.389 ක් විය. | 2023 | රේගු ආඥා පනතේ විධිවිධානයන්ට අනුගත විය යුතු බව. | රේගු දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය සියලු අංශවල නිලධාරීන්ගේ දායකත්වය මත සිදු වන කාර්ය සාධනයක් වන බැවින් සෑම අංශයකම නිලධාරීන්ගේ අභිප්‍රේරණය හා දිරි ගැන්වීම උදෙසා රේගු වැටලීම් හා සම්බන්ධව අදාල වන සියලු අංශවල නිලධාරින් නියෝජනය වන පරිදි ත්‍යාග මුදල් බෙදා දිමට කටයුතු කර ඇති බව සඳහන් කර තිබුණි. | රේගු විමර්ශනයන්ට සෘජුව දායකත්වයක් නොසපයන රේගුවේ අනිකුත් අංශ 18 ක නිලධාරීන්ට ද ත්‍යාග අරමුදලෙන් කොටස් බෙදා දීම සිදුවී තිබුණි. සියලු දෙනාට ප්‍රතිලාභ ලබාදීම ද එක් අරමුණක් වශයෙන් සලකා සෑම මාස 6ට වරක් දෙපාර්තමේන්තුවේ සේවකයන් එක් එක් අංශ අතර ස්ථාන මාරු කිරීමේ ක්‍රමවේදයක් ද පවතී. |
| 8. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය-මු.රෙ.102 සහ 110 ප්‍රකාරව විදේශීය පුද්ගලික ආයතනයක් විසින් නැවකින් නැවකට | 2023 | මුදල් රෙගුලාසි සංග්‍රහයේ විධිවිධානයන්ට අනුගත විය යුතු බව. | මූලික විමර්ශන කමිටු සභාපති විසින් මූලික විමර්ශනයේ වර්තමාන තත්ත්වය පිළිබඳව කරුණු දක්වමින් 2024.03.19 දින අතුරු වාර්තාවක් ඉදිරිපත් කර තිබුණි. | මෙම වාර්තාවේ දිනය දක්වාද මූලික විමර්ශන කමිටු වාර්තාව ඉදිරිපත් කර නොතිබුණු අතර 2024 සැප්තැම්බර් 30 දින වන විට වාර්තාව ප්‍රමාද වූ කාලය මාස |

| | | | | | |
|---|---|---|---|---|---|
| | භාණ්ඩ මාරු කිරීමේ ක්‍රමය යටතේ (Transshipment) සිංගප්පූරුවෙන් නැව්ගත කරනු ලැබූ දුම්වැටි තොගයකට අදාළව සිදු කරන ලද විමර්ශන අවසානයේ එම දුම්වැටි තොගය රු.5,901,750 ක වෙන්දේසිකර තිබුණි. කෙසේවුවද, එම විකිණීමට එරෙහිව අදාල විදේශ ආයතනය විසින් පැවරූ නඩු වලින් රේගුව වැරදිකරු වී තිබුණු බැවින් රේගුවට මෙම වැරදි තීරණය මත රු.69,451,809 ක් ගෙවීමට සිදු වී තිබුණි. මෙම විමර්ශනයට අදාළ ගොනුව ද පසුව අස්ථානගත වී තිබුණු අතර එයට වගකිවයුතු නිලධාරින්ට සහ ඉහත වැරදි තීරණයට වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව 2023 මැයි 11 දින පත් කරන ලද මූලික විමර්ශන කමිටු වාර්තාව ඉන් මාස දෙකක් ඇතුළත ඉදිරිපත් කළ යුතුව පැවතුණ ද, 2024 මැයි 30 දින වන විට ද ඉදිරිපත් කර නොතිබුණි. | | | | 16 ක් විය. |
| 9. | ආනයනකරුවෙකු විසින් ඔහුට අදාළව සිදුකරන ලද රේගු | 2023 | රාජ්‍ය ආදායම සුරක්ෂිත කිරීමට අවශ්‍ය පියවර ගත | මෙම විමර්ශනය අවසානයේ දී නිලධාරීන් 541 කට | නිලධාරීන්ට ත්‍යාග ගෙවීමෙන් පසු යම් අධිකරණ |

| | | | | | |
|---|---|---|---|---|---|
| | විමර්ශනයක ප්‍රතිඵලයක් වශයෙන් පැනවූ අභිමිකිරීමක් සහ දණ්ඩනයකට එරෙහිව නඩුවක් පවරා තිබුණු අතර ඉන් රේගුව අයකර ගත් මුදලින් රු.31,000,000 ක් ආනයනකරුට ආපසු ගෙවීමට නියම වී තිබුණි. අභිමිකිරීම් සහ දණ්ඩන වටිනාකමින් සියයට 50ක් මෙම අරමුදලට බැර වෙන නමුත් ත්‍යාග මුදල් ලබාගත් නිලධාරීන් ආසන්න වශයෙන් 541 ක් පමණ සිටියදී, ඔවුන්ගෙන් කිසිදු මුදලක් ආපසු අයකර නොගෙන ඒකාබද්ධ අරමුදලට බැර කළ ප්‍රමාණය සහ කළමනාකරණ හා වන්දි අරමුදලට බැර වූ ප්‍රමාණය ආපසු ගෙන ආනයනකරුට වන්දි මුදල ගෙවීමට කටයුතු කර තිබුණි. | | යුතු බව. | ආසන්න පිරිසකට මුදල් ගෙවා තිබීම නිසා ඔවුන්ගෙන් එම මුදල් ආපසු අය කිරීම ප්‍රායෝගිකව අපහසු බව දක්වා ඒකාබද්ධ අරමුදලට සහ කළමනාකරණ හා වන්දි අරමුදලට බැර කළ මුදල් ප්‍රමාණයන් ආපසු ගෙන ආනයනකරුට වන්දි මුදල් ගෙවීමට කටයුතු කර තිබුණි. | ක්‍රියාවලියක ප්‍රතිඵලයක් වශයෙන් එම මුදල් ආපසු ගෙවිය යුතු අවස්ථාවක නිලධාරීන්ගෙන් ආපසු අයකර ගෙවීමේ ක්‍රමවේදයක් මෙම වාර්තාවේ දිනය දක්වා ද සකස් කර නොතිබුණි. |
| 10. | පුද්ගලික සමාගමක් විසින් ව්‍යාජ ඉන්වොයිසි ඉදිරිපත් කර ආනයනය කරන ලද සත්ව ආහාර තොගයකට අදාළව එම සමාගම පැහැර හැරීමට උත්සාහ දැරූ බදු වටිනාකම රු.15,198,755 ක් වූ අතර අඩුවෙන් දැක්වූ භාණ්ඩ වටිනාකම | 2023 | රාජ්‍ය ආදායම සුරක්ෂිත කිරීමට අවශ්‍ය පියවර ගත යුතු බව. | විමර්ශන නිලධාරියා විසින් ලිහිල් කරන ලද අභිමි කිරීම් සිදු කිරීම රේගු නීති ප්‍රතිපාදනවලට අනුව නෛතික රාමුව තුළ සිදු කර ඇති බව විගණනයට දන්වා තිබුණි. | විමර්ශන අවසානයේ පනවන දණ්ඩන මුදලින් සියයට 30 ක් පමණක් රාජ්‍ය ආදායමට බැරවන බැවින් එකී ප්‍රතිශතය ඉහළ දැමීම සඳහා රේගු ආඥා පනත සංශෝධනය කිරීම සහ මෙලෙස දණ්ඩන ලිහිල් |

| | | | | | |
|---|---|---|---|---|---|
| | (Under Value) රු.63,519,586 ක් විය. කෙසේවුවද, විමර්ශන අවසානයේ දී වංචා කිරීමට උත්සහ කළ තීරු බදු වටිනාකම සඳහා රු.500,000 ක ලිහිල් කරන ලද අහිමි කිරීමක් සහ අඩුවෙන් දැක්වූ භාණ්ඩ වටිනාකම සඳහා රු.19,000,000 ක අහිමි කිරීමක් පමණක් පැනවීමට විමර්ශන නිලධාරියා කටයුතු කර තිබුණි. එහිදී පැහැර හැරීමට උත්සාහ දැරූ බදු වටිනාකමට සාපේක්ෂව පැනවූ දණ්ඩනය සියයට 3.2 ක පමණ ඉතා අඩු ප්‍රමාණයක් විය. එබැවින් රාජ්‍ය ආදායම සුරක්ෂිත කිරීම සඳහා රේගුව වඩා සැලකිල්ලෙන් කටයුතු කළ යුතු බවට මෙහිදී අවධාරණය කෙරේ. | | | | කිරීමේ දී රාජ්‍ය ආදායම සුරක්ෂිත කිරීම සම්බන්ධයෙන් රේගුවට ඇති වගකීම පිළිබඳව වසර ගණනාවක සිට විගණනය විසින් පෙන්වා දුන්නද ඒ පිළිබඳව අවධානය යොමුකර නොතිබුණි. |
| 11. | ඉන්දියාවේ සිට සුදු සීනි ලෙස අනාවරණය කර ආනයනය කරන ලද සීනි තොගයක් රේගුවේ අවදානම් කළමනාකරණ ඒකකය (RMU) මගින් දැඩි අවදානම් සහිත බවට වර්ගීකරණය කර ගැඹුරින් පරීක්ෂාවට යොමුකර තිබුණ ද, | 2023 | රේගු ආඥා පනතේ විධිවිධානයන්ට අනුගත විය යුතු බව. | ගරු මුදල් අමාත්‍යවරයා විසින් දණ්ඩන මුදල රුපියල් මිලියන 30 කින් ලිහිල් කිරීමට තීරණය කිරීම රේගු ආඥා පනතේ 165 වගන්තියට අනුකූල බව දන්වා තිබුණි. | නිෂ්කාශණයට ඉදිරිපත් වන සියලුම බහාලුම් පරිලෝකනයට ළක් නොකරන බැවින් පරිලෝකන පද්ධතියට කෘතිම බුද්ධිය (Artificial Intelligence) සම්බන්ධ කරන ලෙස විගණනය විසින් වරින් වර |

| | |
|---|---|
| එම කාර්යය නිසි ලෙස සිදු නොවීම හා තෝරාගත් නියැදිය දෝෂයන් හඳුණා ගැනීමට තරම් ප්‍රමාණවත් නොවීම නිසා එම බහාලුම් තුළ දුඹුරු සීනි තොගයක්ද තිබිය දී රේගුවෙන් භාණ්ඩ නිෂ්කාශනය කර තිබුණි. රේගුවේ අනුකූලතා හා පහසුකම් සැලසීමේ අංශයට පසුව ලද තොරතුරකට අනුව සිදු කරන ලද පරීක්ෂාවේ දී ප්‍රකාශ නොකරන ලද දුඹුරු සීනි බහාලුම් 20 ක් ද එහි ඇති බවට අනාවරණය කරගෙන තිබුණි. මේ පිළිබඳව කරන ලද විමර්ශන අවසානයේ ආනයනකරුට එරෙහිව රු.500,000 ක දඩයක් සහ රු.189,293,778 ක අභිමි කිරීමක් පනවා තිබුණි. රේගු ආඥා පනතේ 165 වගන්තිය ප්‍රකාරව පනවන ලද දණ්ඩනය ලිහිල් කරන මෙන් ආනයනකරු විසින් සිදු කරන ලද අභියාචනය පළමු අවස්ථාවේදී අමාත්‍යවරයා විසින් ප්‍රතික්ෂේප කර තිබුණු අතර පසුව එම අභියාචනය සැලකිල්ලට ගෙන පනවන ලද දණ්ඩනය රු.30,000,000 කින් | පෙන්වා දුන්න ද මේ දක්වා එපරදි කටයුතු කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | අඩු කිරීමට කටයුතු කර තිබුණි. දෙවන අවස්ථාවේ එපරදි සිදු කරන ලද ලිහිල් කිරීමට හේතු පැහැදිලි නොවුණි. | | | | |
| 12. | 2023 වර්ෂයේදී අවසන් කරන ලද විමර්ශන පිළිබඳව සිදුකළ නියැදි විගණනයකට අනුව ආනයනකරුවන් විසින් අවස්ථා 10ක දී විවිධ රේගු වැරදි සිදුකර රු.59,583,245 ක බදු මුදලක් ගෙවීම පැහැර හැරීමට උත්සාහ දරා තිබුණු අතර, ඒ සඳහා රේගුව විසින් පැනවූ මුලු දණ්ඩන වටිනාකම රු.1,821,501,276ක් විය. දණ්ඩන වටිනාකම පසුව ලිහිල්කිරීම නිසා එය රු.88,116,774 ක් දක්වා අඩු වී තිබුණු අතර ලිහිල් කළ දණ්ඩන වටිනාකමින් රජයට බැර කල සියයට 30 ක (30%) වටිනාකම රු.26,435,033 ක් වූ අතර පැහැර හැරීමට උත්සාහ කළ බදු මුදල වූ රු.59,583,245 ට සාපේක්ෂව එය රු.33,148,212 කින් රාජ්‍ය ආදායම අඩු වීමකි. මෙලෙස දණ්ඩන පනවා උපයන ලද මුදලින් | 2023 | රජයට අයවිය යුතු ආදායම් නිසිපරිදි අයකර ගැනීමට කටයුතු කළ යුතු බව. | රේගු පරීක්ෂණයක් අවසානයේ තීරණ දෙනු ලබන්නේ පරීක්ෂණයේදී ඉදිරිපත් වූ සියළුම සාක්ෂි සැලකිල්ලට ගනු ලැබීමෙන් වන අතර, ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන 129, 130, 163 හා 166B හි වගන්තිවල දක්වා ඇති බව විගණනයට දැනුම් දී තිබුණි. | විමර්ශන අවසානයේ පනවන දණ්ඩන මුදලින් සියයට 30 ක් පමණක් රාජ්‍ය ආදායමට බැරවන බැවින් එකී ප්‍රතිශතය ඉහළ දැමීම සඳහා රේගු ආඥා පනත සංශෝධනය කිරීම සහ මෙලෙස දණ්ඩන ලිහිල් කිරීමේ දී රාජ්‍ය ආදායම සුරක්ෂිත කිරීම සම්බන්ධයෙන් රේගුවට ඇති වගකීම පිළිබඳව වසර ගණනාවක සිට විගණනය විසින් පෙන්වා දුන්නද ඒ පිළිබඳව අවධානය යොමුකර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | රජයට උපයාගත හැකිව තිබෙන ආදායම, සාමාන්‍ය ක්‍රමවේදය තුළින් රජයට ලැබෙන බදු ආදායමටද වඩා පහල අගයක් ගැනීම තුල රේගුව රජය වෙනුවෙන් ආදායම් ඉපයීමේ ප්‍රධානතම වගකීම දරනු ලබන ආයතනයක් වශයෙන් විචක්ෂණශීලීව කටයුතු කර තිබේද යන්න ගැටලු සහගත විය. | | | | |
| 13. | රේගු ආඥා පනතේ 129 වගන්තිය ප්‍රකාරව ආනයනයන්හි දී තීරු බදුවලින් හෝ එහි යම් කොටසක් වංචනිකව මගහැරීමේ හෝ මගහැරීමට තැත් කිරීමේ හෝ දැන දැනම සම්බන්ධ වන සෑම තැනැත්තකු රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කැමැත්ත පරිදි, එකී භාණ්ඩවල වටිනාකම මෙන් තෙගුණයක අභිමිවීමකට යටත් කළ හැකිය. කෙසේවුවද, නියැදි විගණනයට අනුව අවස්ථා 3 කදී පමණක් එකී භාණ්ඩවල වටිනාකමට සමාන අගයක් දණ්ඩන ලෙස පනවා තිබුණු අතර ඉතිරි අවස්ථා 7 හි දීම භාණ්ඩවල | 2023 | රේගු ආඥා පනතේ විධිවිධානයන්ට අනුගත විය යුතු බව. | රේගු පරීක්ෂණයක් අවසානයේ තීරණ දෙනු ලබන්නේ පරීක්ෂණයේදී ඉදිරිපත් වූ සියළුම සාක්ෂි සැලකිල්ලට ගනු ලැබීමෙන් වන අතර, ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන 129, 130, 163 හා 166B හි වගන්තිවල දක්වා ඇති බව විගණනයට දැනුම් දී තිබුණි. | -එම- |

| | | | | | |
|---|---|---|---|---|---|
| | වටිනාකමට වඩා අඩු අගයක් දණ්ඩන ලෙස පැනවීමට කටයුතු කර තිබුණි. ඒ අනුව රේගු වැරදි සඳහා සැළකිය යුතු දණ්ඩනයක් පැනවීමට අපොහොසත් වීමෙන් අදාළ පුද්ගලයින් තව දුරටත් වැරදි වංචා සිදු කිරිමට පෙළඹවීමක් ඇති විය හැකි බව විගණනයේදී බැහැර කළ නොහැකිය. | | | | |
| 14. | 2023 වර්ෂයේදී අවසන් වූ විමර්ශන සඳහා පාදක වූ රේගු වැරදි වර්ගයන් පිළිබඳව සැළකිල්ලට ගත් කළ විමර්ශන 1902 ක් අතුරින් ප්‍රකාශ නොකළ භාණ්ඩ ආනයනය කිරීමට අදාළව 498 ක් වූ අතර ඊට අමතරව අතිරික්ත ප්‍රමාණයක් ආනයනය කිරීම සම්බන්ධ විමර්ශන 224 ක් ද, වටිනාකම අඩුවෙන් තක්සේරු කිරීම සම්බන්ධ විමර්ශන 207 ක්ද විය. කෙසේවුවද, ශක්තිමත් නීති පද්ධතියක් ස්ථාපිත කිරීම තුළින් මෙම සාමාන්‍ය රේගු වැරදි සැළකියයුතු මට්ටමකින් අඩුකරගත හැකි වන අතර රජයට ලැබිය යුතු ආනයනික බදු ආදායම නිසි පරිදි නිසි කළට රජයට ලබා | 2023 | ශක්තිමත් නීති පද්ධතියක් ස්ථාපිත කිරීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමුවිය යුතු බව. | රේගු වැරදිවලට අදාළව වර්ගීකරණය අනුව Automated Risk Mgt (ARM) පද්ධතිය තුළට ඇතුළත් කර ගැනීමටත් වරින් වර රේගු වැරදි සිදුවන ආකාරය විශ්ලේෂණය කර එය යථාවත් කිරීමට කටයුතු කරන ලෙසත් අදාළ පද්ධතීන් හැකි ඉක්මනින් ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවත් පිළිබඳව කළමනාකරණය විසින් සාකච්ඡා පවත්වා තිබුණි. | නිෂ්කාශණයට ඉදිරිපත් වන සියලුම බහාලුම් පරිලෝකනයට ලක් නොකරන බැවින් පරිලෝකන පද්ධතියට කෘතිම බුද්ධිය (Artificial Intelligence) සම්බන්ධ කරන ලෙස විගණනය විසින් වරින් වර පෙන්වා දුන්න ද මේ දක්වා එපරදි කටයුතු කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ගැනීමේද හැකියාව පවතින බැවින් ඒ සඳහා කළමනාකරණයේ අවධානය යොමුවිය යුතුව පැවතුණි. | | | | |
| 15. | භාණ්ඩ නිශ්කාෂණ ක්‍රියාවලියට සම්බන්ධ වන රේගුවේ අංශ රාශියක් සිද්ධි හේතුවෙන් ආරම්භවන රේගු විමර්ශන කටයුතු වල නිරතව තිබුණ ද, එකී විමර්ශනයන්හි ප්‍රගතිය දැනගැනීමේ ක්‍රමවේදයක් නොවුණ අතර එක් එක් අංශ තනි තනිව විමර්ශන කටයුතු සිදුකර විමර්ශන අවසාන වූ පසු ත්‍යාග ගෙවීම් සඳහා මුදල් අංශයට යොමුකර තිබුණි. විමර්ශන ගොනු පිළිබඳ තොරතුරු එක් එක් අංශවල විමධ්‍යගතව පැවතුණු අතර ඒ අනුව විමර්ශන ප්‍රගතිය පිළිබඳව කළමනාකරණ තීරණ ගැනීමට සහ කාර්යසාධන පරීක්ෂාවට ද අවශ්‍ය මධ්‍යගත තොරතුරු පද්ධතියක් දෙපාර්තමේන්තුව සතුව නොපැවතුණි. | 2023 | මධ්‍යගත තොරතුරු පද්ධතියක් ශ්‍රී ලංකා රේගුව සතුව පවත්වාගත යුතු බව. | මේ පිළිබඳව මධ්‍යගත කිරීමේ ක්‍රමවේදය සඳහා CCR ලේඛනයක් පවත්වා ගෙන යනු ලබන අතර, එය වැඩිදියුණු කිරීමට අවශ්‍ය පියවර ගනිමින් සිටින බව දැනුම් දී තිබුණි. | මධ්‍යගත තොරතුරු පද්ධතියක් සකස් කර නොතිබුණි. |

**3.28 ත්‍යාග හා දිරිදීමනා අරමුදල**

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 102,710,502 | 19,417,037 | 83,293,465 | 2,946,579 | තත්ත්වාගණනය කළ |
| **2022** | 120,092,499 | 21,357,611 | 98,734,888 | 12,043,191 | තත්ත්වාගණනය කළ |
| **2023** | 160,584,122 | 38,667,396 | 121,916,726 | 16,397,208 | තත්ත්වාගණනය කළ |

| | **විගණන නිරීක්ෂණය** | **වාර්තාවේ වර්ෂය** | **විගණකාධිපති නිර්දේශය** | **විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග** | **වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක තත්ත්වය** |
|---|---|---|---|---|---|
| 1. | අරමුදල විසින් පවත්වාගෙන යන ගෙවීම් වවුචර් වලට අනුව වසරේ මුළු අයභාර වියදම රු.1,521,042ක් වුවත් සත්‍ය වශයෙන් වියදම් නොවූ අගයන් (වියදම් සඳහා වෙන් කිරීම්) වෙනත් වියදම් ලෙස ඇතුලත් කරමින් රු.2,306,023 ක් අයභාර වියදම් ලෙස මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් කර තිබීම හේතුවෙන් වසරේ අයභාර වියදම රු.784,981කින් අධිතක්සේරු වී තිබුණි. | 2023<br>2022<br>2021 | කාලච්ඡේද සංකල්පයට අනුව වර්ෂයට අදාල ආදායම් සහ වියදම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශන තුල හඳුනාගත යුතුයි. | පරිපාලන වියදම් වශයෙන් රු.1,330,872 විගණන ගාස්තුව රු.131,100 ප්‍රශංසාත්මක ඇගයීම් රු.444,050 ක්‍රීඩා සුභසාධන රු.300,000 කාර්යමණ්ඩල පුහුණු රු.100,000 වශයෙන් සමස්ථ අයභාර වියදම රු.2,306,023 දැරීම සිදු කල බව | නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත. |
| 2. | අරමුදලේ ස්ථාවර තැන්පත් 3කට අදාලව 2023 දෙසැම්බර් 31 දිනට බැංකුව විසින් ලබා දුන් ශේෂ | 2023<br>2022 | මූලාශ්‍ර ලේඛන මත පදනම්ව ගනුදෙනු නිවැරදිව හඳුනා ගැනීමට කටයුතු කිරීම. | බැංකු සනාථන මගින් ගණනය කරන ලද පොළිය නිවැරදිසේ සලකා අවසන් ගිණුම තුලට ඇතුලත් කිරීම | නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | සනාථන ලිපිය අනුව එදිනට උපචිත වූ පොලිය රු.15,148,732ක් වුවත් මූල්‍ය ප්‍රකාශන තුල ස්ථාවර තැන්පත් පොලිය ලෙස රු.14,003,911ක් ඇතුලත් කර තිබීම හේතුවෙන් වසරේ අතිරික්තය රු.1,144,821ක් අඩුවෙන් දක්වා තිබුණි | | | මෙහිදී සිදුකර ඇත. මින් පෙර වසරේදී බැංකු සනාථන ලිපියේ සඳහන් පොළිය ගැලපීමට ලක් කර ගිණුම්ගත කිරීම විගණන විමසීමකට ලක්කොට ඇත. එබැවින් මෙම වර්ෂයේදී බැංකු සනාථන මගින් තහවුරු කල පොළිය වාර්ෂික පොළිය වශයෙන් අවසන් ගිණුමට ඇතුල් කර ඇති බව | |
| 3. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 I කොටසෙහි 15.1 ඡේදය යටතේ හඳුන්වා දී ඇති මුදල් රෙගුලාසි 877(2) (ඇ) මාර්ගෝපදේශ 04 අනු ඡේද 01 අනුව ව්‍යවස්ථාපිත අරමුදලක සියලු ලැබීම් හා ගෙවීම් විධිමත්ව මූලාශ්‍ර ලේඛන පදනම් කරගෙන සුදුසු උපයෝගී පොත්වල හා ලෙජර් ගිණුම්වල සටහන් කලයුතු වුවත්, ඊට අනුකූල නොවන සේ වර්ෂ ගණනාවක සිට ත්‍යාග හා දිරිදීමනා අරමුදලේ පරිපාලන වියදම් වෙන් කිරීමක්, වසරේ වියදම ලෙස සලකා ගිණුම්ගත කිරීම හේතුවෙන් මූල්‍ය | 2023<br>2022<br>2021 | කාලච්ඡේද සංකල්පයට අනුව වර්ෂයට අදාල ආදායම් සහ වියදම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශන තුල හඳුනාගත යුතුයි | වැළැක්වීමේ ක්‍රියාමාර්ග සඳහන් කර නොමැත. | නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | තත්ත්ව ප්‍රකාශය තුළ අරමුණකින් හෝ අවශ්‍යතාවයකින් තොරව රු.931,510ක පරිපාලන වියදම් සංචිතයක් නිර්මාණය වී තිබුණි. | | | | |
| 4. | පාලක මණ්ඩල සඳහා දීමනා ගෙවීමට අදාළව නිකුත් කර ඇති අංක පි.ඊ.ඩී/ 3/2015 දරණ 2015 ජුනි 17 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව අරමුදලේ පාලක මණ්ඩලය වෙත දීමනා ගෙවීම සඳහා නෛතික ප්‍රතිපාදන ඇතුලත්ව නොතිබියෙදී, විධිමත් අනුමැතියකින් තොරව අරමුදලේ පාලක මණ්ඩලය සඳහා ප්‍රවර්තන වර්ෂය තුල එකතුව රු.154,500ක දීමනා ලබා දී තිබුණි. | 2023<br>2022<br>2021 | භාණ්ඩාගාර චක්‍රලේඛන අනුව කටයුතු කිරීම. | අරමුදලේ කළමනාකරණ කටයුතු සඳහා පාලක මණ්ඩල සාමාජිකයින් 05 දෙනෙකුගේ සේවය ලබාදෙන අතර පාලක මණ්ඩල අනුමැතියට යටත්ව ඉතා අවම පාලක මණ්ඩල දීමනාවක් වාර්ෂික පරිපාලන වියදම් වෙන් කිරීමට යටත්ව ගෙවීම් කරමින් අරමුදල කළමනාකරණ කටයුතු පවත්වාගෙන යන බව | නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත. |
| 5. | 2011 අංක 04 දරණ මෝටර් රථ ප්‍රවාහන (ත්‍යාග හා දිරි දීමනා අරමුදල) නියෝග මාලාවේ අංක 03(1) අනුව; | | | | |
| (i) | පුහුණු කිරීමේ හා අධ්‍යාපනික කටයුතු සඳහා රු.100,000ක් දක්වා, ක්‍රීඩා, විනෝද හා සුබ සාධන කටයුතු සඳහා රු.50,000ක් දක්වා හා කාර්ය මණ්ඩල | 2023<br>2022<br>2021 | පනතේ නියෝග අනුව කටයුතු කිරීම. | පුහුණු කිරීමේ හා අධ්‍යාපන කටයුතු, ක්‍රීඩා විනෝද, සුභ සාධන හා ප්‍රශංසාත්මක කටයුතු වෙනුවෙන් වාර්ෂිකව වෙන් කරන ලද මුදල් ප්‍රමාණය | නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | සාමාජිකයන්ගේ ප්‍රශංශාවකට හෝ විශේෂ ඇගයීමකට ලක්කල යුතු ක්‍රියාවකට තෑගි ගෙවීම පිණිස රු.50,000ක් දක්වා ගිණුම් වර්ෂයක් තුල වැය දැරීම සඳහා ප්‍රතිපාදන ඇතුලත් වී ඇතත් අනාගත තත්ත්වයන් සඳහා වෙන් කිරීමක් සිදු කිරීම සඳහා ප්‍රතිපාදන ඇතුලත් වී නොතිබුණි. එහෙත් ප්‍රවර්තන වර්ෂය තුල උක්ත විෂයන් සඳහා රු.300,000ක වෙන් කිරීමක් සිදු කර තිබුණි. | | | දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය සැසඳීමේදී ප්‍රමාණවත් නොවන බැවින් අතීතයේ සිටම වසර කිහිපයකම වෙන්කිරීම් එකතුකොට අදාළ වාර්ෂික සීමාවන්ට යටත්ව වියදම් දැරීම සිදුවේ. | |
| (ii) | උක්ත (i) හි නිරීක්ෂණයෙහි ඇතුලත් වී ඇති පරිදි ක්‍රීඩා කටයුත්තක් වෙනුවෙන් රු.50,000ක උපරිමයකට යටත්ව වැය දැරිය යුතු වුවත් ඊට අනුකූල නොවන සේ ප්‍රවර්තන වර්ෂය තුල දෙපාර්තමේන්තු සුහද ක්‍රිකට් තරගාවලිය වෙනුවෙන් හා දැල්පන්දු තරගාවලියක් වෙනුවෙන් රු.944,050ක වියදමක් දරා තිබුණි | 2023 | පනතේ නියෝග අනුව කටයුතු කිරීම. | 2021 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ක්‍රීඩා විනෝද, සුභ සාධන කටයුතු හා කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ ප්‍රශංසාත්මක කටයුතු සඳහා වෙන්වූ සමස්ථ මුදල් ප්‍රමාණය රු.944,050ක මුදල 2023 වර්ෂයේ සමස්ථ දෙපාර්තමේන්තුව වෙනුවෙන් පවත්වන ලද ක්‍රිකට් තරඟාවලිය සඳහා හා රාජ්‍ය දැල්පන්දු කණ්ඩායමේ ඇඳුම් සපයා ගැනීම වෙනුවෙන් මුදල් දැරීමට සිදු වූ බව | නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| 6. | 2011 අංක 04 දරණ මෝටර් වාහන (ත්‍යාග හා දිරි දීමනා අරමුදල) නියෝග මාලාවේ 03(1) නියෝග පරිදි මෝටර් රථ සම්බන්ධ අක්‍රමිකතාවයන් සිදු කරන තැනැත්තන් පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා වෙත තොරතුරු සපයන හා සාවද්‍ය ක්‍රියා සම්බන්ධ තොරතුරු හඳුනාගන්නා /සාවද්‍ය ක්‍රියා අනාවරණය කර ගන්නා පුද්ගලයින් සඳහා ත්‍යාග මුදල් ගෙවීම ප්‍රතිපාදන ඇතුලත් කර ඇතත් ඒ සඳහා තොරතුරු සැපයීමට ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමට හා ත්‍යාග ක්‍රමය සම්බන්ධ තොරතුරු පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමට විධිමත් වැඩපිළිවලක් ක්‍රියාත්මක කර නොතිබුණි. | 2023<br>2022<br>2021 | අරමුදලේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා විධිමත් වැඩ පිළිවෙලක් සකස් කිරීමට අවදානය යොමු කල යුතුය. | මෝටර් රථ සම්බන්ධ අක්‍රමිකතා සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ විමර්ශන අංශය වෙත පැමිණිලි කිරීමේ ක්‍රමවේදයක් පවතින අතර එසේ යම් අක්‍රමිකතාවක් පිළිබඳ තොරතුරු සපයන තැනැත්තන්ට මුදල් ගෙවීම සම්බන්ධයෙන් මෝටර් වාහන (ත්‍යාග හා දිරි දීමනා අරමුදල) නියෝග අංක 3(1) “අ “ ප්‍රකාරව ප්‍රමාණවත් ප්‍රතිපාදන ඇත. | නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත. |

## 3.29 වායු විමෝචන භාරකාර අරමුදල

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 628,635,112 | 4,111,084 | 624,524,028 | 248,572,349 | තත්ත්වාගණනය කළ |
| **2022** | 480,078,657 | 3,176,924 | 476,901,733 | 252,377,705 | තත්ත්වාගණනය කළ |
| **2023** | 608,492,820 | 2,463,192 | 606,029,628 | 334,633,332 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| 1. | අරමුදල වෙත මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් ජලය, විදුලිය හා කාර්යාල පහසුකම් සපයා ගැනීම වෙනුවෙන් ගෙවිය යුතු අගය ගණනය කොට ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් වර්ෂයට අදාල එකී වියදම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය තුල අඩුවෙන් දක්වා තිබුණි. | 2023 2022 | වර්ෂයට අදාළ සියලු වියදම් නිසි පරිදි හඳුනා ගෙන මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීම. | ඉදිරියේදී දෙපාර්තමේන්තු නිලධාරීන් සමග සාකච්ඡා කර නිවැරදි ක්‍රමවේදයක් සකස්කර ඒ අනුව ගෙවීම් කිරීමට කටයුතු කරන බව. | නිර්දේශය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. |
| 2. | ගිණුම් වර්ෂය තුල අරමුදලේ කාර්යයන් සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු නිලධාරීන් පූර්ණ කාලීනව සේවයේ යොදවා ගෙන තිබූ | 2023 | වර්ෂයට අදාළ සියලු වියදම් නිසි පරිදි හඳුනා ගෙන මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීම. | වායු විමෝචන භාරකාර අරමුදලේ ක්‍රියාකාරකම් සඳහා නීතිමය බලය මෝටර් රථ පනත මගින් ලැබී තිබීම නිසාත් අරමුදලේ හා මෝටර් රථ ප්‍රවාහන | නිර්දේශය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | නමුත් ඔවුන්ගේ සේවය වෙනුවෙන් ගෙවන ලද රු.3,067,810ක් වූ වැටුප් හා වේතන අරමුදලේ වියදම් ලෙස ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් වසරේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | | | දෙපාර්තමේන්තුව අතර සම්බන්ධතාවය පවත්වා ගැනීම සඳහාත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව යටතේ සේවය කරනු ලබන නිලධාරීන් වායු විමෝචන භාරකාර අරමුදලට අනුයුක්ත කරනු ලබයි. ඔවුන් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ස්ථිර නිලධාරීන් බැවින් දෙපාර්තමේන්තු මගින්ම වැටුප් ගෙවා ඇත. | |
| 3. | අරමුදල විසින් පවත්වාගෙන යන ගිණුම් පොත්පත් හා ලේඛණවලට අනුව 2023 ජනවාරි 01 දිනට දේපල යන්ත්‍ර හා උපකරණ අයිතම 3ක පිරිවැය රු.283,534,928ක් හා සමුච්චිත ක්ෂය වීම් රු.258,245,984ක් වියයුතු වුවත් මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් සටහන් අංක 01හි එකී දේපල යන්ත්‍ර හා උපකරණ අයිතමයන්හි පිරිවැය රු.230,008,038ක් හා සමුච්චිත ක්ෂය වෙන් කිරීම් රු.204,718,592ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් මූල්‍ය | 2023 2022 | පිළිගත් ගිණුම්කරණ ක්‍රමවේදයන්ට අනුකූලව ගිණුම් තැබීම. | මෙම ගිණුම්කරණ අඩුපාඩුව ගිණුම්කරණ ප්‍රමිතීන්වලට අනුකූලව නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිර්දේශය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ප්‍රකාශන තුල දේපල යන්ත්‍ර හා උපකරණ වලට අදාල තත්‍ය අගයන් නිරූපණය කර නොතිබුණි. | | | | |
| 4. | අරමුදල විසින් 2018 දෙසැම්බර් 17 මිලදී ගෙන ඇති නමුත් 2020 වර්ෂයේ මධ්‍යම පරිසර අධිකාරිය හා ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය වෙත පවරා දී ඇති එකතු පිරිවැය රු.මිලියන 129.99ක් වන වායු තත්ත්ව මැනීමේ උපකරණ තුනක් සඳහා රු.මිලියන 17.650ක ක්ෂය වීම් ගණනය කර මුල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් කිරිම හේතුවෙන් ජංගම නොවන වත්කම් උක්ත පිරිවැයේ අගයෙන් වැඩියෙන් ද වසරේ අතිරික්තය ක්ෂයවීම් අගයෙන් අඩුවෙන් ද දක්වා තිබුණි. | 2023 | පිළිගත් ගිණුම්කරණ ක්‍රමවේදයන්ට අනුකූලව ගිණුම් තැබීම. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිර්දේශය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. |
| 5. | අරමුදල සතුව පැවති රු.47,247,000ක් පිරිවැය වූ සංසරණ වායු තත්ත්ව මැනීමේ ඒකකයක් 2023 මාර්තු 10 දින ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය වෙත පවරා දී තිබුණි. එකී පවරා දීමට අදාල ගිණුම් තැබීමේ දී | 2023 | පිළිගත් ගිණුම්කරණ ක්‍රමවේදයන්ට අනුකූලව ගිණුම් තැබීම. | වායු තත්වය පරික්ෂාකිරීමේ ජංගම රථය 2023.03.10 දින ගොඩනැගිලි පර්යේෂණ ආයතනය වෙත නීත්‍යානුකූලව පවරා දී ඇත. නමුත් ඔවුන් විසින් ඉහත රථය ලියාපදිංචි කිරීම සඳහා 2023.03.10 දිනම ඉදිරිපත් | නිර්දේශය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | පවරා දීම සිදු කල දිනය දක්වා වූ රු.1,786,325ක ක්ෂයවීම්වල අගය ගැලපිය යුතු වුවත් ඊට අනුකූල නොවන සේ ක්ෂයවීම් ලෙස රු.3,106,650ක් ගණනය කර මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය තුල දක්වා තිබීම හේතුවෙන් වසරේ අතිරික්තය රු.1,320,325කින් අඩුවෙන් දක්වා තිබුණි. | | | නොකිරීම නිසා 2023.04.30 ගිණුම් පොත් වලින් ඉවත් කරන ලදී. ගිණුම්කරණමය නිවැරදි කිරීම් ඉටු කිරීමට කටයුතු කරන බව. | |
| 6. | අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 17/1615/702/002-xvii හා 2017 අගෝස්තු මස 09 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීම් තීරණය ප්‍රකාරව නිකුත් කර ඇති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2018හි 03 හා 04 ඡේදය ප්‍රකාරව 2018 වර්ෂයේ දී වායු විමෝචන අරමුදල ඇවර කර වගකීම් පියවා වසා දැමීමට කටයුතු කළ යුතු වුවත් අමාත්‍ය මණ්ඩල අනුමැතියකින්, මුදල් අමාත්‍යාංශය සහ භාණ්ඩාගාර අනුමැතියකින් තොරව රේඛීය අමාත්‍යවරයා මගින් අරමුදලේ අයවැය ලේඛණ අනුමත කර ගනිමින් | 2023<br>2022<br>2021 | අදාල නෛතික පරිසරය තුල අවශ්‍ය කටයුතු ඉටු කිරීම. | වාහන වායු විමෝචන භාරකාර අරමුදල ඇවර කිරීම සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් යොමු කරන ලද අතර ඒ සඳහා මුදල් අමාත්‍යාංශයේ නිරීක්ෂණ ලබාදෙන ලෙස ඉල්ලා ඇත.එම නිරීක්ෂණ ලබාදීම සඳහා කමිටුවක් පත් කළ අතර එම කමිටු වාර්තාව අමාත්‍ය මණ්ඩලය වෙත ලබා දෙන ලදී. එම නිරීක්ෂණ ඇතුලත් වාර්තාව නැවත මුදල් අමාත්‍යාංශයේ නිරීක්ෂණ වලට ලබා දෙන ලද අතර මුදල් අමාත්‍යාංශය විසින් එම තීරණ ක්‍රියාත්මක කරන ලෙස නිර්දේශ ලබා දෙන ලදී. ඉන් | නිර්දේශය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | අරමුදල පවත්වාගෙන යාමට අරමුදලේ භාරකාර මණ්ඩලය කටයුතු කර තිබුණි. නමුත් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී අරමුදලේ අඛණ්ඩ පැවැත්ම අවිනිශ්චිත බව අනාවරණය කිරීමට කළමණාකරණය කටයුතු කර නොතිබුණි. | | | අනතුරුව එම නිර්දේශය අමාත්‍ය මණ්ඩලය විසින් ජාතික මෙහෙයුම් මැදිරියට යොමු කරන ලද අතර එහිදී මෙම අරමුදල තවදුරටත් පවත්වා ගෙන යාම වෙනුවට වසා දැමීමට කටයුතු කරන ලෙස දන්වන ලදී. එම තීරණය අනුව අමාත්‍ය මණ්ඩල විසින් ඒ සම්බන්ධ නිරීක්ෂණ ලබා දෙන ලෙස නැවතත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව හා පරිසර අමාත්‍යාංශය වෙත දන්වන ලදී. අදාල උපදෙස් අනුව අවශ්‍ය පැහැදිලි කිරීම් සිදු කර අමාත්‍ය මණ්ඩල වෙත ලබා දී ඇති අතර එම නිරීක්ෂණ අමාත්‍ය මණ්ඩලය විසින් ජාතික මෙහෙයුම් මැදිරියට යොමු කිරීමෙන් අනතුරුව ජාතික මෙහෙයුම් මැදිරිය විසින් ඒ සම්බන්ධව සාකච්ජාවට බඳුන්කරමින් පවතී. | |
| 7. | වායු විමෝචන පරීක්ෂා සිදුකරන පෞද්ගලික සමාගම් දෙකක් සමඟ ඇතිකරගත් ගිවිසුම් ප්‍රකාරව එක් එක් | 2023<br>2022<br>2021 | ආදායම නිසි පරිදි සත්‍යාපනය කළ යුතු වීම. | අදාල ආයතනවල තොරතුරු පද්ධතිය වෙත පිවිස සිදුකරන පරීක්ෂණ ප්‍රමාණයන් පිළිබඳ තොරතුරු ඕනෑම මොහොතක | නිර්දේශය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | වාහනය සඳහා අය කරන පරීක්ෂණ ගාස්තුවෙන් සියයට 10ක් වායු විමෝචන අරමුදල වෙත ගෙවිය යුතු වේ. එහෙත් උක්ත පෞද්ගලික සමාගම් සිදුකරන ලද පරීක්ෂණ සංඛ්‍යාව, ඔවුන් අය කරගෙන ඇති පරීක්ෂණ ගාස්තුව හා ඒ අනුව වායුවිමෝචන අරමුදල වෙත ලැබිය යුතු ආදායම පිළිබඳව පරීක්ෂා කර රජයට ලැබිය යුතු ආදායම් නිසිලෙස ලැබුණේ ද යන්න තහවුරුවකින් තොරව 2023 වර්ෂය තුළ අදාළ සමාගම් දෙක අරමුදල වෙත ප්‍රේෂණය කර ඇති රු.මිලියන 336.47ක් අගය අරමුදලේ ආදායම ලෙස හඳුනාගෙන ගිණුම් ගත කර තිබුණි. | | | ලබාගැනීමට අවශ්‍ය මූරපද වායු විමෝචන කාර්යාලය සතුව ඇත. ඒ අනුව අවස්ථානුකූලව සැසඳුම් සිදුකරනු ලබයි. තවදුරටත් විගණන කාර්යාලයේ යෝජනා අනුව කොන්ත්‍රාත්කාර දූම් පරීක්ෂණ ආයතනවල පරිසනක පද්ධතියේ පද්ධති විගණනයක් සිදුකිරීම සඳහා මූලික කටයුතු කරමින් පවතී. | |
| 8. | දූම් පරීක්ෂණ සිදු කරන සමාගම් සිදුකර ඇති පරීක්ෂණයන් සම්බන්ධ තොරතුරු ලබා ගැනීමට ඔවුන්ගේ පරිගණක පද්ධතීන් වෙත ප්‍රවේශ වීම සඳහා යෝග්‍ය වැඩපිළිවෙලක් සකස් කර නොතිබූ අතර අවශ්‍ය අවස්ථාවන්හි දී ඔවුන්ගේ පද්ධති වලට ප්‍රවේශ වීම සඳහා ඩොංගල් (dongle) ලබාදී ඇතත් ඒවා නිසි | 2023 | ආදායම් නිසි ලෙස හඳුනා ගැනීමට කටයුතු කිරීම. | කොන්ත්‍රාත් සමාගම් විසින් විමෝචන පරීක්ෂණ වැඩසටහන විගණනය සහ කළමනාකරණය කිරීම සඳහා ස්වයංක්‍රීය මෘදුකාංග දෙකක් නිර්මාණය කර දෛනිකව සිදු කරනු ලබන වාහන වායු විමෝචන පරීක්ෂණ මාර්ගගතව පරීක්ෂා කිරීම සඳහා ඔවුන්ගේ මධ්‍යම | නිර්දේශය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | පරිදි ක්‍රියාත්මක නොවීම හේතුවෙන් තොරතුරු ලබා ගැනීම දුෂ්කර වී තිබුණි. | | | දත්ත පද්ධතියට පිවිසීමට වාහන වායු විමෝචන කාර්යාලය වෙත Dongal ලබා දී ඇත.කෙසේ වෙතත් සාමාන්‍ය කාර්යාල වේලාවන් වලදී වාහන වායු විමෝචන පරික්ෂාවන් 30000 ක් පමණ සිදු කරන බැවින් භාගත කිරීමේදී මන්දගාමී ස්වභාවයක් ඇතිවේ. මෙම දෝෂය නිවැරදි කර දෙන ලෙස අදාල සමාගම් වෙත ලිඛිතව දන්වා ඇත. | |
| 9. | අංක 01/2020 හා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය මු.රෙ. 876 (2) (අ) ප්‍රකාරව දැනට පවතින අරමුදල් ක්‍රියාත්මක වීම ජාතික අවශ්‍යතාවක් බව පෙනී යන්නේ නම් හා එම අරමුදල් සඳහා නිසි පරිදි පනතක් මඟින් පාර්ලිමේන්තුවේ අනුමත වී නොමැති නම් එම අරමුදල් සඳහාමෙම චක්‍රලේඛය නිකුත් කර වසරක් ඇතුළත පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතු වුවත් එවැනි අනුමැතියක් ලබා නොතිබුණි. | 2023<br>2022<br>2021 | මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීම. | 2018 දී වාහන වායු විමෝචන භාරකාර අරමුදල ඇවර කිරීමට ගත් තීරණය අත්හිටුවීම සඳහා අමාත්‍ය මණ්ඩලයට කරුණු දක්වමින් 2019 පෙබරවාරි මාසයේදී ප්‍රවාහන අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් යොමු කරන ලදී. එහිදී මුදල් අමාත්‍යවරයා හා ප්‍රවාහන අමාත්‍යවරයා සාකච්ජා කර මේ සඳහා තීරණයක් ගෙන එය නැවත අමාත්‍ය මණ්ඩලය වෙත වාර්තා කරන ලෙස දන්වා තිබුණි. නමුත් එවකට රටේ පැවති කොරෝනා | නිර්දේශය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. |

වසංගත තත්වය හේතුවෙන් මේ පිළිබඳ තීරණයක් ගැනීම ප්‍රමාද වී ඇත. එසේවුවද අරමුදලේ පැවැත්ම සඳහා භාණ්ඩාගාර ලේකම් විසින් වායු විමෝචන භාරකාර මණ්ඩලයේ සභාපති ධූරයට භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයෙකු පත් කිරීම මේ වනතෙක්ම සිදු කර ඇති අතර ඒ අනුව භාරකාර මණ්ඩල රැස්වීම් පවත්වා තිබේ. එසේම මේ සම්බන්ධයෙන් 2023 ජනවාරි මාසයේ අමාත්‍යමණ්ඩලය වෙත කරුණු දක්වන ලදී. එහිදී අරමුදල අඛණ්ඩ පැවැත්ම පිළිබඳ තීරණයක් ගැනීම සඳහා කමිටුවක් පත්කර ඇති අතර එහි නිර්දේශ අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත යොමු කර ඇති අතර වාහන වායු විමෝචන අරමුදල නැවත ස්ථාපිත කිරීමට අදාළව අග්‍රාමාත්‍ය කාර්යාලයට අනුබද්ධ ජාතික මෙහෙයුම් මැදිරියේ නිර්දේශ අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කිරීමට

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | නියමිතව ඇත. | |
| 10. | වායු විමෝචන භාරකාර මණ්ඩලය ඇවර කර මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව යටතේ අංශයක් ලෙස වායු විමෝචන ව්‍යාපෘති කාර්යාලයක් පිහිටුවීමට 2017 දෙසැම්බර් 10 දිනැති අංක DMS/1143/VETF කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය ලැබී තිබිය දී සහ අංක PED/RED/CIR/2018 /02 දරණ 2018 අගෝස්තු 18 දිනැති ලිපිය මගින් වායු විමෝචන අරමුදල ඇවර කිරීම සඳහා භාණ්ඩාගාර ලේකම්වරයා විසින් නිර්දේශ ලබා දී තිබිය දී මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව යටතේ අංශයක් ලෙස ස්ථාපිත කිරීමකින් තොරව අනුමත කාර්ය මණ්ඩලයෙන් පරිබාහිර වෙනත් තනතුරු පවත්වාගනිමින් වැටුප් හා දීමනා ගෙවීමට අරමුදලේ පාලක මණ්ඩලය කටයුතු කර තිබුණි. | 2023 2022 | විධිමත් අනුමැතියක් මත වියදම් සිදු කිරීමට පියවර ගැනීම. | අරමුදලේ කාර්යයන් ඵලදායීව ඉටුකරවා ගැනීමට නිලධාරින්ගේ සහභාගීත්වය ලබාගැනීම සඳහා භාරකාර ගිවිසුම ප්‍රකාරව භාරකාර මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන මෙම ගෙවීම් සිදුකර ඇත. යම් නිලධාරියෙකු සංයුක්ත දීමනා ඉල්ලුම්කරන අවස්ථාවේදී මෙම ගෙවීම් සිදු කරනු නොලැබේ | නිර්දේශය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| 11. | යම් තනතුරකට අදාළව ගිවිසගත් වැටුපක් මත එකී තනතුරට අදාළ රැකියා විස්තරයේ සඳහන් කාර්යයන් ඉටු කළ යුතු වන අතර එකී කාර්යයන් සඳහා අමතර ගෙවීමක් හිමි නොවේ. එහෙත් රැකියා විස්තරයෙහි දුම් පරීක්ෂණ වැඩසටහන් පැවැත්වීම, දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම වැනි වායු විමෝචනයට අදාළ කාර්යයන් සිදුකිරීම සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන ඇති ව්‍යාපෘති සහකාර, පර්යේෂණ සහකාර සහ ව්‍යාපෘති කාර්මික ශිල්පීන් 13දෙනෙකු වෙනුවෙන් මුදල් අමාත්‍යාංශයේ අනුමැතියකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් මත රැකියා විස්තරය අනුව සිදු කළ යුතු කාර්යයන් සඳහා දිනකට රු.2,000 බැගින් සහභාගී වීමේ දීමනාවක් ගෙවීමට කටයුතු කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුල උක්ත විෂය වෙනුවෙන් විධිමත් අනුමැතියකින් තොරව රු.846,175ක දීමනා ලබා දී තිබුණි. | 2023 | විධිමත් අනුමැතියක් මත වියදම් සිදු කිරීමට පියවර ගැනීම | අරමුදලේ කාර්යයන් ඵලදායීව ඉටුකරවා ගැනීමට නිලධාරින්ගේ සහභාගීත්වය ලබාගැනීම සඳහා භාරකාර ගිවිසුම ප්‍රකාරව භාරකාර මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන මෙම ගෙවීම් සිදුකර ඇත. | නිර්දේශය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| 12. | මුදල් අමාත්‍යාංශය හෝ අදාළ වැටුප් බලධාරී ආයතන ව්‍යුහයන්ගේ අනුමැතියකින් තොරව 2022 දෙසැම්බර් 21 දින අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අංක 2022/04 දරණ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවට ලබාගත් අනුමැතියක් මත උපරිමය මාසයකට වාර 06ක් වන පරිදි වායු විමෝචන වැඩසටහන් සඳහා සහභාගි කරවා ගනු ලබන මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරීන්, පොලිස් නිලධාරීන් වැනි බාහිර රාජ්‍ය නිලධාරීන් සඳහා එක් වරකට රු.2,000 බැගින් දීමනාවක් ද ක්ලීන්කෝ ලංකා හා ලාෆ් එකෝ ශ්‍රී පුද්ගලික සමාගම්හි කාර්මික ශිල්පීන් සඳහා එක් වරකට රු.1,000ක දීමනාවක් ද ගෙවීමට කටයුතු කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුල විධිමත් අනුමැතියකින් තොරව උක්ත විෂය සඳහා රු.1,230,500ක දීමනා ලබා දී තිබුණි. | 2023 | විධිමත් අනුමැතියක් මත වියදම් සිදු කිරීමට පියවර ගැනීම. | අරමුදලේ කාර්යයන් ඵලදායීව ඉටුකරවා ගැනීමට නිලධාරින්ගේ සහභාගීත්වය ලබාගැනීම සඳහා භාරකාර ගිවිසුම ප්‍රකාරව භාරකාර මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන මෙම ගෙවීම් සිදුකර ඇත. | නිර්දේශය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| 13. | වායු විමෝචන අරමුදල සඳහා කොන්ත්‍රාත් පදනම මත ව්‍යාපෘති සහකාර නිලධාරීන් තිදෙනෙකු, කාර්මික ශිල්පීන් දසදෙනෙකු, රියදුරන් දෙදෙනෙකු හා කාර්යාල කාර්ය සහායකයින් දෙදෙනෙකු බඳවාගෙන තිබූ අතර ඔවුන්ගේ කොන්ත්‍රාත් ගිවිසුම් 2016, 2017 හා 2018 යන වර්ෂයන්හි දී අවසන් වී තිබුණි. එහෙත් එකී කොන්ත්‍රාත් ගිවිසුම් දීර්ඝ කිරීමකින් හෝ අලුත් කිරීමකින් තොරව සේවා ගිවිසුමක් රහිතව උක්ත නිලධාරීන් දාහත්දෙනා සමාලෝචිත වර්ෂය තුල සේවයේ යොදවා නීත්‍යානුකූල පදනමකින් තොරව රු.8,585,980 වැටුප් හා දීමනා ලබා දී තිබුණි. | 2023 | විධිමත් අනුමැතියක් මත වියදම් සිදු කිරීමට පියවර ගැනීම. | මෙහි සඳහන් සියලුම නිලධාරින්ගේ සේවාව ලබා ගැනීම සඳහා සියලුම වර්ෂයන්ට අදාලව භාරකාර මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන ඇති අතර භාරකාර අරමුදල අහෝසි කර දැනට සේවයේ යොදවා ඇති පිරිස ස්ථිර සේවයට අන්තග්‍රහණය කිරීමේ අරමුණින් කටයුතු කර ඇති අතර සියලුම නිලධාරින්ට අදාල පත්වීම් ලිපි සහ සේවා ගිවිසුම් අත්සන් කර ඇති බව දන්වා සිටිමි. | නිර්දේශය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. |
| 14. | 2023 වර්ෂය සඳහා සකස් කරන ලද අයවැය ප්‍රතිපාදනයන්හි වෙනත් බාහිර ආයතන වෙත අරමුදල් ප්‍රදානය කිරීමක් ලෙස ඇතුළත්ව නොතිබිය දී සහ මුදල් අමාත්‍යාංශයේ හෝ රේඛීය අමාත්‍යාංශයේ | 2023 | විධිමත් අනුමැතියක් මත වියදම් සිදු කිරීමට පියවර ගැනීම. | වාහන වායු විමෝචන අරමුදල පිහිටුවීමේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට අදාල කාර්යභාරයට අයත් වැඩසටහනක් සඳහා භාරකාර ගිවිසුම ප්‍රකාරව භාරකාර මණ්ඩලයේ අනුමැතිය මත මෙම | නිර්දේශය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | අනුමැතියකින් තොරව අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතියක් මත 2023 අගෝස්තු 17 වන දින පරිසර අමාත්‍යාංශය වෙත රු.1,383,500ක මුදලක් ප්‍රදානය කර තිබුණි. | | | අරමුදල් ලබා දෙන ලදී. | |
| 15. | වායු තත්ත්ව මැනීමේ උපකරණ සම්බන්ධයෙන් 2020 ජනවාරි 16 හා 2020 නොවැම්බර් 03 දින අරමුදලේ භාරකාර මණ්ඩලය ගෙන ඇති තීරණය ප්‍රකාරව එකතු පිරිවැය රු.මිලියන 82.752ක් වන Eco Tech මාදිලියේ ස්ථාපිත සංසරණ වායු තත්ත්ව මැනීමේ ඒකක 02ක් මධ්‍යම පරිසර අධිකාරිය වෙත පවරා දීමට කටයුතු කර ඇති නමුත් අදාල ආයතනය වෙත පවරා ඇති උපකරණවල මෙහෙයුම් අලුත්වැඩියා හා නඩත්තු සේවා සඳහා මධ්‍යම පරිසර අධිකාරිය වෙත සමාලෝචිත වර්ෂයේ අයවැය මගින් ප්‍රතිපාදන සලසා නොමැති රු.3,437,358ක වායු විමෝචන අරමුදලට අදාල නොවන පිරිවැයක් දරා තිබුණි. | 2023<br>2022 | වියදම් පාලනයට අදාළව නිසි ක්‍රමවේදයක් සකස් කිරීම | වාහන වායු විමෝචන භාරකාර අරමුදල ස්ථාපිත කර ඇත්තේ සමස්ථ වායු දූෂණය අවම කිරීමේ අරමුණුන් වේ. ඒ අනුව වාහන වලින් ප්‍රමුඛව, අනෙකුත් ප්‍රභව වලින් සිදුවන වායු දූෂණය අවම කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට විද්‍යාත්මක මට්ටමේ වායු තත්වයන් මැනීමේ උපකරණ මිලදී ගැනීමට හා එවා තිරසාරව නඩත්තු කිරීමට සිදුවන අතර ඊට විශාල මුදලක් වැය කිරීමට සිදුවේ. මෙම අරමුදල ඇති කිරීමේ මූලික අරමුණු අතර වායු තත්වය ගුණාත්මක භාවයෙන් වැඩි දියුණු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම ප්‍රධාන වේ. එවැනි කටයුතු සඳහා රජයට අමතර පිරිවැයක් දැරීමට නොදී මෙම අරමුදල මගින් මුදල් ප්‍රතිපාදන වැය කිරීම | නිර්දේශය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | සිදු කරනු ලබයි. ඒ අනුව වායු තත්වයන් පිළිබඳ නිවැරදි ප්‍රතිපත්තිමය තීන්දු තීරණවලට එළඹීම සඳහා වායුවේ ගුණාත්මකභාවය පිළිබඳ තොරතුරු ලබාගැනීමට බලයලත් රාජ්‍ය ආයතන වෙත මෙලෙස මුදල් ලබාදී ඇත. | |
| 16. | වායු තත්ත්ව සහ දත්ත කළමනාකරණ පද්ධතිය ඒකාබද්ධ කිරීම හා බෙදා හැරීම සඳහා ජාතික වේදිකාවක් සංවර්ධනය කිරීම සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය හා මධ්‍යම පරිසර අධිකාරිය එක්ව ඉදිරිපත් කර තිබූ යෝජනාවලිය ත්‍රෛපාර්ශවිකව ක්‍රියාත්මක කිරීම සඳහා 2023 වර්ෂයේ අයවැය ලේඛණය මගින් රු. මිලියන 150ක ප්‍රතිපාදන වෙන්කර දී ඇතත් උක්ත කාර්යයට අදාල කාර්යයන් 2023 වර්ෂය තුල සිදුකර නොතිබුණි. එකඟ වූ කොන්දේසි ප්‍රකාරව අදාල ආයතන සිදු කල යුතු කාර්යයන්ගේ ප්‍රගතිය පරීක්ෂාකර | 2023 | සුපරික්ෂාකාරීව අරමුදල් වැය කිරීමට කටයුතු කිරීම. | අදාල කාර්යය සිදු කිරීමට අවශ්‍ය ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය වෙත මුදල් ලබා දී ඇත. | නිර්දේශය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | බලා අදාල ගෙවීම් කටයුතු සිදුකල යුතු වුවත්, ප්‍රගතිය පරීක්ෂාවකින් තොරව හා සිදු කල යුතු කාර්යයන් තහවුරු කර ගැනීමකින් තොරව ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය වෙත රු.මිලියන 9ක් ගෙවීමට කටයුතු කර තිබුණි. | | | | |
| 17. | අරමුදල විසින් ආයෝජනයන් සිදු කිරීමට පෙර මුදල් අමාත්‍යවරයාගේ, භාණ්ඩාගාර ලේකම්වරයාගේ, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියකින් තොරව අරමුදලේ අතිරික්ත මුදලින් රු.500,000,000ක් දක්වා වූ මුදලක් භාණ්ඩාගාරය වෙත මාරු කිරීමකින් තොරව ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. අරමුදලේ ගිණුම අනුව 2023 දෙසැම්බර් 31 දින දක්වා සමුච්චිත වී ඇති ලාභය රු.මිලියන 612.023ක් වන නමුත් එකී සමුච්චිත ලාභය ඒකාබද්ධ අරමුදල වෙත බැර කිරීමකින් තොරව රු.මිලියන 551.888ක් ස්ථාවර තැන්පතුවල | 2023 | අතිරික්ත මුදල් භාණ්ඩාගාරයේ ලේකම්ගේ අනුමැතිය ඇතිව ආයෝජනය කිරීම හෝ රාජ්‍ය මුදල් නිසි පරිදි ඒකාබද්ධ අරමුදල වෙත බැර කිරීමට කටයුතු කිරීම | අරමුදලේ අතිරික්ත මුදල් මහ භාණ්ඩාගාරය වෙත මාරු කරනුයේ වාහන වායු විමෝචන භාරකාර අරමුදල් මණ්ඩලයෙන් ලබා ගන්නා අනුමැතියට යටත්වයි. එබැවින් 2023 වර්ෂයේදී මහා භාණ්ඩාගාරයේ ඉල්ලීම මත භාරකාර මණ්ඩලයේ අනුමැතියට යටත්ව රු.200,000,000/- මහා භාණ්ඩාගාරය වෙත මාරු කර ඇත. ගිණුමේ අතිරික්ත මුදල් පවතින අවස්ථාවලදී භාරකාර ගිවිසුමේ ප්‍රතිපාදන ප්‍රකාරව භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්ගේ සහ භාරකාර මණ්ඩලයේ උපදෙස් පරිදි ආවරණ අනුමැතියට යටත්ව දැනට ගිණුම් පවතින | නිර්දේශය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | හා රු.මිලියන 60.135ක් ඉතුරුම් තැන්පතුවල ආයෝජනය කර තිබුණි. | | | මහජන බැංකුවේ කෙටිකාලීන ස්ථාවර තැන්පතුවල ආයෝජනය කරන ලදී. නමුත් භාණ්ඩාගාරයේ අතිරික්ත මුදලින් කොටසක් ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීම් වලදී භාණ්ඩාගාරය වෙත මුදල් ප්‍රේශණය කර තිබේ.අරමුදලේ අතිරික්ත මුදල් රාජ්‍ය මුල්‍ය දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පරිදි භාරකාර මණ්ඩලයේ අනුමැතියට යටත්ව පමණක් ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලබයි. ඒ අනුව 2023 වර්ෂයේදී රු. මිලියන 200 මුදලක් ඒකාබද්ධ අරමුදලට බැරකර ඇත. | |
| 18. | රථවාහන ආශ්‍රිත වායු දූෂණය, ශ්‍රී ලංකාවේ ප්‍රධාන නගරවල වාතයේ තත්ත්වය, බලශක්තිය, පරිසරය හා ආර්ථික බලපෑම් වැනි විවිධ පර්යේෂණයන් සඳහා 2012 වර්ෂයේ සිට 2023 වර්ෂය සඳහා වායු විමෝචන අරමුදල මගින් රු.මිලියන 29.52ක වියදමක් දරා ඇති නමුත් එකී ව්‍යාපෘතීන් මගින් ලබාගත් | 2023 | ලබා ගත් පර්යේෂණ වාර්තා සාධනීය ක්‍රියාමාර්ගයක් වෙනුවෙන් වැඩපිළිවෙලක් සැකසීම. | මේ වන විට සියළුම පර්යේෂණ වාර්තාවන් ලැබී ඇති බව දන්වා සිටින අතර පර්යේෂණ වාර්තා මගින් ලබා දී ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීම හා අදාල දත්ත ඒ පිලිබඳ උනන්දුවක් දක්වන පාර්ශවයන්ට මෙන්ම පරිසර අමාත්‍යාංශයේ වායු සම්පත් කළමනාකරණ ඒකකය වෙත භාරදීමට කටයුතු කර | නිර්දේශය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | අවසන් පර්යේෂණ වාර්තා ලබාගෙන කිසිදු සාධනීය ක්‍රියාමාර්ගයක් වෙනුවෙන් වැඩපිළිවෙළක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි. | | | ඇති බව දන්වා සිටින අතර අපගේ වෙබ් අඩවියේ මෙන්ම පරිසර අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ එළ කිරීමට කටයුතු කර ඇත. | |
| 19. | වායු විමෝචන පරීක්ෂණ සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කර ඇති පුද්ගලික සමාගම් දෙක සමඟ ඇති කරගෙන ඇති ගිවිසුම්වල 4.1 ඡේදය ප්‍රකාරව කොන්ත්‍රාත්කරුවන් විසින් එදිනෙදා ලබන දෛනික ආදායමෙන් සියයට 10ක මුදලක් දින හතක් ගතවීමට පෙර වායු විමෝචන අරමුදල වෙත ප්‍රේෂණය කළ යුතු වේ. ගිවිසුම්ගත එක් කොන්ත්‍රාත්කාර සමාගමක් උක්ත කොන්දේසිය සම්පූර්ණ වන පරිදි දින හතක් තුළ අදාල මුදල වායු විමෝචන අරමුදල වෙත ගෙවා ඇති නමුත් අනෙක් කොන්ත්‍රාත් සමාගම උක්ත කොන්දේසිය සම්පූර්ණ වන සේ අදාළ කාලය තුළ අරමුදල වෙත මුදල් ප්‍රේෂණය කර නොතිබුණි. ගිවිසුම ප්‍රකාරව ප්‍රමාද වන දිනකට සියයට 3ක් | 2023 | ආදායම නිසි ලෙස හඳුනා ගැනීමට නිසි ක්‍රමවේදයක් සකස් කිරීම. | සමාගම් අතර ඇති ගිවිසුම අනුව වාහන වායු විමෝචන පරික්ෂාවකින් අරමුදලට ලැබිය යුතු මුදල වැඩකරන දින 07 ක් තුල ලැබිය යුතුය. ඒ අනුව මුදල් ලැබී ඇති අතර දක්වා ඇති විචලයක් නිරික්ෂණය නොවේ. තවදුරටත් මෙම සැසඳීම පහසු කරගැනීම සඳහා එදිනෙදා මුදල් ඊට පසුදිනම බැරකරන ලෙස ආයතන වෙත උපදෙස් ලබාදී ඇත. මේ වනවිට ඔවුන් ඒ අනුව දෛනික මුදල් බැරකරමින් පවතින බව දන්වමි. 2024 ජනවාරි මස සිට දෛනිකව ආදායම් හඳුනාගත හැකිවන පරිදි දුම් පරික්ෂණ සිදුකරන සමාගම් දෙකෙන්ම වාර්තා ලබා ගැනීම සිදු කරනු ලබයි. | නිර්දේශය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | බැගින් අධිභාරයක් අය කළ යුතු වුවත් වායු විමෝචන අරමුදල විසින් එවැනි අධිභාරයක් අය කිරීමට කටයුතු කර නොතිබූ අතර විගණනය විසින් සිදුකළ ගණනය කිරීම් අනුව 2023 වර්ෂය තුළ දිනක්, දින දෙකක් හා දින තුනක් ලෙස ප්‍රමාද වී ගෙවීම් කළ අවස්ථා වෙනුවෙන් ආසන්න වශයෙන් රු.1,189,569ක අධිභාරයක් අය කළ යුතුව තිබුණි. සමාගම් විසින් දෛනිකව එකතු කරන ලද ආදායම හඳුනාගත හැකිවන පරිදි වාර්තා ඉදිරිපත් නොකරන හෙයින් ගිවිසුම් ප්‍රකාරව අය විය යුතු ප්‍රමාද ගාස්තු ගණනය කිරීම ගැටලුකාරී වී තිබුණි. | | | | |
| 20. | වායු විමෝචන භාරකාර අරමුදල රු.මිලියන 82.75ක වියදමක් දරා සංසරණ වායු තත්ත්ව මැනීමේ ඒකක දෙකක් මධ්‍යම පරිසර අධිකාරිය වෙත හා රු.මිලියන 47.24ක පිරිවැය සහිත ජංගම සංසරණ වායු තත්ත්ව මැනීමේ උපකරණය ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය | 2023<br>2022 | වත්කම් නිශ්කාර්ය නොවන ලෙස උපයෝජනය කිරීම. | මෙම උපකරණ මිලදී ගැනීමේ ප්‍රධාන අරමුණ වන්නේ වායු තත්ව කළමනාකරණ සඳහා අවශ්‍ය දත්ත ලබා ගැනීම හා එවා මහජනතාවට ප්‍රදර්ශනය කිරීමත්ය. ඒ අනුව , AIR QUALITY INDEX එකක් සාදා ඇති අතර ඒ අවට වායු තත්වයේ ගුණාත්මක | නිර්දේශය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | වෙත ලබාදී තිබුණි. ගිවිසුම් ප්‍රකාරව අදාළ උපකරණ මගින් ලබාගන්නා මිනුම් දත්ත අරමුදල වෙත ලබාදිය යුතු නමුත් උක්ත වායු තත්ත්ව මැනීමේ උපකරණය මගින් ලබාගන්නා මිනුම් දත්ත භාවිතයෙන් සිදු කළ යුතු කාර්යයක් සම්බන්ධයෙන් පූර්ව නිශ්චිත වැඩපිළිවෙළක් නොමැති වීම හා එකී මිනුම් දත්ත භාවිතා කර කිසිදු ප්‍රයෝජනවත් කාර්යයක් සිදු නොකිරීම හේතුවෙන් රු.මිලියන 130කට අධික රජයේ මුදල් ආයෝජනය හා උපකරණ මගින් ලබාගෙන ඇති මිනුම් දත්ත නිෂ්කාර්යය වී තිබුණි | | | තත්වය එමගින් ප්‍රදර්ශනය කරනු ලබයි. තවද මෙම ඒකක මගින් ලබා ගන්නා ලද දත්ත, එම දත්තයන් පිළිබද උනන්දුවක් දක්වන පාර්ශව වෙත ලබා ගැනීම සඳහාත්, මහජනතාවට ප්‍රදර්ශනය කිරීම සඳහත් මධ්‍යම පරිසර අධිකාරියේ හා ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ වෙබ් අඩවි වල දක්වා ඇත. ඊට අමතරව , මෙම දත්ත පරිසර අමාත්‍යාංශයේ වායු තත්ව කළමනාකරණ කේන්ද්‍රය මගින් වායු තත්ත්ව කළමනාකරණය කිරීම සම්බන්ධ ප්‍රතිපත්ති, තීරණ හා ක්‍රියාකාරකම් හඳුනා ගැනීම සඳහාත් යොදා ගැනීමට යොමු කර ඇති බව දන්වමි. | |
| 21. | අරමුදල ආරම්භ කළ 2008 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අරමුදල ස්ථාපිත කිරීමේ අරමුණු ඉටු කිරීම වෙනුවෙන් වායු තත්ත්ව මැනීමේ උපකරණ හා දුම් පරීක්ෂණ උපකරණ වෙනත් බාහිර ආයතන වෙත ලබාදීම | 2022 | කාර්ය සාධන වාර්තා හෝ ප්‍රගති වාර්තා කාලීනව සකස් කල යුතුය. | විගණනයෙන් පෙන්වාදී ඇති පරිදි කාර්යසාධන වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමු. එසේම මේ වන විටත් අරමුදලේ කාර්යයසාධනය පිළිබද විස්තරය මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු | නිර්දේශය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | සඳහා රු.මිලියන 283.5ක් හා පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා රු.මිලියන 40ක් වැය කර ඇති නමුත් එම ආයෝජනයන් තුලින් අරමුදලේ අරමුණු ළඟා කරගෙන තිබේ ද යන්න තහවුරු කිරීම සඳහා කාර්ය සාධන වාර්තා හෝ ප්‍රගති වාර්තා කිසිවක් පවත්වාගෙන ගොස් නොතිබුණි.ඒ අනුවකාර්ය සාධන දත්ත/වාර්තා ඇසුරින් පසුගිය වසර 15 තුළ අරමුදලේ අරමුණු ඉටු කලේද යන්න සමාලොචනය කිරීමට අරමුදලේ භාරකාර මණ්ඩලය අපොහොසත්වී තිබුණි. | | | කාර්යයසාධාන වාර්තාවට ඇතුළත් කරනු ලබයි. | |
| 22. | නව දුම් පරීක්ෂණ මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා අවශ්‍ය මූලික අනුමැතියෙන් හා අවශ්‍ය යටිතල පහසුකම් සම්පූර්ණ කර ඇති බවට තහවුරු කර ගැනීමකින් තොරව වායු විමෝචන අරමුදල විසින් 2017 දෙසැම්බර් 28 දින රුපියල් මිලියන 21.937ක පිරිවැයක් දරා ඩීසල් වාහන දුම් පරීක්ෂණ කට්ටල 10ක් ශ්‍රී ලංකා | 2022 | මූලික අනුමැතීන් හා අවශ්‍ය යටිතල පහසුකම් සම්පූර්ණ කර ඇති බව තහවුරු කර ගැනීමෙන් පසුව පමණක් මෙවැනි ආයෝජනයන් සිදු කළ යුතුය. | මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයට අයත් බස් රථ සඳහා ආදායම් බලපත්‍ර ලබා ගැනීමට හැකි වන පරිදි පරීක්ෂණ සිදු කිරීමට අවසර ලබා දෙන ලද අතර ඒ පිළිබඳ මේ වන විට සියළුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල දැනුවත් කර ඇති බවද දන්වන | නිර්දේශය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| ගමනාගමන මණ්ඩලය වෙත ලබාදී තිබූ අතර 2023 වර්ෂය දක්වා උක්ත දුම් පරීක්ෂණ මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා අවශ්‍ය නීතිමය නිෂ්කාශන ලබා ගැනීමට නොහැකි වීම හේතුවෙන් වසර 5 කට අධික කාලයක සිට එකී උපකරණ භාවිතයකින් තොරව භාවිතයට ගත නොහැකි තත්ත්වයට පත්වෙමින් තිබුණි. | අතර ඉතා ඉක්මනින් එම කටයුතු ආරම්භ වීමට නියමිත බව දන්වමි. |

## 3.30 සුරාබදු තෑගි අරමුදල

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 291,524,196 | 38,844,870 | 252,679,326 | (71,662,780) | තත්ත්වාගණනය කළ |
| **2022** | 331,806,612 | 31,086,992 | 300,719,620 | 48,444,530 | තත්ත්වාගණනය කළ |
| **2023** | 362,116,691 | 24,363,751 | 337,752,940 | 36,968,594 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| 1. | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම රු. 47,134,000 ක් ලෙස දක්වා තිබුණද, එය ගොඩනැගිල්ලේ වටිනාකම පමණක් විය. එසේ වුවද ගොඩනැගිල්ල පිහිටි ඉඩම 2021 වර්ෂය අවසානය දක්වාම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණු අතර ඉඩමේ අයිතිය සනාථ කිරීම සඳහා අවශ්‍ය ලියකියවිලි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2021 | ගොඩනැගිල්ල පිහිටි ඉඩම විධිමත් පරිදි අයිතිය තහවුරු කර ගනිමින් තක්සේරු කර ගිණුම්ගත කිරීම. | අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් ඉඩමක් බැවින් පවරා ගැනීමේ කටයුතු කෙරෙමින් පවතී. පැවරුම් සහතිකය මෙතෙක් ලැබී නොමැත. | 2013 වර්ෂයේ සිට සුරාබදු දෙපාර්තමේන්තුවට පවරා දී ඇති සුරාබදු පුහුණු පාසලට අයත් ඉඩම සහ ගොඩනැගිලි සම්බන්ධ නිර්දේශ 2024 සැප්තැම්බර් දක්වාත් ක්‍රියාත්මක වී නොමැත |
| 2. | 2021 අවසානය දක්වාම රු.47,134,000 ක් වූ ගොඩනැඟිලි වෙනුවෙන් ක්ෂය | 2021 | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කිරීම. | 2022 වර්ෂයේ දී ක්ෂය ගණනය කිරීමට අදාළ නිලධාරීන්ට උපදෙස් දී ඇත. | ගොඩනැගිලි වටිනාකම තක්සේරු කර මේ දක්වාත් ක්ෂය ප්‍රතිපාදනයන් සිදු වී නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ගැලපීම් සිදුකර නොතිබුණි. | | | | |
| 3. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක - 07 අනුව දේපළ පිරියත හා උපකරණ උපලේඛනය තුල වත්කම් වල දළ ධාරණ අගය ,සමුච්චිත ක්ෂය, ශුද්ධ ධාරණ අගය හෙළිදරව් කල යුතු වුවද ගොඩනැගිලි, ගෘහ භාණ්ඩ, කාර්යාල උපකරණ ඇතුළු වත්කම් කාණ්ඩ අයිතම 08 ක එකතුව වු රු.101,798,966 ක ශුද්ධ ධාරණ අගය පමණක් හෙළිදරව් කර තිබුණි. 2023 වර්ෂයේ අවසාන දිනට එම දේපළ පිරියත හා උපකරණ වල දළ ධාරණ අගය රු. 190,995,393 ක් විය. | 2023 | එම | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව | ගිණුම් ප්‍රමිත අනුව කටයුතු කර නොමැත. |
| 4. | 1999 අංක 08 දරණ දුම්කොළ බදු පනතේ 17 (ආ) I හා II ඡේද අනුව ලැබෙන සිගරට් දඩ මුදලින් සියයට 25 ක කොටසකින් දුම්කොළ තැගි අරමුදලක් පිහිටුවීමට කටයුතු සිදු කළ යුතු වුවත් 1999 වර්ෂයේ සිට 2023 වර්ෂයේ අවසානය දක්වාම එවැනි අරමුදලක් පිහිටුවීමට කටයුතු කර නොතිබුණි. මේ | 2023 | දුම්කොළ තැගි අරමුදල පිහිටුවීමට කටයුතු කල යුතුය. | 1999 අංක 08 දරණ දුම්කොළ බදු පනතට අදාලව නියෝගවලට අවශ්‍ය නව සංශෝධන ඇතුළත් කිරීම සඳහා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර, දුම්කොළ තැගි අරමුදල පිහිටු වීමට කටයුතු කරන බව | දුම්කොළ තැගි අරමුදලක් පිහිටුවා නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | දක්වාම වාර්ෂිකව වෙන්කල මුදල් ආයෝජනයකින් තොරව දුම්කොළ තැගි අරමුදලට ගෙවිය යුතු රු.24,363,751 ක දිගුකාලීන බැරකමක් ලෙස පැවතුණි. | | | | |
| 5. | 2019 දෙසැම්බර් 27 දිනැති සුරාබදු චක්‍රලේඛ අංක 10/2019 හි 02 ඡේදය පරිදි, දැනට පවතින 1994 මාර්තු 4 දිනැති සුරාබදු නිවේදන අංක 818 සංශෝධනය කිරීමට යටත්ව, 2019 මාර්තු මස සිට දෙපාර්තමේන්තුවේ සේවය කරන සියළුම නිළධාරීන්ට දිරිදීමනා ගෙවීමේ දී තැගි අරමුදලින් දායක වී තිබුණි. ඒ අනුව 2022 වර්ෂය තුල දී රු. 54,243,053 ක් සහ පෙර වර්ෂ වල දිරි දීමනා සඳහා හිමිකම් නොපෑ නිළධාරීන්ට අවස්ථා 17 ක දී ගෙවන ලද රු.1,133,785 ක මුදලක් ඇතුළුව රු.55,376,838 ක් සුරාබදු අරමුදලින් දිරිදීමනා ගෙවීම් සඳහා වැයකර තිබුණි. දෙපාර්තමේන්තුවේ සියළු කාර්ය මණ්ඩලය වෙත දිරි දීමනා ගෙවීම සඳහා අවශ්‍ය නෛතික | 2022 | 1994 මාර්තු 04 දිනැති 818 සුරාබදු නිවේදනය සංශෝධනය කඩිනමින් නිමකර ගත යුතුය. | 1994 මාර්තු 04 දිනැති 818 සුරාබදු නිවේදනය දෙපාර්තමේන්තුවේ කාර්යභාරය පුළුල් වීම සැළකිල්ලට ගෙන, වර්තමානයට ගැළපෙන අයුරින් 818 සුරාබදු නිවේදනය සංශෝධනය කර අනුමැතිය සඳහා 2021.03.03 දින මුදල් අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බව. | අංක 818 දරන සුරාබදු නිවේදනය සංශෝධනය මෙතෙක් සිදුකර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ප්‍රතිපාදන සැලසෙන පරිදි අදාළ සුරාබදු නිවේදනයේ සංශෝධන කටයුතු 2022 වර්ෂය අවසාන වනවිට වසර 27 ක් ගතවී තිබුණ ද අවසන් වී නොතිබුණි. | | | | |
| 6. | සුරාබදු දෙපාර්තමේන්තුවේ 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව කාර්මික අපරාධ ග්‍රහනයන් 4,000 ක් සිදු කිරීමට සැලසුම් කර ග්‍රහන 5,499 ක් සිදුකර තිබුණි.ඉන් සුරාබදු ස්ථාන 10 ක ඉලක්ක සැපිරීමේ ප්‍රගතිය අඩු අගයක වූ අතර සුරාබදු ස්ථාන 10 ක වාර්ෂික ඉලක්ක ඉක්මවා තිබුණ ද ලබා දී තිබුණු ග්‍රහන ඉලක්ක පහල අගයක විය. තවද 2023 වර්ෂයේ තැගි මුදල් ගෙවීම් සඳහා පදනම් වූ කාර්මික අපරාධ ග්‍රහණ ග්‍රහන 1,559 හි දඩ මුදල් විශ්ලේෂණය අනුව සියයට 65 ක ප්‍රතිශතයක් සාමාන්‍ය ගණයේ කොන්දේසි කඩකිරීම් වලට අදාළ වැටලීම් විය. | 2023 | වැටලීම් වල ගුණාත්මක ප්‍රගතියක් ලගා කර ගැනීම කෙරෙහි අවධානය යොමුකල යුතුය. | පවතින නිළධාරීන්ගේ හිගය පරීක්ෂණ කටයුතු සම්බන්ධයෙන් ඇති වූ සීමාකාරී, තත්ත්වය ග්‍රහන ඉලක්ක සංශෝධනය කිරීමට සිදුකරන ලද නියෝජනයන් අනුව ඉලක්ක කල ප්‍රමාණයට වඩා ග්‍රහන අඩු වී ඇත. සාමාන්‍ය කොන්දේසි කඩ කිරීම් බහුලව සිදුවන අතර ප්‍රධාන ගණයේ කොන්දේසි කඩකිරීම් සිදුවන්නේ අල්ප වශයෙන් වේ. | 2024 සඳහා ද සැලසුම්කර ඇත්තේ 2023 වර්ෂයේ ඇස්තමේන්තු කල ග්‍රහන 4,000 ක ප්‍රමාණයම වේ.ඉන් මේ වනවිට ග්‍රහන 2,385 ක් හෙවත් සියයට 59 ක් සිදුකර ඇත. ප්‍රධාන ගණයේ වැරදි ආවරණය සඳහා ග්‍රහන සැලසුම් කර නොමැත. |

## 3.31 ලංකා විදුලිබල මණ්ඩලයේ අර්ථසාධක අරමුදල

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | බදු පෙර ලාභය (අලාභය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 73,985,427,313 | 877,169,992 | 73,108,257,320 | 4,672,608,058 | තත්ත්වාගණනය නොකළ |
| **2022** | 87,243,763,180 | 802,391,604 | 86,441,371,576 | 9,742,206,300 | තත්ත්වාගණනය කළ |
| **2023** | 96,408,654,994 | 1,656,884,047 | 94,751,770,947 | 13,294,852,358 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ගය | වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය |
|---|---|---|---|---|---|
| 1. | ඉවත් කළ සහ සේවය හැර ගිය සාමාජිකයින්ගේ සාමාජික ශේෂයන් නොපියවීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට සාමාජික ශේෂයන්ට එරෙහිව ලබා දුන් ණය වලින් අක්‍රීය සාමාජිකයන් 128 දෙනෙකුගෙන් රු. මිලියන 19.06 ක් වසර 3 කට වැඩි කාලයක් තිස්සේ අයවිය යුතුව පැවතුණි. එම මුදලින් අක්‍රීය සාමාජිකයන් 34 දෙනෙකුගෙන් රු. මිලියන 9.5 ක් සහ අක්‍රීය සාමාජිකයන් 86 දෙනෙකුගෙන් රු. මිලියන 2.4 ක් පිළිවෙලින් වසර 7 කට සහ වසර 31 කට වැඩි කාලයක් තිස්සේ අයවිය යුතුව පැවතුණි. | 2022-1.6.1<br>2023-1.6.1 | අක්‍රීය සාමාජිකයින්ගේ දිගුකාලීන හිඟ ණය ශේෂ නිරවුල් කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. | අක්‍රීය සාමාජිකයින් සඳහා ලබා දුන් ණය ද අපගේ ගිණුම් පොත්වල සටහන් කර ඇති අතර අක්‍රීය සාමාජිකයින්ගේ අවසන් පියවීම් නිරවුල් කිරීමේදී එය නිරවුල් කරනු ඇත. | නිර්දේශ මෙතෙක් ක්‍රියාත්මක කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2. | අදාළ සාමාජිකයින්ගේ සාමාජික ශේෂයන් නිදහස් කිරීම සඳහා අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් නොකිරීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට ඉවත් කළ සාමාජිකයින් 588 දෙනෙකුට අයත් රු. මිලියන 107 ක් වසර 3 කට වැඩි කාලයක් තිස්සේ ගෙවිය යුතුව පැවතුණි. එයින් ඉවත් කළ සාමාජිකයින් 307 දෙනෙකුට රු. මිලියන 56.8 ක් සහ ඉවත් කළ සාමාජිකයින් 124 දෙනෙකුට රු. මිලියන 1.9 ක් පිළිවෙලින් වසර 7 කට සහ වසර 31 කට වැඩි කාලයක් තිස්සේ ගෙවිය යුතුව පැවතුණි. | 2021- 1.6 (ඉ)<br><br>2022- 1.6.2 (අ)<br><br>2023 1.6.2 (අ) | දිගුකාලීන හිඟ සාමාජික ශේෂ නිරවුල් කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. | අදාළ සාමාජිකයින්ගේ සාමාජික ශේෂයන් නිදහස් කිරීම සඳහා අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් නොකිරීම හේතුවෙන් මෙම ශේෂයන් අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල පවතී. එබැවින්, අරමුදලේ වගකීම තවමත් පවතින බැවින් මෙම ශේෂයන් කපා හැරිය නොහැක. | නිර්දේශ මෙතෙක් ක්‍රියාත්මක කර නොමැත. |
| 3. | 2023 දෙසැම්බර් අවසානයේදී සේවය හැර ගිය සාමාජිකයින් 305 දෙනෙකුට මුළු මුදල රු. මිලියන 5.1 ක් වසර 6 කට වැඩි කාලයක් තිස්සේ ගෙවිය යුතුව පැවතුණි. | 2023- 1.6.2 (ආ) | දිගුකාලීන හිඟ සාමාජික ශේෂ නිරවුල් කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. | අවසන් පියවීම් නිරවුල් කිරීමේදී එය නිරවුල් කරනු ඇත. | නිර්දේශ මෙතෙක් ක්‍රියාත්මක කර නොමැත. |
| 4. | අර්ථසාධක අරමුදල් රෙගුලාසිහි රීති අංක 04 ප්‍රකාරව සෑම සාමාජිකයෙකුම සහ සේවා යෝජක විසින් සේවකයාගේ වැටුපෙන් හෝ වේතනයෙන් පිළිවෙලින් සියයට 10 | 2021 – 1.7 (අ) (i)<br><br>2022 – 1.7 (අ) (i)<br><br>2023 – 1.7 (අ) (i) | අර්ථසාධක අරමුදල් රෙගුලාසිවලට අනුකූල විය යුතුය. | අර්ථසාධක අරමුදලට දායකත්වය ගණනය කිරීමේදී, 2007 ඔක්තෝබර් 23 දිනැති පුද්ගල චක්‍රලේඛ අංක: ඩීජීඑම්(පී)/පොලිසි/ජී එස්(1)/181 ට අනුකූලව, ඒකාබද්ධ | නිර්දේශ මෙතෙක් ක්‍රියාත්මක කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ක් සහ සියයට 15 ක් අරමුදලට දායක විය යුතුය. මූලික වැටුප් නිර්වචනයට පටහැනිව, අරමුදලට දායකත්වය ගණනය කිරීමේදී ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයන්ගේ ඉහළම දීමනාව ඇතුලත් වැටුප සලකා බලා තිබුණි. | | | වැටුපට අමතරව ඉහළම දීමනාවක් සලකා බලා ඇත. | |
| 5. | අර්ථසාධක අරමුදල් රෙගුලාසිහි රීති අංක 22 පටහැනිව පෙර වර්ෂය අවසන් වන දිනට පැවති සාමාජිකයින්ගේ බැර ශේෂයන් මත පදනම්ව ලාභාංශ ගෙවීම වෙනුවට 2023 දෙසැම්බර් 31 දිනට පැවති සාමාජිකයින්ගේ බැර ශේෂයන් මත පදනම්ව ලාභාංශ ගෙවා තිබුණි. තවද, මෙම විධිවිධානයට පටහැනිව, 2022 දෙසැම්බර් 31 වන දිනට එම සාමාජිකයින්ගේ බැර ශේෂය මත පදනම්ව 2022 දෙසැම්බර් 31 දින විශ්‍රාම ගිය සාමාජිකයින් 285 දෙනෙකුට 2022 වර්ෂය සඳහා ලාභාංශ ගෙවා ඇති බව නිරීක්ෂණය විය.තවද, මෙම ප්‍රතිපාදනයට පටහැනිව, 2023 | 2022-1.7 (අ) (ii)<br>2022-1.7 (අ) (ii)<br>2023- 1.7 (අ) (ii) | අර්ථසාධක අරමුදල් රෙගුලාසිවලට අනුකූල විය යුතුය. | සාමාජිකයා විශ්‍රාම ගොස් ඇති පසුගිය වසරේ දායකත්වය සඳහා ලාභාංශ රැස් නොකෙරේ. එබැවින් රීති අංක 22 මගින් ලබා දී ඇති උපදෙස් වලට අනුකූල වේ. තවද, සංචිත හා ප්‍රතිපාදන නිර්මාණය කිරීමෙන් පසුව සහ අරමුදලට අය කළ හැකි වියදම් අඩු කිරීමෙන් පසුව ලාභාංශ ගණනය කිරීම නිසි ලෙස සිදු කරයි. | නිර්දේශ මෙතෙක් ක්‍රියාත්මක කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ජනවාරි 01 දිනට රඳවාගත් ඉපැයීම්වල සහ 2023 වර්ෂය සඳහා පරීක්ෂා කිරීමේ පිරිවැය සහ බදු පමණක් අඩු කිරීමෙන් පසු ශුද්ධ ලාභයේ එකතුව වූ රු. බිලියන 13.29 ක් සාමාජිකයින් අතර සම්පූර්ණයෙන්ම බෙදා හැර තිබුණි. | | | | |
| 6. | අර්ථසාධක අරමුදල් රෙගුලාසිහි රීති අංක 31 ප්‍රකාරව කම්කරු කොමසාරිස්වරයාගේ සහ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගේ අනුමැතියට යටත්ව අධ්‍යක්ෂක මණ්ඩලයේ තීරණයක් මගින් මින්මතු ඕනෑම අවස්ථාවක දී කලින් කලට හෝ ලංකා විදුලිබල මණ්ඩලය විසින් මෙම රීති හෝ ඒවායින් යමක් විවර්තනය කිරීම, වෙනස් කිරීම, විකරණය කිරීම, නැවත සෑදීම හෝ පරිච්ජින්න කිරීම නීත්‍යානුකූල විය යුතුය. අධ්‍යක්ෂක මණ්ඩලයේ, කම්කරු කොමසාරිස්වරයාගේ සහ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගේ අනුමැතිය නොමැතිව සහ 2003 අර්ථසාධක අරමුදල් රෙගුලාසිවල | 2022-1.7 (අ) (iii)<br>2023- 1.7 (අ) (iii) | අර්ථසාධක අරමුදල් රෙගුලාසිවලට අනුකූල විය යුතුය. | 2024 පෙබරවාරි 14 වැනි දින පැවති අර්ථසාධක අරමුදල් කළමනාකරණ කමිටු රැස්වීමේදී අරමුදලේ පවතින රීති සහ රෙගුලාසිවලට අවශ්‍ය වෙනස්කම් සමාලෝචනය කර නිර්දේශ කිරීම සඳහා විශේෂ කමිටුවක් පත් කර ඇත. කමිටු වාර්තාව ඉදිරිපත් කළ පසු අරමුදලේ පවතින රීති සහ රෙගුලාසි සංශෝධනය කරනු ඇත. | කමිටු වාර්තාව මෙතෙක් ඉදිරිපත් කොට නැත.රෙගුලාසි සංශෝධනය කිරීමේ ක්‍රියාවලිය වාර්තාව ලද විගස ආරම්භ කරනු ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | සංශෝධන ගැසට් නිවේදනයක් හරහා ප්‍රකාශයට පත් නොකර, කළමනාකරණ කමිටුවේ බලතල හා රාජකාරි, ආයෝජන බලතල, සාමාජිකයින්ට ණය ලබා දීම යනාදියට අදාළ රීති අරමුදල විසින් සංශෝධනය කර ඒ අනුව කටයුතු කර තිබුණි. | | | | |
| 7. | 2008 සහ 2009 වර්ෂවල එන්ට්‍රස්ට් සිකියුරිටීස් පීඑල්සී හරහා භාණ්ඩාගාර බැඳුම්කර තුනක රු. බිලියන 2.3 ක් ආයෝජනය කර තිබූ අතර මධ්‍යම තැන්පතු පද්ධතියේ අරමුදලේ නමින් මෙම ආයෝජනයට අදාළ සුරැකුම්පත් නොමැති බව 2015 වර්ෂයේදී අනාවරණය විය. කෙසේ වෙතත්, ඒ වන විට අරමුදලේ සේවය කළ වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව ඔවුන්ගේ නොසැලකිල්ල සඳහා සුදුසු ක්‍රියාමාර්ගයක් කාලීනව ගෙන නොතිබූ අතර ඔවුන්ට ලංකා විදුලිබල මණ්ඩලයේ සේවයෙන් විශ්‍රාම යාමට ඉඩ ලබා දී තිබුණි. තවද, 2015 | 2021-3.1 (අ)<br>2022-3.1 (අ)<br>2023- 3.1 | **(i)** අනාගතයේ දී එවැනි සිදුවීම් වළක්වා ගැනීම සඳහා නිසි අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයක් ඇති බවට සහතික විය යුතුය.<br><br>**(ii)** සිදු වූ පාඩුව අයකර ගැනීමට සියලු සාධාරණ ක්‍රියාමාර්ග ගෙන ඇති බවට සහතික විය යුතුය.<br><br>**(iii)** වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව ඔවුන්ගේ නොසැලකිල්ල සඳහා පියවර ගත යුතුය. | මෙම ආයෝජනයේ මුහුණත වටිනාකම සහ පැහැර හරින ලද කූපන් පොලී අයකර ගැනීමට ලංකා විදුලිබල මණ්ඩලයේ අර්ථසාධක අරමුදල විසින් එන්ට්‍රස්ට් සිකියුරිටීස් පීඑල්සීට එරෙහිව කොළඹ දිසා අධිකරණයේ සිවිල් නඩුවක් ආරම්භ කර ඇත. ලංකා විදුලිබල මණ්ඩලයේ නීති අංශය විසින් ලංකා විදුලිබල මණ්ඩලයේ අර්ථසාධක අරමුදල සහ විශ්‍රාම වැටුප් අරමුදල සමාගමේ ඇවර කිරීමේ ක්‍රියාවලියට පාර්ශවකරුවෙකු කරමින් නඩු අංක ඩීඑම්ආර්/1405/2018 සහ ඩීඑම්ආර්/1029/2018 යන සිවිල් නඩු | නඩු කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී. මීලග නඩු දිනය 2024 නොවැම්බර් 4 දිනට යෙදී ඇත. |

දෙසැම්බර් 09 වැනි දින එන්ට්‍රස්ට් සිකියුරිටීස් පීඑල්සීට එරෙහිව ලංකා විදුලිබල මණ්ඩලය විසින් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශයට පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබූ අතර මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශය විසින් එන්ට්‍රස්ට් සිකියුරිටීස් පීඑල්සීට එරෙහිව නඩුවක් පවරා තිබුණි. තවද, මුහුණත වටිනාකම සහ පැහැර හරින ලද කූපන් පොලී අයකර ගැනීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය විසින් එන්ට්‍රස්ට් සිකියුරිටීස් පීඑල්සීට එරෙහිව 2018 වර්ෂයේදී සිවිල් නඩුවක් ගොනු කර තිබුණි. 2018 සහ 2019 වසරවල පරිණත වූ ආයෝජනවල මුහුණත වටිනාකම සහ පැහැර හරින ලද කූපන් පොලී වටිනාකම රු. බිලියන 2.8 ක් වූ අතර නඩු දෙකම විභාග වෙමින් පවතී.

දෙක ඉදිරියට කරගෙන යාමට කොළඹ දිසා අධිකරණයට අයදුම්පතක් ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලියක නිරතව සිටී.

## 3.32 ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අරමුදල

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | බදු පෙර ලාභය (අලාභය) රු. | මතය |
|---|---|---|---|---|---|
| 2021 | 929,895,906 | 929,895,906 | - | - | තත්ත්වාගණනය කළ |
| 2022 | 1,719,489,764 | 1,719,489,764 | - | - | තත්ත්වාගණනය කළ |
| 2023 | 3,299,624,133 | 3,299,624,133 | - | - | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ගය | වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය |
|---|---|---|---|---|---|
| 1. | 2018 අංක 35 දරන මුදල් පනතේ I කොටසෙහි (3) වගන්තියට අනුව 2005 අංක 38 දරන සංචාරක පනත යටතේ බලපත්‍ර ලබාගෙන තිබූ සියයට 0.5 ක බද්දක් අයකරනු ලැබූ ආයතනවලින් ලද බද්ද අය කළ දින සිට දින 30 ක් ඇතුළත ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කළ යුතුය. කෙසේ වෙතත්, 2023 ජනවාරි සහ පෙබරවාරි මාසවල එකතු කරන ලද බද්ද රු.2,743,629 ක් දින 119 සිට දින 150 දක්වා කාල පරාසයක ප්‍රමාදයකින් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර තිබුණි. එසේම, 2023 මාර්තු | 2021<br>2022<br>2023 | සංචාරක සංවර්ධන බද්දේ භාණ්ඩාගාරයට අදාළ කොටස නියමිත වේලාවට ප්‍රේෂණය කිරීමට ක්‍රියා කළ යුතුය. | මහා භාණ්ඩාගාරය වෙත සිදු කරන ප්‍රේෂණ ක්‍රියාවලිය කඩිනම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇත. | 2023 මාර්තු මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා වූ රු.15,774,967 ක බද්ද 2024 ජූලි 12 දින භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර තිබුණි. 2024 ජනවාරි සිට මේ දක්වා එකතු වූ බදු මුදල් රු.6,508,751 ක් ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කිරීමට මේ දක්වා පියවර ගෙන නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා වූ රු.15,774,967 ක බද්ද 2024 මාර්තු 19 වන විටත් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර නොතිබුණි. | | | | |
| 2. | ලියාපදිංචි හෝටල් හිමියන් සහ සංචාරක ව්‍යාපාර හිමිකරුවන් විසින් 2017 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා රු.876,828,957 ක මුදලක් බැංකුවට සෘජුවම ප්‍රේෂණය කර තිබුණද, එය නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීම වෙනුවට ජංගම වගකීම් යටතේ අඛණ්ඩව ඉදිරියට ගෙනවිත් තිබුණි. | 2021 2022 2023 | ගෙවන්නන් හඳුනාගෙන ඉකමනින් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. | ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියෙහි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයේ සහාය ඇතිව, මෙම කාරණය සඳහා ස්ථිර විසඳුමක් සෙවීම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් ලංකා බැංකුවේ කළමනාකාරීත්වය සමඟ රැස්වීම් කිහිපයක් පවත්වා තිබුණි. | මේ දක්වා ගැටලුව විසඳීමට පියවර ගෙන නොතිබුණි. |

## 3.33 දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 3,080,270 | 894,000 | 2,186,270 | 275,050 | තත්ත්වාගණනය කළ |
| **2022** | 4,190,516 | 1,045,675 | 3,144,841 | 958,572 | තත්ත්වාගණනය කළ |
| **2023** | 5,373,550 | 1,297,245 | 4,076,305 | 931,464 | තත්ත්වාගණනය නොකළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| 1. | 1992 අංක 09 දරන දෘශ්‍යාබාධිතයන් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදල පනත මඟින් දෘශ්‍යාබාධිතයන් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදල පිහිටුවා අවුරුදු 31 ක් ගත වුවත් සමස්ථ දිවයිනම ආවරණය වන පරිදි දෘශ්‍යාබාධිතයන් සංඛ්‍යාව හඳුනාගැනීමට තොරතුරු පද්ධතියක් සකස්කර නොතිබුණි. | 2021<br>2022<br>2023 | දෘශ්‍යාබාධිතයන් හඳුනාගැනීමට තොරතුරු පද්ධතියක් කඩිනමින් සකස් කරීමට කටයුතු කල යුතුය. | සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් දෘශ්‍යාබාධිත පුද්ගලයින් ඇතුළු ආබාධ සහිත පුද්ගලයින් පිළිබඳ දත්ත පද්ධතියක් සකස් කිරීමේ කටයුතු මේ වන විට ක්‍රියාත්මක කර ඇති බැවින් දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල සඳහා එම තොරතුරු භාවිතා කිරීමට අපේක්ෂිත බව. | මේ දක්වා දෙපාර්තමේන්තුව විසින් දත්ත පද්ධතියක් සකස් කර නොමැත. |
| 2. | අරමුදල සඳහා රජයේ ප්‍රතිපාදන වලට අමතරව , දේශීයව හෝ විදේශ වලින් ලැබෙන ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග, උපලබ්ධි හෝ එකතු | 2022<br>2023 | පනතේ විධිවිධාන ප්‍රකාරව අරමුදල් සම්පාදනය කර ගැනීමට කටයුතු කල යුතුය. | අරමුදල සඳහා ආදායම් උත්පාදන කටයුතු වෙනුවෙන් සීදුව වෘත්තීය පුහුණු ආයතනය තුළ පවත්වාගෙන ගිය දෘශ්‍යාබාධිත කාන්තා | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු අරඹා ඇතත් අරමුදල් සම්පාදනය කර ගැනීමේ අවස්ථාවන්ට යොමු වී නොමැත. |

කරන මුදල් සහ අරමුදලේ ආයෝජනවලින් ලැබෙන ආදායම හෝ අරමුදලට අයවිය යුතු හෝ වෙනත් මුදල් මඟින් අරමුදල් සම්පාදනය කර ගැනීමට 1992 අංක 09 දරණ දෘශ්‍යාබාධිතයින් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදල් පනතේ 7 වගන්තිය පරිදි නෛතික ප්‍රතිපාදන සලසා තිබුණු නමුත් අරමුදල ආරම්භයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වර්ෂ 29 ක කාලපරිච්ඡේදය තුල අරමුදල වර්ධනය කරගැනීම වෙනුවෙන් රජයේ ප්‍රදාන වලට අමතරව අනෙකුත් අරමුදල් ප්‍රභවයන් කෙරෙහි අවධානය යොමුකර හෝ ඒ සඳහා ඉදිරි සැලැස්මක් හෝ අරමුදල සතුව නොතිබුණි.

සුහසාධන මධ්‍යස්ථානයේ අත්‍යන්ත්‍ර පේෂකර්ම අංශය අලාභ ලබන තත්වයක් තුළ වසා දැමීමට කටයුතු කරන ලදි. 2023 වර්ෂයේ මුදල් රැස්කිරීමේ අරමුණින් කැට ස්ථාපනය කිරීමේ වැඩ සටහනක්ද මේ වන විට ක්‍රියාත්මක කරමින් පවතී.

## 3.34 සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩල අරමුදල

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 56,647,222 | - | 56,647,222.00 | (1,192,333.00) | තත්ත්වාගණනය කළ |
| **2022** | 60,328,001 | - | 60,328,001.00 | 3,907,854.00 | තත්ත්වාගණනය කළ |
| **2023** | 68,174,163 | - | 68,174,163.00 | 8,346,577.00 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| 1. | 2014 අංක 16 දරන සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනතේ, 07 (1)(අ)උපවගන්තිය ප්‍රකාරව සාමාජිකයින් විසින් ගෙවිය යුතු ගාස්තු සම්බන්ධයෙන් අදාළ වන රීති සකස් කර ගෙන සාමාජික ගාස්තු හා දායක මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබීමෙන් අරමුදල සඳහා නිශ්චිත ආදායම් මාර්ගයක් නොතිබුණි. | 2023 | රීති සකස් කර සාමාජික ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | සාමාජික ගාස්තු අයකිරීම සම්බන්ධයෙන් විධායක සභාව දැනුවත් කර තීරණයකට එළඹීමට නියමිතයි. | වර්තමානය වන විට සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩල සමාජිකයින්ගේ සමාජික මුදල් අයකිරීමක් සිදු නොකරයි. |
| 2. | 2014 අංක 16 දරන සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනතේ, 6 වගන්තියේ (ඊ) උප වගන්තිය ප්‍රකාරව අවශ්‍ය වන නිලධාරීන් | 2021<br>2022<br>2023 | අරමුදලේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන ප්‍රමාණවත් නිලධාරීන් හා සේවකයින් පත්කිරීමට හා සේවයේ යෙදවීමට | මේ සම්බන්ධව නව විධායක මණ්ඩලය නැවත වතාවක් දැනුවත් කිරීමට නියමිතයි. | වර්තමානය වන විට ද විගණකාධිපති නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | හා සේවකයින් පත්කිරීම මෙන්ම සේවයේ යෙදවීම සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු කර නොතිබීම, අරමුදලේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීමට අයහපත් බලපෑමක් ඇති කර තිබුණු බව නිරීක්ෂණය විය. | | කටයුතු කළ යුතුය. | | |
| 3. | අරමුදල සතු ස්ථාවර තැන්පතු වටිනාකම රු.57,183,750ක් ද, ඊට අදාළව 2023 වර්ෂයේ පොලිය රු.10.265,513 ක් ද වූ නමුත් 2014 අංක 16 දරන සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩල (සංස්ථාගත කිරීමේ) පනතේ 03 ඡේදය ප්‍රකාරව අරමුදලට අදාළ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා 2023 වර්ෂයේ වැය කළ මුදල රු.2,600,179 ක් පමණක් විය. අරමුදල් කාර්යක්ෂමව යොදාගනිමින් අරමුදලේ පරමාර්ථ ඉටු කර ගැනීම කෙරෙහි අවධානය යොමු නොකර ආයෝජනය කරමින් පැවතීම මීට හේතුව බව නිරීක්ෂණය විය. | 2021 2023 | අරමුදල් කාර්යක්ෂමව යොදාගනිමින් අරමුදලේ පරමාර්ථ ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. | ඉදිරියේදි විධායක සභාවේදි හා මහා සභාවේදි මේ සම්බන්ධව සාකච්ඡා කර අරමුදලේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා අරමුදල කාර්යක්ෂව යෙදවීමට සුදුසු වැඩ පිළිවෙලක් සැකසීමට කටයුතු කරන බවත් දැනට ද අරමුදලෙහි අරමුණු වලට අනුකූලව ලැබෙන ඉල්ලීම් පදනම් කරගෙන වෛද්‍ය ආධාර, බුදුපුත් නිවාස අධාර ලබා දීම ආදී කටයුතු සිදු කරනු ලැබේ. | වර්තමානය වන විට ද විගණකාධිපති නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| 4. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ, 38(ඊ) සහ 40 වගන්ති ප්‍රකාරව විගණනය කරනු ලබන අස්ථිත්වයක ගණන් දීමේ නිලධරයා විසින් අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් ඇති බවට සහතික විය යුතු වුවත්, බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය විසින් හෝ අරමුදලේ කටයුතු පිළිබඳව විගණනයක් සිදු කිරීමට කටයුතු කර නොතිබුණි. | 2021 2022 2023 | ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | නව විධායක මණ්ඩලය දැනුවත් කරන ලද අතර බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අභ්‍යන්තර විගණක මගින් විගණනයක් සිදු කර ගැනීමට බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් සමග සාකච්ඡා කරමින් පවතී. | වර්තමානය වන විට ද විගණකාධිපති නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |
| 5. | 41(1) වගන්තිය අනුව, විගණන හා කලමනාකරණ කමිටු පත්කර ඒ අනුව අරමුදලේ ක්‍රියාකාරිත්වයන් අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කිරීමට කටයුතු කර නොතිබුණි. | 2022 | පනතේ විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය. | දෙපාර්තමේන්තුවේ විගණන කළමනාකරණ කමිටු රැස්වීම්වලදී අරමුදල සම්බන්ධව ද සාකච්ඡා කිරීමට ඉදිරියේදී කටයුතු කිරීමට බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් සමඟ සාකච්ඡා කරමින් පවතී. | වර්තමානය වන විට ද විගණකාධිපති නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |

### 3.35 ලංකා විදුලිබල මණ්ඩලයේ විශ්‍රාම වැටුප් අරමුදල

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 39,437,870,064 | 190,354,712 | 39,247,515,352 | 1,078,519,057 | තත්ත්වාගණනය නොකළ |
| **2022** | 54,122,758,334 | 154,377,538 | 53,968,380,796 | 2,863,238,444 | තත්ත්වාගණනය නොකළ |
| **2023** | 60,067,701,342 | 302,106,954 | 59,765,594,388 | 3,793,785,591 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| 1. | 2003 දෙසැම්බර් 31 දිනැති අංක 1321/18 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශිත විශ්‍රාම අරමුදල් රෙගුලාසි රීති අංක 18 ට පටහැනිව විශ්‍රාම වැටුප් ගෙවීම් වැඩි කිරීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩලය තීරණය කර තිබුණි. තවද, 2013 ඔක්තෝබර් 23 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මත 2018 වසරේ සිට 2023 දක්වා රු. මිලියන 866.22 ක මුදලක් වෛද්‍ය ගෙවීම් ලෙස ගෙවා තිබුණි. | 2021-1.5<br>2022-1.5<br>2023-1.5 | විශ්‍රාම අරමුදල් රෙගුලාසිවලට අනුකූල විය යුතුය. | 2022-06-16, 2022-02-03 සහ 2021-09-30 දිනැති අංක සීඊබී/ඒසීසීටී(පීඊඑන්) සීසී යන ලිපි මගින් ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කිරීම සඳහා ඉල්ලා සිටින ලියකියවිලි විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය වෙත වරින් වර ලබා දී ඇත. | විශ්‍රාම වැටුප් අරමුදලේ සංශෝධිත රෙගුලාසි ගැසට් නිවේදනයක් මගින් මෙතෙක් ප්‍රකාශයට පත් කොට නොතිබුණි. |
| 2. | 2014 වර්ෂයේදී එන්ට්‍රස්ට් සිකියුරිටීස් පීඑල්සී හරහා රු. මිලියන 400.4 ක මුදලක් භාණ්ඩාගාර බැඳුම්කරවල | 2022- 3.1<br>2023 -3.1 | අනාගතයේදී එවැනි සිදුවීම් වළක්වා ගැනීම සඳහා නිසි අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයක් ඇති | ලංකා විදුලිබල මණ්ඩලය විසින් 2015 වර්ෂයේදී මෙම කරුණ අනාවරණය කර ගෙන තිබූ අතර, 2015-12-09 දිනට | අර්ථසාධක අරමුදල සහ විශ්‍රාම වැටුප් අරමුදල යන දෙකෙහිම ගණකාධිකාරීවරුන් දෙදෙනෙකු |

| | | | |
|---|---|---|---|
| ආයෝජනය කර තිබූ අතර කළමනාකරණ කමිටුවේ අනුමැතියකින් තොරව සමාගම එම ආයෝජනය ඉවත් කරගෙන ඇති බව නිරීක්ෂණය විය. තවද, 2015 වසරේ ලංකා විදුලිබල මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය විසින් කරන ලද විමර්ශනයක දී ශ්‍රී ලංකා බැංකුව වෙතින් ලද තහවුරු කිරීම් (ලංකා සෙකියො පද්ධතිය) අනුව විශ්‍රාම අරමුදල නමින් භාණ්ඩාගාර බැඳුම්කර නොතිබූ බව අනාවරණය විය. කෙසේ වෙතත්, 2018 දී කල් පිරෙන දින දක්වා වූ උපචිත කූපන් පොලිය සමඟ ආයෝජිත මුදල අයකර ගැනීමට ලංකා විදුලිබල මණ්ඩලය විසින් එන්ට්‍රස්ට් සිකියුරිටීස් පීඑල්සී සමාගමට එරෙහිව වසර 2 කට වැඩි ප්‍රමාදයකින් පසුව සිවිල් නඩුවක් ගොනු කර තිබුණි. තවද, ඒ වන විට අරමුදලේ සේවය කළ වගකිවයුතු නිලධාරීන් හඳුනා ගැනීමට නිසි ක්‍රියාමාර්ගයක් නිසි වේලාවට ගෙන නොතිබූ අතර ඔවුන්ට ලංකා විදුලිබල | බවට හා සිදු වූ පාඩුව අයකර ගැනීමට සියලු සාධාරණ ක්‍රියාමාර්ග ගෙන ඇති බවට සහතික විය යුතු වීමත් වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව ඔවුන්ගේ නොසැලකිල්ල සඳහා පියවර ගත යුතු වීම. | පරිණත වීමට තිබූ ආයෝජිත මුදල අයකර ගැනීම සඳහා වහාම මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශය වෙත පැමිණිලි කර ඇත. ඉන් අනතුරුව, එන්ට්‍රස්ට් සිකියුරිටීස් පීඑල්සී සමාගමට එරෙහිව මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශය විසින් අංක බී290/2016 දරන නඩුව මහේස්ත්‍රාත් අධිකරණයේ ගොනු කර තිබුණි. තවද, ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයාගේ වාර්තාව මත පදනම්ව, ලංකා විදුලිබල මණ්ඩලයේ සභාපතිවරයා විසින් විෂය ක්ෂේත්‍රයක් යටතේ මේ සම්බන්ධයෙන් අධ්‍යයනය කර වාර්තා කිරීම සඳහා කමිටුවක් පත් කර තිබුණි. කිසිදු සාක්ෂියක් නොමැතිවීම හේතුවෙන් ලංකා විදුලිබල මණ්ඩලයේ නිලධාරීන් අක්‍රමිකතා, වංචා හෝ දූෂණ චෝදනාවලට ලක්ව නොමැති බව හඳුනා ගනිමින් කමිටුව විසින් වාර්තාව අවසන් කර තිබුණි. | වෙනුවට අරමුදල් දෙකම නියෝජ්‍ය මූල්‍ය කළමනාකරුවෙකු ගේ අධීක්ෂණය යටතේ ගෙන ඒමට මණ්ඩලය පියවර ගෙන ඇත. ඊට අමතරව 2016 නොවැම්බර් 07 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ලංවිම භාණ්ඩාගාර ඒකකය පිහිටුවීමේ ක්‍රියාවලිය කඩිනම් කරන ලෙසත් විශ්‍රාම වැටුප් අරමුදල, අර්ථසාධක අරමුදල සහ භාණ්ඩාගාර ඒකකයේ ප්‍රධානියා ලෙස එක් අතිරේක මූල්‍ය කළමනාකරු තනතුරක් ඇති කරන ලෙසත් මණ්ඩලය කළමනාකාරීත්වයට උපදෙස් දී ඇත. එන්ට්‍රස්ට් සිකියුරිටීස් පීඑල්සී සමාගමට එරෙහිව සිය හිමිකම් පෑම සඳහා වාණිජ මහාධිකරණයට (අංක. CHC/ 83/2021/CO දරන නඩුව) අයදුම්පත ඉදිරිපත් කරන බවත් අධිකරණය මගින් පත් කිරීමට නියමිත ඇවරකරුට එරෙහිව දිස්ත්‍රික් උසාවියේ නඩුවක් ඉදිරියට ගෙන යාමට අවසර ඉල්ලා |

| | | |
|---|---|---|
| මණ්ඩලයේ සේවයෙන් විශ්‍රාම යාමට ඉඩ ලබා දී තිබුණි. | අංක ඩීඑම්ආර් 1029/2018 දරන නඩුව ගොනුකරමින් ලංකා විදුලිබල මණ්ඩලය විසින් එන්ට්‍රස්ට් සිකියුරිටීස් පීඑල්සී සමාගමට එරෙහිව පියවර ගෙන ඇති අතර එය දිසා අධිකරණයේ විභාග වෙමින් පවතී. | සිටින බවත් නීති උපදේශකවරයා විසින් ලංවිම වෙත දන්වා තිබුණි. කෙසේ වෙතත්, අදාළ වගකිව යුතු පාර්ශ්වයන්ගෙන් අලාභය අයකර ගෙන නොතිබුණි. |

### 3.36 අපි වෙනුවෙන් අපි අරමුදල

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 1,230,833,443 | 270,837,221 | 959,996,222 | 26,231,498 | තත්ත්වාගණනය කළ |
| **2022** | 1,407,386,443 | 47,591,258 | 1,359,795,185 | 398,875,766 | තත්ත්වාගණනය කළ |
| **2023** | 1,582,020,984 | 146,671,865 | 1,435,349,119 | 75,144,999 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරික්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ගය | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| 1. | අරමුදල විසින් නිවාස ප්‍රතිලාභ ගෙවීමේදී අදාල ප්‍රතිලාභියාට සෘජුවම මුදල් ගෙවීමේ ක්‍රමවේදයක් වෙනුවට අදාල හමුදා ගිණුම් වෙත මුදල් මුදාහැරිම සිදුකර තිබුණි. ඒ අනුව 2023 වර්ෂයේදී එකතුව රු. මිලියන 333.9 ක මුදල් හමුදා ගිණුම්වෙත නිදහස් කර ඇතත් එම මුදල් නියමිත ප්‍රතිලාභියා වෙත නිශ්චිත දිනයේදී ලැබුණු බවට අප්‍රමාදව සහතිකවන ක්‍රමවේදයක අවශ්‍යතාව 2021 වර්ෂයේ සිට අවධාරණය කර ඇතත් සමාලෝචිත වර්ෂය දක්වාම විධිමත් පරිදි ක්‍රියාත්මකර නොතිබුණි. | 2023 | ප්‍රතිලාභ මුදල් නියමිත ප්‍රතිලාභියා වෙත නිශ්චිත දිනයේදී ලැබුණු බවට ප්‍රමාදයකින් තොරව හා නිවැරදිව ප්‍රතිලාභීන්ට මුදල් ලැබෙන බවට සහතිකවන ක්‍රමවේදයක් ක්‍රියාත්මත කළ යුතු වීම. | ප්‍රතිලාභ මුදල් නියමිත ප්‍රතිලාභියා වෙත වෙත ලැබුණු බවට සම්බන්ධීකරණ නිලධාරීන් මගින් සනාථන වාර්තා කඩිනමින් ගෙන්වා ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස්කර ඇත. | 2024 තෙවන කාර්තුව අවසන්වන විට රු. මිලියන 90.55 ප්‍රතිලාභ ගෙවා ඇතත් ඉන් සියයට 30 ක් හෙවත් රු. මිලියන 27.8 ක සනාථ කිරීම් ඉදිරිපත් කර නැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2. | 2023 දෙසැම්බර් 31 දිනට රණජයපුර නිවාස හිමියන්ගෙන් අයවියයුතු හිග වාරික මුදල රු. 43,503,101 ක් වූ අතර එයින් වර්ෂ 1සිට 5 දක්වා කාලයක් හිඟහිටි ශේෂයන්ගේ එකතුව රු. 26,220,080 ක් වූ අතර වසර 05 ට වැඩි කාලයක් හිඟහිටි ශේෂ එකතුව රු. 2,792,000 ක් විය. මෙම හිග හිටි ණය ශේෂ අයකර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2023 | සුදුසු ක්‍රියාමාර්ග ගෙන අප්‍රමාදව වාරික අයකර ගැනීමට හා යාවත්කාලීන ලේඛණ පවත්වා ගැනීමට කටයුතු කළ යුතු වීම. | දීර්සකාලීන හිඟ වාරික මුදල් පිළිබඳව ත්‍රිවිධ හමුදා පරීක්ෂණ මණ්ඩලයක් පත්කර ඇති අතර එහි නිර්දේශ කළමනාකරණ මණ්ඩලය වෙත ඉදිරිපත් කර කඩිනමින් ඒ පිළිබඳව ක්‍රියා කිරීමට කටයුතු සිදු කරනු ලැබේ. | නිර්දේශ ක්‍රියාත්මක කිරීම ප්‍රමාණවත් නොවේ. |
| 3. | 2008 අංක 06 දරන අපි වෙනුවෙන් අපි අරමුදල් පනතේ 09 වන වගන්තිය පරිදි අරමුදල විසින් “අපි වෙනුවෙන් අපි අරමුදල” යන නාමයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුදලක් පවත්වාගත යුතු අතර එකී පනතේ 7 වන වගන්තිය යටතේ අරමුදලට ගෙවිය යුතු මුදල් එකී ගිණුමට බැර කරනු ලැබිය යුතු වුවත් අරමුදල විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුමක් පවත්වා නොතිබුණි. | 2023 | පනතේ 09 වන වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | මේ සම්බන්ධයෙන් උපදෙස් ලබාගැනීම සඳහා කළමනකරණ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට නියමිතව ඇත. | උපදෙස් ක්‍රියාත්මක කර නැත. |
| 4. | අපි වෙනුවෙන් අපි අරමුදල් පනතේ 10 වන වගන්තිය | 2023 | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙතින් | අරමුදල් පනතේ 10 වන වගන්තියෙන් දක්වා ඇති පරිදි මුදල් | උපදෙස් ක්‍රියාත්මක කර නැත. |

ප්‍රකාරව, දේශීය ආදායම් පනතින් අවසර දෙනු ලබන ප්‍රමාණයට අරමුදලේ ආදායම හෝ ලාභය මත ගෙවිය යුතු ආදායම් බද්ද ගෙවීමෙන් නිදහස් කරනු ලැබිය යුතුවේ. 2021 අංක 10 දරන දේශිය ආදායම් (සංශෝධන) පනත සහ 2022 අංක 45 දරන දේශීය ආදායම් පනත් මගින් සංශෝධනය කළ 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන අනුව අරමුදලේ ස්ථාවර තැන්පතු මත පොලි ආදායමෙන් සියයට 05 ක රඳවාගැනීම් බදු ලෙස රු.13,771,820 ක් අයකර තිබුණු අතර එම රඳවාගැනීම් බදු මුදල අරමුදලේ වියදමක් ලෙස වර්ෂයේ අතිරික්තයට එරෙහිව ලියාහැර තිබුණි. එහෙත් අපි වෙනුවෙන් අපි අරමුදල් පනතේ 10 වන වගන්තිය ප්‍රකාරව කටයුතු කර අරමුදලට යම් බදු බැදියාවක් පවතීද යන්න දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙතින් තහවුරු කර ගැනීමක් හෝ අදාල බැංකු වෙතින් රඳවාගැනීම්

ආදායම් බදු නිදහස් කිරීම සනාථ කර ගැනීම හා එය රඳවා ගැනීමේ අනුනියෝජිතයා (බැංකු) වෙත ඉදිරිපත් කර බදු රඳවාගැනීමේ අවශ්‍යතාවයෙන් මුදාහරින ලෙස ඉල්ලීමක් කළ යුතු බව.

විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ලබාගැනීම සඳහා ඉදිරි කටයුතු සිදුකරමින් පවතින බව කාරුණිකව දන්වා සිටිමි.

| | | | | | |
|---|---|---|---|---|---|
| | බද්ද අඩු නොකරන ලෙසට ඉල්ලීමක් හෝ සිදුකර නොතිබුණි. | | | | |
| 5. | අංක 01/2020 හා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 877(2)(ඇ) හා මාර්ගෝපදේශ 04 හි 2.2 ඡේදය ප්‍රකාරව සන්නිවේදන කුළුණු ආදායම් ඇතුළු අරමුදලෙහි ආදායම් හඳුනාගැනීමේදී ලැබීම් වවුචර, ලදුපත්, ඉන්වොයිසි, ආදී මුලාශ්‍ර ලේඛණ භාවිතාකර නොතිබුණු අතර බැංකු ප්‍රකාශනයේ බැරට දැක්වෙන වටිනාකම් මත සියළුම ආදායම් හඳුනාගෙන තිබුණි. එබැවින් අරමුදලට ලැබියයුතු වර්ෂයට අදාල ආදායමෙහි නිරවද්‍යතාවය තහවුරු කරගැනීමේ ක්‍රමවේදයක් නොපැවතුණි. | 2023 | යොමුගත රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ගිණුම් තොරතුරු සනාථවන පරිදි මූලාශ්‍ර ලේඛණ සහිතව ගිණුම්වල සටහන් කල යුතු වීම. | ඍජුවම මුදල් බැරකරන පුද්ගලයින්ගේ බැරපත් මෙම අරමුදල වෙත ඉදිරිපත් කරනු ලබයි. තවද, සන්නිවේදන කුළුණු ආදායම් ලබාගැනීමේදී ඉන්වොයිස් හා ගිවිසුම් වල සඳහන් වටිනාකම් සැලකිල්ලට ගනිමින් ගිණුම්ගත කිරීමට කටයුතු කර ඇත. | බැංකු ගිණුමට බැර කරනු ලබන වටිනාකම මත පදනම්ව ඇතැම් ආදායම් හඳුනාගන්නා බව තවදුරටත් නිරීක්ෂණය වේ. |
| 6. | රණජයපුර නිවාස සංකීර්ණයේ නිවාස සඳහා සාමාජිකයන් 69 ක් වාරික මුදල් ගෙවා අවසන් බවට වාර්තාගතව පැවති අතර දෙපාර්ශවය විසින් එළඹි ගිවිසුමේ 2 වන වගන්තිය ප්‍රකාරව වාරික ගෙවා | 2023 | ගිවිසුම් ප්රකාරව කටයුතු කළ යුතු වීම. | ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව සහ ඉඩම් අමාත්‍යාංශය යන රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධ වී රණජයපුර | මේ සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇතත් මේ දක්වා නිවාස අයිතිය පැවරීම සිදුකර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | අවසන් කළ සාමාජිකයන් වෙත නිවාසවල අයිතිය පැවරීමේ කටයුතු සිදුකර නොතිබුණි. | | | නිවාසලාභීන් සඳහා හිමිකම් සහතික ලබාදීමේ ක්‍රියාවලිය කඩිනමින් සිදු කිරීමට කටයුතු කරගෙන යනු ලැබේ. | |
| 7. | 2023 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම අනුව 2023 වර්ෂය අවසාන වන විට අර්ධ නිවාස 379 ක් හා පූර්ණ නිවාස 29 ක් සඳහා රු.423,275,789 ක ආධාරමුදල් ගෙවා අවසන් කිරිමට සැළසුම් කර පැවතියද 2023 දෙසැම්බර් 31 දින වනවිට තවදුරටත් රු.106,613,263 ක් සහ 2021 වර්ෂය වෙනුවෙන් රු.3,034,862 ක් ගෙවිය යුතුව පැවතුණි. | 2023 | ක්‍රියාකාරි සැලැස්මට අනුගතව කටයුතු කළ යුතු වීම. | ඉදිකිරීම් පිළිබඳ ප්‍රායෝගික ගැටළු පවතින නිසා ඇතැම් ප්‍රතිලාභීන්ගේ වාරික තවදුරටත් ගෙවිය යුතුව පවතී. කෙසේ වුවද තවදුරටත් ගෙවිය යුතු මෙම මුදල ගෙවීම සඳහා කඩිනමින් කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | 2024 වර්ෂයේ ගෙවීමට අපේක්ෂිත මුදලින් 2024 තෙවන කාර්තුව අවසන්වන විට ගෙවා ඇති ප්‍රමාණය සියයට 32 ක් පමණකි. |
| 8. | 2008 අංක 06 දරන අපි වෙනුවෙන් අපි අරමුදල් පනතේ 11(6) වගන්තිය ප්‍රකාරව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන සහ විගණකාධිපති වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වුවත් අරමුදල ආරම්භයේ සිට 2022 වර්ෂය දක්වා වූ වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | 2023 | පනතේ වගන්ති ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තා පාර්ලිමේන්තුවේ සභාගතකළ යුතු වීම. | මෙම අරමුදලේ මූල්‍ය ප්‍රකාශන සහ විගණකාධිපති වාර්තා අරමුදල ආරම්භයේ සිටම සභාගත කිරීමක් සිදුකර නොමැති අතර මේ වන විට අදාළ ආයතන හා සම්බන්ධීකරණය වී පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | නිර්දේශ ක්‍රියාත්මක කර නැත. |

## 3.37 ජාතික ආරක්ෂක අරමුදල

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 831,800,894 | - | 831,800,894 | (34,987,345) | තත්ත්වාගණනය කළ |
| **2022** | 815,716,008 | - | 815,716,008 | (17,189,698) | තත්ත්වාගණනය කළ |
| **2023** | 805,256,204 | 28,312,535 | 776,943,669 | (40,365,301) | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ගය | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| 1. | මෙත්සෙවණ ව්‍යාපෘතිය යටතේ 2023 වර්ෂයේදී රණවිරු ප්‍රතිලාභින් 174 ක් වෙනුවෙන් රු. මිලියන 174 ක් ගෙවා අවසන් කිරීමට සැළසුම් කළද, ඉන් නිවාස ප්‍රතිලාභීන් 79 ක් වෙනුවෙන් එකතුව රු.27,228,619 ක් වූ අවසන් වාරිකය ගෙවීමට 2023 දෙසැම්බර් 31 දින වනවිටත් අපොහොසත් වී තිබුණි. | 2023 | වර්ෂයේ සැලසුම් කළ අපේක්ෂිත ඉලක්ක කරා ළඟාවීමට ක්‍රියා කළ යුතු වීම. | අදාල වර්ෂයේ ව්‍යාපෘතිය එම වර්ෂයේදීම නිම කිරීමට සම්බන්ධීකරණ නිළධාරීන් දැනුවත් කළ අතර මේ පිළිබඳ පසුවිපරම් සිදුකරමින් ව්‍යාපෘති කඩිනමින් නිම කිරීමට කටයුතු කරනු ලැබේ. | 2024 වර්ෂයේදී ද 2023 වර්ෂයේ දී මෙන් ප්‍රතිලාභීන් 145 ක් වෙත රු.මිලියන 139 ගෙවිය යුතු වුවද තෙවන කාර්තුව දක්වා ගෙවා ඇතිමුදල රු.මිලියන 43 ක් පමණක් බැවින් ප්‍රමාණවත් කාර්යසාධනයක් ලැබී නොමැත. |
| 2. | 1985 අංක 09 දරණ ජාතික ආරක්ෂක අරමුදල් පනතේ 09 වන වගන්තිය ප්‍රකාරව රාජකාරී ඉටු කරන අතරතුර තුවාල ලැබූ හෝ මිය ගිය සන්නද්ධ හමුදාවල | 2023 | අරමුදල් පනතේ දැක්වෙන මූලික අරමුණු ඉටුවන අයුරින් සැලසුම් පිළියෙල කළ යුතු වීම. | ඉදිරි වැඩසටහන් සැලසුම් කිරීමේදී ජාතික ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීම හා සහතික කිරීමට අදාලව අරමුදලේ පාලක මණ්ඩලය වෙත දැනුවත්වීම | 2024 වර්ෂය තුළ වැඩසටහන් සැලසුම්කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | සාමාජිකයන්ට හා පවුල් වලට ප්‍රතිලාභ ගෙවීම හැරුණුවිට පනතේ අරමුණු ප්‍රකාරව ජාතික ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීම හා සහතික කිරීමට අදාළ කාර්යය සඳහා සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම තුලද වැඩසටහන් සැලසුම්කර නොතිබුණි. | | | සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | |
| 3. | 1985 අංක 9 දරන ජාතික ආරක්ෂක අරමුදල් පනතේ 13 වගන්තිය ප්‍රකාරව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන සහ විගණකාධිපති වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කළ යුතු වුවත් අරමුදලේ 2018 සිට 2021 දක්වා වූ වර්ෂවලට අදාල මූල්‍ය ප්‍රකාශන සහ විගණකාධිපති වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි. | 2023 | 1985 අංක 9 දරන ජාතික ආරක්ෂක අරමුදල් පනත පනතේ 13 වගන්තිය ප්‍රකාරව කටයුතු කල යුතු වීම. | 2017 වර්ෂය දක්වා ජාතික ආරක්ෂක අරමුදල මුදල් අමාත්‍යාංශය යටතේ පැවති බැවින් එම වර්ෂයට අදාල වාර්තාව සභාගත කිරීමෙන් අනතුරුව මෙම අමාත්‍යාංශය විසින් වාර්තා පාර්මේන්තුවේ සභාගත කිරීමට කටයුතු කරනු ලැබේ. | මෙම වාර්තාවේ දිනය දක්වා අරමුදලේ මූල්‍ය ප්‍රකාශන සහ විගණකාධිපති වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නැත. |

## 3.38 සිරකරු සුභසාධක අරමුදල

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 4,545,580 | - | 4,545,580 | 908,830 | තත්ත්වාගණනය කළ |
| **2022** | 5,308,408 | - | 5,308,408 | 758,638 | තත්ත්වාගණනය කළ |
| **2023** | 5,708,004 | - | 5,708,004 | 403,785 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතනය විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ගය | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| 1. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 877(2)(අ) ඡේදය ප්‍රකාරව අරමුදල සඳහා වෙනම බැංකු ගිණුමක් පවත්වා නොමැති අතර, සුභසාධක අරමුදලේ ගනුදෙනු දෙපාර්තමේන්තුවේ නිල බැංකු ගිණුම යටතේ ඉටුකරගෙන තිබුණි. | 2023<br>2022<br>2021 | මුදල් රෙගුලාසි 877(2)(අ) ප්‍රකාරව කටයුතු කළ යුතු ය. | 1973 අංක 18 දරන බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සිරකරු සුභසාධක අරමුදල් පනතේ අංක 2(2) වගන්තිය ප්‍රකාරව ''මුදල් විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම් විසින් නියම කරනු ලැබිය හැකි ආකාරයෙන් අරමුදලේ පොදු ගිණුමක් පවත්වාගෙන යා යුතු ය.'' ඒ අනුව බන්ධනාගාර දෙපාර්තමේන්තුව මගින් මහා භාණ්ඩාගාරයේ තැන්පත් ශීර්ෂ 232-6000-0-0-006-0-028-0 යටතේ සිරකරු සුභසාධක අරමුදලේ ගිණුම් කටයුතු පොදු | සිරකරු සුභසාධක අරමුදලේ අදාළ බැංකු ගිණුම් විවෘත කිරීමට නම් සිරකරු සුභසාධක අරමුදලේ නම සංශෝධනය කිරීම කළ යුතු ය. එලෙස අරමුදලේ නම සංශෝධනය කිරීමට නම් සිරකරු සුභසාධක අරමුදල පිහිටුවන ලද ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 18 දරන බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සිරකරු සුභසාධක අරමුදල් පනත සංශෝධනය කළ යුතු ය. එබැවින් ඒ සඳහා වන නෛතික කටයුතු ඉදිරියේදී සිදුකරන බව විගණනය වෙත දන්වා ඇත. |

ගිණුමක් ලෙස පවත්වාගෙන යනු ලබයි. රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 ප්‍රකාරව ව්‍යවස්ථාපිත අරමුදලක් සඳහා වෙනම බැංකු ගිණුමක් පවත්වාගත යුතු බව දක්වා තිබීම හා විගණනය විසින් ද විමසුම් කර තිබූ බැවින්, සිරකරු සුභසාධක අරමුදලට අදාළව වෙනම බැංකු ගිණුමක් විවෘත කිරීම සඳහා අදාළ ආකෘතිපත්‍ර ද සම්පූර්ණ කර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. එහිදී භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අංක TO/BE2/02/BA/232/2015 හා 2023 ජනවාරි 05 දිනැති ලිපිය මඟින් දන්වා ඇත්තේ අරමුදල් නමින් ගිණුම් විවෘත නොකරන බවත්, දෙපාර්තමේන්තුවේ නිල කටයුතු සඳහා බැංකු ගිණුමක් විවෘත කරන්නේ නම් ඒ අනුව එහි නිලනාමය සංශෝධනය කර අදාළ ලියවිලි ඉදිරිපත් කරන ලෙසත් ය.

| | | | | | |
|---|---|---|---|---|---|
| 2. | බන්ධනාගාරගත වූ රැඳවියන් තුළ පවතින කලා කුසලතාවයන් වර්ධනය කර බන්ධනාගාර නිලධාරීන් හා ඔවුන් අතර සුහදතාවය ඇති කිරීමේ අරමුණින් බන්ධනාගාරයේ මානව හා භෞතික සම්පත් යොදාගෙන ලලිත සිරිසර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබූ අතර, මෙම ව්‍යාපෘතියට අදාළව රුපියල් මිලියන 8.5ක ආදායමක් රැස්කර තිබුණි. ඉන් රුපියල් මිලියන 1.1ක සංග්‍රහ වියදම් ද ඇතුලුව රුපියල් මිලියන 4.7 ක වියදමක් දරා ඉතිරි මුදල් ලෙස රුපියල් මිලියන 3.75ක් වැලිකඩ සිරකරු සුභසාධක උපසංගමයේ බැංකු ගිණුමේ පවත්වාගෙන යනු ලබයි. සිරකරු සුභසාධන අරමුදල මගින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද්දේ නම් මෙම ඉතිරි මුදල් විධිමත්ව සිරකරු සුභසාධනය සඳහා යොදා ගැනීම මෙන්ම රජයේ විගණනයට ද භාජනය වන අතර, එය වඩා විනිවිදභාවයකින් සිදු කිරීමට රජයේ සම්පත් යොදාගෙන සිදුකළ මෙම ව්‍යාපෘතියට | 2023 | සිරකරු සුභසාධක අරමුදල මගින් මෙවැනි ව්‍යාපෘතිය සිදු කිරීමට පියවරගත යුතු ය. | බන්ධනාගාරගත වූ රැඳවියන් තුළ පවතින කලා කුසලතාවයන් වර්ධනය කර බන්ධනාගාර නිලධාරීන් හා නේවාසිකයන් අතර සුහදතාවය වර්ධනය කිරීමේ අරමුණෙන් ලලිත සිරසර 02 ප්‍රසංගය බන්ධනාගාර දෙපාර්තමේන්තුව හා සිරකරු සුභසාධක උපකමිටුවල අනුග්‍රහයෙන් වැලිකඩ බන්ධනාගාර සිරකරු සුභසාධක උපකමිටුවේ මැදිහත් වීමෙන් පවත්වන ලදී. සිරකරු සුභසාධක සංගමයේ විධායක සභාවේ ගරු සභාපතිවරයා විසින් සියලුම උපකමිටුවල සභාපතිවරුන්ට මෙම වැඩසටහන සඳහා අනුග්‍රාහක දායකත්වය ලබාදෙන ලෙස ඉල්ලීමක් කර ඇති අතර, ඒ අනුව උපකමිටු විසින් ඔවුන්ට පහසු පරිදි අනුග්‍රහය දක්වා ඇත. එම අනුග්‍රහ කටයුතු විනිවිදභාවයකින් යුතුව සිදු කිරීම සඳහා සිදු කරනු ලබන සියලුම අනුග්‍රහ කටයුතු ලබාගැනීමේදී බන්ධනාගාර අධිකාරිවරයාගේ | ප්‍රසංගයෙන් පසු උප කමිටුවලින් ලබාදුන් මුදල නැවත එම ආයතනවල නේවාසික පුනරුත්ථාපන කටයුතු සඳහා ලබාදී ඇති අතර, මෙම මුදල් ලබාදීම් කටයුතු කිරීමේදී ද කමිටුවක් පත්කර එම කමිටුවේ නිර්දේශයන්ට අනුව කටයුතු කර ඇති බව දන්වා ඇත. සිරකරු පුනරුත්ථාපනය සඳහා වාර්ෂිකව බන්ධනාගාර ආයතනවල සිරකරු සුභසාධක අරමුදලෙන් ලබාදෙන මුදලට සාපේක්ෂව මෙවැනි වැඩසටහන් කිරීම සඳහා ප්‍රමාණවත් මුදලක් සිරකරු සුභසාධක අරමුදලෙන් ලබා දීමට හැකියාව ඇත්නම් මෙම වැඩසටහන ඉදිරියේදී සිරකරු සුභසාධක අරමුදලේ අනුග්‍රහයෙන් සිදු කිරීමට හැකි බවත්, වෙනත් අනුග්‍රාහකයන්ගේ අවශ්‍යතාවයක් ඇති නොවන බවත්, වාර්තාකර ඇත. |

හැකියාව පවතින බව නිරීක්ෂණය විය.

මූලිකත්වයෙන් හා සිරකරු සුභසාධක සංගමයේ සාමාජික මහතෙකුගෙන් යුතුව තිදෙනෙකුගෙන් යුත් කමිටුවක් මගින් කටයුතු සිදුකර ඇත. ඒ අනුව ප්‍රසංගයෙන් පසු උපකමිටුවලින් ලබාදුන් මුදල නැවත එම ආයතනවල නේවාසික පුනරුත්ථාපන කටයුතු සඳහා ලබා දී ඇති අතර, මෙම මුදල් ලබාදීමේ කටයුතු කිරීමේදී ද කමිටුවක් පත්කර එම කමිටුවේ නිර්දේශයන්ට අනුව කටයුතු කර ඇති බව ද දන්වා සිටිමි. සිරකරු පුනරුත්ථාපනය සඳහා වාර්ෂිකව බන්ධනාගාර ආයතනවල සිරකරු සුභසාධක අරමුදලෙන් ලබාදෙන මුදලට සාපේක්ෂව මෙවැනි වැඩසටහන් කිරීම සඳහා ප්‍රමාණවත් මුදලක් සිරකරු සුභසාධක අරමුදලෙන් ලබා දීමට හැකියාව ඇත්නම් මෙම වැඩසටහන ඉදිරියේදී සිරකරු සුභසාධක අරමුදලේ අනුග්‍රහයෙන් සිදු කිරීමට හැකි බවත්,

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | වෙනත් අනුග්‍රාහකයන්ගේ අවශ්‍යතාවයක් ඇති නොවන බවත්, කාරුණිකව වාර්තා කරමි. | |
| 3. | සිරකරු සුභසාධක අරමුදලින් සිරකරු සුභසාධන වැඩසටහන් නිවැරදිව පුරෝකථනය කර තාත්වික ලෙස වියදම් ඇස්තමේන්තු සකස් නොකිරීම නිසා මුල් ඇස්තමේන්තුවේ අපේක්ෂිත කාර්යසාධනයට සාපේක්ෂව සත්‍ය වශයෙන් ක්‍රියාත්මක කළ වැඩසටහන් සංඛ්‍යාව සියයට 3ක් විය. | 2023 | අරමුදලේ ඇස්තමේන්තු තාත්විකව සකස්කර නිවැරදි කාලරාමු තුළ වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු ය. | සිරකරු සුභසාධක අරමුදල් පනතේ නේවාසිකයන් සඳහා සිදු කිරීමට අවශ්‍ය පුනරුත්ථාපන වැඩසටහන් දක්වා ඇති අතර, ඒ අනුව සියලු බන්ධනාගාර ආයතනවලට පුනරුත්ථාපන වැඩසටහන් සිදු කරන ආකාරය පිළිබඳව සකස්කර ඇති ලක්ෂ 08 ට අදාළ ක්‍රියාකාරී සැලැස්මට අනුව එම වැඩසටහන් සිදුකර ඇත. ඉදිරි වර්ෂවලදී ලබාදෙනු ලබන මුදල් ප්‍රතිපාදන ප්‍රමාණය මත සාර්ථකව පුනරුත්ථාපන වැඩසටහන් විශාල ප්‍රමාණයක් සිදු කිරීමට අවශ්‍ය කටයුතු කරන බව ද වාර්තා කරමි. තව ද සිරකරු සුභසාධක අරමුදලේ වාර්ෂිකව ලබාදෙන ප්‍රතිපාදන පුනරුත්ථාපන වැඩසටහන් සඳහා ප්‍රමාණවත් නොවන බැවින් සිරකරු සුභසාධක සංගමය හා එක්ව | සෑම වර්ෂයකම අපේක්ෂිත ආදායමට සරිලන ලෙස වියදම් ඇස්තමේන්තුවක් සකස්කර පුනරුත්ථාපන වැඩසටහන් පවත්වාගෙන යනු ලබයි. ඒ අනුව 2024 වර්ෂය සඳහා ද රුපියල් ලක්ෂ 15ක වියදම් ඇස්තමේන්තුවක් සකස්කර අදාළ පුනරුත්ථාපන වැඩසටහන් සිදු කරනු ලබයි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | නේවාසිකයන්ගේ පුනරුත්ථාපනය සඳහා වැඩසටහන් රාශියක් සිදුකර ඇත. | |
| 4. | සිරකරු සුභසාධක අරමුදලේ 2023 වර්ෂය සඳහා මුල් ඇස්තමේන්තුව අනුව අපේක්ෂිත ආදායම රු.858,500 ක් සහ අපේක්ෂිත වියදම රු.1,500,000 ක් විය. සිරකරු සුභසාධනය සඳහා ප්‍රමාණවත් මුදලක් වැය කිරීමට හැකියාව තිබියදී අරමුදලේ මුල් ඇස්තමේන්තුවේ වියදම සියයට 53.3ක් දක්වා එනම් රු.800,000ක් දක්වා අඩුකර තිබූ අතර, 2023 වර්ෂය තුළ සත්‍ය ආදායම රු.1,172,126 ක් ද, සත්‍ය වියදම රු.768,341ක් විය. තව ද සමාලෝචිත වර්ෂය ආරම්භයේ රු.5,299,068ක හා සමාලෝචිත වර්ෂය අවසානයේ සිරකරු සුභසාධක අරමුදලේ රු.5,696,914ක ශේෂයක් පැවති බැවින් සිරකරු සුභසාධනය සඳහා ප්‍රමාණවත් මුදලක් වැයකර නොතිබුණු බව නිරීක්ෂණය විය. | 2023 | සිරකරු සුභසාධනය පාදක කරගෙන අරමුදලේ ඇස්තමේන්තු තාත්විකව සකස්කර එපරිදි වියදම් දැරීමට කටයුතු කළ යුතු ය. | 2023 වර්ෂයේ පුනරුත්ථාපන වැඩසටහන් සඳහා රුපියල් ලක්ෂ 15ක ප්‍රතිපාදනයක් වෙන්කරදී තිබූ අතර, ඒ අනුව එම මුදලට සාපේක්ෂව ක්‍රියාකාරී සැලැස්ම සකස්කළ ද එම වර්ෂයේ අපේක්ෂිත ආදායම රු.858,500ක් බැවින්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව මගින් 2023 වර්ෂයට අපේක්ෂිත ආදායම තුළ ඉලක්කගත වියදම් කළමනාකරණය කර ගැනීමට යටත්ව වියදම් ඇස්තමේන්තුව සුදුසු පරිදි ගැළපීම් කරගැනීම සඳහා අනුමැතිය ලබාදී ඇත. ඒ අනුව එම මුදලට සාපේක්ෂව ක්‍රියාකාරී සැලැස්ම සකස්කර නේවාසික පුනරුත්ථාපන කටයුතු සිදුකර ඇති බව ද කාරුණිකව වාර්තා කරමි. | 2024 වර්ෂය සඳහා ද එසේ ලබාදුන් ප්‍රතිපාදන ප්‍රමාණය වන රුපියල් ලක්ෂ 15ට අදාළව සකස් කරන ලද වියදම් ඇස්තමේන්තුව පරිදි අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් පවතී. |

## 3.39 හිමිකම් රක්ෂණ අරමුදල

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 113,155,614 | 296,400 | 91,409,664 | 21,449,550 | තත්ත්වාගණනය නොකළ |
| **2022** | 138,622,430 | 296,400 | 112,859,215 | 25,466,815 | තත්ත්වාගණනය නොකළ |
| **2023** | 193,211,590 | - | 138,326,029 | 54,885,560 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපතිගේ නිර්දේශය | විගණිත ආයතනය විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| 1. | 2009 අංක 01 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ (රක්ෂණ අරමුදල්) නියෝග අංක 42(ආ) ප්‍රකාරව, හිමිකම් රෙජිස්ට්‍රාර්වරුන් විසින් සති 02කට වරක් හිමිකම් ආදායම් සම්බන්ධ වාර්තා ප්‍රධාන කාර්යාලය වෙත ලබාදිය යුතු වුව ද, හිමිකම් රෙජිස්ට්‍රාර් කාර්යාල 14ක ආදායම් වාර්තා ලබාදී නොතිබුණු අතර, අරමුදලේ ආදායම් අදාළ කාර්යාල විසින් බැංකුගත කරන මුදල් වටිනාකම අනුව ගණනයකර තිබුණි. ඒ සඳහා ආදායම් වාර්තා පදනම්කර නොගැනීම හේතුවෙන් අරමුදලේ මුළු | 2021 2022 2023 | ආදායම් වාර්තා ලබාගෙන බැංකුගත කළ ආදායම නිවැරදිව සනාථ කරගත යුතු බව. | ලිඛිතව හා වාචිකව දැනුම් දීමෙන් ආදායම් වාර්තා ගෙන්වා ගැනීමට කටයුතුකර ඇත. ආදායම් වාර්තා පරිගණක පද්ධතියක් මඟින් ලබාගැනීමට සැලසුම්කර ඇත. | ඊමේල් මඟින් සහ පරිගණක පද්ධතියක් මඟින් ද වාර්තා ලබාගැනීම සිදු කරමින් පවතී. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ලැබීම්වල නිරවද්‍යතාවය තහවුරු කරගත නොහැකි විය. | | | | |
| 2. | 2009 අංක 01 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ (රක්ෂණ අරමුදල්) නියෝග අංක 42(ඉ) ප්‍රකාරව, සෑම දින 14 ක් අවසානයේදීම හිමිකම් රෙජිස්ට්‍රාර්වරුන් විසින් එකතු කරගන්නා මුදල් හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් ප්‍රධාන මුදල් පොතට වෙන් වෙන් වශයෙන් හර කළ යුතු වුව ද, දෛනික ආදායම් ලෙස දිනපතා ලැබීම්වල එකතුවක් මුදල් පොතට හරකර තිබුණි. | 2021 2022 2023 | ආදායම් වෙන් වෙන් වශයෙන් හඳුනාගෙන ප්‍රධාන මුදල් පොතේ සටහන් කළ යුතු බව. | කාර්යාල වශයෙන් ආදායම් හඳුනාගැනීමට පරිගණක පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. බැංකු ප්‍රකාශනය හරහා ආදායම් බැංකුගත කරන ශාඛා කාර්යාලය හඳුනාගැනීමට බැංකුව සමඟ සාකච්ඡා පවත්වා ඇත. | 2024 ජූලි මස සිට බැංකු ප්‍රකාශනයේ දෛනික ආදායම් රැස් කිරීම්, කුමන කාර්යාලයෙන්ද යන්න හඳුනා ගැනීමට එක් එක් හිමිකම් කාර්යාලවලට TR අංකයක් ලබාදී ඇත. |
| 3. | 2009 අංක 01 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ (රක්ෂණ අරමුදල්) නියෝග 42(ආ) හා (ඇ) ප්‍රකාරව ඇතැම් හිමිකම් කාර්යාල විසින් ප්‍රධාන කාර්යාලය වෙත එවන ලද හිමිකම් ආදායම පිළිබඳ වාර්තා "ආර්.ජී.ටී/අයි.එෆ් 03" ආකෘතියට අනුකූල නොවුව ද, කළමනාකරණය විසින් නිවැරදි ආකෘතිය සහිත වාර්තා | 2021 2022 2023 | නිවැරදි ආකෘතියට අනුකූල වාර්තා ඉදිරිපත් කළ යුතු බව. | නිවැරදි ආකෘතියට වාර්තා එවන ලෙස ශාඛා කාර්යාලවලට උපදෙස් ලබාදී ඇත. | ශාඛා කාර්යාල බොහොමයක් විසින් නිවැරදි ආකෘතියෙන් වාර්තා ඉදිරිපත් කරමින් පවතී. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ගෙන්වා ගැනීමට කටයුතුකර නොතිබුණි. | | | | |
| 4. | අරමුදලේ ජංගම ගිණුමට කරන ලද සෘජු බැරකිරීම් හිමිකම් කාර්යාලවලින් ලබාගන්නා ලද තොරතුරු මත සැසඳීම් කර වර්ෂයට අදාළ හිමිකම් ආදායම හඳුනා ගැනීමට ක්‍රමවේදයක් හඳුන්වාදී නොතිබුණි. | 2022 | නිවැරදි ආදායම් ගිණුම්ගත කළ යුතු වීම හා ආදායම් බැර කරන කාර්යාල හඳුනාගැනීම සඳහා නිසි වැඩපිළිවෙලක් හඳුන්වාදිය යුතු බව. | බැංකු ප්‍රකාශනය හරහා ආදායම් බැංකුගත කරන ශාඛා කාර්යාලය හඳුනාගැනීමට බැංකුව සමඟ සාකච්ඡා පවත්වා ඇත. | 2024 ජූලි මස සිට බැංකු ප්‍රකාශනයේ දෛනික ආදායම් රැස් කිරීම්, කුමන කාර්යාලයෙන් ද යන්න හඳුනාගැනීමට එක් එක් හිමිකම් කාර්යාලවලට TR අංකයක් ලබාදී ඇත. |
| 5. | යථෝක්ත නියෝග අංක 42(ආ) ප්‍රකාරව ප්‍රධාන කාර්යාලයට හිමිකම් රෙජිස්ට්‍රාර් කාර්යාලවලින් ලැබෙන වාර්තා ඇතුළත් කිරීමට ආකෘති අංක"ආර්.ජී.ටී./අයි.ඒෆ්.02" අනුව රෙජිස්ටරයක් නඩත්තු කළ යුතු වුව ද, එම රෙජිස්ටරය ද අදාළ ආකෘතිය ප්‍රකාරව සකස් කිරීමට කටයුතුකර නොතිබුණි. | 2021 | යොමුගත ආකෘතියට අනුකූලව ලේඛනයක් නඩත්තු කළ යුතු බව. | හිමිකම් රෙජිස්ට්‍රාර් කාර්යාලවලින් එවනු ලබන සියළුම ආදායම් වර්ගීකරණයන්ගෙන් යුක්තව රෙජිස්ටරය නඩත්තුකර ඇත. | එළඹෙන මුදල් වර්ෂයේ සිට අදාළ ආකෘති අනුව පරිගණක දත්ත පද්ධතියක් මඟින් රෙජිස්ටරයක් නඩත්තු කිරීමට හා මුද්‍රිත පිටපත් ගොනු කිරීමටත් කටයුතු කරමින් පවතී. |

## 3.40 බුද්ධිමය දේපළ අරමුදල

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 986,103,982 | 3,816,701 | 982,287,281 | 68,822,100 | තත්ත්වාගණනය කළ |
| **2022** | 1,162,811,608 | 3,262,384 | 1,159,549,224 | 174,567,112 | තත්ත්වාගණනය කළ |
| **2023** | 1,473,171,053 | 5,068,875 | 1,468,102,178 | 308,424,933 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ගය | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්වය |
|---|---|---|---|---|---|
| 1. | ඉඩමේ අයිතිය පවරා ගැනීමකින් තොරව බුද්ධිමය දේපළ අලෙවි ප්‍රවර්ධන මධ්‍යස්ථානයක් ඉදිකිරීම වෙනුවෙන් රු.මිලියන 22.29 ක මුදලක් වියදම් කර තිබියදී එම ගොඩනැගිල්ල පිහිටි ඉඩම නාගරික සංවර්ධන අධිකාරිය විසින් අත්පත් කර ගෙන තිබුණි. එම ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වැය කළ මුදල 2023 වර්ෂයේදීද නිරවුල් කර ගැනීමට නොහැකි වී තිබුණි. | 2022 (3.1) 2023 (3.1) | භූමියක අයිතිය පවරා ගැනීමකින් තොරව ගොඩනැගිලි ඉදිකිරීම නොකළයුතු අතර, නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් එම මුදල ලබා ගැනීමට කටයුතු කළ යුතුය. | මුදල් ප්‍රතිපූර්ණය කිරීමට අදාලව වර්තමාන තත්ත්වය විමසා නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිපියක් යොමු කර ඇති බව. | නාගරික සංවර්ධන අධිකාරියෙන් ප්‍රතිචාර ලැබී නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2. | 2023 වර්ෂයේ ලියාපදිංචි කළ වෙළඳ ලකුණු අයදුම්පත් 27 ක් සම්බන්ධයෙන් සිදුකළ නියදි පරීක්ෂාවේදී, ලියාපදිංචිය සඳහා වර්ෂ 2 සිට වර්ෂ 28 දක්වා කාලයක් ගෙන තිබුණි. ලියාපදිංචි කළ පුරවැසි/ සේවා ලාභී ප්‍රඥප්තිය අනුව ලියාපදිංචි කිරීමේ එක් එක් පියවරයන්හිදී නිර්දේශිත කාලය දක්වා තිබූ අතර, සතියක කාලයකින් නිම කළ යුතු කාර්යයක් සඳහා මාස 8ක සිට මාස 221 ක් ද, මාසයක කාලයකින් නිම කළ යුතු කාර්යයක් සඳහා මාස 8ක සිට මාස 94 ක් ද, මාස දෙකක කාලයකින් නිම කළ යුතු කාර්යයක් සඳහා මාස 24 ක සිට මාස 192 ක් ද, මාස තුනක කාලයකින් නිම කළ යුතු කාර්යයක් සඳහා මාස 10 ක සිට මාස 96 ක් අතර ද කාල පරාසයක් ගෙන තිබුණි. | 2023 | වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීමේ එක් එක් පියවරයන්හි ප්‍රමාදයට බලපාන හේතු සොයා බලා විසඳුම් ලබා දිය යුතුය. | නිලධාරීන් බඳවා ගැනීම සිදු වූ පසු ප්‍රමාදය අවම කර ගත හැකි බව. | මේ දක්වා ප්‍රමාදවීම් සිදුවේ. |
| 3. | 2023 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රතික්ෂේපිත වෙළඳ ලකුණු අයදුම්පත් 1,923 කින් වර්ෂ එකකට අඩු කාලයකදී අයදුම්පත් 62 ක් | 2023 | වෙළඳ ලකුණු සඳහා ප්‍රාථමික හා ද්වීතීයික පරීක්ෂාව සිදු කර ප්‍රතික්ෂේප කිරීමේ හෝ පිළිගැනීමේ ලිපි නිකුත් කිරීමට | නිලධාරීන් බඳවා ගැනීම සිදු වූ පසු ප්‍රමාදය අවම කර ගත හැකි බව. | මේ දක්වා ප්‍රමාදවීම් සිදුවේ. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | පමණක් ප්‍රතික්ෂේප කර තිබූ අතර අයදුම්පත් 37 ක් ප්‍රතික්ෂේප කරන දින වන විටත් වර්ෂ 5ක් ද, අයදුම්පත් 104 ක් සඳහා වර්ෂ 3 ක සිට වර්ෂ 4 ක් ද, අයදුම්පත් 1,720 ක් සඳහා වර්ෂ 01 ක සිට වර්ෂ 02 ක අතර කාලයක් ද, ඉක්මවා තිබුණි. | | ගත වන කාලය අවම කර ගත යුතුය. | | |
| 4. | 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතේ 111(9) (අ) වගන්තිය හා පූරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය ප්‍රකාරව අයදුම් පත්‍රය ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා වූ ගාස්තු නියමිත කාල සීමාව ඇතුළත ගෙවනු ලැබුවහොත් සති 04 ක කාලයක් තුළ එය සිදු කළ යුතු වුවද, 2023 දෙසැම්බර් 31 දින වන විට ගාස්තු ගෙවා ඇති නමුත් ගැසට් නොකළ අයදුම්පත්‍ර සංඛ්‍යාව 690 ක් විය. | 2023 | අදාළ ගාස්තු නියමිත කාල සීමාව ඇතුළත ගෙවනු ලැබුවහොත් ප්‍රඥප්තිය ප්‍රකාරව සති 04 ක කාලයක් තුළ ගැසට් පත්‍රයේ පළ කිරීමට කටයුතු කළ යුතුය. | නිලධාරීන් බඳවා ගැනීම සිදු වූ පසු ප්‍රමාදය අවම කර ගත හැකි බව. | මේ දක්වා ප්‍රමාදවීම් සිදුවේ. |
| 5. | 2023 දෙසැම්බර් 31 වන විටත් 2021 ,2022 හා 2023 වර්ෂවල ලද අයදුම්පත්වලින් අයදුම්පත් 12,898 ක වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීමේ කටයුතු ආරම්භ කර නොතිබුණි. | 2023 | අයදුම්පත් ලද පසු පනත ප්‍රකාරව ලියාපදිංචි කටයුතු ආරම්භ කළ යුතුය. | නිලධාරීන් බඳවා ගැනීම සිදු වූ පසු ප්‍රමාදය අවම කර ගත හැකි බව. | මේ දක්වා ප්‍රමාදවීම් සිදුවේ. |

| | | | | | |
|---|---|---|---|---|---|
| 6. | 2016 වර්ෂයේ අයවැය යෝජනාව අනුව වෙළඳ හා සේවා ලකුණු ජාත්‍යන්තරව ලියාපදිංචි කිරීම සඳහා වූ මැඩ්රිඩ් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබූ අතර 2018 වර්ෂය වන විට රු.මිලියන 78 ක වියදමක් විසර්ජන පනත මඟින් දරා තිබුණි. එසේ වුවද 2023 වර්ෂය අවසන් වන විටත් මැඩ්රිඩ් සන්ධාන පත්‍රයට ප්‍රවේශ වීමේ කාර්යයන් අවසන් කිරීමට නොහැකි වී තිබූ බැවින් වෙළඳ ලකුණු ජාත්‍යන්තරව ලියාපදිංචි කිරීමේ කටයුතු සිදු කළ නොහැකිව තිබුණි. | 2023 | මැඩ්රිඩ් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර වෙළඳ ලකුණු ජාත්‍යන්තරව ලියාපදිංචි කිරීමේ කටයුතු සිදු කළ යුතුය. | පනත් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කර ඇත. | මේ දක්වා අදාල කාර්යයන් ක්‍රියාත්මක කර නොමැත. |

## 3.41 සමාගම් අරමුදල

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 6,952,059,026 | 69,679,449 | 6,882,379,577 | 418,498,586 | තත්ත්වාගණනය කළ |
| **2022** | 8,172,805,703 | 86,382,902 | 8,086,422,801 | 581,481,421 | තත්ත්වාගණනය කළ |
| **2023** | 9,049,012,504 | 146,783,117 | 8,902,229,387 | 849,379,157 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ගය | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්වය |
|---|---|---|---|---|---|
| 1. | 2007 වර්ෂයේදී ඊ සර්විසස් ලංකා සමාගම පිහිටුවීමට අදාළව සියයට 35 ක රජයේ දායකත්වය වෙනුවෙන් එම සමාගමේ සාමාන්‍ය කොටස් හා වරණීය කොටස් මිලදී ගැනීම වෙනුවෙන් වෙළඳ, අලෙවි සංවර්ධන සමූපකාර හා පාරිභෝගික සේවා අමාත්‍යාංශ ලේකම්ගේ ගිණුමට මාරුකළ රු.90,275,000 ක මුදලක්, ආයෝජන යටතේ දක්වා තිබුණි. එසේ වුවද ආයෝජිත දිනයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කිසිදු ප්‍රතිලාභයක් ලැබී නොතිබු අතර, 2016 දෙසැම්බර් 31 දිනට වූ | 2023<br>2022<br>2021 | කොටස් ආයෝජිත සමාගමේ පැවැත්ම සහ කොටස්වල අයිතිය තහවුරු කර ගතයුතුය. | රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවෙන් උපදෙස් විමසා තිබීම. | මේ දක්වා කොටස්වල අයිතය තහවුරු කරගෙන නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | සමාගම් පනතේ 131(1) වගන්තිය අනුව ඉදිරිපත් කරනු ලැබූ 15 වන ආකෘතියට අනුව අමාත්‍යාංශ ලේකම් නමින් කොටස් හිමිකමක් පෙන්වා නොතිබුණි. | | | | |
| 2. | සමාගම් පනතේ 131 (1) හා (2) වගන්ති අනුව වාර්ෂික වාර්තා ගොනුකළ යුතු වුවත් 2023 වර්ෂය වෙනුවෙන් ලියාපදිංචි සමාගම්129,229 කින් සමාගම් 16,643 ක් පමණක් වාර්ෂික වාර්තා ගොණු කර තිබූ අතර 2007 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ වාර්ෂික වාර්තා ගොනු කළ යුතු සමාගම් 564,872 ක් පැවති අතර ඉන් සමාගම් 552,344 ක් සමාලෝචිත වර්ෂයේදී ද එම විධිවිධානය පැහැර හැර තිබුණි. ඒ අනුව 2023 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මුළු හිඟ ආදායම රු.3,058,678,000 ක් වී තිබුණි. | 2023<br>2022<br>2021 | වාර්ෂික වාර්තා ගොනු කිරීම උනන්දු කරවීමට, වාර්ෂික වාර්තා ගොනු නොකළ සමාගම් සම්බන්ධයෙන් නෛතික ක්‍රියාමාර්ග ගැනීමට සහ හිඟ ආදායම් අයකිරීමට අවශ්‍ය පියවර කඩිනමින් ගත යුතුය. | වාර්ෂික වාර්තා ගොනු කරන ලෙස අධ්‍යක්ෂ මණ්ඩලයට හා ලේකම්වරුන්ට ලිපි මගින් හා මාර්ගගත ක්‍රමය යටතේ ලියාපදිංචි වූ සමාගම්වලට විද්‍යුත් තැපැල මගින් පණිවිඩ යොමු කළ බව. | නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත. |
| 3. | 2007 අංක 07 දරන සමාගම් පනතේ 170 වගන්තිය ප්‍රකාරව පෞද්ගලික නොවන සෑම සමාගමකම මූල්‍ය | 2023<br>2022 | ලියාපදිංචි නොකල සමාගම් ප්‍රමාණය පද්ධතිය තුලින් හඳුනා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග | පද්ධතියේ සිදුකළ යුතු වැඩි දියුණු කිරීම් අධ්‍යනය කරමින් පවතින අතර ක්‍රමානුකූලව ඒවා | මේ වනවිටත් තත්ත්වය එසේම පවතී. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ප්‍රකාශන සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ලියාපදිංචි කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ දී එම නියමය අනුව කටයුතු කළ සමාගම් පිළිබඳ වාර්තා පවත්නා e -ROC පද්ධතිය තුළින් ලබාගත නොහැකිවී තිබුණි. | | ගත යුතුය. | ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව දන්වා තිබීම | |
| 4. | e–ROC ව්‍යාපෘතිය වෙනුවෙන් 2018 වර්ෂයේ මිලදීගත් රු.2,088,220 ක වටිනාකමකින් යුතු 10KAV වර්ගයේ Online UPS ඒකක (unit) 04 ක් සහ බැටරි 60 ක් උපයෝජනයකින් තොරව වසර 05 ක කාලයක සිට ගබඩාවේ නිෂ්ක්‍රියව පැවතුණි | 2023 2022 | වත්කම් ඵලදායී ලෙස උපයෝජන කිරීමට කටයුතු කළ යුතුය. | තාක්ෂණ දැනුමැති නිලධාරී කමිටුවක් පත් කර මෙම අයිතමයන්හි ක්‍රියාකාරීත්වය පිළිබඳව වාර්තාවක් ලබාගෙන ඉදිරි කටයුතු කරන බව. | තවදුරටත් නිශ්ක්‍රියව පවතී. |

## 3.42 සමූපකාර අතිරික්ත අරමුදල

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | බදු පෙර ලාභය (අලාභය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 2,735,391,439 | 84,191,335 | 2,651,200,104 | 105,727,365 | තත්ත්වාගණනය කළ |
| **2022** | 2,964,779,437 | 83,509,154 | 2,881,270,283 | 230,070,179 | ව්‍යාචනය කළ |
| **2023** | 3,407,413,215 | 84,712,459 | 3,322,700,756 | 441,430,472 | ව්‍යාචනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| 1. | වර්ෂ 11 ක සිට පැවත එන රු.9,475,735 ක් වූ අවිනිශ්චිත ගිණුම් ශේෂය හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2023<br>2022<br>2021 | ශේෂය හඳුනා ගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. | මෙම ශේෂ නිරවුල් කිරීම සඳහා අමාත්‍යාංශ නිලධාරියෙක් ඇතුලත්ව කමිටුවක් පත් කර ඇත. සුදුසු නිලධාරීන් වෙත අදාල කාර්යයන් පැවරීමට කටයුතු කරගෙන යනු ලබයි. | මේ දක්වා නිරවුල් කරගෙන නැත. |
| 2. | අක්‍රිය ණය උපලේඛණය අනුව 1989 වර්ෂයේ සිට 2006 වර්ෂය දක්වා කාලය තුල අරමුදලින් සමූපකාර සමිති 69 කට ලබා දී තිබුණු රු.125,231,173 ක ණය මුදලින් 2023 ජනවාරි 01 දිනට රු.87,986,525 ක ශේෂයක් අයවීමට පැවති අතර සමාලෝචිත වර්ෂයේ ණය වාරික ලෙස | 2023<br>2022<br>2021 | ණය වාරික හා පොළී අයකර කර ගැනීමට කටයුතු කල යුතුය. | ණය අයකර ගැනීමට ගන්න ලද ක්‍රියා මාර්ග අඛණ්ඩව සිදුකරමින් පවතින අතර මෙම වසරේ විවිධ සේවා සමුපකාර සමිති 3කින් අයවිය යුතු ණය ප්‍රතිලේඛනය කර එම ණය අයකර ගැනිමට කටයුතු කර ඇත.එමෙන්ම සී.ස ගාල්ල විවිධ සේවා සමුපකාර සමිතියෙන් අයවිය යුතු මුදල් අය | 2024.09.30 දිනට ණය වාරික ලෙස රු.3,157,512.96ක් සහ පොළී අයවීම් ලෙස රු.216,549ක් අය කරගෙන ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | රු.1,024,971 ක් පමණක් ලැබී තිබුණි. 2023 ජනවාරි 01 දිනට ලැබිය යුතු රු. 102,215,361 ක ණය පොලියෙන් රු.497,630 ක මුදලක් පමණක් ලැබී තිබුණි. | | | කරගැනීම සඳහා අදාල සමිතියේ ඉල්ලීම් ණය අනු කමිටුව වෙත ඉදිරිපත් කර ඇත. | |
| 3. | විවිධ වත්කම් යටතේ දක්වා තිබුණු 1999 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පවතින රු.1,721,566 ක් වූ අහරු චෙක්පත් ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2023<br>2022<br>2021 | අහරු චෙක්පත් ශේෂය නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. | මෙම ශේෂ නිරවුල් කිරීම සඳහා අමාත්‍යාංශ නිලධාරියෙක් ඇතුලත්ව කමිටුවක් පත් කර ඇත. බාහිර පාර්ශවයකගේ සුදුසු නිලධාරීන් වෙත අදාල කාර්යයන් පැවරීමට කටයුතු කරගෙන යනු ලබයි. | මේ දක්වා නිරවුල් කරගෙන නැත. |
| 4. | දේශිය කිරි නිෂ්පාදනය වැඩි කිරීමට ප්‍රමුඛතාවය දෙමින් කිරි සුපිරි අලෙවිසැලක් සඳහා ගොඩනැඟිල්ලක් ඉදිකිරීමට හා අලෙවිසැලක් ආරම්භ කිරීම සඳහා 2007 වර්ෂයේදී රු.15,587,000 ක පොලී රහිත ණය මුදලක් වසර 20 ක් තුල ගෙවා නිම කිරීමට ලබා දී තිබුණි. ණය මුදල ලබා දී වසර 16 ක් ගත වී තිබුණද, අයකර ගෙන තිබුණු මුදල රු. 737,250 ක් වූ අතර, 2023 දෙසැම්බර් 31 දින වන විටත් අයවිය | 2023<br>2022 | ණය මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | දැනට මෙම සංගමයේ ලියාපදිංචිය 2023.01.31 දින අවලංගු කර අදාල දැන්වීම පුවත්පත් වල එල කර ඇත.ඒ අනුව ඉදිරි ක්‍රියා මාර්ග ගැනීමට නියමිත වේ. | මේ දක්වා අය කරගෙන නැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | යුතු ශේෂය රු.14,849,750 ක් වී තිබුණි. | | | | |
| 5. | ගොඩනැඟිලි ද්‍රව්‍ය සංස්ථාවට 2013 වර්ෂයේදී ලබා දී තිබූ රු.75,000,000 ක ණය මුදලින් 2023 දෙසැම්බර් 31 දින වන විට රු.62,091,372 ක් මුදලක් අයවීමට පැවති අතර ඒ සඳහා අයවිය යුතු පොලිය රු.85,435,460 ක් විය. 2023 දෙසැම්බර් 31 දින වන විට ණය මුදල ලබා දී වර්ෂ 11ක් ගත වී ඇතත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, හිඟ ණය මුදල හා පොළී මුදල අය කර ගැනීම අමාත්‍යාංශ මට්ටමින් සිදු කළ නොහැකි නම් අමාත්‍ය මණ්ඩලයට යොමු කරන ලෙස 2021 අගෝස්තු 05 දින පවත්වන ලද රාජ්‍ය ගිණුම්කාරක සභාවේදී නියෝග කර තිබු අතර වර්ෂ 2 ½ ක් ගත වී ඇතත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | 2023<br>2022 | ණය මුදල් අයකර ගැනීමට සහ ගිණුම් කාරක සභා නියෝග ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. | මෙම ණය අය කර ගැනීම සඳහා එම ආයතනයේ කළමනාකාරිත්වය සමඟ සාකච්ඡා සඳහා අවස්ථාව ලබා දෙන ලෙස ඉල්ලා 2024.09.12 දිනැතිව අදාල විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් තුමාට පිටපත් සහිතව ලිපි යොමු කර ඇත. 1973 සමුපකාර සමිති රීති මාලාවේ 44(iii) ට අනුකූලව ණය /ආධාර ලබාදීමේදී ක්‍රියාකල යුතු ආකාරය පිළිබඳ මාර්ගෝපදේශ මාලාවක් නිකුත් කර ඇත. | මේ දක්වා නිරවුල් කරගෙන නැත. |
| 6. | මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ විවිධ වගකීම් යටතේ දක්වා තිබූ අතිරික්ත අරමුදලට ගෙවිය යුතු රු.6,017,551 ක් වූ | 2023<br>2022<br>2021 | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට ක්‍රියා කළ යුතුය. | මෙම ශේෂ නිරවුල් කිරීම සඳහා අමාත්‍යාංශ නිලධාරියෙක් ඇතුලත්ව කමිටුවක් පත් කර ඇත. බාහිර | මේ දක්වා නිරවුල් කරගෙන නැත. |

| | |
|---|---|
| ශේෂය 1987 වර්ෂයේ සිට නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | පාර්ශවයකගේ සුදුසු නිලධාරීන් වෙත අදාල කාර්යයන් පැවරීමට කටයුතු කරගෙන යනු ලබයි. |

## 3.43 සමූපකාර සංවර්ධන අරමුදල

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 1,038,964,621 | 528,781,007 | 510,183,614 | 68,573,375 | තත්ත්වාගණනය කළ |
| **2022** | 1,204,840,127 | 615,244,199 | 589,595,928 | 79,412,313 | තත්ත්වාගණනය කළ |
| **2023** | 1,573,589,009 | 724,437,463 | 849,151,546 | 259,555,617 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| 1. | 2023 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අක්‍රීය සමිති 45 කින් ලැබිය යුතු රු.30,461,782 ක් හා සක්‍රීය සමිති දෙකකින් ලැබිය යුතු රු.3,016,480 ක්ද වශයෙන් එකතුව රු.33,478,262 ක හිඟ ණය ශේෂයෙන් හා ලැබිය යුතු පොලිය රු. 8,608,138 කින් ණය වාරික ලෙස රු.14,366 ක් පමණක් අය වී තිබුණි. එම ණය හා පොලිය අතර වර්ෂ 12 ක සිට වර්ෂ 60 ක් දක්වා කාල පරාසයක් තුල අය නොවී පවතින ශේෂයන්ද වූ අතර, ඉන් අක්‍රීය සමිති 15 කට ලබාදුන් රු.8,080,900 ක් වූ ණය මුදලින් කිසිදු ණය වාරිකයක් අය වී | 2023 3.1 (අ) 2022 2021 | ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කල යුතුය. | ණය අයකිරීමේ කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක කරන බව. | 2024 සැප්තැම්බර් 15 දින වන විට සක්‍රිය සමිති 5 කින් රු. 1,166,656ක් පමණක් අයකරගෙන තිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | නොතිබුණි. | | | | |
| 2. | 2023 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වෙනත් ජංගම වත්කම් යටතේ දක්වා තිබුණු 1997 වර්ෂයේ සිට පැවත එන රු.2,666,000 ක් වූ සමූපකාර විදුහල් ණය, 2012 වර්ෂයට පෙර සිට පැවත එන රු.281,379 ක් වූ කාර්යසාධන අත්තිකාරම් හා රු.882,175 ක් වූ ලැබිය යුතු උසාවි වන්දි මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2023 2022 2021 | ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කල යුතුය. | කරුණු සොයාබලා ඉදිරි ක්‍රියාමාර්ග ගැනිමට නියමිත බව. | මේ දක්වා ණය අයකරගෙන නැත. |
| 3. | සිමාසහිත කොබෙයිගනේ විවිධ සේවා සමූපකාර සමිතියට 2012 වර්ෂයේදී ලබා දී තිබූ රු.මිලියන 3ක ණය මුදලින් අය නොවූ ණය ශේෂය රු.2,983,090 ක් හා ඊට අදාල පොලිය රු.3,231,662 ක් වූයෙන් 2023 දෙසැම්බර් 31 දිනට අයකරගෙන නොතිබූ මුළු මුදල රු.6,214,752 ක් වී තිබුණි. | 2023 2022 2021 | ණය ලබා දීම විධිමත්ව සිදු කළ යුතු අතර ණය අයකර ගැනීමට කටයුතු කල යුතුය. | වර්තමානයේ ණය නිදහස් කිරීමේ දී අදාල ගිවිසුම් ප්‍රකාරව කටයුතු කරනු ලබයි. මෙම ණය සම්බන්ධව නීති ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතී. | මේ දක්වා ණය අයකරගෙන නැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| 4. | 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු දායක මුදල් ශේෂය රු.216,749,648 ක් වූ අතර ඉන් පිළිවෙලින් රු.159,194,344 ක් හා රු.17,767,353 ක් වශයෙන් සීමාසහිත සමූපකාර අධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ සමූපකාර සමිතියෙන් හා සීමාසහිත සමූපකාර රාජ්‍ය සේවා සණස යන සමිති දෙකෙන් අයවිය යුතුව පැවති අතර, එය මුළු දායක මුදලෙන් සියයට 82 ක ඉහළ ප්‍රතිශතයක් විය. | 2023<br>2022<br>2021 | ලැබිය යුතු ශේෂ අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කල යුතුය. | 2024.08.26 දිනැති ලිපිය මගින් ලැබිය යුතු දායක මුදල් කඩිනමින් ගෙවා අවසන් කරන ලෙස දන්වා හිඟ ශේෂයන් ඇති සියලු සමිති වෙත දැනුම් දී ඇත. | 2024.10.07 දිනට සමස්ථ අයවීම් රු.42,631,025 වූ අතර සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ සමූපකාර සමිතියෙන් අයවීම් රු.7,000,000ක් ද සී/ස සමූපකාර රාජ්‍ය සේවා සණස සමිතියේ අයවීම් රු. 4,345,925ක් ද විය. |
| 5. | චක්‍රීය අරමුදලින් 2010 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ පළාත් සමූපකාර සංගම් 9 ක් සඳහා රු.මිලියන 306 ක ණය මුදලක් ලබාදී තිබුණි. එම ණය මුදල් වලින් දකුණ සහ උතුරු මැද යන පළාත් වලින් 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.9,626,500 ක ණය වාරික වලින් කිසිදු මුදලක් ලැබී නොතිබුණි. | 2023<br>2022<br>2021 | ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කල යුතුය. | දකුණු පලාත් හා බස්නාහිර පළාත් සමූපකාර සංවර්ධන කොමසාරිස් වෙත අදාල ණය මුදල අයකර ගැනීම සඳහා මැදිහත් වීම සිදුකරන ලෙස ඉල්ලීම් සිදුකර ඇත. | මේ දක්වා ණය අයකරගෙන නැත. |
| 6. | චක්‍රිය අරමුදලින් 2011 හා 2012 වර්ෂවල සමූපකාර පාරිභෝගික | 2023<br>2022 | ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කල යුතුය. | 2024.07.10 දින සමිති නියෝජිතයන් ගෙන්වා මෙම ණය | මේ දක්වා ණය අයකරගෙන නැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | සංගමයට ලබා දී තිබු රු.මිලියන 191 ක ණය මුදලින් 2023 දෙසැම්බර් 31 වන විට ලැබිය යුතු මුදල රු.මිලියන 64 ක් විය. ණය ගිවිසුම් අනුව ණය ලබාගෙන මාසයක් හෝ දෙකක් ඇතුලත එම ණය පියවිය යුතු වුවත් වසර 11 ක් ගත වී තිබුණද එම ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | | | ගෙවීමට කටයුතු කරන ලෙස දැනුම් දී ඇත. | |
| 7. | 2011 වර්ෂයේදී රු.මිලියන 152.5 ක ණය මුදලක් සමූපකාර තොග වෙළඳ සංස්ථාවට ලබා දී තිබුණි. එම මුදලින් 2012 වර්ෂයේදී රු.මිලියන 60 ක් පමණක් අය වී තිබුණු අතර, 2023 දෙසැම්බර් 31 දිනට තවදුරටත් අයවිය යුතු ණය ශේෂය රු.මිලියන 92.5 ක් විය. | 2023<br>2022<br>2021 | ණය අයකර ගැනීමට කටයුතු කල යුතුය. | ණය මුදල ගෙවීමට කටයුතු කරන ලෙස දැනුම් දී ඇත. | මේ දක්වා ණය අයකරගෙන නැත. |

## 3.44 ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 15,536,827,871 | 70,706,982 | 15,466,120,889 | 1,292,729,814 | ව්‍යාවනය කළ |
| **2022** | 16,103,992,501 | 532,009,954 | 15,571,982,547 | 1,746,616,255 | තත්ත්වාගණනය කළ |
| **2023** | 20,558,991,405 | 1,417,429,734 | 19,141,561,671 | 2,343,035,448 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ගය | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්වය |
|---|---|---|---|---|---|
| 1. | අරමුදල වෙනුවෙන් මාර්ගගත ලොතරැයියක් ආරම්භ කිරීම සඳහා 2021 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණු අතර, තෝරාගත් ආයෝජක ආයතනය වෙත එම කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා 2023 පෙබරවාරි 07 දිනැති ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලැබී තිබුණ ද, මෙම ලිපියේ දින වන විටත් මාර්ගගත ලොතරැයිය ක්‍රියාත්මක කර නොතිබුණි. | 2022 3.2 (VII)<br><br>2023 | ක්‍රියාකාරි සැලැස්මේ ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කළ යුතුය. | ප්‍රසම්පාදන කමිටු නිර්දේශ ප්‍රකාරව ක්‍රියා නොකිරීම සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කොමිෂන් සභාවට සහ අල්ලස් හෝ දූෂණ විමර්ෂන කොමිෂන් සභාවට පැමිණිලි කිරීම. | ලොතරැයිය මේ දක්වා ක්‍රියාත්මක නොවේ. මේ සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ කොමිෂන් සභාව විසින් පරීක්ෂණයක් සිදු කරනු ලැබේ. |
| 2. | යෝජිත ජාත්‍යන්තර විශ්වවිද්‍යාල ගම්මානය ඉදි කිරිම සඳහා හොරණ මිල්ලෑව වත්ත ඉඩමෙන් අක්කර 123 රූඩ් 2 පර්චර්ස් 29.7 ක | 2022 3.2 (IV)<br><br>2023 | ඉඩම් සම්බන්ධයෙන් හිමිකම් ඔප්පුව කඩිනමින් ලබාගත යුතුය. | ඉඩම සඳහා අත්තිකාරම් මුදලක් පමණක් ගෙවා ඇති අතර අවසාන ගෙවීම සිදු කිරීමේදී අත්පත් කර ගැනීමට යෝජිත ඉඩම් ප්‍රමාණය සඳහා | ඉඩම සඳහා මේ දක්වා හිමිකම් ඔප්පුව ලැබී නොතිබුණි. |

| | |
|---|---|
| ඉඩමක් මිලදී ගැනීම සඳහා 2021 දෙසැම්බර් 29 දින අරමුදල විසින් රු. 340,200,000 ක මුදලක් නාගරික සංවර්ධන අධිකාරිය වෙත ගෙවා තිබුණ ද 2023 ඔක්තෝබර් 24 දින එම අධිකාරිය විසින් අක්කර 117 රූඩ් 01 පර්චර්ස් 22.7 ක් සඳහා පමණක් භිස් කායික භුක්තිය ලබාදී තිබුණි. ඒ අනුව අරමුදලට අක්කර 6 රූඩ් 1 පර්චර්ස් 07 ක් අහිමි වී තිබුණු අතර රු. 17,311,224 ක මුදලක් වැඩියෙන් ගෙවා තිබුණි. එසේම, ඉඩම් ආඥා පනතේ 6(1) වගන්තිය අනුව ඉඩම වෙනුවෙන් නිදහස් දීමනා පත්‍රයක් ලබා දීම සඳහා ඉඩමේ වන්දි තක්සේරුව සම්පූර්ණ කල යුතු අතර මෙහිදි වන්දි තක්සේරුව සම්පූර්ණ වී නොමැති බැවින් නාගරික සංවර්ධන අධිකාරියට නිදහස් දීමනා පත්‍රයක් ලබා ගැනීමට හැකියාවක් ලැබී නොතිබුණි. ඒ අනුව 2024 අගෝස්තු 22 දින වන විටත් ඉඩම සම්බන්ධයෙන් අරමුදලට හිමිකම් ඔප්පුවක් ලබා ගැනීමට නොහැකි වී තිබුණි. | පමණක් ගෙවීම් කිරීම. |

### 3.45 මිනුම් ඒකක ප්‍රමිති හා සේවා අරමුදල

| | **මුළු වත්කම්** | **මුළු වගකීම්** | **ස්කන්ධය** | **බදු පෙර ලාභය (අලාභය)** | **මතය** |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 1,692,768,235 | 41,573,704 | 1,651,194,531 | 66,445,027 | තත්ත්වාගණනය කළ |
| **2022** | 1,788,132,257 | 44,089,641 | 1,744,042,616 | 75,092,226 | තත්ත්වාගණනය කළ |
| **2023** | 1,889,407,329 | 24,292,931 | 1,865,114,398 | 165,955,538 | තත්ත්වාගණනය කළ |

| | **විගණන නිරීක්ෂණය** | **වාර්තාවේ වර්ෂය** | **විගණකාධිපතිගේ නිර්දේශය** | **විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග** | **වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය** |
|---|---|---|---|---|---|
| 1. | 1995 අංක 35 දරන මිනුම් ඒකක ප්‍රමිත හා සේවා පනතේ 20 (1) (අ) සහ 37 වගන්තිය වෙළඳාමේ භාවිතා වන සියලුම මිනුම් උපකරණ වාර්ෂිකව සත්‍යාක්ෂණය කලයුතු වුවත් භාවිතා කරනු ලබන සෑම උපකරණයක්ම සත්‍යාක්ෂණය කරන බව තහවුරු කර ගැනීමේ නිසි ක්‍රමවේදයක් අරමුදල තුල මේ දක්වා ස්ථාපිත කර නොතිබුණි. | 2023 1.6 (අ)<br><br>2022 1.6 (අ)<br><br>2021 1.6 (අ) | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. | සියළුම මිනුම් උපකරණ සඳහා ලියාපදිංචි අංකයක් ලබා දී විධිමත් දත්ත පද්ධතියක් සකස් කිරීම සඳහා කටයුතු ආරම්භ කර ඇති අතර එහි ප්‍රගතිය මීලග විගණනයේදී වාර්තා කිරීමට කටයුතු කරනු ලබන බව | තහවුරු කර ගැනීමේ ක්‍රමවේදයක් මේ දක්වා ස්ථාපිත කර නැත. |
| 2. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 371 (2) (ආ) සමාලෝචිත වර්ෂයේදී භාණ්ඩාගාර අනුමැතියකින් තොරව | 2023 1.6 (ආ) | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. | 2024 වර්ෂයේදී රු.100,000 සීමාව ඉක්මවා නොයන ලෙස කටයුතු කරන බව | 2024 වර්ෂයේදී ද රු. 100,000 ඉක්මවා අත්තිකාරම් ලබා දී තිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | නිලධාරීන් 04 දෙනෙකුට රු.100,000 ඉක්මවා එකතුව රු.900,000 ක් වූ ඉන්ධන අත්තිකාරම් ලබා දී තිබුණි. | | | | |
| 3. | දෙපාර්තමේන්තුවේ විද්‍යාගාර කාමර 66ක් සහිතව 2015 සිට ජාතික මිනුම් පර්යේෂණාගාරය පිහිටුවා තිබුණද වර්තමානයේ මිනුම් ක්ෂේත්‍ර 12 ක් සඳහා විද්‍යාගාර කාමර 33 ක් පමණක් ක්‍රියාකාරීව පවත්වාගෙන යන අතර ඉතිරි කාමර 33 ක් (වර්ග අඩි 140,060 ප්‍රමාණයක්) විගණිත දින දක්වා නිශ්කාර්යව පවතින බව නිරීක්ෂණය විය. | 2023 3.4 | වත්කම් ඵලදායීව උපයෝජනය කිරීමට කටයුතු කල යුතුය. | දැනට විද්‍යාගාර කාමර 20ක් වායු සමීකරණ යන්ත්‍ර යොදාගෙන පර්යේෂණාගාර පවත්වාගෙන යන අතර අනෙකුත් පර්යේෂණ කාමර වායු සමීකරණ පද්ධතියක් හා වාතාශ්‍රය නොමැතිව පවත්වාගෙන යා නොහැකි බව. | වාර්තාවේ දින දක්වාම නිශ්කාර්යව පවති. |

## 3.46 පොල් වගාකිරීමේ මණ්ඩලයේ අර්ථ සාධක අරමුදල

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | - | - | - | - | - |
| **2022** | - | - | - | - | - |
| **2023** | - | - | - | - | - |

2021, 2022 සහ 2023 වර්ෂ සඳහා මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොමැත.

| | විගණන නිරීක්ෂණ | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| 1. | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය හා 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.6 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2021, 2022 හා 2023 මූල්‍ය වර්ෂයන්ට අදාළ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2021 – 2023 ගනුදෙනු වාර්තාව | යොමුගත චක්‍රලේඛ ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. | 2021 මාර්තු මුල් වරට මෙම අරමුදලේ වංචාව අනාවරණය වීමෙන් පසු 2021 පැවති මහ සභා රැස්වීමේදී ගත් තීරණ අනුව මෙම අරමුදල මහ බැංකුව වෙත පැවරීමට කමිටුවක් පත් කරන ලදී. ඉන් අනතුරුව අරමුදලේ අවසන් ගිණුම් සැකසීම 2019 සිට 2021 දක්වා 2022 වර්ෂයේදී සිදු කරන ලද අතර 2021 වර්ෂයේ අවසන් ගිණුම් මේ වන විට රජයේ විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට සූදානම් කොට ඇත. | 2021 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2. | 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනතේ 27 (3) වගන්තිය හා 1973 මැයි 02 දින කම්කරු දෙපාර්තමේන්තුවෙන් අනුමත කරන ලද පොල් වගාකිරීමේ මණ්ඩලයේ අර්ථ සාධක අරමුදල් ව්‍යවස්ථාවේ 6 (II) වගන්තිය ප්‍රකාරව අනුමත කරන ලද අර්ථසාධක අරමුදලක් පාලනය කෙරෙන ව්‍යවස්ථා හෝ නියෝග කොමසාරිස්වරයාගේ ලිපිගත අනුමැතිය ඇතිව මිස වෙනස් නොකළ යුතු අතර අරමුදලේ පාලනය පිළිබඳ, නියෝගයන් පනවා නොමැති කිසියම් කරුණක් හෝ දෙයක් සම්බන්ධයෙන් ද වූ සියලු කරුණු ගැන පාලන කාරක සභාවේ වැඩි දෙනාගේ තීරණයට, කම්කරු කොමසාරිස්වරයාගේ සහ දේශීය ආදායම් කොමසාරිස්වරයාගේ ආවරණ අනුමැතිය ලබාගැනීමෙන් පසුව, ඒ අනුව ක්‍රියා කළ යුතු වුවද යථෝක්ත අනුමැතියන්ගෙන් තොරව 2008 ජුනි 19 දින පැවැත්වූ පාලන කාරක සභාව විසින් ගන්නා ලද තීරණය ප්‍රකාරව සාමාජිකයන්ගේ වයස අවුරුදු 55 සම්පූර්ණ වූ පසු එක් | 2021 – 2023 ගනුදෙනු වාර්තාව | පනතේ විධිවිධාන හා යොමුගත ව්‍යවස්ථාවට අනුකූලව අත්තිකාරම් සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය. | 2021 පැවති මහ සභා රැස්වීමෙන් අනතුරුව ඒ වන විට ඉදිරිපත් කර තිබූ අත්තිකාරම් අයදුම්පත් හා ඒ වන විට වයස අවුරුදු 55 හා 57 සම්පූර්ණ කර තිබූ සාමාජිකයින් සඳහා පමණක් අත්තිකාරම් මුදල් නිදහස් කිරීම 2022 වර්ෂයේදී සිදු කරන ලදී. ඉන් අනතුරුව මෙම අරමුදල මහ බැංකුව වෙත පැවරීම සඳහා මහ සභා රැස්වීමේදී අනුමත වීමෙන් අනතුරුව අත්තිකාරම් හා ණය ලබාදීම් නවතා ඇත. | 2021, 2022 වර්ෂයන්හි පිළිවෙලින් රු.2,240,000 ක් හා රු.14,780,000 ක් සාමාජිකයන් වෙත ගෙවා තිබුණු අතර 2023 වර්ෂයේදී අත්තිකාරම් ගෙවා නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | වරක්ද, ඊට අවුරුදු 2½ කට පසු එනම් වයස අවුරුදු 57½ සම්පූර්ණ වූ විට නැවත වරක්ද වශයෙන් අවස්ථා දෙකකදී අත්තිකාරම් ගෙවා තිබුණි. 2021, 2022 වර්ෂයන්හි පිළිවෙලින් රු.2,240,000 ක් හා රු.14,780,000 ක් සාමාජිකයන් වෙත ගෙවා තිබුණු අතර 2023 වර්ෂයේදී අත්තිකාරම් ගෙවා නොතිබුණි. | | | | |
| 3. | 1973 මැයි 02 දින කම්කරු දෙපාර්තමේන්තුවෙන් අනුමත කරන ලද පොල් වගාකිරීමේ මණ්ඩලයේ අර්ථ සාධක අරමුදල් ව්‍යවස්ථාවේ (i) 28 වගන්තිය ප්‍රකාරව සෑම ලිත් වර්ෂයක් සඳහා සූදානම් කළ යුතු අරමුදලේ ගිණුම්, කම්කරු කොමසාරිස් විසින් අනුමත කරනු ලැබූ විගණකවරයෙකු විසින් සෑම දොළොස් මසකට වරක් බැගින් විගණනය කළ යුතු වුවද 2023 වර්ෂය දක්වා අරමුදලේ ගිණුම් විගණනය කිරීමේ ආයතන පත් කිරීම සඳහා කම්කරු කොමසාරිස් වෙතින් අනුමැතිය ලබාගෙන නොතිබුණි. | 2021 – 2023 ගනුදෙනු වාර්තාව | අදාළ කාලපරිච්ඡේදය ට අදාළ අරමුදලේ ගිණුම් කම්කරු කොමසාරිස් විසින් අනුමත කළ විගණකයෙකු මඟින් විගණනය කරවා ගැනීමට කටයුතු නොකිරීම සම්බන්ධයෙන් බලධාරීන්ට එරෙහිව කටයුතු කළ යුතුය. | 2019 වර්ෂයේ සිට ඉදිරියට විගණන කටයුතු රජයේ විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් සිදුකරන අතර ඒ සඳහා කම්කරු කොමසාරිස්තුමා ගේ අනුමැතිය ලබාගැනීමට කටයුතු කරනු ඇත. | 2021 සිට 2023 වර්ෂය දක්වා අරමුදලේ ගිණුම් විගණනය කිරීමේ ආයතන පත් කිරීම සඳහා කම්කරු කොමසාරිස් වෙතින් අනුමැතිය ලබාගෙන නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| 4. | 2021 වර්ෂයේදී අනාවරණය කරගෙන තිබූ පරිදි අරමුදලේ ලේකම් ලෙස කටයුතු කල පොල් වගා කිරීමේ මණ්ඩලයේ ගණකාධිකාරි විසින් අරමුදලේ සාමාජික නොවන සිය පවුලේ සාමාජිකයන් ඇතුලු 13 දෙනෙකු වෙත ණය, දායක අත්තිකාරම් සහ විශ්‍රාම ප්‍රතිදාන ලෙස චෙක්පත් මගින් මුදල් ලබා දීම තුළින් 2012 වර්ෂයේ සිට වංචා කර තිබූ මුදල 2021 දෙසැම්බර් 31 වන විට රු.77,727,691 ක් වී තිබුණි. වංචාව නිසා අරමුදලට සිදු වූ පාඩුව පියවා ගැනීම සඳහා නීතිපති දෙපාර්තුමේන්තුවේ සහාය ඇතිව අදාළ පුද්ගලයන්ට එරෙහිව සිවිල් නඩු පැවරිය යුතු වුවද 2023 දෙසැම්බර් 31 දක්වා එබඳු නඩු පවරා නොතිබුණු බව නිරීක්ෂණය විය. තවද වංචාව සිදු වූ කාලය වූ 2012 සිට 2021 දක්වා අරමුදලේ ගෙවීම් කටයුතු සිදුකිරීම සඳහා චෙක්පත්වල දෙවන අත්සන් තැබූ අරමුදලේ සභාපතිවරු 7ක් හා වැඩ බැලීමේ හා ද්විතීය පදනම මත පත්කර තිබුණු සාමාන්‍යාධිකාරිවරුන් 7 ක් සම්බන්ධයෙන් කිසිදු | 2021 – 2023 ගනුදෙනු වාර්තාව | වංචාවට අදාළ සියළුම පාර්ශවයන්ට නීතිමය පියවර ගතයුතු අතර වංචාකර තිබූ අරමුදලේ මුදල් නැවත අයකර ගැනීමට කටයුතු කළ යුතුය | වංචාව පිළිබඳ නීතිමය පියවර ගැනීම සඳහා 2021.08.12 වන දින මූල්‍ය අපරාධ විමර්ෂණ කොට්ඨාශව වෙත සාමාන්‍යාධිකාරී විසින් සිදුකළ පැමිණිල්ල අනුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයේ විමර්ශනයන් පිළිබඳව කරුණු වාර්තා කර එකොළොස්දෙනෙක් අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාරගත කිරිමට කටයුතු කල අතර මේ වන විට එම සියළුම සැකකරුවන්ට ගරු අධිකරණය විසින් ඇප ලබාදී ඇත. අදාල වංචාව සම්බන්ධයෙන් චූදිතයන්ට එරෙහිව නිතිපති දෙපාර්තමේන්තුව විසින් නඩුගොනු කරන අතර කඩුවෙල දිසා අධිකරණයේ හා සුළු හිමිකම් අධිකරණයේ නඩු ගොනුකර ක්‍රියාත්මක වෙමින් ඇත. | රු.77,727,691 ක මුළු වංචාවෙන් රු.15,898,523ක් පමණක් 2023 දෙසැම්බර් 31 දින වන විට අයකරගෙන තිබුණි. වංචාව සිදු වූ කාලය වූ 2012 සිට 2021 දක්වා අරමුදලේ ගෙවීම් කටයුතු සිදුකිරීම සඳහා චෙක්පත්වල දෙවන අත්සන් තැබූ අරමුදලේ සභාපතිවරු 7ක් හා වැඩ බැලීමේ හා ද්විතීය පදනම මත පත්කර තිබුණු සාමාන්‍යාධිකාරිවරුන් 7 ක් සම්බන්ධයෙන් කිසිදු නීතිමය කටයුත්තක් 2024 ජුලි 31 දින දක්වා සිදු කර නොමැත. |

නීතිමය කටයුත්තක් 2024 ජූලි 31 දින දක්වා සිදු කර නොතිබුණු අතර මුළු වංචාවෙන් රු.15,898,523ක් පමණක් 2023 දෙසැම්බර් 31 දින වන විට අයකරගෙන තිබුණි.

## 3.47 ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 1,550,518,459 | 21,383,670 | 1,529,134,789 | 188,434,938 | තත්ත්වාගණනය කළ |
| **2022** | 2,186,557,075 | 497,215,266 | 1,689,341,809 | 164,877,523 | තත්ත්වාගණනය කළ |
| **2023** | 2,165,759,378 | 78,567,872 | 2,087,191,506 | 371,298,795 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| 1. | ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවා නංවාලීම වෙනුවෙන් ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල සතු පොදු අරමුදල් උපයෝජනය කරගැනීම දුර්වල තත්ත්වයක පැවතුණු බව නිරීක්ෂණය වූ අතර 2023 දෙසැම්බර් 31 දින වනවිට පොදු අරමුදලේ සමුච්චිත ආදායම රු.729,412,012ක් වූ අතර පනතේ අරමුණු ඉටුකිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී පොදු අරමුදල්වලින් වැයකර තිබුණු මුදල රු.60,614,018ක් පමණක් විය. මේ අනුව අරමුදලේ මුදල් උපයෝජනය සියයට 8.3 ක පහළ මට්ටමක පැවතුණි. | 2021-2.3 (ඊ) 2022-2.3 (උ) 2023-2.3 (ඊ) | අදාල ආයතන දැනුවත් කර අරමුදල් කාර්යක්ෂමව හා ඵලදායීව භාවිතා කළ යුතුය. | ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදලේ 2.2.1 ඡේදය ප්‍රකාරව අවිච්ඡින්න පැවැත්ම තහවුරු කරමින් අරමුදලේ මුදල් උපයෝජනය කරන බව. | 2024 සැප්තැම්බර් 30 දින වන විටත් මෙම තත්ත්වය නිවැරදි කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2. | අම්පාර මහ රෝහල සතු ගොඩනැගිල්ලක් අළුත්වැඩියාකර ගෙවන වාට්ටුවක් ස්ථාපිත කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබාදී තිබුණද ගොඩනැගිල්ල අළුත්වැඩියා කරනවා වෙනුවට කාමර 8කින් සමන්විත ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා සෞඛ්‍ය සංවර්ධන අරමුදලින් රු.මිලියන 18.20ක් වැයකර තිබුණි. 2017 වර්ෂයේදී මෙම ගෙවන වාට්ටුව ස්ථාපිත කර තිබුණු අතර අමාත්‍යමණ්ඩල සංදේශය ප්‍රකාරව ගෙවන වාට්ටු ආදායමින් සියයට 60ක් ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදලටත් ඉතිරිය ඒකාබද්ධ අරමුදලටත් බැර කිරීමට තීරණය කර තිබුණි. 2018 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය වෙනුවෙන් රු.2,113,932ක මුදලක් ගෙවන වාට්ටුවේ ආදායම් ලෙස අරමුදල වෙත ලැබී තිබුණද, පසුගිය වර්ෂ දෙකක කාලයක් තුල ආදායම් නොලබා නිශ්කාර්යව පැවතුණි. | 2022-2.3(ඊ) 2023-2.3(ඇ) | ගෙවන වාට්ටුව සඳහා වූ අවශ්‍යතාවයන් සම්පූර්ණ කර නියමිත ගාස්තු අයකර ගැනීමට කටයුතු කල යුතුය. | සමාලෝචිත වර්ෂයේ රටේ උද්ගතව පැවති තත්ත්වය හේතුවෙන් ගෙවන වාට්ටුව සඳහා රෝගීන් ඇතුලත් වී නොමැති බැවින් ආදායම් ලබා නොමැති බව | 2024 සැප්තැම්බර් 30 දින වන විටත් මෙම තත්ත්වය නිවැරදි කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| 3. | 1998 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අරමුදල වෙත විවිධ ව්‍යාපෘති 04කට අදාලව ලැබී තිබුණු රු.13,758,807ක් වූ පරිත්‍යාග අරමුණුගත කාර්යයන් ඉටුකිරීම සඳහා යෙදවීමට කටයුතු නොකර පරිත්‍යාග ගිණුමේ රඳවාගෙන තිබුණි. | 2021-2.3 (ඇ) 2022-2.2.4(ඇ) 2023-2.3 (ඌ) | අරමුණුගත කාර්යයන් ඉටුකිරීම සඳහා පරිත්‍යාග මුදල් කාර්යක්ෂමව යෙදවීමට කටයුතු කළ යුතුය. | කිරිගෝරිස් අප්පුහාමි අරමුදල තංගල්ල මූලික රෝහලේ රෝගී වැසිකිළි පිළිසකර කිරීම සඳහා යොදා ගන්නා බව, තැලසීමියා රෝගීන් සඳහා වූ මහජන අරමුදල අවශ්‍ය වූ විට ලබා ගැනීම සඳහා රඳවා තබා ගන්නා ලෙස දැනුම් දී ඇති බව හා කොවිඩ් මර්ධන වැඩසටහන් වෙනුවෙන් ලැබී ඇති මුදල එම වැඩසටහන් වෙනුවෙන් පමණක් යෙදවීමට කටයුතු කර ඇති බව. | 2024 සැප්තැම්බර් 30 දින වන විටත් අරමුණුගත කාර්යයන් ඉටු කර නොතිබුණි. |
| 4. | 2010 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා වූ කාලපරිච්ඡේදය තුළ රු.674,624,055ක් ලොතරැයි ආදායම ලෙස ලැබී තිබුණු අතර ලොතරැයිය ආරම්භයේදී රෝහල් උපකරණ මිලදීගැනීම හා රෝහල් අළුත්වැඩියාකිරීම සඳහා මෙම ආදායම් යෙදවිය යුතු බවට තීරණය කර තිබුණද එම අරමුණුගත කාර්යයන් ඉටුකිරීම සඳහා 2023 දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදය තුළ පිළිවෙලින් රු.95,053,462ක් හා රු.332,146,734ක් ලෙස | 2021-2.3 (ඌ) 2022-2.3 (එ) 2023-2.3(උ) | ලොතරැයිය ක්‍රියාත්මක කිරීම තුළින් අපේක්ෂිත අරමුණු ඉටුකිරීම සඳහා ලොතරැයි ආදායම භාවිතා කළ යුතුය. | 1981 අංක 13 දරන ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදලේ 7 ඡේදය ප්‍රකාරව අරමුදලේ අරමුණු සඳහා ලොතරැයි ආදායම වැයකර තිබුණු බව | 2024 සැප්තැම්බර් 30 දින වන විටත් අරමුණුගත කාර්යයන් ඉටුකිරීම පහළ මට්ටමක පවතී. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | එකතුව රු.427,200,196ක් පමණක් වැයකර තිබුණි. | | | | |
| 5. | 2023 ඔක්තෝබර් 17 දිනැති 2023 අංක 22 දරන ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකු භාරය පනත මගින් වෙනම ආයතනික ව්‍යුහයක් සහිත ඒකකයක් වශයෙන් ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකු භාරය ස්ථාපිත කර තිබුණද කාර්යමණ්ඩල බඳවා ගැනීමේ පටිපාටි සකස්කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | 2023-2.3 (අ)(ii) | කාර්යමණ්ඩල බඳවා ගැනීමේ පටිපාටි සකස්කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු වේ අනුමැතිය ලබාගැනීමට කටයුතු කළ යුතුය. | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 12/2003 අනුව සංස්ථාමය සැලැස්මට අනුකූලව තනතුරු ඇතිකර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියට යටත්ව සේවකයන් බඳවා ගත යුතු බව | 2024 සැප්තැම්බර් 30 දින වන විටත් මෙම තත්ත්වය නිවැරදි කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| 6. | 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 1.1 ඡේදයේ සඳහන් විධිවිධානයන්ට අනුව අවශ්‍ය කොන්දේසි සපුරා නොතිබීම හේතුවෙන් අක්ෂි බැංකුව විදේශාධාර ව්‍යාපෘතියක් ලෙස හඳුනාගත නොහැකිව තිබියදී ලෝක සෞඛ්‍ය සංවිධානයේ අරමුදල් මගින් ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවලට අදාල ගෙවීම් සම්බන්ධයෙන් නිකුත්කර තිබුණු 2022 දෙසැම්බර් 22 දිනැති අංක 1822/11 දරන සෞඛ්‍ය අමාත්‍යාංශයේ | 2023-2.3 (අ)(iii) | අමාත්‍ය මණ්ඩල හා මහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනීමට කටයුතු කළ යුතුය. | සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පාලනය වන විදේශාධාර මගින් ක්‍රියාත්මක වන ව්‍යාපෘති වල සේවය කරන වෘත්තිකයන්ගේ සේවය සඳහා අමාත්‍ය මණ්ඩලයේ හා මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය සහිතව නිකුත් කර ඇති බැවින් චක්‍රලේඛය සඳහා නැවත මහා භාණ්ඩාගාරය හෝ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියක් අවශ්‍ය නොවන බව. | 2024 සැප්තැම්බර් 30 දින වන විටත් අනුමැතියක් ලබා නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | පොදු චක්‍රලේඛය පදනම් කරගෙන අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය මත නිලධාරීන් 31දෙනෙකු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රු.2,990,400ක් ගෙවීම් කර තිබුණි. දීමනා ගෙවීම් සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල අනුමැතියක් හෝ මහා භාණ්ඩාගාර අනුමැතියක් ලබා නොතිබුණි. | | | | |
| 7. | රිජ්වේ ආර්යා ළමා රෝහල සඳහා දස මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම හා උපකරණ මිලදීගැනීම වෙනුවෙන් Little Heart ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත වර්ෂය අවසානය වනවිට රැස් කරන ලද මහජන අරමුදල්වල එකතු වටිනාකම රු.624,435,910ක් වුවද, එම මුදලින් වර්ෂය තුළ රු.81,397,296ක් පමණක් වැයකර තිබුණි. | 2022-2.2.4 (අ) 2023-2.2.4 (අ) | පරිත්‍යාග මුදල් කාර්යක්ෂමව යෙදවීමට කටයුතු කළ යුතුය. | ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කරන ලෙස දන්වා අධ්‍යක්ෂ රිජ්වේ ආර්යා ළමා රෝහල වෙත සිහිකැඳවීම් යවා ඇති බව. | 2024 සැප්තැම්බර් 30 දින වන විටත් අරමුණුගත කාර්යයන් ඉටුකිරීම පහළ මට්ටමක පවතී. |
| 8. | 2019 හා 2020 වර්ෂයන්හි ව්‍යාපෘති කාර්යයන් නිමකල ව්‍යාපෘති 03කට අදාලව එකතුව රු.9,324,047ක ඉතිරි මුදල් ඵලදායී ලෙස යොදා ගැනීමට කටයුතු කිරීමකින් තොරව තවදුරටත් පරිත්‍යාග ගිණුමේ රඳවාගෙන තිබුණි. | 2019 - 3.4 (අ) 2022-2.2.4(ආ) 2023-3.2 (ආ) | අරමුදල් ඵලදායී ලෙස යොදා ගැනීමට කටයුතු කළ යුතුය. | Fellowship programme for Korean Doctors ඉතිරි මුදල අතිරේක ලේකම් මහජන සම්බන්ධතා විසින් රඳවා තබා ගන්නා ලෙස දැනුම් දී ඇති බව, රත්නපුර රෝහල සඳහා PCR යන්ත්‍රයේ ඉතිරි මුදල මුළුතැන්ගෙය නවීකරණය | 2024 සැප්තැම්බර් 30 දින වන විටත් මෙම තත්ත්වය නිවැරදි කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | සඳහාත්, හම්බන්තොට දිස්ත්‍රික් PCR යන්ත්‍රය සඳහා ඉතිරි මුදල රෝගීන් බැලීමට පැමිණෙන ජනතාව වෙනුවෙන් අසුන් ගැනීමට ස්ථානයක් සැකසීමට හා යතුරුපැදි නවතා තැබීමට අංගනයක් ඉදිකිරීමටත් කටයුතු කරන බව. | |
| 9. | අංක අමප/12/0489/509/022 දරන 2012 මැයි 04 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව උතුරු පළාතේ පිළිකා රෝගීන් සඳහා වූ ව්‍යාපෘතිය යටතේ තෙලිප්පලේ මූලික රෝහලේ විකිරණ ප්‍රතිකාර ඒකකය ඉදිකිරීම හා යාපනය ශික්ෂණ රෝහලේ ළමා ප්‍රතිකාර ඒකකය සඳහා වෛද්‍ය උපකරණ ලබාදීම වෙනුවෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය, පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය, ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල සහ ආධාරක ආයතනය වන භාරකාර සමාගමක් අතර එළඹ තිබුණු අවබෝධතා ගිවිසුම අනුව Jaffna Project නමින් අදාල භාරකාර සමාගම විසින් එකතු කරනු ලැබූ ආධාර මුදල් | 2022 - 2.3 (ඉ) 2023- 2.3 (ආ) | මුදල් කඩිනමින් අයකරගෙන අරමුණුගත කාර්යයන් සඳහා යෙදවීමට කටයුතු කළ යුතුය. | ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදලේ භාරකාර මණ්ඩලයේ තීරණය පරිදි අදාල භාරකාර සමාගම වෙතින් ලැබිය යුතු මුදල් ලබාගැනීම සඳහා නීතිපතිවරයාගේ මැදිහත්වීම ඉල්ලා ලිපියක් යවා ඇති බව. | 2024 සැප්තැම්බර් 30 දින වන විටත් මෙම තත්ත්වය නිවැරදි කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් දේපලක් වන බැවින් 2023 මාර්තු 31 දින දක්වා වූ කාලපරිච්ඡේදය තුළ එසේ එකතු කළ රු.72,356,055ක මුදලක් ගිවිසුම ප්‍රකාරව යාපනය ශික්ෂණ රෝහලේ පිළිකා ඒකකය වැඩිදියුණු කිරීම සඳහා නොයොදවා එම සමාගම භාරයේ රඳවාගෙන තිබුණි. | | | | |
| 10. | 2023 දෙසැම්බර් 31 දිනට අපේක්ෂා රෝහල සඳහා වූ පරිත්‍යාග ගිණුමේ රු.406,243,364ක මුදලක් ඉතිරිව පැවති අතර 2022 හා 2023 වර්ෂයන්හිදී කිසිදු ඵලදායී කාර්යයක් සඳහා මෙම අරමුදල් භාවිතාකර නොතිබුණි. | 2022-2.3(ඇ) 2023-2.3(ඇ) | පරිත්‍යාග ලෙස ලැබුණු මුදල් කාර්යක්ෂමව යෙදවීමට කටයුතු කළ යුතුය. | 1981 අංක 13දරන ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල් පනතේ 6 සහ 7(ඇ) වගන්ති අනුව විශේෂ යෝජනා ක්‍රමයක් වෙනුවෙන් ලැබෙන පරිත්‍යාග අරමුදල වෙත බැර කෙරෙන අතර එම විශේෂ ව්‍යාපෘති සඳහා රජයේ විධිවිධානවලට අනුකූලව ගෙවීම පමණක් අරමුදලේ කාර්ය බව, එම විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කරවීමේ බලධරයා වනුයේ අදාල පරිත්‍යාග ලබන ආයතන ප්‍රධානීන් බව | 2024 සැප්තැම්බර් 30 දින වන විටත් අරමුණුගත කාර්යයන් ඉටුකිරීම පහළ මට්ටමක පවතී. |

## 3.48 විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 64,152,143,490 | 965,761,735 | 63,186,381,755 | 4,225,026,103 | තත්ත්වාගණනය නොකළ |
| **2022** | 73,196,807,111 | 1,391,544,316 | 71,805,262,795 | 6,015,429,579 | තත්ත්වාගණනය නොකළ |
| **2023** | 82,814,579,339 | 1,462,850,362 | 81,351,728,977 | 8,501,528,246 | තත්ත්වාගණනය නොකළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| 1. | 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 95 වගන්තිය හා 2022 පෙබරවාරි 07 දිනැති අංක 03/2022 දරන කොමිෂන් සභා චක්‍රලේඛය අනුව දායකයාගේ ගිණුම අවසන් කර මාස 03ක් තුළ ඔහුගේ අර්ථසාධක අරමුදලේ බැරට ඇති ශේෂය ගෙවිය යුතු වුවද, අවස්ථා 155ක දී මාස 01 සිට මාස 69 දක්වා වූ කාලයක් ප්‍රමාද වී ගෙවීම් කර තිබීම නිසා එම කාලය සඳහා රු.9,021,851ක අමතර පොළියක් ද ගෙවා තිබුණි. | 2021<br>2022<br>2023 | ප්‍රමාදයකින් තොරව අර්ථසාධක අරමුදල් නිදහස් කිරීම සඳහා ක්‍රමවේදයක් ස්ථාපිත කළ යුතුය. | විශ්වවිද්‍යාල පනතේ අංක 95 වගන්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධව පවතින ගැටළු සාකච්ඡා කර නිර්දේශයක් ලබා ගැනීම සඳහා කමිටුවක් පත්කර ඇත. | මේ දක්වා නිවැරදි කර නොතිබුණි. |

### 3.49 විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 17,386,922,134 | 234,767,606 | 17,152,154,528 | 1,222,412,486 | තත්ත්වාගණනය නොකළ |
| **2022** | 21,108,114,322 | 359,891,283 | 20,748,223,039 | 1,957,339,557 | තත්ත්වාගණනය නොකළ |
| **2023** | 25,796,243,374 | 476,602,477 | 25,319,640,897 | 3,182,236,075 | තත්ත්වාගණනය නොකළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| 1. | 2022 පෙබරවාරි 07 දිනැති අංක 03/2022 දරන කොමිෂන් සභා චක්‍ර ලේඛය අනුව දායකයාගේ ගිණුම අවසන් කර මාස 03ක් තුල ඔහුගේ විශ්‍රාම වැටුප් අරමුදල් ගිණුමේ බැරට ඇති ශේෂය ගෙවිය යුතු වුවද, අවස්ථා හතරකදි මාස 08 සිට මාස 39ක් දක්වා ප්‍රමාද වී ගෙවීම් කර තිබීම නිසා ප්‍රමාද කාලය සඳහා විශ්‍රාම වැටුප් අරමුදලින් රු.715,283 ක පොළියක් ගෙවීමට සිදුවී තිබුණි. | 2022<br>2023 | චක්‍රලේඛය ප්‍රකාරව ගෙවීම් සිදු කළ යුතුය. | සේවය අවසන් කර විශ්‍රාම වැටුප් ගෙවීම දක්වා වන ක්‍රියාවලියේ දුර්වලතා හඳුනාගෙන පරිගණක ගත කිරීම සඳහා නව පරිගණක පද්ධතියක් නිර්මාණය කිරීමට කටයුතු කරමින් පවතින බව. | මේ දක්වා නිවැරදි කර නොතිබුණි. |

## 3.50 ජාතික ක්‍රීඩා අරමුදල

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 62,147,776 | 539,503 | 61,608,273 | 12,466,552 | තත්ත්වාගණනය නොකළ |
| **2022** | 254,970,589 | 172,000 | 254,798,589 | 193,190,265 | තත්ත්වාගණනය නොකළ |
| **2023** | 291,208,715 | 381,760 | 290,826,955 | 36,028,367 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්වය |
|---|---|---|---|---|---|
| 1. | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සංශෝධනය කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 877 (1) ඇ) ඡේදය) ප්‍රකාරව 2023 වර්ෂයේ ජාතික ක්‍රීඩා අරමුදල් අයවැය සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | 2021<br>2022<br>2023 | අරමුදලේ අයවැය සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගත යුතු වීම. | 2024 වර්ෂය සඳහා විගණකාධිපති මහපෙන්වීම මත ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය හා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන ඇත. | නිර්දේශය ක්‍රියාත්මක කර තිබුණි. (2024 වර්ෂය සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන ඇත.) |
| 2. | අරමුදල පිහිටුවා වසර ක් ගතවී තිබුණ ද 51ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මට්ටමින් ඔලිම්පික් ක්‍රීඩා උළෙලවල් 20 කදී ඔලිම්පික් පදක්කම් 02 ක් ද පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා තරඟවලදී රිදී පදක්කම් ක් සහ ලෝකඩ 03 පදක්කම් 08 ක්ද | 2022<br>2023 | ක්‍රීඩා අරමුදලේ අරමුණු ඉටුකර ගැනීම සඳහා කටයුතු කල යුතු වීම. | ක්‍රීඩා අරමුදලට ලැබෙන සීමිත අරමුදල් තුලින් දැරිය හැකි වියදම් අඩු මට්ටමක පවතී. අරමුදලේ කාර්යයන් හා ක්‍රීඩක ක්‍රීඩිකාවන් ජාත්‍යන්තර තරඟවලදි පදක්කම් ලබා ගැනීම අතර | නිර්දේශය ක්‍රියාත්මක කරමින් පවතී. (නව පදක්කම් ජයග්‍රහණය කර නොතිබුණි. ) |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ආසියානු ක්‍රීඩා උළෙලයන්හිදී රන් පදක්කම් ක් 02, රිදී පදක්කම් ක් සහ 03 ලෝකඩ පදක්කම් 02 ක් හණ කර පමණක් ජයග .තිබුණි | | | සෘජු සම්බන්ධතාවයක් නොමැති අතර සංසන්දනය කිරිමක්ද කල නොහැක. | |
| 3. | වර්ෂයේ 2023 අරමුදලේ අයවැය මගින්ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පෝෂණ දීමනා, පුහුණුකරුවන්ගේ වියදම් හා කාර්යමණ්ඩලයේ ධාරිතාව වර්ධනය කිරීම සඳහා පිළිවෙලින් රු . 5,000,000, 200, 000 හා 1,000,වෙන් 000 කර තිබුණද එයින් කිසිඳු වියදමක් දරා .නොතිබුණි | 2021 2022 2023 | ක්‍රීඩකයන්ගේ කාර්ය සාධනය වර්ධනය කිරීම සඳහා අරමුදලේ අයවැය පිළිබඳ ප්‍රමාණවත් අවධානයක් යොමු කළ යුතු වීම. | 2023 වර්ෂයේදි මේ යටතේ අරමුදල් සඳහා ඉල්ලීමක් ලැබී නොතිබුණි. ඒ අනුව අයවැය සංශෝධනය කර ඇත. | නිර්දේශය ක්‍රියාත්මක කරමින් පවතී. (2024 වර්ෂයේ පරීක්ෂා කිරීමට නියමිතය.) |
| 4. | ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති 13 යාත්මක කිරීම ක් ක්‍රි සඳහා සමාලෝචිත වර්ෂය තුල රු. මිලියන 104.ක් විවිධ 7 පාර්ශවයන් වෙත ලබා දී තිබුණ අතර ඒ සඳහා සකස් කර තිබුණු ඇස්තමේන්තු මත අත්තිකාරම් ලබා දී වැඩ අනුව අවසන් අදියර තිපූර්ණය වියදම් ප්‍ර කිරීම වෙනුවට ඇස්තමේන්තුගත කර තිබුණු මුළු මුදලම ව්‍යාපෘතිය වෙත නිදහස් කර තිබුණි. ඉහත පරිදි ලබා දී තිබුණු මුදලට | 2023 | ඉදිකිරීම් ව්‍යාපෘති ක්‍රමවත්ව කළමනාකරණය සහ නියාමනය සිදුකළ යුතුය. | ව්‍යාපෘති කිහිපයක සියයට සිට 09 0 දක්වා පරාසයක ඉදිකිරීම් මේවන විට අවසන් කර ඇත. තහවුරු ලේඛන කිහිපයක් ලැබී ඇත. | නිර්දේශය ක්‍රියාත්මක කරමින් පවතී. (මේ වන විට ව්‍යාපෘති සිදු කරමින් පවතී.) |

| | | | | | |
|---|---|---|---|---|---|
| | අදාළව සිදු කළ යුතු කාර්යයන් සඳහා නිශ්චිත කාල රාමුවක් හඳුන්වාදීමෙන් එම කාලය තුළ අදාල ඉදිකිරීම් නිමකල බවට තහවුරුවක් ද ලබාගෙන නොතිබුණි ,තවද .2023 දෙසැම්බර් 31 දිනට රු. මිලියනක 90 වටිනාකමින් ඉටු කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති ක භෞතික 07 ගතිය සියයට 0 සිට ප්‍ර දක්වා පරාසයක 60 පැවති අතර, ඉතිරි පෘති සාර්ථකව ව්‍යා නිමකළ බවට ඉංජිනේරුවරයකු විසින් සහතිකයක් ද විගණනය වෙත ඉදිරිපත් කර බුණි. එබැවින් නොති ලබාදී තිබුණු මුදල් පෘතිය සඳහා උක්ත ව්‍යා යොදවා ගත්තේ ද යන්න හා එකී ව්‍යාපෘති වෙත නිදහස් කර තිබුණු මුදලට සරිලන ප්‍රතිලාභ ලබාගෙන තිබුණේද යන්න තහවුරු කර ගැනීමට නොහැකි විය. | | | | |
| 5. | මාතර කඹුරුපිටිය බොක්ෂිං ක්‍රීඩාගාරයේ ගොඩනැගිල්ලක් සකස් කිරීම සහ වොලිබෝල් ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා ජාතික ක්‍රීඩා අරමුදල මගින් මාතර දිස්ත්‍රික් ලේකම් | 2021<br>2022<br>2023 | වෙනත් රාජ්‍ය ආයතන මගින් සංවර්ධන කටයුතු සිදු කිරිමේදී ලබාදෙන ප්‍රතිපාදන සම්බන්ධ විධිමත් පසු විපරම් | ක්‍රීඩා අමාත්‍යාංශයේ සංවර්ධන අංශයේ අංක MOYS/DEV/NSF/ 04/06/01 හා 2023.12.01 දිනැති ලිපිය මඟින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර | නිර්දේශය ක්‍රියාත්මක කරමින් පවතී. (සංවර්ධන කටයුතු සම්පූර්ණ කර නොතිබුණි.) |

| | | | | | |
|---|---|---|---|---|---|
| | කාර්යාලය වෙත රු.9,157,992 ක් 2020 ජුලි 20 දින ලබාදී තිබුණි. ලබා දී තිබුණු මුදලින් 2022 ජනවාරි දින වන විට 12 .රු7,265,483 ක් පමණක් වියදම් කර, ඉතිරි මුදල වන රු.1,892,509 ක මුදල ජනවාරි සිට 2022 2024 අගෝස්තු දක්වා වසර දෙකකට වඩා වැඩි කාලයක් ගතවීමෙන් පසුවද අරමුදල වෙත ආපසු ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | | කටයුතු සිදු කිරීම. | බිල්පත් අමාත්‍යාංශය වෙත ලබාදෙන ලෙස දැනුවත් කර ඇත. | |
| 6. | ක්‍රීඩක ක්‍රීඩිකාවන් හා පුහුණුකරුවන් සඳහා ආධාර හා අනුග්‍රහයන් ලබාදීම වෙනුවෙන් විධිමත් ක්‍රමවේදයක් සකස් කර එය අනුගමනය කිරීම වෙනුවට ඔවුන් විසින් අරමුදල වෙත කරන ඉල්ලීම් මත මුදල් නිදහස් කර තිබුණිඒ . අනුව සමාලෝචිත වර්ෂයේ පමණක් රු . මිලියන 11 ක මුදලක් එලෙස ඔවුන් වෙත ලබා දී තිබුණ අතර එම මුදල් නිශ්චිත අරමුණු සඳහා යොදවා ගත්තේ ද යන්න පිළිබඳ පසුවිපරමක් ද අරමුදල මඟින් සිදුකර නොතිබුණිතවද ., ශ්‍රී ලංකාව නියෝජනය කරමින් | 2023 | ක්‍රීඩක ක්‍රීඩිකාවන් හා පුහුණුකරුවන් සඳහා ආධාර හා අනුග්‍රහයන් ලබාදීම වෙනුවෙන් විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීම. | ක්‍රීඩා අරමුදල මගින් සියළු ක්‍රීඩක ක්‍රීඩිකාවන් හා පුහුණුකරුවන් සඳහා අධාර හා අනුග්‍රහයන් ලබා දීම සිදු කිරීම ප්‍රායෝගිකව සිදු කල නොහැක.ශ්‍රී ලංකාව නියෝජනය කරමින් අනිවාර්යෙන් සහභාගි විය යුතු තරඟාවලි සඳහා යම් ප්‍රතිපාදන ප්‍රමාණයක් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත වාර්ෂිකව වෙන් වේ.ඒ අනුව ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් හෝ ක්‍රීඩා සංගම්වලින් මූල්‍ය | නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි. (ආධාර හා අනුග්‍රහයන් ලබාදීම වෙනුවෙන් විධිමත් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.) |

| | | | | | |
|---|---|---|---|---|---|
| | අනිවාර්යයෙන්ම සහභාගී විය යුතු තරගාවලින් සොයා බලා ඒ සඳහා ආධාර හා අනුග්‍රහයන් දැක්වීම වෙනුවට අවිධිමත් පරිදි එම ක්‍රියා සිදුවී තිබුණි. | | | අනුග්‍රහය නොලබන යම් ක්‍රීඩකයකු හෝ පුහුණුකරුවකු වෙනුවෙන් ඔවුන්ගේ ඉල්ලීම් පදනම් කර ගනිමින් අමාත්‍යවරයාගේ අනුමැතිය මත ක්‍රීඩා අරමුදලින් ගෙවීම් කරනු ලබයි. | |
| 7. | ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ගුවන් ටිකට්පත් මිලදී ගැනීම විනිවිදභාවයකින් යුක්තව සිදු වී නොතිබුණ අතර විගණන නියැදි පරීක්‍ෂාවේ දී අනාවරණය වූ කරුණු අනුව එක් අවස්ථාවකදී නිදහස් කර තිබුණු රු. 4,484,293 ක මුදලක් උපයෝජනය කරමින් ගුවන් ටිකට්පත් 09 ක් මිලදී ගැනීමේදි තරඟකාරී මිල කැඳවීමක් මත අවම පිරිවැයක් දරා ගුවන් ටිකට්පත් මිලදී ගෙන නොතිබුණි. | 2023 | ගුවන් ටිකට්පත් මිලදී ගැනීම විනිවිදභාවයකින් යුක්තව කටයුතු සිදු කිරීම. | ගුවන් ටිකට් පත් මිලදි ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් ඉදිරිපත් කර තිබූ මිල ගණන් අනුව ක්‍රීඩා අරමුදලින් ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය මත අනුග්‍රහය දක්වා ඇත. | නිර්දේශය ක්‍රියාත්මක කරමින් පවතී. (අරමුදලේ ගුවන් ටිකට් පත් ප්‍රසම්පාදන කටයුතු දෙපාර්තමේන්තුව මගින් සිදු කරන අතර 2024 වර්ෂයේ ප්‍රසම්පාදන කටයුතු පරීක්ෂා කිරීමට නියමිතය.) |
| 8. | අවස්ථා 38 ක දී ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව ඇතුළුව වෙනත් ආයතන හා පාර්ශවයන් වෙත විවිධ කාර්යයන් සඳහා ලබා දී තිබූ එකතුව රු. 23,690,647 ක් අදාළ කාර්යයන් සඳහා යොදවා ගත්තේ ද යන්න තහවුරු කිරීම සඳහා | 2023 | ප්‍රමාණවත් සාක්ෂි ලබා ගැනීමට කටයුතු සිදු කිරීම. | ලබා දි ඇති අරමුදල්වලට අදාල බිල්පත් හා අනෙකුත් ලේඛණ අමාත්‍යාංශය වෙත එවන ලෙස දැණුම් දිම සිදු කර ඇති අතර බොහෝ ව්‍යාපෘති වලට අදාල ලේඛණ මේ වන විට ලැබී ඇත. | නිර්දේශය ක්‍රියාත්මක කරමින් පවතී. |

ප්‍රමාණවත් සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් කර නොතිබීමෙන් බලපෙරොත්තු වූ කාර්යන් ඉටු වී තිබුණේ ද යන්න නිශ්චිත කිරීමට නොහැකි විය.

## 3.51 උද්භිද උද්‍යාන භාර අරමුදල

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 1,213,210,573 | 12,930 | 1,213,197,643 | 21,546,128 | තත්ත්වාගණනය නොකළ |
| **2022** | 1,156,057,814 | - | 1,156,057,814 | 101,335,943 | තත්ත්වාගණනය කළ |
| **2023** | 1,355,621,757 | - | 1,355,621,757 | 200,260,522 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපතිගේ නිර්දේශය | විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| 1. | 2018 අගෝස්තු 18 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව අරමුදල වසා දැමීමට අමාත්‍ය මණ්ඩලය තීරණයක් ලබා දී තිබියදී, එසේ කටයුතු නොකර මෙම භාර අරමුදල ව්‍යවස්ථාපිත අරමුදලක් බවට පත්කිරීමට කැබිනට් පත්‍රිකාවක් කෙටුම්පත් කර සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබුණි. | 2021 2022 2023 | රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. | දැනට භාරකාර අරමුදලක් ලෙස ක්‍රියාත්මකවන උද්භිද උද්‍යාන භාර අරමුදල ව්‍යවස්ථාපිත අරමුදලක් බවට පත්කරගැනීමේ අරමුණින් අළුතින් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය කැබිනට් පත්‍රිකාවක් කෙටුම්පත්කර සංචාරක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. | අදාලකැබිනට් පත්‍රිකාවසකස් කිරීම සංචාරක අමාත්‍යාංශය විසින් සිදු කරමින් පවතී. |
| 2. | 2021 වර්ෂයේදී අවශ්‍යතාවය පිළිබඳව නිසි ඇගයීමකින් තොරව රු.5,796,360 ක් වැයකර මිලදී ගෙන තිබුණු සමරු ඵලක හා කැක්ටස් බඳුන් 7000 ක්රු. 4,591,876 ක | 2022, 2023 | රජයේ අරමුදල් අරපිරිමැසුම්දායක ලෙස භාවිතයට ගත යුතුය. | 2022 වර්ෂය වනවිට, රාජකීය උද්භිද උද්‍යානයට වසර දෙසියයක් සැපිරීම නිමිත්තෙන්, සිහිවටන සමරුඵලක 4000ක් හා කැක්ටස් බඳුන් 3000 ක් මිලදී | දැනට ඉතිරිව ඇති තොග අලෙවි කිරීම සඳහා සියළු ඒකක වෙත ලබාදී ඇත. |

සමරු එලක හා කැක්ටස් බඳුන් 5507ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අලෙවි කර ගැනීමට නොහැකිව නිශ්කාර්යයව පැවතුණි.

ගන්නා ලදී. එසේ වුවද එම අවස්ථාවේ රටෙහි පැවති ගැටළුකාරී වාතාවරණය මත අපේක්ෂා කළ පරිදි අදාළ උත්සවය පැවැත්වීමට නොහැකිවිය. මේ වන විට මිල කමිටුවක් මඟින් සමරු එලක වල මිල සංශෝධනය කර සංශෝධිත මිල ගණන් යටතේ 2024.04.01 දින සිට අලෙවි කිරීම සඳහා කටයුතු කර ඇත.

## 3.52 අම්බුළුවාව දිසානායක මුදියන්සේලාගේ ජයරත්න ආගමික මධ්‍යස්ථානය සහ ජෛව විවිධත්ව සංකීර්ණය භාර අරමුදල

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 306,393,711 | 18,113,054 | 288,280,057 | 4,167,652 | ව්‍යාචනය කළ |
| **2022** | 313,675,179 | 13,438,960 | 300,236,219 | 11,955,562 | ව්‍යාචනය කළ |
| **2023** | 363,111,759 | 18,242,315 | 344,869,444 | 44,632,225 | - |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| 1. | නිර්මාතෘගේ පිළිරුව ආශ්‍රිත භූමිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය මිලගණන් කැඳවීමකින් තොරව හා ගිවිසුම්ගතවීමකින් තොරව අම්බුළුවාව උද්‍යාන පරිශ්‍රයේ ග්‍රැනයිට් සැපයීම, ඇල්ලීම සහ පොලිෂ් කිරීම, නව උද්‍යානයේ පොකුණු ආශ්‍රිතව වතුරමල් සපයා සවිකිරීම, ආලෝකකරණය හා භූමි අලංකරණය ඉටු කිරීම පුද්ගලයන් 09 ක් වෙත පවරා සමාලෝචිත වර්ෂයේ රු.9,805,074 ක් ගෙවා තිබුණි. මෙම ඉදිකිරීම්වලට අදාළ මුළු පිරිවැය ඇස්තමේන්තු ඉදිරිපත් නොකෙරුණු අතර, ඉංජිනේරුවෙකු හෝ තාක්ෂණික | 2021 | මිල ගණන් කැඳවා ගිවිසුම් ගතව ඉදිකිරීම් පවරා ඉංජිනේරු/ තාක්ෂණ නිලධාරි වාර්තා අනුව ගෙවීම් කළ යුතුය. | පිළිතුරු ලබා දී නැත. | මිල ගණන් කැඳවා ගිවිසුම් ගතව ඉදිකිරීම් කටයුතු සිදුකර නොතිබූ අතර ඉංජිනේරු හා තාක්ෂණ නිලධාරි වාර්තා අනුව ගෙවීම් කටයුතු කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | නිලධාරියෙකු විසින් ගෙවීම් බිල්පත් සහතික කර නොතිබුණි. | | | | |
| 2. | සෘජු ශ්‍රම පදනමින් ඉදිකිරීම් ව්‍යාපෘති 03 ක් ක්‍රියාත්මක කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුල එකතුව රු.5,831,618 ක් වැයකර තිබුණද, ඊට අදාළ මුළු පිරිවැය ඇස්තමේන්තු වැඩ පත්‍රිකා (Job Sheet) සකස් කර නොතිබුණි. එමෙන්ම මිලදීගත් අමුද්‍රව්‍ය තොග පොත්වල සටහන් කර නොතිබුණි. | 2021 | සෘජු ශ්‍රම පදනමින් ඉදිකිරීම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී මුළු පිරිවැය ඇස්තමේන්තු හා වැඩ පත්‍රිකා පවත්වා ගත යුතු අතර මිලදී ගත් අමුද්‍රව්‍ය තොග පොත් වලට ඇතුළත් කර නිකුත් කිරීම් කළ යුතුය. | පිළිතුරු ලබා දී නැත | 2024 සැප්තැම්බර් 30 දින වන විටත් ඉදිකිරීම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී මුළු පිරිවැය ඇස්තමේන්තු සකස් කිරීමත්, වැඩ පත්‍රිකා පවත්වාගෙන යාමත්, අමුද්‍රව්‍ය තොග පොත් වලට ගැනීමත් සිදු නොවේ. |
| 3. | සමාලෝචිත වර්ෂයේදී භාර අරමුදල සතුව පවතින කළමනාකරණ බංගලාව වෙනුවෙන් රු.121,505 ක් හා පුස්තකාල ගොඩනැගිල්ල සභාපතිගේ නිල නිවස සඳහා භාවිතා කිරීමේ අරමුණින් රු.1,646,906 ක වියදමක් දරා අළුත්වැඩියා කර තිබුණද 2022 අගෝස්තු 31 විගණිත දින වන විටත් ඒවා උපයෝජනය කර නොතිබුණි. | 2021 | භාර අරමුදල සතුව පවතින වත්කම් උපයෝජනය සඳහා කටයුතු කළ යුතුය. | පිළිතුරු ලබා දී නැත. | 2024 සැප්තැම්බර් 30 දින වන විටත් මෙම වත්කම් ඌන උපයෝජිතව පවතී. |
| 4. | සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු.3,726,540 ක වියදමක් දරා කඳු සහිත ස්ථාන තැන්තලා කරමින් පස් කැපීම හා ගල් කැඩීම නිසා | 2021 | භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කැණීම් කාර්යාංශයේ හා මධ්‍යම පරිසර අධිකාරියේ | පිළිතුරු ලබා දී නැත. | ජෛව විවිධත්වයට හානි වන පරිදි 2024 සැප්තැම්බර් වන විටත් වන විටත් විවිධ ඉදිකිරීම් සිදු |

| | | | | | |
|---|---|---|---|---|---|
| | අම්බුළුවාව පරිශ්‍රෙය් ජෛව විවිධත්වය හා පාරිසරික තත්ත්වයන්ට හානියක් සිදුවී තිබුණි. මෙම කටයුතු සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කැනීම් කාර්යාංශයේ හා මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශ හා අනුමැතිය ලබාගෙන නොතිබුණි. | | නිර්දේශ හා අනුමැතීන් ලබා නොගෙන ජෛව විවිධත්වයට හානි වන ලෙස කටයුතු කිරීම සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. | | කරමින් පවතී. |
| 5. | 2009 අංක 44 දරන භාර අරමුදල් පනතේ 4 වන වගන්තියේ සඳහන් අරමුණු 20 න් අරමුණු 16ක් ඉටුකර ගැනීම සඳහා භාරකාර මණ්ඩලය විසින් ප්‍රමාණවත් ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. | 2021<br>2022 | භාර අරමුදල පිහිටුවීමේ අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. | 2023 වර්ෂයේ අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කරන බව. | පනතේ සඳහන් අරමුණු ඉටුකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| 6. | 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක්, ප්‍රසම්පාදන සැලැස්මක් සහ ප්‍රගති වාර්තා පිළියෙල කර නොතිබුණි. | 2022 | චක්‍රලේඛ ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම හා ප්‍රගති වාර්තා පිළියෙල කළ යුතුය. | ඉදිරියේදී සකස් කිරීමට කටයුතු කරන බව. | 2023 හා 2024 වර්ෂ සඳහාත් ක්‍රියාකාරී, ප්‍රසම්පාදන සැලසුම් හා ප්‍රගති වාර්තා සකස් කර නොතිබුණි. |
| 7. | මෙම සංකීර්ණයට අයත් ඉඩම් අක්කර 400 ක් පවතින බව සඳහන් වුවත්, එම ඉඩම් මැණුම්කර අදාළ මිනුම් වාර්තා භාරය වෙත ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | 2022 | භාරයට අයත් ඉඩම් මැනුම් කර වාර්තා ලබා ගැනීමට කටයුතු කළ යුතුය. | ඉදිරියේදී අදාල මිනුම් වර්තා ලබා ගැනීමට කටයුතු කරන බව. | 2024 සැප්තැම්බර් 30 දක්වාත් භාරයට අයත් ඉඩම් මැනුම් කර වාර්තා ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| 8. | අම්බුළුවාව අරමුදල නමින් මහා භාරකාරවරයා යටතේ පවතින සියළු මුදල් හා අම්බුළුවාව පරිසර සංවර්ධන සහ සංරක්ෂණ භාර අරමුදල නමින් බැංකුවල පවතින මුදල් පිළිබඳ තොරතුරු හා ලේඛන, භාරය මගින් ලබාගෙන නොතිබුණි. | 2021 2022 | භාරකාර අරමුදලට අදාලව මහා භාරකාරවරයා සතුව පවතින වත්කම් පිළිබඳ සියලු තොරතුරු ලබා ගැනීමට කටයුතු කළ යුතුය. | මහා භාරකාරවරයා සතුව පවතින අරමුදල් වෙනුවෙන් කිසිදු තොරතුරක් අප සතුව නොමැති බව. | භාරකාර අරමුදලට අදාළව මහා භාරකාරතැන වෙත පවතින වත්කම් හා වගකීම් හඳුනාගෙන 2024 සැප්තැම්බර් 30 දක්වාත් ලේඛනගත කර නොතිබුණි. |
| 9. | අරමුදල සතු එකතුව රු.9,130,000 ක ටොයෝටා වර්ගයේ මෝටර් රථය හා විදුලියෙන් ක්‍රියා කරන යතුරු පැදිය භෞතිකව පවතින බවට හා භාරයේ කටයුතු සඳහා යොදවාගත් බවට තහවුරු කිරීම සඳහා තොරතුරු ඉදිරිපත් නොකෙරුණ | 2021 2022 | අරමුදල සතු වත්කම් අරමුදලේ කටයුතු සඳහා යොදවාගත යුතුය. | විදුලි යතුරු පැදියේ විදුලි බැටරිය අළුත්වැඩියා කිරීමට කොළඹ රැගෙන ගොස් ඇත. මෝටර් රථය දැනට සංචිත වාහනයක් ලෙස භාවිතා කරයි. ධාවන සටහන්, ලොග් පොත, අළුත්වැඩියා ලේඛන ඉදිරියේදී ඉදිරිපත් කරන බව. | මෙම වාහන 2024 සැප්තැම්බර් 30 දින තෙක් භෞතිකව පවතින බව හා අරමුදලේ කටයුතු සඳහා භාවිතා කරන බවට ලියවිලි ඉදිරිපත් කර නොතිබුණි. |
| 10. | ඉකුත් වර්ෂ 02 තුල මාර්ග සංවර්ධන අධිකාරිය විසින්, අම්බුළුවාව පරිශ්‍රයට ඇතුළු වන ප්‍රධාන පිවිසුමේ සිට අභ්‍යන්තර මාර්ගයේ කිලෝ මීටර් 6 ක ප්‍රමාණයක් ABC අතුරා කාපට් කිරීම සහ 2021 වර්ෂයේදී පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් අම්බුළුවාව පරිශ්‍රයේ පිහිටි වැවේ සොරොව්ව හා වැව් බැම්ම අළුත්වැඩියා කිරීම සහ ඇවිදින මංතීරුව දෙපස | 2022 | සංවර්ධන ව්‍යාපෘති වල වටිනාකම වත්කම් ලෙස ගිණුම්ගත කළ යුතුය. | පිළිගනිමි. මාර්ග සංවර්ධන අධිකාරියෙන් හා අදාළ ආයතන වලින් තොරතුරු ලබාගෙන වත්කම් යටතට ගැනීමට කටයුතු කරන බව. | සංවර්ධන ව්‍යාපෘතිවල වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | කුට්ටි ගල් ඇල්ලීම් ව්‍යාපෘතිවල වටිනාකම් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | | | | |
| 11. | භාර අරමුදල් පනතේ 6(2)(ඊ) ප්‍රකාරව බඳවා ගැනීමේ පටිපාටියක් පිළියෙල කර අනුමත කර ගැනීමකින් තොරව ජෛව විවිධත්ව සංකීර්ණයේ සේවකයින් 23 දෙනෙකු සේවයේ යොදවාගෙන තිබුණි. | 2022 | බඳවා ගැනීමේ පටිපාටියක්පිළි යෙල කිරීමට කටයුතු කළ යුතුය. | ඉදිරියේදී නිවැරදි කරන බව. | 2024 සැප්තැම්බර් 30 දක්වා බඳවා ගැනීමේ පටිපාටියක් පිළියෙල කර නොතිබුණි. |
| 12. | භාරකාර මණ්ඩලය විසින් සේවයේ යොදවාගෙන ඇති කාර්ය මණ්ඩලය වෙත විධිමත් පත්වීම් ලිපියක් හෝ සේවයේ යොදවා ගැනීම සම්බන්ධයෙන් සේවා ගිවිසුම් අත්සන් කරගෙන හෝ නොතිබුණි. | 2022 | සේවා නියුක්තිකයන් සම්බන්ධයෙන් විධිමත් පත්වීම් ලිපි හා සේවා ගිවිසුම් පවත්වා ගත යුතුය. | ඉදිරියේදී නිවැරදි කරන බව. | කාර්ය මණ්ඩලය සඳහා විධිමත් පත්වීම් ලිපි හා සේවා ගිවිසුම් පවත්වාගෙන නොතිබුණි. |

## 3.53 ජාතික රක්ෂණ භාර අරමුදල

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | බදු පසු ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 31,795,871,950 | 14,739,332,181 | 17,056,539,767 | 5,127,770,399 | ව්‍යාවනය කළ |
| **2022** | 41,487,016,324 | 22,758,348,642 | 18,728,667,679 | 6,049,158,366 | ව්‍යාවනය කළ |
| **2023** | - | - | - | - | - |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| 1. | 1.5.1 (අ iv) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා අභ්‍යන්තර පාලනය. අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමයේ සේවකයකු විසින් සිදු කරන ලද වංචාවක් 2022 ඔක්තෝබර් මාසයේදී අනාවරණය වී ඇත. මෙම වංචාව 2018 වර්ෂයේ සිට සිදු කර ඇති අතර අභ්‍යන්තර විගණන වාර්තාවට අනුව අනාවරණය වූ මූල්‍ය පාඩුව රු. 5,136,000 කි. මණ්ඩලයේ අභ්‍යන්තර විමර්ශනවලට අනුව මේ වන විට තවත් නිලධාරීන් 13 දෙනෙකු ද මෙවැනිම වංචාවන්ට සම්බන්ධ වී ඇති අතර එම මූල්‍ය අලාභයේ වටිනාකම රු. 6,572,300 ක් බව අනාවරණය වී ඇත. | 2022 | වංචා වැළැක්වීමට, අනාවරණය කර ගැනීමට සහ වංචා අවදානම අවම කිරීමට කළමනාකාරීත්වය විසින් අභ්‍යන්තර පාලන ක්‍රමවේද සහතික කළ යුතුය. | වංචාවේ පාඩුව අධිකරණ ක්‍රියාමාර්ග වලින් පසුව අයකර ගන්නා ලදී. | 2023 වර්ෂයේදී අග්‍රහාර අංශයේ වංචනික ක්‍රියා සිදු වී නිලධාරීන් 07 දෙනෙකුට එරෙහිව නඩු ගොනුකර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| දැනට පාඩුව රු. 5,746,571 වංචනික පුද්ගලයින්ගෙන් අයකරගෙන ඇති අතර අධිකරණ කටයුතු තවමත් සිදුවෙමින් පවතී. කෙසේ වෙතත්, ආයෝජන ආදායම අහිමිවීම හේතුවෙන් මණ්ඩලයට සිදුවූ පාඩුව අයකර ගැනීම සඳහා වංචනිකයින්ට එරෙහිව කටයුතු කර නොතිබුණි. | | | | |
| 1.5 (ආ.) අග්‍රහාර හිමිකම් ඉල්ලුම්පත්‍ර භාරගැනීමේ සිට හිමිකම් පියවීම දක්වා සහ අග්‍රහාර හිමිකම්වල බැරකම් හඳුනාගැනීම සඳහා, හිමිකම් කළමනාකරණය කිරීමේ ඒකාබද්ධ පද්ධතියක් මණ්ඩලයට නොතිබුණි. එබැවින්, හිමිකම් අයදුම්පත් භාරගැනීමේ අක්‍රමිකතා, හිමිකම් තොරතුරු නැතිවීම, දෝෂ නිවැරදි කිරීමේ ප්‍රමාදයන් සහ හිමිකම් සැකසීමේ අනවශ්‍ය ප්‍රමාදයන් සිදුවී තිබුණි. හිමිකම් හැසිරවීමේ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවය සහ සඵලතාවය වැඩි දියුණු කිරීම සඳහා මෑත කාලයේදී මණ්ඩලය කටයුතු කර තිබුණි. කෙසේ වෙතත්, ඉහත කී වැඩිදියුණු කිරීම්වල සාර්ථකත්වය මැන | 2022 | අග්‍රහාර රක්ෂණ ක්‍රමය සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන පද්ධතියක් හඳුන්වා දීමට කළමනාකාරීත්වය අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | කෙසේ වෙතත්, අග්‍රහාර හිමිකම් අංශය ක්‍රියාත්මක වන්නේ හිමිකම් ක්‍රියාවලියේ ප්‍රථම අදියර වන හිමිකම් වගකීම් භාර ගැනීම සහ හඳුනා ගැනීම හැර ඒකාබද්ධ පද්ධතියක් මඟිනි. හිමිකම් සැකසුම් පද්ධති වෙනස් කිරීම් වල මෙම ආරම්භක අදියර 2023- 2027 ආයතනික සැලැස්මේ සලකා බැලූ අතර දැනට ප්‍රගතියක් ලබමින් පවතී. අග්‍රහාර හිමිකම් සැකසීම දැනට ORACLE පද්ධතිය භාවිතයෙන් සිදු කෙරේ. කෙසේ වෙතත්, මණ්ඩලය දැනටමත් වහාම සංවර්ධනය කළ යුතු හිඩැස් සහ ක්ෂේත්‍ර | අග්‍රහාර ගෙවීම් පද්ධතියේ පවතින අඩුපාඩු 22 ක් සම්බන්ධවයෙන් ආයතනයේ අභ්‍යන්තර විගණන අංශය විසින් දැනුවත් කර ඇත. තවදුරටත් නිවැරදි කර නොමැති අඩුපඩු පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| බැලීම සඳහා සැලකිය යුතු කාලයක් ගතවනු ඇත. | | | හඳුනාගෙන ඇත. ඇත්ත වශයෙන්ම, පද්ධතියේ සමහර වෙනස්කම් මෑතකදී සිදු කර ඇත. තවද මුදල් අමාත්‍යාංශයේ සහය ඇතිව, අභ්‍යන්තර පාලන ගැටළු, තොරතුරු තාක්ෂණ පාලන, තාක්ෂණික අවශ්‍යතා සහ හිමිකම් සැකසීම කඩිනම් කිරීම සඳහා ඇති හිඩැස් හඳුනා ගැනීම සඳහා විශේෂඥයෙකු සහිත කමිටුවක් පිහිටුවන ලදී. එම ක්‍රියාවට නැංවීමේ පළමු පියවර ලෙස ඇස් කණ්නාඩි හිමිකම් පෑම අන්තර්ජාලය හරහා ඉදිරිපත් කිරීමට දැනටමත් පියවර ගෙන ඇත. | |
| 1.5.(ඉ.) හිඟ ප්‍රතිරක්ශණ හිමිකම් පිළිබඳ මූල්‍ය තොරතුරු රු.3,283,936,585 සහ ගෙවා ඇති ප්‍රතිරක්ෂණ හිමිකම් රු.1,153,035,170 පැතුරුම් පත්‍රවල අතින් නඩත්තු කර ඇත. එබැවින් ප්‍රතිරක්ෂණ අංශයේ ගනුදෙනු හැසිරවීමට හා වාර්තා තබා ගැනීමට නිසි ක්‍රමවේදයක් නොතිබූ බව නිරීක්ෂණය වේ. මෙම ප්‍රතිරක්ෂණ අංශයේ | 2022 | ඵලදායී වාර්තාකරණ පද්ධතියක් ක්‍රියාත්මක වන බවට කළමනාකාරිත්වය සහතික විය යුතුය. | පද්ධතියක් නොමැති වුවද, දත්තවල නිරවද්‍යතාවය සහ සම්පූර්ණත්වය සහතික කිරීම සඳහා සාමාන්‍ය පාලනයන් ඇත. හිමිකම් ක්‍රියාවලි සඳහා ගිණුම්කරණ පද්ධතියෙහි ගෙවිය යුතු ගිණුම් මොඩියුලය දැනට ක්‍රියාත්මක වේ. තවද, 2023-2027 ආයතනික සැලැස්මට අනුව | 2023 -2027 සංයුක්ත සැලැස්ම මේ සඳහා ප්‍රතිපාදන ඇතුලත් කර නැත. ඒ අනුව පැරනි ක්‍රම වේදය දිගින් දිගටම කරගෙනු යනු ලබයි. වාර්තා කරන තොරතුරු බොහෝ විට ගිණුමේ සංඛ්‍යා හා උප ලේඛන අතර වෙනසක් නිරීක්ෂණය වේ. |

| | | | | |
|---|---|---|---|---|
| මූල්‍ය තොරතුරු වාර්තා කිරීමේ දුර්වලතාවය හේතුවෙන් දත්තවල විශ්වාසනීයත්වය පිළිබඳ වැඩි අවදානමක් නිර්මාණය කරයි. තවද, ප්‍රතිරක්‍ෂණ හිමිකම් එකතු කිරීම සහ එම තොරතුරුවල නිරවද්‍යතාවය පිළිබඳ කාලෝචිත ක්‍රියාමාර්ග සැක සහිතය. | | | ප්‍රතිරක්ශණ අංශයේ හිමිකම් හැසිරවීම සඳහා ක්‍රමවේදයක් සංවර්ධනය කිරීමේ ක්‍රියාවලිය මේ වන විට සිදු කරමින් පවතී | ඒ අනුව ඒවා නිවැරදි කර නොමැති බව නිරීක්ෂණය වේ. |
| 1.5.5 අධිකාරී බලය නොලත් ගනුදෙනු විස්තර **1989** සැප්තැම්බර් **27** දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අංක **1989/107(85)** සහ **2008** මාර්තු **25** දිනැති අංක **1542/11** දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ **3(1)** ඡේදය අනුව ප්‍රාථමික රක්ෂණ සමාගම් විසින් රක්ෂණ ඔප්පු නිකුත් කිරීමෙන් වැඩවර්ජන, කැරලි කෝලාහල, සිවිල් කලබල සහ ත්‍රස්තවාදී **(SRCC** සහ **Tr)** ආවරණය සඳහා ලබාගන්නා වාරික වැඩවර්ජන, කැරලි කෝලාහල, සිවිල් කලබල සහ ත්‍රස්තවාදී **(SRCC** සහ **Tr)** අරමුදලට බැර කළ යුතුය. කෙසේ වෙතත්, | 2022 | මණ්ඩලය අදාළ නීතිමය විධිවිධානවලට අනුකූලව රක්ෂණ සමාගම්වලින් වැඩවර්ජන, කැරලි කෝලාහල, සිවිල් කලබල සහ ත්‍රස්තවාදී (SRCC සහ Tr) ආවරණ වාරික එකතු කළ යුතුය. | මණ්ඩලය ආරම්භයේ සිටම මෝටර් පංතිය සඳහා ක්‍රියාත්මක කරන ලද **Motor XOL** විධිවිධානයට අනුව සහ මණ්ඩලය විසින් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී.. ඒ අනුව, මෝටර් පන්තියේ අමතර පාඩු විධිවිධානය **(XOL)** යටතේ අය කරන වාරිකයේ ප්‍රතිශතය කලින් කල තීරණය කරන ලද අතර අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අංක **53-16** අනුව වාරික වශයෙන් ලබාගත් මුදල රක්ෂණ සමාගම් විසින් එකතු කරන ලද මුළු වාරිකයෙන් **12%** කි. කෙසේ වෙතත්, | 2008 සිට 2023 දක්වා අයකර ගත යුතු රු.මි.9600 කට ආසන්න මුදලක් අය කර ගැනීමට කටයුතු කර නොමැති අතර අමාත්‍යමණ්ඩල තීරණ අනුව 2024 ජනවාරි සිට අයකර ගනු ලබයි. |

මණ්ඩලය එම රක්ෂණ වාරිකවලින් එකතු කර ගෙන ඇත්තේ මෝටර් රථ රක්ෂණයෙන් සියයට 12 ක් සහ මෝටර් නොවන රක්ෂණයෙන් සියයට 80 ක් පමණි. එබැවින්, වර්ෂය සඳහා දළ ලිඛිත වාරිකය රු. 12,369,745,744 කින් අවතක්සේරු වී ඇත. 2005 දී මෙම අරමුදල මණ්ඩලයට භාර දෙන විට වැඩවර්ජන, කැරලි කෝලාහල, සිවිල් කලබල සහ ත්‍රස්තවාදී (SRCC සහ Tr) අරමුදල රුපියල් බිලියන 10.9 කි. 2022 වසරේදී අරමුදල රුපියල් බිලියන 17.8 කි. මෙම අරමුදලට එකතු වන සියලුම අරමුදල් එම නීතිමය ප්‍රතිපාදනවල සඳහන් ප්‍රතිපාදන අනුව ලැබුණේ නම් මෙම අරමුදල රුපියල් බිලියන 68.9ක් විය යුතුව තිබුණි. ඒ අනුව පසුගිය වසර 17 තුළ අරමුදලට සිදු වූ පාඩුව දළ වශයෙන් රුපියල් බිලියන 51 කි. පසුගිය වසර 17 තුළ අරමුදලට අදාළ සියලුම අරමුදල් ලැබුණේ නම්, අරමුදලේ සඵල වර්ධනය සියයට 12% තීරණය කිරීමට පෙර, එම වසරේම මුළු වාරිකයෙන් 15% ක් ඉල්ලා සිටියද, කර්මාන්තය එම තීරණයට විරුද්ධ වීම නිසා අවසානයේ එය 12% දක්වා අඩු කරන ලදී.

2021 දී මණ්ඩලයේ කළමනාකාරීත්වය ලෙස XOL සැකැස්මේ වර්තමාන භාවිතය නතර කිරීමට අවස්ථාව බව සටහන් කරගන්නා ලදී. එබැවින් අංක 172-03 දරන මණ්ඩල පත්‍රිකාවට අනුව 2022 අප්‍රේල් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි 100% වාරික සහිතව මෝටර් රථ රක්ෂණ පන්තියේ දැනට පවතින මෝටර් වාරික එකතු කිරීමේ ක්‍රමය වෙනස් කර 100%ක් භාර ගැනීමට තීරණය කරන ලදී. එය ක්‍රියාත්මක කිරීමට කර්මාන්තය විරුද්ධ වූ බැවින් එය

**11.5** ක් විය යුතුය. කෙසේ වෙතත්, අරමුදලේ වත්මන් ඵලදායී වර්ධනය සියයට **3**ක් පමණක් බව නිරීක්ෂණය විය. මණ්ඩලයේ කළමනාකාරිත්වයට අනුව **2006** වර්ෂයේදී මුදල් අමාත්‍යාංශය විසින් අරමුදලේ පරිපාලනය මණ්ඩලය වෙත පැවරීමේදීද මෙම ක්‍රමය ක්‍රියාත්මක වී ඇත. තවද, **2023** මැයි **11** සහ **2023** ඔක්තෝම්බර් **03** යන දෙදින තුළ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී **(COPE)** මෙම කරුණ සාකච්ඡා වූ අතර අමාත්‍ය මණ්ඩලයේ තීරණය නොසලකා හැරීමෙන් සිදු වූ මූලික වරදක් බව කෝප් කමිටුවේ අදහස විය. කෙසේ වෙතත්, මෙම ගැටළුව විසඳීම සඳහා ඵලදායී පියවරක් ගෙන නොතිබුණි. තවද, **2006** වර්ෂයේදී මෙම අරමුදල මණ්ඩලයට පැවරීමේදී මෙම අරමුදලේ කළමනාකාරිත්වයට අදාළ ලියකියවිලි මුදල් අමාත්‍යාංශය විසින් මණ්ඩලය වෙත භාරදී නොතිබුණි. එබැවින් කල් දමන ලදී. මණ්ඩල තීරණ අංක **189-1** අනුව, මෝටර් රථ ප්‍රතිපත්ති සඳහා **100%** වාරිකය **2023** ජනවාරි **01** සිට ක්‍රියාත්මක වන අතර, **2023** ඔක්තෝබර් **01** දින සිට ක්‍රියාත්මක වන පරිදි ක්‍රියාත්මක වන දිනය වෙනස් කරන ලෙස කර්මාන්තය නැවත ලිපියක් මගින් ඉල්ලා ඇත.

**මෙම මූලික දෝෂය සිදුවූ කාලසීමාව සහ මේ සම්බන්ධයෙන් වගකිව යුතු පුද්ගලයින් සොයා ගැනීම අපහසු විය.**

## 3.54 ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 74,443,892,000 | 8,659,519,000 | 65,784,374,000 | 16,555,208,000 | තත්ත්වාගණනය නොකළ |
| **2022** | 69,017,617,000 | 8,841,204,000 | 60,176,413,000 | 18,220,595,000 | තත්ත්වාගණනය නොකළ |
| **2023** | 121,356,319,000 | 8,593,677,000 | 112,762,643,000 | 24,126,464,000 | තත්ත්වාගණනය නොකළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| 1. | යෝජනා ක්‍රමය විසින් ප්‍රාථමික අලෙවිකරුවකු සමඟ රු. මිලියන 147.05 ක මුදලකට 2016 මාර්තු 31 දිනට කල් පිරෙන ප්‍රතිවර්ත ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුමකරු. මිලියන 137.18 ක මුදලක් 2015 අප්‍රේල් 01 දින ආයෝජනය කර තිබුණි. ප්‍රාථමික අලෙවිකරු විසින් ඉහත ආයෝජනය සඳහා පාදක වු සුරැකුම්පත්, ඒ වෙනුවෙන් කිසිදු සුරැකුම්පතක් ආදේශ නොකර ඉවත් කර ගෙන තිබුණි.ඒ අනුව, ඉහත සඳහන් ආයෝජනය සඳහා රු. මිලියන 144.25 ක් වූ හානිකරණයක් 2015 දෙසැම්බර් 31 දිනට යෝජනා ක්‍රමයේ මූල්‍ය ප්‍රකාශනවල සිදු කර | 2021, 2022, 2023 | පාඩුව අයකර ගැනීමට අවශ්‍යයි. | 2023 මාර්තු මාසයේදී ණය හිමියකු ලෙස, ශ්‍රී ලංකා මහ බැංකුවේ හිමිකම් පෑමේ විස්තර ඇතුළත් අතරමැදි පත්‍රිකා ගොනු කරමින් ශ්‍රී ලංකා මහ බැංකුව එම ප්‍රාථමික අලෙවිකරු ගණන් බේරා වසා දැමීමේ නඩුවට මැදිහත් විය. එසේම, යෝජනාක්‍රමය 2023 මාර්තු මාසයේදී දිවුරුම් ප්‍රකාශයක් මඟින් එහි හිමිකම් ඉල්ලීම ඉදිරිපත් කරන ලදි. | ක්‍රියාත්මක වෙමින් පවති. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | තිබුණි. 2017 ජූලි 24 දින සිට ක්‍රියාත්මක වන පරිදි රජයේ සුරැකුම්පත් සඳහා වන ප්‍රාථමික වෙන්දේසි කටයුතුවලට සහභාගිවීම අත්හිටුවීමට මෙම ප්‍රාථමික අළෙවිකරු වෙත නියෝග කර තිබුණි. ශ්‍රී ලංකා මහ බැංකුවේ 2023 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශ හා මෙහෙයුම් වාර්තාව අනුව, අනාරක්ෂිත ආයෝජකයකු විසින් මෙම සමාගම ණයහිමියන්ගේ ස්වෙච්ඡාවෙන් ගණන් බේරා වසාදැමීම සඳහා වන ඉල්ලීමක් කරන ලද අතර අධිකරණය මඟින් 2022 ජූනි 17 දින ගණන් බේරා වසාදැමීම සඳහා වන නියෝගය ලබාදෙන ලදි. කෙසේ වෙතත්, ගණන් බේරා වසාදැමීම සඳහා ගොනු කළ නඩුව (CHC83/2021/CO) වෙනත් නීතිමය ක්‍රියාමාර්ග හේතුවෙන් විභාගවෙමින් පවතී. | | | | |
| 2. | 2023 නොවැම්බර් 15 දිනැති 2023 අංක 1 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනත් විධානයේ 7(iii) වගන්තිය ප්‍රකාරව, කිසියම් සාමාජික ආයතනයක් විසින් ගෙවිය යුතු වාරික ගෙවීමේදී කිසියම් | 2023 | දඩය ගෙවිය යුතු කාල සීමාව සඳහන් කිරීම අවශ්‍ය වේ. | සාමාජික ආයතනවලට නිකුත් කිරීමට නියමිත ඉදිරි විධානවලදී, පැහැර හරින ලද මුදල මත නියමිත දඩ මුදල පියවීම වෙනුවෙන් නිශ්චිත කාල සීමාවක් සම්බන්ධ විධිවිධාන ඇතුළත් කිරීමට | ක්‍රියාත්මක වෙමින් පවතී |

පැහැර හැරීමක් සිදු කරන විට, එම සාමාජික ආයතනය එම පැහැර හැරීමේ කාලසීමාව සඳහා දඩයක් ලෙස මහබැංකුවට ගෙවීමට බැඳී සිටියි. කෙසේ වෙතත්, දඩ මුදල් ගෙවිය යුතු නිශ්චිත කාලසීමාවක් එකී විධානයේ නියම කර නොතිබුණි

අපේක්ෂා කෙරේ.

## 3.55 ඇසල පෙරහැර භාරය

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 32,505,740 | 17,616,054 | 14,889,686 | 191,079 | තත්ත්වාගණනය කළ |
| **2022** | 36,446,245 | 17,530,173 | 18,916,072 | 4,034,194 | තත්ත්වාගණනය කළ |
| **2023** | 41,253,635 | 14,964,894 | 26,288,741 | 5,125,760 | තත්ත්වාගණනය කළ |

| | **විගණන නිරීක්ෂණය** | **වාර්තාවේ වර්ෂය** | **විගණකාධිපති නිර්දේශය** | **විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග** | **වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය** |
|---|---|---|---|---|---|
| 1. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 877(1)(ඇ) ප්‍රකාරව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කරන ලද අයවැය ලේඛනය මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් හා රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ රු.5,998,920 ක වියදමක් දරා තිබුණි. | 2021 2022 | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. . | අමාත්‍යාංශයක් නිශ්චිතව සඳහන් නොවන බැවින් වාර්ෂික ඇස්තමේන්තු ඇසළ පෙරහැර භාරය විසින් අනුමත කළ බව. | නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |
| 2. | 1980 අංක 34 දරන මහනුවර ඇසළ පෙරහැර භාරය පනතේ 06 වන වගන්තිය අනුව භාරය පිහිටුවීමේ පරමාර්ථයක් වූ මහනුවර වාර්ෂික ඇසළ | 2023 | භාරයේ අරමුණු ඉටුකර ගැනීමට හෝ එම අරමුණු අවශ්‍යතාවය අනුව සංශෝධනය කරගැනීමට | ඇසළ පෙරහැරේ දී උපයෝගී කර ගන්නා භාණ්ඩ ශ්‍රී දළදා මාළිගාව විසින් නිෂ්පාදනය සිදු කරනු ලබන බැවින් භාරය විසින් අමතර | 2024 සැප්තැම්බර් 30 දින දක්වාත් නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | පෙරහැරේදී උපයෝගී කරගත යුතු භාණ්ඩ නිෂ්පාදනයෙහි නිරතවීම ක්‍රියාත්මක කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුලදී කටයුතු කර නොතිබුණි. | | කටයුතු කළ යුතුය. | පිරිවැයක් දැරීම නිෂ්ඵල කාර්යයක් බව. | |
| 3. | 2006 දෙසැම්බර් 22 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක PF/423 හි 4.4 ඡේදය හා රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2020 ජූලි 16 දිනැති ලිපිය අනුව ගිණුම් වර්ෂය අවසානවී මාස 05 ක් තුල විගණකාධිපතිවරයාගේ වාර්තාව සහ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු කළයුතු වුවද, ඉකුත් වර්ෂයේ විගණන වාර්තා හා කාර්යසාධන වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නොතිබුණි. | 2021<br>2022<br>2023 | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. | ඒ පිළිබඳව භාරයේ ඉදිරි රැස්වීමක දී සාකච්ඡා කර අදාළ අංශ දැනුවත් කර ඉදිරියේ දී අවශ්‍ය කටයුතු සිදු කිරීමට කටයුතු කරන බව. | සමාලෝචිත වර්ෂවල විගණන වාර්තා හා කාර්යසාධන වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නොතිබුණි. |

## 3.56 දේශීය ආදායම් දිරිගැන්වීමේ අරමුදල

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 268,362,276.33 | - | 268,097,776.33 | 17,670,638.15 | තත්ත්වාගණනය කළ |
| **2022** | 254,641,926.47 | 19,800.65 | 254,357,625.82 | 9,060,958.34 | තත්ත්වාගණනය කළ |
| **2023** | 261,621,516.00 | - | 261,357,016.00 | 6,999,390.18 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණ | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| 1. | දේශිය ආදායම් සේවයේ නිරත නිලධාරින් සඳහා නිවාස ණය සැපයීමේ අරමුණින් රු.2,500,000 ක මූලික තැන්පතුවකින් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ පිහිටුවා තිබූ නිවාස ණය අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.41,440,057ක් වී තිබූ අතර එදිනට රු.14,100,000 ක් ණය ලබාදී තිබූ නිලධාරින් 15 දෙනකුගෙන් රු.4,716,605 ක මුදලක් තව දුරටත් අයවිය යුතුව පැවතුණි. අවසන් වරට නිලධාරියකු වෙත ණය ලබාදීම සිදුව තිබුණේ 2011 දෙසැම්බර් මස 05 දිනවූ අතර එදින සිට පුරා වසර 12කට අධික කාලයක් දෙපාර්තමේන්තු | 2023 | ණය අරමුදල පිහිටුවීමේ අරමුණ ඉටුකිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. | දේශිය ආදායම් දිරිගැන්වීමේ අරමුදල සඳහා භාණ්ඩාගාරය මඟින් ලබා දී ඇති මුදල් උකස් හා ආයෝජන බැංකුවේ තැන්පත් කර නිවාස ණය අරමුදලක් පිහිටුවා ඇති අතර, දේශිය ආදායම් සේවයේ ස්ථිර නිලධාරීන්ට දේපල ඇපයක් තැබීම මත ණය ලබාදි ඇති බව හා ලබාදෙන ලද උපරිම ණය මුදල රුපියල් 1,000,000 ක් වන බවත් එම ණය මුදල සඳහා වර්ෂ 2011 න් පසුව නිලධාරීන්ගෙන් ණය අයදුම්පත් ලැබී නොමැති බව. | නිර්දේශය ක්‍රියාත්මක කර නැත |

| | | | | | |
|---|---|---|---|---|---|
| | නිලධාරින් වෙත ණය ලබාදී නොතිබුණි. | | | | |
| 2. | දේශිය ආදායම් දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව ඇතිකරගෙන තිබූ ගිවිසුම අනුව රු.1,000,000 ක උපරිම ණය මුදල ලැබීමට හැකියාව ඇත්තේ අයදුම්කරන අවස්ථාව වන විට අයදුම්කරුට හෝ කාලාත්‍රයාට හෝ යැපෙන දරුවන් සඳහා ඉඩමක් හෝ නිවසක් සතු නොවන අවස්ථාවකදී පමණි.එසේම මෙම ණය මුදල ලබාගැනීම තුල රජයේ දේපල ණය යෝජනා ක්‍රමය යටතේවූ දේපල ණය අයදුම්කිරීමට යම් නිලධාරියකු වෙත ඇති අවස්ථාව අහිමිවීම මත වඩා ආකර්ශණීය ණය යෝජනාක්‍රමය වෙත නිලධාරින් යොමුවීම හේතුවෙන් පසුගිය වසර කිහිපය පුරාම මෙම ණය යෝජනා ක්‍රමයෙන් නිවාස ණය ලබා ගැනීම සඳහා අයදුම්පත් ලැබී නොතිබුණු අතර 1989 අප්‍රේල් 10 දිනැතිව දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව සමග අත්සන් තබන ලද ගිවිසුමේ සඳහන් කොන්දේසි නැවත | 2023 | ණය අරමුදල පිහිටුවීමේ අරමුණ ඉටුකිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. | දේශිය ආදායම් දිරිගැන්වීමේ අරමුදල සඳහා භාණ්ඩාගාරය මගින් ලබා දී ඇති මුදල් උකස් හා ආයෝජන බැංකුවේ තැන්පත් කර නිවාස ණය අරමුදලක් පිහිටුවා ඇති අතර, දේශිය ආදායම් සේවයේ ස්ථිර නිලධාරීන්ට දේපල ඇපයක් තැබිම මත ණය ලබාදි ඇති බව හා ලබාදෙන ලද උපරිම ණය මුදල රුපියල් 1,000,000 ක් වන බවත් එම ණය මුදල සඳහා වර්ෂ 2011 න් පසුව නිලධාරීන්ගෙන් ණය අයදුම්පත් ලැබී නොමැති බව | නිර්දේශය ක්‍රියාත්මක කර නැත |

| | | | | | |
|---|---|---|---|---|---|
| | සමාලෝචනයට ලක්කිරීමේ අවශ්‍යතාවය කෙරෙහි බලධාරීන්ගේ අවධානය යොමුවිය යුතුව පැවතුණි. | | | | |
| 3. | 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන තුල දක්වා ඇති පරිදි 2023 , වර්ෂයට අදාළව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මූලික ආදායම් ඇස්තමේන්තුව රු.බිලියන 2,090 ක් වූ අතර 2023 දෙසැම්බර් 31 දිනට සත්‍ය වශයෙන් ඉපයූ ආදායම වූ රු.බිලියන 1,832 මූලික ආදායම් ඇස්තුමේන්තුවෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 12 ක අඩුවීමක් විය. කෙසේ වුවද දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා 2023 පළමු අර්ධ වර්ෂය සඳහා දිරිදීමනා ගෙවීමේදී ඇගයීමට ලක්වූ උප ශාඛා 96 ක් අතරින් ශාඛා 08 ක හැර ඉතිරි සියළු ශාඛා සඳහා සියයට 112 ඉක්මවූ කාර්යය සාධනයක් ලබා ගත් බව සලකා සම්පූර්ණ ප්‍රසාද ලකුණු ලබාදී තිබුණි. | 2023 | දිරිදීමනා සඳහා කාර්යය සාධනය ඇගයීමට ක්‍රමවත් වැඩපිළිවෙලක් පිහිටවිය යුතුය. | ලබාදී ඇති ඉලක්ක ළඟාකර ගැනීම මත ඒ අංශ සඳහා දිරිදීමනා හිමිව ඇති බවත් අංශ 8 ක් හැර ඉතිරි සියළුම ශාඛා සඳහා උපරිම දිරිදීමනා පිරිනමා ඇති බව. | නිර්දේශය ක්‍රියාත්මක කර නැත |

## 3.57 ජනාධිපතිවරයාගේ අරමුදල

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 6,425,891,215 | 6,425,891,215 | 6,153,715,092 | - | තත්ත්වාගණනය නොකළ |
| **2022** | 8,088,895,493 | 8,088,895,493 | 7,882,906,732 | - | තත්ත්වාගණනය නොකළ |
| **2023** | 11,294,355,315 | 11,294,355,315 | 10,914,177,962 | - | තත්ත්වාගණනය නොකළ |

| | විගණන නිරීක්ෂණ | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| 1. | **නීති, රීති රෙගුලාසි ආදියට යොමුව** | | | | |
| | 1978 අංක 07 දරන ජනාධිපතිවරයාගේ අරමුදල් පනතේ 03 වගන්තිය;<br><br>අරමුදල සඳහා පාලක මණ්ඩලයක් සිටිය යුතු අතර, මණ්ඩලයේ රැස්වීම් පිළිබඳ කාර්ය පටිපාටිය ද ඒ රැස්වීම් වල කටයුතු, මණ්ඩලය විසින් විධිමත් කරනු ලැබිය යුතුය. එසේ වුවද, සමාලෝචිත වර්ෂයේදී පාලක මණ්ඩල රැස්වීම් එකක් පමණක් පවත්වා තිබුණි. 2022 හා 2023 වර්ෂවලදී අරමුදලෙහි පාලක මණ්ඩලය සාමාජිකයන් හත් දෙනෙකුගෙන් සමන්විත විය යුතු වුවත් | 2023 | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු වීම. | අදහස් දක්වා නොමැත | මේ වනවිටත් පනතේ විධිවිධාන අනුව රැස්වීම් පවත්වා නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | සමාලෝචිත වර්ෂය අවසාන වන විට අරමුදලේ පාලක මණ්ඩලය සාමාජිකයන් 06 දෙනෙකුගෙන් පමණක් සමන්විත වී තිබුණි. | | | | |
| 2. | එක් අයදුම්කරුවෙකු ඉන්දියාවේ රෝහලකදී සිදු කරන ලද සැත්කමක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.5,000,000 ක් අරමුදලෙන් ගෙවා තිබුණි. 1978 අංක 07 දරන ජනාධිපතිවරයාගේ අරමුදල් පනතේ 06 වන වගන්තිය අනුව මෙම ගෙවීම සඳහා පාලක මණ්ඩලයේ හා ජනාධිපතිවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. මෙම අයදුම්කරුගේ මාසික දීමනා සමඟ රු.55,596 ක මාසික විශ්‍රාම වැටුපක් ද, රු.15,000,000 ක් වටිනා නිවස සමඟ ඉඩමක්, රු.4,000,000 ක මෝටර් රථයක්, රු.2,000,000 ක ස්ථාවර තැන්පතු හා රු.779,049 ක බැංකු ජංගම ශේෂයක් ද නිශ්චල හා චංචල දේපල වල වටිනාකම දක්වා තිබිණි. ඒවා තහවුරුකර ගැනීමට රෝගියාගේ සහ පවුලේ සාමාජිකයන්ගේ මාස 03ක වැටුප් වාර්තා | 2023 | අරමුදල් ලබා දීමේදී පවත්නා පද්ධතියට අනුකූලව සිදු කළ යුතු වීම. | ඔබ විසින් දක්වා ඇති පරිදි එම මහත්මිය හුදෙක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරියක් පමනක් නොව ශ්‍රී ලංකාවේ කලා ක්ෂේත්‍රයට ඉමහත් කීර්තියක් ලබා දුන් අග්‍රගන්‍ය කලාකාරිණියක් බව ප්‍රකාශ කරමි.ඒ අනුව ජනාධිපති අරමුදලේ 6(ඇ) වගන්තිය අනුව ජාතිය වෙනුවෙන් සේවය කර ඇති තැනැත්තන් සඳහා ප්‍රදානයන් කිරීමට අතිගරු ජනාධිපතිවරයාට සහ ජනාධිපති අරමුදලේ පාලක මණ්ඩලයට ඇති හැකියාව මත හා පාලක මණ්ඩයේ අනුමැතියට යටත්ව එම මහත්මිය වෙත අදාල ගෙවීම් සිදු කර ඇත. | එක් අයදුම්කරුවකු සඳහා අරමුදලෙන් රු.5,000,000 ක් ගෙවා තිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | සියලු බැංකු ගිණුම්වල සහතික සහ බැංකු ගණුදෙනු ඇතුලත් බැංකු වාර්තා ඉදිරිපත් කරන ලෙසට දන්වා ඇතත් එම තොරතුරු ඉදිරිපත් කල බවට ලිපිගොනුව අනුව තහවුරු නොවීය. තවද, මෙම අයදුම්කරු වෙනුවෙන් 2021 වර්ෂයේද අරමුදලෙන් රු. 500,000 ක් ගෙවා තිබුණි. | | | | |
| 3. | 2023 ජනවාරි 27 හා 2024 පෙබරවාරි 07 දිනැති ලිපි මඟින් චෙන්නායි හි නියෝජ්‍ය මහකොමසාරිස් කාර්යාලයෙන් දන්වා තිබූ පරිදි 2020 හා 2021 වර්ෂ වලට අදාල සමුච්චිත විදේශ විනිමය හුවමාරුව වෙනස වූ රු.322,051 ක මුදල නියෝජ්‍ය මහකොමසාරිස් කාර්යාලයට ප්‍රතිපූර්ණය කිරීම හෝ කපා හැරීමට පියවර ගෙන නොතිබුණි. මේ පිළිබඳව පසුගිය වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දී තිබුණි. | 2023 | විනිමය හුවමාරු වෙනස ගැලපීමට කටයුතු කළ යුතුවීම. | මෙම වර්ෂයේ දී අවශ්‍ය කටයුතු සිදු කිරීමට උපදෙස් ලබා දෙන ලදී. | මේ වනවිටත් නිවැරදි කර නොතිබුණි. |
| 4. | පාර්ලිමේන්තු මන්ත්‍රීන් දෙදෙනෙක් විදේශ රෝහලකදී සිදු කළ වෛද්‍ය ප්‍රතිකාර සඳහා සමාලෝචිත වර්ෂයේදී තනි පුද්ගලයකු සඳහා ගෙවූ වැඩිම වටිනාකම | 2022 | අරමුදලේ ප්‍රතිලාභ ගෙවීමේදී වැඩි ප්‍රතිලාභීන් සංඛ්‍යාවකට ප්‍රතිලාභ සැලසීම කෙරෙහි | ජනාධිපති අරමුදල් පනත අනුව ජනාධිපතිතුමාගේ අභිමතය පරිදි මෙවැනි ගෙවීම් සිදුකල හැකි බව දන්වා තිබුණි. | මේ වනවිටත් මෙම තත්ත්වය නිරීක්ෂණය විය. |

| | |
|---|---|
| වූ රු.මිලියන 6.083 ක් හා 6.955 ක් බැගින් එකතුව රු.මිලියන 13.038 ක් අරමුදලෙන් ගෙවා තිබූ බව නිරීක්ෂණය විය. | අවධානය යොමු විය යුතු වීම. |